මගේ ප්‍රකාශය විකෘති කර පළ කළ විද්‍යුත් නාලිකාවට එරෙහිව ඉදිරියේදී නීතිමය පියවර:

# හිටපු ඇමැති බදියුදීන්ගේ ගුණ වර්ණනාවක් මා කළේ නෑ

## ආරක්ෂක ලේකම් විශ්‍රාමික මේජර් ජනරාල් කමල් ගුණරත්න

**රත්නසිරි පතිරණ සහ රක්ෂණ ශ්‍රියන්ත**

හිටපු ඇමැති රිෂාඩ් බදියුදීන් මහතා ගැන තමන් ගුණ වර්ණනාවක් නොකළ බවත් ඔහු සම්බන්ධයෙන් කිසිසේත්ම අගය කිරීමක් කිරීමට අවශ්‍යතාවක් නැති බවත් ආරක්ෂක ලේකම් (විශ්‍රාමික) මේජර් ජනරාල් කමල් ගුණරත්න මහතා අවධාරණය කළේය.

තමන් විසින් පසුගියදා වව්නියාව දිසාපති කාර්යාලයේ නව ශ්‍රවණාගාරය විවෘත කිරීමේදී සිදු කළ කතාව එක්තරා විද්‍යුත් නාලිකාවක් විසින් විකෘති ආකාරයෙන් සංස්කරණය කර පළ කර ඇති බවත් ඉන් පසු එය විවිධ සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ පළ කරමින් තමන්ගේ ප්‍රතිරූපයට හානියක් වන ආකරයෙන් පළ කර ඇති බවත් ආරක්ෂක ලේකම්වරයා පවසයි.

ආරක්ෂක ලේකම්වරයා මේ බව ප්‍රකාශ කළේ ඊයේ (05) ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැති විශේෂ මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

තමන් විසින් සිදු කළ ප්‍රකාශය විකෘති කර පළ කිරීම සම්බන්ධයෙන් අදාළ විද්‍යුත් නාලිකාවට එරෙහිව ඉදිරියේදී නීතිමය පියවර ගන්නා බවද ඒ මහතා කියා සිටියේය.

වව්නියාව දිසාපති කාර්යාලයේ නව ශ්‍රවණාගාරය විවෘත කිරීමේ උත්සවයේදී ආරක්ෂක ලේකම්වරයා විසින් සිදු කළ සම්පූර්ණ කතාවම එම අවස්ථාවේදී මාධ්‍යවේදීන් ඉදිරියේ ප්‍රදර්ශනය කෙරිණි.

වව්නියාව දිසාපති කාර්යාලයේ නව ශ්‍රවණාගාරය විවෘත කිරීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්ව සිටියේ වාරිමාර්ග ඇමැති සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය ඇමැති චමල් රාජපක්ෂ මහතාය. මේ අවස්ථාවට හිටපු ඇමැති රිෂාඩ් බදියුදීන් මහතාද පැමිණ සිටියේය. ශ්‍රවණාගාරය විවෘත කිරීමෙන් පසු උතුර හා නැගෙනහිර පළාත් මහජන නියෝජිතයන් සමග පළාතේ අඩුපාඩුකම් ගැන සහ ඉදිරි ආර්ථිකමය සහ සංවර්ධන යෝජනා ක්‍රම සම්බන්ධයෙන් දීර්ඝ සාකච්ඡාවක් පැවැත්විණි. ඒ අවස්ථාවේ ආරක්ෂක ලේකම්වරයා ලෙස තමන් විසින් කළ කතාව විවිධ තැන්වලින් සංස්කරණය කරමින් මේ විද්‍යුත් නාලිකාව විසින් ඉදිරිපත් කර ඇති ආකාරයද මෙහිදී ආරක්ෂක ලේකම්වරයා පෙන්වා දුන්නේය.

මෙහිදී ආරක්ෂක ලේකම්වරයා කියා සිටියේ එවකට රිෂාඩ් බදියුදීන් මහතා නැවත පදිංචි කිරීමේ ඇමැතිවරයාව සිටියදී තමන්ට ඒ අවස්ථාවේදී වන්නි දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් කරන ලද පුනරුත්ථාපන කටයුතුවලදී සහයෝගය දුන් බවයි. එසේම එම පුනරුත්ථාපන කටයුතුවලදී මැණික් ෆාම් කඳවුරේ අවතැන් වූ ජනතාවට සහන සැලසීමේදී එවකට වව්නියාව දිසාපතිනිය ලෙස කටයුතු කළ පී.එස්.එම්. චාල්ස් මහත්මියද විශාල සහයෝගයක් ලබාදුන් බව තමන් එහිදී වැඩිපුරම අගය කළේ චාල්ස් මහත්මිය වුවද ඒ ගැන අදාළ විද්‍යුත් නාලිකාව මගින් ඒ පිළිබඳව කිසිවක් සඳහන් නොකිරීම කනගාටුවට කරුණක් බවද ඒ මහතා සඳහන් කළේය. අපේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක් හෙයින් ඕනෑම දෙයක් විවේචනය කිරීමේ නිදහස ඇති නිසා ඔවුන් මෙලෙස තමන්ගේ ප්‍රකාශය විකෘති කරන්න ඇතැයි තමන් සිතන බවද හෙතෙම පැවසීය.

එවකට වන්නියේ ලක්ෂ තුනකට අධික ජනතාවකට නිවාස, පුනරුත්ථාපන කටයුතු, සුබසාධන ඇතුළු මූලික අවශ්‍යතා සැලසීමේදී පක්ෂ පාට ජාති භේද කිසිවක් නොසලකා තමන් රාජ්‍ය නිලධාරියකු හැටියට පැවරුණු වගකීම් හරිහැටි ඉටු කළ බවත් ඊට විශාල සහයෝගයක් දුන්නේ එවකට දිසාපතිනිය වූ චාල්ස් මහත්මිය බවත් එහිදී තමන් ප්‍රකාශ කළ බවද ආරක්ෂක ලේකම්වරයා කියා සිටියේය.



තමන් විසින් සිදුකළ ප්‍රකාශයක් මෙලෙස අනවශ්‍ය ලෙස විකෘති කර සංස්කරණය කර පළ කිරීම සම්බන්ධයෙන් හා තමාට මඩ ගැසීමේ චේතනාවෙන් කරන ලද මේ අසත්‍ය ප්‍රචාරය සම්බන්ධයෙන් කනගාටු වන අතර එයට නීති උපදෙස් ලබාගෙන අදාළ මාධ්‍ය ආයතනයට විරුද්ධව නීතිමය කටයුතු කරන බවද ඒ මහතා කියා සිටියේය.

තමන් වෙත විශ්වාසයෙන් යුතුව ජනාධිපතිවරයා සහ අගමැතිවරයා පවරන ලද වගකීම් රටත් ජනතාවත් වෙනුවෙන් කිසිදු ජාති ආගම් භේදවලින් තොරව නොබියව අවංකවම ඉදිරියටද ඉෂ්ට කිරීමටද තමා පසුබට නොවන බවද ආරක්ෂක ලේකම්වරයා වැඩිදුරටත් කියා සිටියේය.

# රට පුරා පාලම් 6000ක් ඉදිකිරීමට සැලසුම්

**චන්දිමා කරුණාරත්න**

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොදුජන ඉංජිනේරු පෙරමුණ මැදිහත් වීමෙන් ලංකාව පුරා පාලම් 6000ක් ඉදිකිරීමට සැලසුම් කෙරේ.

පැරණි ලයිට් කණු හා විවිධ හේතූන් නිසා ඉවත දමන ලයිට් කණු භාවිතා කරමින් ඉදිකෙරෙන මේ පාලම් ව්‍යාපෘතියේ මේ අවුරුද්ද අවසාන වනවිට පාලම් 300ක් පමණ ඉදිකිරීමට සැලසුම් කර තිබෙන බව ශ්‍රී ලංකා පොදුජන ඉංජිනේරු පෙරමුණේ සභාපති, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති ඉංජිනේරු විජිත හේරත් මහතා පැවැසීය.

'දිනමිණට' අදහස් දක්වමින් ඒ මහතා මේ බව ප්‍රකාශ කළේය.

එහි පළමු පියවර වශයෙන් යටියන්තොට ප්‍රදේශයේ පාලම් තුනක් මේ වන විට ඉදි කර තිබෙන බවත් පැවැසූ ඒ මහතා පළමු පාලම් 20 ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබෙන බවත් ඒවා රත්නපුර, කෑගල්ල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික් කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන බවත් පැවැසීය.

මේ ජාතික වැඩසටහනේ තාක්ෂණික කටයුතු, ව්‍යාපෘති සැලසුම් කිරීම හා ස්ථාන හඳුනා ගැනීම ශ්‍රී ලංකා පොදුජන ඉංජිනේරු පෙරමුණ විසින් සිදු කරන බවත් මේ සමග මාර්ග සංවර්ධන ආධිකාරිය මේ සම්බන්ධව කටයුතු කරන බවත් පෙන්වා දුන්නේය.

වසර ගණනාවක සිට ඒ දඬු වැනි පාලම් භාවිත කරමින් ගමනාගමනයේදී විවිධ අපහසුතාවන්ට මුහුණ දුන් ජනතාවගේ ගැටලුවලට මේ ව්‍යාපෘතිය හරහා විසඳුම් ලැබෙන බවත් පැහැදිලි කළේය.

# කටුනායක ගුවන් තොටුපොළේ තීරු බදු රහිත සාප්පු වෙත පිවිසීම අත්හිටුවයි

**කටුනායක ටී.කේ.ජී.කපිල**

ගම්පහ දිස්ත්‍රික්කයේ අලුතෙන් කොරෝනා රෝගී තත්ත්වය පැතිර යෑමත්, දිස්ත්‍රික්කයේ පොලිස් බල ප්‍රදේශ කීපයකට ඇඳිරි නීතිය පැනවීමත් සමග කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ ද යම් සීමා කිරීම් කීපයක් කිරීමට කටුනායක ගුවන් තොටුපොළ ඉහළ කළමනාකරණයේ උපදෙස් මත පියවර ගෙන ඇති බව ගුවන් තොටුපොළ කාර්යභාර නිලධාරියා පැවසීය.

ඒ අනුව කටුනායක ගුවන් තොටුපොළ පිටත්වීමේ සහ පැමිණීමේ පර්යන්තයේ ඇති තීරු බදු රහිත සාප්පු සංකීර්ණ වෙත පෙරේදා (04) දහවල් 12.00 සිට ගුවන් මගීන්ට පිවිසීම යළි දැනුම් දෙනතුරු අත්හිටුවා තිබේ. එමෙන්ම ගුවන් තොටුපොළේ පිහිටි පැමිණීමේ පර්යන්තයේ ආලින්දයට සහ පිටත්වීමේ පර්යන්තයේ ඇති ආලින්දයටත් ගුවන් මගීන් සමග පැමිණෙන අමුත්තන්ට පිවිසීම මෙන්ම ගුවන් තොටුපොළ මහජන ප්‍රේක්ෂක මණ්ඩපය ද මහජනතාවට පෙරේදා(04) සිට නැවත දැනුම් දෙන තුරු වසා දමා ඇමීමට ගුවන් තොටුපොළ ඉහළ කළමනාකරණයේ උපදෙස් මත පියවර ගත් බව කටුනායක ගුවන් තොටුපොළ කාර්ය භාර නිලධාරියා සඳහන් කළේය.

# ආණ්ඩුවට ජනතාව විශාල ජනවරමක් දුන්නේ රට පෙරට ගෙනයෑමටයි

## පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් කුමාර



**උපාලි කරුණාරත්න**

වත්මන් රජයට මෙරට ජනතාව විශාල ජනවරමක් දුන්නේ රට පෙරට ගෙන යාමට යැයි පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් කුමාර මහතා පැවැසීය. මන්ත්‍රීවරයා එසේ ප්‍රකාශ කළේ, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කඩුවෙල ආසනයේ තරුණ බල මණ්ඩලය පිහිටුවීම සහ කාන්තා බල මණ්ඩලය පැවැත්වීමේ අවස්ථාවට සහභාගි වෙමිනි. තලංගම සමෘද්ධි ශ්‍රවණාගාරයේ දී පෙරේදා (04) මෙය සිදු කෙරිණි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් සම්බන්ධයෙන් රටවැසියන් විශ්වාසයෙන් කටයුතු කරන බවද මෙහිදී ප්‍රකාශ කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විපක්ෂයේ ඇතැම් කියුම් කෙරුම්වලට රැවටීමට අවශ්‍ය නොවන බවද කීය. යහපාලන නඩයේ ඇතැමුන් මේ අවස්ථාවේ රජයට එකතු කර ගැනීමට තමන් විරුද්ධයැයිද මන්ත්‍රීවරයා පැවසීය.




SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel
ඔබ සමගයි. සැමදා.

## 42 වන ඔබ්සවර් - මොබිටෙල්

### වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ........
අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐
සමස්ත ලංකා ක්‍රීඩිකාව: ........
**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**
පාසල : ........
ඔබේ නම : ........
ලිපිනය : ........
ජංගම දුරකථන අංකය : ........

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-10-10 **අංකය** 31






NLB
ජාතික ලොතරැයිය

## ලංසු සඳහා ආරාධනයයි

## ජාතික ලොතරැයි මණ්ඩලය

### මුදල් අමාත්‍යාංශය

### ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා වසරක කාලයකට කඩදාසි ප්‍රතිචක්‍රීකරණ සේවාව සැපයීම සඳහා ප්‍රසම්පාදනය

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) වෙනුවෙන් එහි සභාපති විසින් ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා වසරක කාලයකට කඩදාසි ප්‍රතිචක්‍රීකරණ සේවාව සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

මෙම ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු ක්‍රමවේදය යටතේ මෙහෙයවනු ලැබේ.

තෝරාගන්නා ලද සේවා සැපයුම්කරු විසින් ජාතික ලොතරැයි මණ්ඩලයේ කල් ඉකුත් වූ ලොතරැයි තොග කඩදාසි ඉරීමේ යන්ත්‍ර මගින් ඉරා දැමිය යුතුය. සෑම මාස දෙකකට වරක් මෙම ක්‍රියාවලිය සිදු කළ යුතුය.

මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කොළඹ 01, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවතේ අංක 32 පිහිටි ජාතික ලොතරැයි මණ්ඩලයේ 1 වන මහලේ ප්‍රසම්පාදන අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් (දුරකථන අංකය : 0114607020) ලබාගත හැකි අතර, ඕනෑම රාජකාරී දිනයක 9.00 පැය හා 15.00 පැය අතර, පහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

රුපියල් දහසක (රු. 1,000.00) ගාස්තුවක් (වැට් බදු සහිතව) මුදලින් ගෙවීමෙන් අනතුරුව 2020.10.06 වෙනි දින සිට 2020.10.20 වෙනි දින දක්වා ඕනෑම රාජකාරී දිනයක 9.00 පැය සහ 15.00 පැය අතර, ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

ලංසු, 2020.10.21 වෙනි දින 14.30 පැයට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 01, එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවතේ, අංක 32 පිහිටි ජාතික ලොතරැයි මණ්ඩලයේ 5 වන මහලේ පරිපාලන අංශයේදී ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් අයෙකුට මෙයට සහභාගි විය හැකිය. සියලුම ලංසු සමග රුපියල් හතලිස් දහසක (රු. 40,000.00) වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර, එය 2021.01.19 දින දක්වා වලංගු විය යුතුය.

සාර්ථක ලංසුකරු විසින් රුපියල් දෙලක්ෂ හැට දහසකට (රු. 260,000.00) සමාන වටිනාකමින් යුත් කාර්යසාධන ඇප බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතුය. ලංසුව ප්‍රදානය කරන දිනයේ සිට මාස 12 ක කාලයක් කාර්යසාධන ඇප බැඳුම්කරය වලංගු විය යුතුය.

මුද්‍රා තබන ලද ලංසු ලියවිලි ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් බර දිය හැකිය. ලංසු ලියවිලි බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**කඩදාසි ප්‍රතිචක්‍රීකරණ සේවාව සඳහා වූ ලංසුව (NLB/SUP/08/PRS/2020)**" ලෙස සටහන් කළ යුතුය.

පූර්ව ලංසු රැස්වීමක් 2020.10.13 වෙනි දින 10.00 පැයේදී කොළඹ 01, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවතේ, අංක 32 පිහිටි ජාතික ලොතරැයි මණ්ඩලයේදී පැවැත්වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික ලොතරැයි මණ්ඩලය,**
**අංක 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත,**
**කොළඹ 01.**

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board


# ගෝනදෙණියේ සීවලී හිමිගේ ජන්ම දිනට පොත් බෙදාදීමක් අද

ගෝනදෙණියේ සීවලි හිමියන්ගේ ජන්ම දිනයට සමගාමීව වාර්ෂිකව සිදු කෙරෙන සිසු සිසුවියන් උදෙසා පාසල් පොත් පිරිනැමීමේ උත්සවය අද (06) සවස 3.00ට හෝමාගම සීවලි සදහම් අසපුවේදී පැවැත්වේ.

හෝමාගම පිටිපන දකුණ ගලගහහේන සදහම් සේවණේදී පැවැත්වෙන මේ අවස්ථාවට ප්‍රවීණ ගායක නිහාල් නෙල්සන්, චන්ද්‍රසේන හෙට්ටිආරච්චි, සුභානි හර්ෂණී ඇතුළු ගායක ගායිකාවන් පිරිසක්ද එක්වීමට නියමිතය. ප්‍රවීණ ගායන ශිල්පී චන්ද්‍රසේන හෙට්ටිආරච්චි මහතා විසින් විශේෂ දේශනයක්ද පැවැත්වීමට නියමිතය.

# 'රැකියා පොළ 2020' අද ඇරැඹේ

මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව හා කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය සමග සංවිධානය කරන 'රැකියා පොළ 2020' අද (6) කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේදී ආරම්භ වෙයි.

රැකියාවක් අපේක්ෂිත ඕනෑම අයකුට එදිනම සම්මුඛ පරීක්ෂණයන්ට සූදානම්ව උදේ 9.30 සිට 2.00 අතර කාලයේ පැමිණිය හැකි බව මානව සම්පත් සංවර්ධන නිලධාරී බී. එම්. එන්. පුෂ්පකුමාරි (0718046191) පවසයි.

# සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සියවස් පූර්ණය:

## නිවාස ව්‍යාපෘතියේ පළමුවැන්න මඩකලපුවේ පූනානිහිදී



**උපාලි කරුණාරත්න**

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සියවස් පූර්ණය නිමිත්තෙන් ඉදි වන නිවාස ව්‍යාපෘතියේ පළමුවන අදියර මඩකලපු දිස්ත්‍රික්කයේ පූනානි ග්‍රාමයේ ආරම්භ කර ඇත. එහි පළමු නිවෙස මීට ඉහතදී නිවාසලාභී පවුල් වෙත ලබා දුන් අතර දෙවැනි නිවෙස පිරිනැමීම හා සහ නව නිවෙස් පහකට මුල්ගල් තැබීමේ මහෝත්සවය පසුගියදා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති සහ ලෝක බෞද්ධ මහා සම්මේලනයේ උප සභාපති ජගත් සුමතිපාල මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

# අපජලය ඉවත් කිරීමට ගිය නගර සභා සේවකයා ගලියට ඇදවැටී මරුට

**හේමන්ත ඩෙප්**

මට්ටක්කුලිය ප්‍රදේශයේ ප්‍රකට වෙළෙඳ සංකීර්ණයක ඉදි කර ඇති ගලියක ජලය ඉවත් කිරීමට ගිය කොළඹ නගර සභාවේ විශ්‍රාමික සේවකයකු ගලියට ඇදවැටී මරුමුවට පත්ව ඇත.

ග්‍රෑන්ඩ්පාස් ශාන්ත ජෝශප් සමඟිපුර ප්‍රදේශයේ පදිංචි සේරසිංහ පතිරණගේ සෝමරත්න නැමති 60 හැවිරිදි දෙදරු පියෙකු මෙලෙස මරුමුවට පත්ව තිබේ.

අදාළ වෙළෙඳ සංකීර්ණයේ කුකුළන් සෝදා එහි ජලය රඳවා තබන අඩි 10ක පමණ ගැඹුරැති ගලියේ මසකට වරක් එහි ජලය කොළඹ නගර සභාවට අයත් බවුසරයකට බැහැර කරන අතර, සිද්ධිය වූ අවස්ථාවේදී එහි ජලය නියමිත ලෙස බැහැර නොවුණ නිසා මරණකරු එම ගලිය පරීක්ෂා කිරීමට යාමේදී එයට වැටී මෙලෙස මරුමුවට පත්ව ඇත.

කොළඹ නාගරික හදිසි මරණ පරීක්ෂක නීතිඥ ඉරේෂා දේශානි සමරවීර මහත්මිය හමුවේ පැවැති මියගිය අයගේ හදිසි මරණ පරීක්ෂණයේදී සිද්ධිය සියැසින් දුටු සිරියානන්ද සිල්වා (60) යන අය සාක්කි දෙමින් මෙසේද කීය.

මියගිය අය මා වසර 35 ක පමණ කාලයක සිට දන්නා අයෙකි. මේ මස 3 වැනිදා අප මට්ටක්කුලිය (කාර්ගිල්ස්) වෙළෙඳ සංකීර්ණයේ ඉදිකර තිබෙන ගලියක වතුර ඉවත් කිරීමට හෝස් එකක් උපයෝගී කරමින් බවුසරයට ජලය ඉවත් කරමින් සිටියා. නියමිත ලෙස ගලියේ ජලය ඉවත් නොවුණු නිසා එය පරීක්ෂා කිරීමට මරණකරු ඉහළින් එබී බැලුවා. ඒ සමගම ඔහුව එම ගලිය ඇතුළට වැටුණා. අප වහාම අවට තිබෙන බ්ලොක් ගල් ඉවත් කර බලද්දී අමුතු ගෑස් ගඳක් වගේ එකක් දැනුණා. අප ඔහුව උඩට ගෙන රෝහල වෙත ගෙන ගියා. එහිදී ඔහු මිය ගියා.

මෙහිදී මියගිය අයගේ දියණියක වන සේරසිංහ පතිරණගේ නිල්මිණි (28) යන අය ද සාක්කි දුන්නාය.

කොළඹ අධිකරණ වෛද්‍ය ඩබ්ලිව්. ආර්. ඒ. එස්. රාජපක්ෂ මහතා මියගිය අයගේ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීය.

අදාළ වෛද්‍ය වාර්තා හා සාක්කි සැලකිල්ලට ගත් කොළඹ නාගරික හදිසි මරණ පරීක්ෂක නීතිඥ ඉරේෂා දේශානි සමරවීර මහත්මිය මියගිය අයගේ මරණය හදිසි අනතුරක් බවට නිගමනය කළාය.

සිද්ධිය පිළිබඳව මට්ටක්කුලිය පොලිසිය පරීක්ෂණ මෙහෙයවිය.

# නවගත්තේගම කැලඹූ සද්දන්තයා හොරොව්පොතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට



**මිහිර විජේසේකර-මාරවිල සමූහ**

නවගත්තේගම ප්‍රදේශ රැසක් භීතියට පත් කරමින් නිවාස කඩා දමා වගා වැනසූ කන් කොටා නමින් හඳුන්වන වන අලියා වනජීවී නිලධාරින් විසින් අල්ලා හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට රැගෙන යාමට කටයුතු කළ බව පුත්තලම සහකාර වන ජීවි අධ්‍යක්ෂ එරන්ද ගමගේ මහතා පවසයි.

මේ කන්කොටා නැමති වන අලියා රඹකනයාම පෞද්ගලික ඉඩමක වගා ළිඳකට වැටී සිටියදී පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විදේශ කටයුතු රාජ්‍ය ඇමැති ප්‍රියංකර ජයරත්න මහතාගේ විශේෂ ඉල්ලීමකට වනජීවි ඇමැති සී.බී. රත්නායක මහතා විසින් වනජීවි නිලධාරින් යොදවා මහත් පරිශ්‍රමයක් දරා මේ වන අලියා අල්ලා ගැනීමට කටයුතු කළේය. වන ජීවි පශු වෛද්‍යවරුන් වන දොස්තර චන්දන ජයසිංහ මහතා, ඉසුරු කොට්ටගේ මහත්වරුන් ඇතුළු වන ජීවි නිලධාරින් 21 දෙනෙකු මේ අවස්ථාවට එක්වූහ.

වන අලියා අවුරුදු 35ක වයසකින් යුත් බවත් උස අඩි නවයකට ආසන්න වන බවත් වනජීවි නිලධාරීහු පවසති.

# මාරවිල කුරුස පල්ලිය අසල මුහුදු වෙරළේ තරුණයකුගේ මළසිරුරක්

**මිහිර විජේසේකර**
**මාරවිල සමූහ**

මියගිය තරුණ පුද්ගලයකුගේ මළසිරුරක් මාරවිල කුරුස පල්ලිය අසල මුහුදු වෙරළට ඊයේ (05) දහවල් ගොඩ ගසා තිබිය දී මාරවිල පොලීසිය විසින් සොයාගෙන තිබේ.මියගිය අය වයස අවුරුදු විසි 27ක් පමණ විය හැකි බව පොලිසිය සඳහන් කරයි.

ඊයේ (5) රාත්‍රියේ දිය යෑමට ගිය අවස්ථාවේ මේ පුද්ගලයා මුහුදට ගසා ගෙනගොස් ඇති බවට පොලිසිය සැක පහළ කරයි. මේ ස්ථානයේ දිය නෑමෙන් වළකින ලෙසද නාම පුවරු ප්‍රදර්ශනය කර තිබුණත් බොහෝ තරුණයන් රාත්‍රී කාලයේ මත්පැන් පානය කරමින් දිය නෑමට කටයුතු කරන බව ප්‍රදේශයේ ධීවරයෝ සඳහන් කරති.

පුද්ගලයන් දෙදෙනෙක් මෙසේ මත්පැන් පානය කරමින් සිටියදී මාරවිල පොලිසිය අත්අඩංගුවට ගත් බව පොලිසිය සඳහන් කරයි. මහවැව හදිසි මරණ පරීක්ෂක නිහාල් පද්මසිරි ගරුසිංහ මහතා සිද්ධිය වූ ස්ථානයට පැමිණ මූලික පරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. සිද්ධිය සම්බන්ධයෙන් මාරවිල පොලිසිය පරීක්ෂණ සිදු කරයි.

# මාදම්පේ අත්හැර දැමූ වැසිකිළියේ සිටි අය ළඟ කුඩු

**ආරච්චිකට්ටුව සමූහ - අතුකෝරළ යූ. ගුණපාල**

මාදම්පේ තනිවැල්ල දේවාලය අසල නිවසක අතහැර දමා තිබූ වැසිකිළියක සිටි පුද්ගලයාගේ ගුද මාර්ගයේ හෙරොයින් සඟවාගෙන සිටියදී අත්අඩංගුවට ගෙන තිබේ.

මාදම්පේ පැරණි නගරයේ තිනිපිටිගම පදිංචි නිශාන්ත පීරිස් යන අය මෙලෙස සැකපිට අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු ළඟ තිබූ හෙරොයින් ප්‍රමාණය මිලිග්‍රෑම් 2160 කි.

සැකකරු මාදම්පේ පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ධර්මප්‍රිය මහතා විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර, හලාවත දිසා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව රක්ෂිත බන්ධනාගාර ගතකර තිබේ.




**ඉස්සර පන්සලක රත් වුණු තැටියෙ — රොටී**
**මතකයි දෙගොල්ලක් එක් වී ගිලපු — හැටී**
**එහි සිටි කෙනෙකු ඇත පල්ලිය අසල — වැටී**
**තොප්පිය හැරෙන අත සෝදිසි කරනු — වටී**

**කලිසම්-කෝට්-ටයි ඔක්කොම ඇත — ගැලවී**
**මල්ලිගෙ අතේ එල්ලී බිමටම — ඇලවී**
**දඟලයි නැඟිට යන්නට එතැනින් — ගැලවී**
**අත දුන්නොතින් යනු ඇත ඔහුටත් — කෙළවී**

**රටේමුල්ලේ මුදන්නායක**

# දිවුලපිටිය ඥානාවාස මහ විදුහලේ සිසුහු 41ක් සහ ගුරුවරු දෙදෙනෙක් මීගමුවේ හෝටලයකදී නිරෝධායනයට



**කොටදෙණියාව සමූහ -එම්. පී. කුමාර**

සී.ආර්.පරීක්ෂණ සිදු කිරීමට කැඳවා තිබූ දිවුලපිටිය ඥානාවාස මහා විද්‍යාලයේ සිසුන් 41 සහ ඔවුන් සමීපව ඇසුරු කළ ගුරුවරු දෙදෙනෙක් මීගමුවේ හෝටලයක දී නිරෝධායනයට යොමු කිරීමට ඊයේ (05) සවස පියවර ගනු ලැබීය.

සිසුන් 41ක් සහ ගුරුවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයේ 57ක් පරීක්ෂණ සඳහා යොමු කිරීමට සූදානම් ව සිටියත් ඒ අවස්ථාවේ එහි පැමිණි කොරෝනා කාර්ය සාධක බළකායේ නිලධාරීන් පිරිසක් සිසුන් හතළිස් එක් දෙනා සහ ගුරුවරු දෙදෙනෙක් නිරෝධායනයට කැඳවා ගෙන යාමට අවශ්‍ය බව දැන්වූහ. එම පිරිසේ පරීක්ෂණ කටයුතු නිරෝධායන මධ්‍යස්ථානයේ දී සිදු කරන බවද පැවසීය

ඒ සමගම පැමිණ සිටි සිසුන් සහ මවුපියන් වික්ෂිප්ත වූ අතර හඬා වැටෙන සිසුවියන් ද දැකගත හැකිවිය. කාර්ය සාධක බළකායේ නිලධාරීන් සිසුන් නැවත නිවෙස්වලට පිටත් කර හැරිය අතර අවශ්‍ය ඇඳුම් පැළඳුම් ආදිය රැගෙන ඒමට දන්වනු ලැබීය. අවශ්‍ය සිසුන්ට ප්‍රවාහන පහසුකම් සපයන බවට ද නිලධාරීහු දැන්වූහ .

දිවුලපිටිය ශ්‍රී ඥානාවාස මහ විදුහලේ විදුහල්පති පූජිත ප්‍රේමතිලක මහතා ප්‍රකාශ කළේ මෙවැනි තත්ත්වයක් උද්ගත වන බව අවසන් මොහොත වනතුරු තමන් දැන නොසිටි බවයි. තමන් දැනුම් දුන්නේ දරුවන්ගේ පී සීආර් පරීක්ෂණවලට පැමිණීමට බවද ඔහු වැඩිදුරටත් පැවසීය. ආරක්ෂක අමාත්‍යාංශය ගත් තීරණයක් මත මේ පියවර ගැනුණු බව ද මෙහිදී හෙළිවිය.

මේ අතර පීසීආර් පරීක්ෂණ සඳහා කැඳවා තිබූ සිසු සිසුන් ගුරුවරුන් පනස් පස් දෙනාගේ පරීක්ෂණ කටයුතු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් ඊයේ සවස සිදුකිරීමට නියමිතව කිරීමට නියමිතව ඇති බවද විදුහල්පතිවරයා පැවසීය.

# කොරෝනා බවට සැක අයෙක් බදුල්ල මහ රෝහලේ

**ආර්.එම්.විජේරත්න- හාලිඇල සමූහ**

කොවිඩ්-19 ආසාදිත බවට සැක කෙරෙන පුද්ගලයකු ඊයේ (05) දහවල් බදුල්ල පළාත් මහ රෝහලට ඇතුළත් කොට තිබේ. බදුල්ල මහියංගණ පාර ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 29ක් වන පුද්ගලයකු මෙසේ රෝහල්ගත කර ඇත. ඉකුත් අගෝස්තු මාසයේ ඩුබායි රාජ්‍යයේ සිට යළි මෙරටට පැමිණ ඇති ඔහු සෞඛ්‍ය අංශ නිර්දේශ අනුව දින 14ක කාලයක් නිරෝධායනය වූ අයෙකු බවද හුස්ම ගැනීමේ අපහසුතාව සහ උණ රෝගී තත්ත්වය හේතුවෙන් ඊයේ දහවල් බදුල්ල මහ රෝහලේ බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබාගැනීමට පැමිණ ඇතැයිද පැවසේ.

බදුල්ල මහ රෝහලේ කොරෝනා විශේෂ ප්‍රතිකාර ඒකකය භාර වෛද්‍ය පාලිත රාජපක්ෂ මහතාගෙන් මේ පිළිබඳ කළ විමසීමේදී ඒ මහතා සඳහන් කළේ අදාළ රෝගියාට තිබූ රෝග ලක්ෂණ අනුව ඔහු කොවිඩ්-19 ආසාදිතයකු බවට සැකපිට ඒකකයට ඇතුළත් කෙරුණු නමුත් ඒ තත්ත්වය තහවුරු වී නොමැති බවයි. එබැවින් විශේෂිත ආරක්ෂිත තත්ත්වයන් යටතේ අදාළ පරීක්ෂණ සිදු කෙරෙමින් පවතින බවද වෛද්‍යවරයා පැවසීය.

# වෑන් රියක් හා පොල් ලොරියක් ගැටී අඹන්පොළදී අයෙක් මරුට

## සිව්දෙනකුගේ තත්ත්වය බරපතළයි

**අඹන්පොල සමූහ**

වෑන් රථයක් සහ කුඩා ලොරි රථයක් මුහුණට මුහුණ ගැටීමෙන් අනතුරුව ලොරි රථය පිටුපසින් පැමිණි තවත් වෑන් රථයක ද ගැටී අනතුරට පත්ව තිබේ. පෙරේදා (04) පස්වරුවේ පාදෙණිය - අනුරාධපුර මාර්ගයේ අඹන්පොල නගරයේදී මේ අනතුර සිදුව තිබේ. අනතුරින් වෑන් රථයේ රියැදුරු රෝහල් ගතකිරීමෙන් අනතුරුව මියගොස් ඇති අතර, අනතුරට පත් වාහනවල ගමන් ගත් දහතුන්දෙනෙක් රෝහල් ගත කර තිබේ. වයස අවුරුදු එකහමාරක පමණ කුඩා දරුවකුගේ තත්ත්වය බරපතළ බව රෝහල් ආරංචි මාර්ග පවසයි.

පස්යාල සිට නාච්චාදූව දක්වා ගමන් ගත් වෑන් රථයක් තඹුත්තේගම සිට ගම්පොළ දක්වා පොල් පටවාගෙන ගිය ලොරි රථයේ ගැටී ඇත. අනතුරින් වෑන් රථ දෙකේ හා කුඩා ලොරි රථයේ ගමන් ගත් සියලු දෙනාම රෝහල් ගතකර ඇත.

අඹන්පොල පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සේනානායක මහතාගේ උපදෙස් මත රථවාහන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ජයකොඩි මහතා ඇතුළු රථවාහන අංශයේ නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ මෙහෙයවති.

ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත



- ඉස්සරහට දහස් ගණනින් තමයි ගණින්න වෙන්නෙ සර්!
- කොරෝනා හැදිච්ච ගාණද බං!
- නෑ සර්, ඇදිරිනීතිය කඩන ගාණ!

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
NSBM GREEN UNIVERSITY TOWN

# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනය (EOI)

**හෝමාගම, පිටිපන පිහිටි ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනය හෙවත් NSBM හරිත සරසවි නගර ව්‍යාපෘතියේ යෝජිත දෙවන අදියරෙහි සෞඛ්‍ය විද්‍යා පීඨය, සමාජ විද්‍යා පීඨය සහ නීති පීඨය සඳහා පීඨ ගොඩනැගිල්ල හා ආශ්‍රිත යටිතල පහසුකම් ඉදිකිරීම.**

1. ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනයේ උපකුලපති වෙනුවෙන්, කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව විසින්, හෝමාගම, පිටිපන පිහිටි ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනය (NSBM) හෙවත් NSBM හරිත සරසවි නගර ව්‍යාපෘතියේ යෝජිත දෙවන අදියරෙහි, සෞඛ්‍ය විද්‍යා පීඨය, සමාජ විද්‍යා පීඨය සහ නීති පීඨය සඳහා පීඨ ගොඩනැගිල්ල හා ආශ්‍රිත යටිතල පහසුකම් ඉදිකිරීම සඳහා සුදුසුකම්ලත් කොන්ත්‍රාත් කරුවන්ගෙන් අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනය කරනු ලැබේ.
2. මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වනුයේ යෝජිත සෞඛ්‍ය විද්‍යා පීඨය, සමාජ විද්‍යා පීඨය සහ නීති පීඨයන්ගේ සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට අවශ්‍ය යටිතල පහසුකම් සහ අධ්‍යයන පහසුකම් සැපයීම වේ.
3. මහල් දොළහකින් සමන්විත සහ වර්ග මීටර් 20,775ක ඇස්තමේන්තුගත ඉදිකිරීම් බිම් ප්‍රමාණයක් සහිත වන යෝජිත පීඨ ගොඩනැගිල්ල, කාර්ය මණ්ඩල සඳහා පහසුකම් සහිතව පීඨාධිපති කාර්යාල තුනක්, විද්‍යාගාර දහයක්, ආසන 1,600 ක මුළු ධාරිතාවයක් වන පරිදි දේශනශාලා / නිබන්ධන කාමර දොළහක්, පරිගණක විද්‍යාගාර, අභ්‍යාස නඩු විභාග ආකෘති කුටියක්, ආපනශාලා සහ බහුකාර්ය පහසුකම් සහිතව ඉදිවන අතර කොන්ත්‍රාත් කරුවන්ගෙන් වැඩ විෂය පථය සඳහා පයිලින් වැඩ, වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, යාන්ත්‍රික, විදුලි හා ජලනල සේවා, බාහිර ගෘහ අලංකරණ සහ උපයෝගිතා සේවා කටයුතු ඇතුලත් වේ.
4. ලංසු තැබීම, ජාතික තරගකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රියාපටිපාටිය හරහා සිදු කෙරෙන අතර අරමුදල් සම්පාදනය ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනය මඟින් වේ.
5. අනාගත ලංසුකරුවන් තෝරා ගැනීම සහ කෙටි ලැයිස්තුගත කිරීම සඳහා පහත සඳහන් නිර්ණායක සලකා බලනු ලැබේ.
   a) ලංසුකරු අසාදු ලේඛණගත නොකළ පාර්ශවයක් විය යුතුය.
   b) ප්‍රධාන ලංසුකරු සහ හවුල් ව්‍යාපාර පාර්ශවයන් (ඇත්නම්) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දේශීය ලංසුකරුවන් විය යුතු අතර ඔවුන්ගේ ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටා තිබිය යුතුය.
   c) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා CIDA ශ්‍රේණියේ C1 සහ ඊට ඉහළ ශ්‍රේණියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෙකු විසින් ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතුය.
   d) පසුගිය වසර තුන තුළ සිදු කරන ලද ඉදිකිරීම් කටයුතු වල සාමාන්‍ය වාර්ෂික පරිමාව අවම වශයෙන් රු. බිලියන 2.5 ක් විය යුතුය.
   e) ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ පළපුරුද්ද, සමාන ස්වභාවය හා සංකීර්ණත්වය සහිත, වැට් බද්ද රහිතව බිලියන 2 කට නොඅඩු, මහල් දොළහක් හෝ ඊට වැඩි RCC ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක්, පසුගිය වසර පහ තුළ විය යුතු අතර මෙයින් එකක්වත් සම්පූර්ණ කළ ව්‍යාපෘතියක් යුතුය.
   f) අනෙකුත් ගිවිසුම්ගත බැඳීම් සඳහා වෙන් කිරීමෙන් පසු සහ කොන්ත්‍රාත්තුව යටතේ කළ යුතු අත්තිකාරම් ගෙවීම් වලින් බැහැරව අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම් රු. මිලියන 500 ට නොඅඩු විය යුතුය.
6. ඉහත 5 වන අයිතමයේ දක්වා ඇති නිර්ණායකයන්ට අනුකූල වීමට ලංසුකරු අපොහොසත් වුවහොත්, ලංසුකරු ප්‍රතිචාර නොදක්වන ලංසුකරුවෙකු ලෙස සලකනු ලබන අතර එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා වන අයදුම් පත්‍රය ලබාගැනීම, 2020 ඔක්තෝම්බර් 6 සිට කාර්යාල වේලාවන් තුළදී කළමනාකාර - ප්‍රසම්පාදන, ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය, NSBM හරිත සරසවි නගරය, මාහේන්වත්ත, පිටිපන, හෝමාගම දරන ස්ථානයට රු 5,000/- ක මුදල් ගෙවීමක් සහිත ඉල්ලීමක් මඟින් සිදු කල හැකිය. උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට වැඩකරන දිනවල උදේ 9.00 සිට පස්වරු 3.00 දක්වා වැඩිදුර තොරතුරු මෙම ලිපිනයෙන් හෝ 011 544 5036, 071 672 6012 හෝ projects@nsbm.lk මඟින් ලබා ගත හැකිය.
8. මෙම අභිලාෂය ප්‍රකාශය සකස් කිරීම, ඉදිරිපත් කිරීම සහ සහභාගීත්වය සම්බන්ධයෙන් ලංසුකරු විසින් සිදු කළ වියදම් හෝ දරනු ලබන අලාභ සඳහා NSBM වගකිවකියනු නොලැබේ. "සවිස්තරාත්මක යෝජනා සඳහා ඉල්ලීමක්" (RFP) නිකුත් කිරීමට පෙර ඕනෑම අවස්ථාවක, අභිලාෂය ප්‍රකාශ කිරීමක් (EOI) යෝජනාවක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවට අයිතියක් ඇත.
9. ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද අභිලාෂය ප්‍රකාශ කිරීමේ යෝජනා පත් පිටපත් 2 ක් සහිතව **සභාපති, කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය, 354/2, 'නිපුණතා පියස', ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05** යන ලිපිනය වෙත **2020 ඔක්තෝම්බර් 27 වන දින ප.ව. 03.00** ට හෝ ඊට පෙර ඉදිරිපත් කලයුතුය.
10. අභිලාෂය ප්‍රකාශ කිරීමේ යෝජනා විවෘත කිරීම, ඒවා භාර ගැනීම අවසන් වු විගස සිදු කෙරේ. අභිලාෂය ප්‍රකාශ කිරීමේ යෝජනා ඉදිරිපත් කරන්නා හෝ ඔහුගේ නියෝජිතයෙකුට අභිලාෂය ප්‍රකාශ කිරීමේ යෝජනා විවෘත කිරීම සඳහා සහභාගී විය හැකිය.

**සභාපති,**
කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව,
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය,
354/2, 'නිපුණතා පියස', ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

සිළුමිණ වට පිට
පල දරන්න - පළ කරන්න
මංගල යෝජනා
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
SUNDAY OBSERVER
Marriage Proposals
දැන් වචන 15ක් රු. 560ක් පමණයි...
චාමර - 0777 270 067 / අනුෂා - 0777 278 948

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2020 ඔක්තෝබර් 06 අඟහරුවාදා

## මුඛවාඩම් වීසි කිරීම!

ලෝක බලවතා ලෙස ප්‍රකට ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් කොවිඩ් 19 සමච්චලයට ලක් කළ අතර, එය සාමාන්‍ය උණ රෝගයක් ලෙස අර්ථ ගැන්වීය. ඔහු මහජනයා ඉදිරියේ තම මුඛවාඩම ගලවා ඉවතට වීසි කළේ කොවිඩ් වසංගතය ගණන් ගත යුතු දෙයක් නොවන බව හඟවමිනි. එහෙත් ට්‍රම්ප් මහත්තයාට වැරදුණේය. ඔහු මේ වන විට කොවිඩ් ආසාදිතයකු වී හමාරය. ලෝක බලවතාගේ චර්යා රටාවෙන් අපට යමක් උගත හැකිය. එනම්: මේ ලෝක වසංගතය නොසලකා හැරීමට කිසිදු ජගතකු මිහි පිට නැති බවය. බලවත්, ධනවත්, උගත් යන සියල්ල ඇත්තේ වසංගතයට පහළිනි.

ශ්‍රී ලංකාව කොවිඩ් 19 වසංගතය ඉදිරියේ අපරාජිතව නැඟී සිටි බව ප්‍රකට කාරණයකි. වසංගත මර්දනය හා ඊට මුහුණදීම සම්බන්ධයෙන් සාර්ථක ප්‍රතිඵල ගත් ලොව දෙවන රාජ්‍යය හැටියට කීර්ති නාමයක් අපට ලැබී තිබේ. එහි සැබෑ අර්ථය වන්නේ වසංගත තත්ත්වය රටෙන් බැහැර වී ඇති බව නොවේ. අප රෝගය පිළිබඳ අවධානයකින් සිටින බව හා රෝග මර්දනය සඳහා වැඩපිළිවෙළක් ඇති බව ඉන් කියවේ. බුද්ධිමත් රාජ්‍ය නායකයකු අපට සිටින බැවින් ද, ශක්තිමත් ආණ්ඩුවක් අපට ඇති බැවින් ද එම සතුටුදායක තත්ත්වය උදා වී ඇත. එහෙත් නිසි පිළිවෙත් අනුගමනය නොකළ හොත් ඕනෑම මොහොතක කොවිඩ් 19 හිස එසවිය හැකිය.

මේ තත්ත්වය සනාථ කරමින් ගම්පහ දිවුලපිටියෙන් ආසාදිත කාන්තාවක හමු වී ඇත. ඇය මිනුවන්ගොඩ ප්‍රදේශයේ ඇඟලුම් කම්හලක සේවය කරන අතර, උණට ප්‍රතිකාර ගැනීම සඳහා ගම්පහ රෝහලට ගොස් තිබේ. ආසාදිත කාන්තාව සමාජ කණ්ඩායම් කිහිපයක් ඇසුරු කර ඇති බව වාර්තා වෙයි. මේ වන විට තුන්දහසක් දෙනා නිරෝධායනයට ලක් කර සිටිති. රෝගී කාන්තාවගේ දියණියට ද වයිරසය ඇතුළු වී ඇති බව තහවුරු වී ඇත. එම දියණියගේ සම්බන්ධතා ජාලය ද දැන් විමසුමට ලක් වී තිබේ. මිනුවන්ගොඩ, දිවුලපිටිය, වේයන්ගොඩ යන ප්‍රදේශවලට පොලිස් ඇඳිරි නීතිය පනවා ඇත. ගම්පහ දිස්ත්‍රික්කය පුරා යළිත් කොවිඩ් වසංගත භීතිකාව පැතිර යමින් පවතී.

මේ සිද්ධියත් සමඟ මතු වන ප්‍රධාන ගැටලුව වන්නේ ඉහත කාන්තාව ආසාදිතයකු වූයේ කෙසේ ද යන්නය. පොදු සමාජයෙන් කොවිඩ් රෝගියකු හමු වන්නේ සැලකිය යුතු කාලයකට පසුය. එහි අනතුරු හැඟවීමක් ද තිබේ. අපගේ මූලික අවධානය යොමු වී ඇත්තේ විදේශගත වී සිට නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන පුද්ගලයන් ගැනය. එලෙස එන සියලු දෙනා නිරෝධායනයට හා අදාළ පරීක්ෂණවලට යොමු කරන බැවින් ඒ කෙරෙහි සැකයක් ඇති කර ගැනීමට හේතු සාධක නැත. එසේ නම් ඉහත කාන්තාව ආසාදිතයකු බවට පත් වූයේ කෙසේ ද? මෙතෙක් ඊට අදාළ හේතුවක් තහවුරු වී නැත. එහෙත් හඳුනාගත යුත්තේ ද එම හේතු සාධකය බව මතක් කළ යුතුය.

කොවිඩ් වසංගතයෙන් බරපතළ පීඩා විඳින රාජ්‍යය අමෙරිකා එක්සත් ජනපදයයි. දෙවනුවට පීඩා විඳින රාජ්‍යය ඉන්දියාවයි. එම රටවලින් වාර්තා වන කොවිඩ් මරණ සංඛ්‍යාව, ආසාදිතයන්ගේ ගණන, රෝග ව්‍යාප්තියේ ශීඝ්‍රතාව හා ආර්ථිකයට සිදු වන බරපතළ හානියත් සැලැකිල්ලට ගන්නා විට භයානක චිත්‍රයක් අප ඉදිරියෙහි මැවෙයි. අමෙරිකාව පුරා රෝගය ව්‍යාප්ත වූයේ නොසැලකිල්ල නිසාය. රාජ්‍ය පාලකයාගේ සිට සාමාන්‍ය පුරවැසියා දක්වා සියල්ලෝම වසංගතය හැල්ලුවට ගත්හ. අද පවා එහි වෙනසක් දකින්නට නැත. ඉන්දියාව මේ තත්ත්වයට මුහුණ දෙන්නේ ජනතාවගේ ඇති නොහික්මුණු භාවය නිසා යැයි කියන්නට හේතු සාධක තිබේ. ඉන්දීය ජාතිකයෝ පොලීසිය පහර දුන්න ද සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කිරීම ප්‍රතික්ෂේප කරති.

ඉහත රාජ්‍ය දෙකම අපට වඩා ඉදිරියෙන් සිටින බලවත් රටවල් වුව අප ඔවුන් අනුගමනය කළ යුතු නැත. ශ්‍රී ලංකාව කොවිඩ් වසංගතය මර්දනය සම්බන්ධයෙන් කීර්ති නාමයක් හිමි කර ගෙන ඇත්තේ අපේම ක්‍රමවේදයකට හා අපේම වැඩසටහනකට අනුව ඊට මුහුණ දෙන නිසා බව කිව හැකිය. ලෝකයේ බලවත් රටවලට ද ප්‍රථම වසංගත මර්දනය සඳහා ආරක්ෂක අංශ යොදා ගත්තේ ශ්‍රී ලංකාවය.

පසුව බලවත් රටවල් අපේ ක්‍රමය ආදර්ශයට ගත්තේය. නිවැරැදි තීන්දු තීරණ ගන්නා නායකයන්, සේම වැඩසටහන් කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නංවන නිලධාරීන් සිටිත් නම්, කිසිදු රටක් මේ වසංගතයෙන් බරපතළ පීඩාවට පත් වන්නේ නැත. ඒ සමඟම සිහිපත් කළ යුත්තේ ජනතාවගේ පැත්තෙන් ද ඉටු විය යුතු වැඩ කොටසක් ඇති බවය.

ආපසු හැරී බලන විට අපේ ජනතාවගේ වැඩ කොටස පිළිබඳ ගැටලු ගණනාවක් මතු වී ඇත. කොවිඩ් 19 පිළිබඳ අවදානමක් ශ්‍රී ලංකාව තුළ නැතැ'යි යන හැඟීමෙන් බොහෝ දෙනෙක් ක්‍රියා කරති. ඇතැම් ආයතන හා නිලධාරීන් ද මන්දගාමී වී ඇති බවක් ද පෙනෙන්න තිබේ. ප්‍රසිද්ධ ස්ථානවල ද මුඛවාඩම නැතිව හැසිරෙන අය බහුලය. පොලීසිය ඔවුන් දෙස හැරී බලන්නේ ද නැත. මීටරයේ දුරස්ථභාවය වෙළෙඳ දැන්වීම්වලට පමණක් සීමා වී ඇත. සෞඛ්‍ය පිළිවෙත් හා උපදේශන එකින් එක සමාජය වෙතින් ගිලිහී යන්න පටන්ගෙන තිබේ. අමෙරිකාව ප්‍රමුඛ බටහිර රටවල් අනුකරණය කරන්න ගිය හොත් අප විශාල අනතුරක වැටෙනු ඒකාන්තය. දිවුලපිටියේ සිද්ධිය සනාථ කරන්නේ ද එම වැදගත් සාධකය බව සිහි තබා ගත යුතුය.

කොවිඩ් මර්දනය සාමූහික වගකීමක් බව ජනාධිපතිවරයා කියා ඇත. එය තේමා පාඨයක් ලෙස පවත්වාගෙන යා හැකි නම්, අපට මේ සටන ජය ගත හැකිය.




මතු වූ කොරෝනා අවදානම අස්සේ
අතහැරි සුව පුරුදු සිහි වෙයි හැම තිස්සේ
ජීවත් වුණොත් ඒවා නොතකා රිස්සේ
තැවි තැවි ඉන්න සිදු වෙනවාමයි පස්සේ



# රටින් එන අපේ ශ්‍රමිකයන්ගෙන් ආර්ථිකයට ගැම්මක්

### කොවිඩ් -19 හමුවේ රට රැකියා අහිමි වීමේ ගැටලුවට විසඳුම



**මහාචාර්ය සුරංග සිල්වා**
**ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය**
**කොළඹ විශ්වවිද්‍යාලය**

මේ වන විට ශ්‍රී ලංකාවේ විදෙස් විනිමය උපයන ප්‍රධානතම මාර්ගය බවට පත් ව ඇත්තේ මැදපෙරදිග සහ අනෙකුත් රටවල සේවය කරන අපේ ශ්‍රමිකයන් මාර්ගයෙන් රටට ලැබෙන මුදල් ප්‍රමාණයයි. එය සංඛ්‍යාත්මකව සලකන කළ ඇමරිකානු ඩොලර් බිලයන 7කට සමාන වන අතර මෙරට විදෙස් විනිමය ඉපැයීම්වලින් අතිවිශාල ප්‍රමාණයකි. කෙසේ වෙතත් කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වයත් සමඟ රැකියා අහිමි වීම, එම රටවල පවතින අනාරක්ෂිතභාවය වැනි හේතු සාධක මත විදෙස්ගත ලාංකික ශ්‍රමිකයන් නැවත ගෙන්වා ගැනීමත් සමඟ රටට ලැබීමට නියමිත විදෙස් විනිමය ප්‍රමාණය පහත වැටෙමින් පවතී. ඇතැම් පිරිස් තවමත් එම රටවල ම නැවතී සිටිය ද ඔවුන්ට රැකියා අහිමි වී ආදායම් මාර්ග නොමැති තත්ත්වයක් ද උදා වී තිබෙනු දැකිය හැකි ය. මේ පිළිබඳව සැලකිලිමත් වීම අවශ්‍ය වන අතර ම නැවත ලංකාවට පැමිණෙන පිරිස රටට බරක් නොවන අන්දමින් රටේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක කරගන්නේ කෙසේද යන කාරණය පිළිබඳ අපට මුල සිටම තිබිය යුත්තේ පැහැදිලි සැලැස්මකි.

මෙහි දී බහුතරයක් ශ්‍රමිකයන් ලංකාවට පැමිණෙන්නේ ඉතිරි කරගත් යම්කිසි මුදල් ප්‍රමාණයක් ද රැගෙන ය. මේ මුදල රටේ නිෂ්පාදන නඟා සිටුවීම වෙනුවෙන් ආයෝජනයට සම්බන්ධ කරගත හැකි නම් එම ආයෝජන සමඟ නිෂ්පාදනය වැඩි කරමින් සේවා නියුක්තිය ද වැඩි කරගත හැකි නම් එය දැකිය හැක්කේ මේ අවස්ථාවේ රටට වන පාඩුව අවම කරගැනීම සඳහා යෙදිය හැකි හොඳ ම උපක්‍රමය ලෙසිනි. ඇතැම් විට ලාභය උපරිම කරගැනීම වෙනුවට පාඩුව අවම කරගැනීමට සිදු වන අවස්ථා අප විසින් පසු කරන අතර මෙය ද සැලකිය යුත්තේ එවන් අවස්ථාවක් ලෙස ය. එබැවින් විදේශීය විනිමය උපයන අපේ ශ්‍රී ලාංකිකයන් නැවත පැමිණීම තුළ අපට වන පාඩුව හැකිතාක් අවම කරගැනීමට යොදාගත හැකි එක් උපක්‍රමයක් ලෙස පැමිණෙන ලාංකිකයන් රැගෙන එන මුදල් ප්‍රමාණය විශ්වාසයෙන් ආයෝජනය කළ හැකි පසුබිම සැකසීම වඩා වැදගත් වේ. ඒ සඳහා බැංකු පද්ධතිය සූදානම් විය යුතු සේ ම ආයෝජකයින් අවශ්‍ය පරිදි දිරිමත් කිරීම රජය මගින් සිදු වීම අත්‍යවශ්‍ය කාරණයකි.

## ඉල්ලුම හා සැපයුම

එක් අතෙකින් ශ්‍රී ලාංකික පුරවැසියන් මැදපෙරදිග දුෂ්කර රැකියාවල නිරත වීම අපේ ආර්ථිකයේ උපක්‍රමයක් ලෙස සැලකීම ඇත්තෙන් ම අසාධාරණ ය. රටක් ලෙස සංවර්ධනය කරා යන ගමනේ දී එය එතරම් ගැළපෙන තත්ත්වයක් ද නොවේ. රට සංවර්ධනය කිරීමේ දී නුපුහුණු ශ්‍රමිකයින් අඩු වැටුපුවලට දුෂ්කර රැකියාවලට යවනු වෙනුවට පුහුණු සහ දක්ෂ ශ්‍රමිකයන් එතෙර යැවිය හැකි නම් ශ්‍රමිකයන් මාර්ගයෙන් මේ වන විට රටට ලැබෙන විදෙස් විනිමය මෙන් සිය ගුණයක විදෙස් විනිමයක් ඉපයීම අරුමයක් නොවේ. පිටරටවලින් ඉල්ලුම් කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් අප තවමත් සපයමින් සිටිනුයේ 48%ක පමණ ප්‍රමාණයකි. එනම් 50% ඉක්මවූ ප්‍රතිශතයක් අපට සැපයීමේ හැකියාවක් නැත. ඊට හේතුව අපට බොහෝ දුරට සැපයිය හැක්කේ ගෘහ සේවිකාවන් වැනි, විශේෂ හැකියාවන්, අධ්‍යාපන සුදුසුකම් සහ දැනුමෙන් දුගී ශ්‍රමිකයන් වුවත් ලෝකය අපෙන් ඉල්ලන්නේ සැලකිය යුතු මට්ටමේ අධ්‍යාපන සුදුසුකම්, පරිගණක දැනුම, ඉංග්‍රීසි භාෂා දැනුම, ප්‍රායෝගික කුසලතා ඇති දක්ෂ, පුහුණු ශ්‍රමිකයන් ය.

ඉන්දියාව වැනි රටවල් තමන්ගේ ශ්‍රමිකයන් බල ගන්වා විදෙස් රැකියාවලට යොමු කිරීමෙන් අතිවිශාල ආදායමක් ලබයි. ඒ ලැබෙන ආදායම රටේ දුගී බව නැති කරගැනීමට, ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට, ලෝකයේ ඇති අලුත් දැනුම ලබාගැනීමට මෙන් ම නව සබඳතා ඇති කරගැනීමට ද හේතු වනු ඇති. අප ද එයාකාරයෙන් වැඩි දියුණු කළ මානව සම්පත ලෝකයේ රට රටවලට යැවිය හැකි මට්ටමකට පැමිණිය යුතු ය. ඒ අනුව මේ අවස්ථාවේ ශ්‍රී ලංකාවට පැමිණෙන පිරිස ක්‍රම දෙකක් ඔස්සේ බලගැන්විය හැකි ය. පළමු වැන්න ඔවුන්ගේ මුදල් අපතේ නොයන අන්දමින් ආයෝජනය කළ හැකි පසුබිමක් සැකසීම යි. දෙවැන්න නැවත කොවිඩ් -19 අවදානමෙන් පසු මෙරටින් පිට වන විට ඒ ඒ රටවල උසස් රැකියා ලබාගැනීම වෙනුවෙන් අවශ්‍ය පුහුණුව ලබා දී යැවීම යි.

නුපුහුණු ශ්‍රමිකයන් මැද පෙරදිග යැවීමෙන් රටේ ගෞරවයත් එම ශ්‍රමිකයන්ගේ ජීවිතත් හානිකරන පරිසරයක් ඇති කරනු වෙනුවට ඔවුන් ව දියුණු මානව සම්පතක් ලෙස ගොඩනගමින් ලෝකයේ ඕනෑම රටක් පිළිගන්නා ශ්‍රමිකයන් ලෙස එතෙර යැවීමේ නව වැඩපිළිවෙළට ක්‍රමයෙන් අඩිතාලම දමාගැනීමට මේ කොවිඩ් වසංගත සමය යොදාගත හැකි ය. එසේ ම ඔවුන් රටට ගෙන එන ආදායම හැකිතාක් දුරට ඵලදායි අංශවලට යොමු කරමින් රටේ නිෂ්පාදනය වැඩි කරගත යුතු ය. ඔවුන්ගේ දැනුම, හැකියාව යොදාගෙන මේ වකවානුව තුළ නව කර්මාන්ත ආරම්භ කිරීමේ දී වැඩි වශයෙන් අවධානය යොමු කළ යුත්තේ සාම්ප්‍රදායික නොවන අංශ දිරිගැන්වීමට ය. උදාහරණයක් ලෙස ගත්කළ ඇමරිකානුවන් නින්දේ පසුවන විට ඇමරිකාවේ විදුලිබිල් සකස් කරන්නේ ඉන්දියාවෙන් ය. එවැනි කොන්ත්‍රාත් ශ්‍රී ලංකාවට ලැබෙන්නේ බොහෝ විට ඉන්දියාවෙන් ලබාගන්නා උප කොන්ත්‍රාත් වශයෙනි. ඉන්දියාව ඇමරිකාව ඇතුළු රටවලින් ලබාගන්නා එම කොන්ත්‍රාත්වලින් අවසන් කරගත නොහැකි කොටසක් අපට ද ලබාදේ. එවැනි කොන්ත්‍රාත් ලබාගැනීම ඇතින් දියුණු විය හැකි නම් එය ද මේ රටේ මානව සම්පත වර්ධනය කරමින් විදෙස් විනිමය උපයීමට අවශ්‍ය නව උපාය මාර්ගයක් සකස් කරගැනීම සඳහා තුඩු දෙනු ඇත.

අප මේ වන විටත් බොහෝ රටවලට වඩුකාර්මිකයින්, කාර්මික ශිල්පීන්, ජලනල කාර්මිකයින් වැනි පුහුණු ශ්‍රමිකයන් යැවීම යහපත් ප්‍රවණතාවකි. මෙහි දී තවදුරටත් වත්මන් ගෝලීය වාතාවරණය තුළ අපේ මානව සම්පත් එතෙර යවන විට වඩාත් ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රයන් පිළිබඳව යම් අධ්‍යයනයක් සිදු කළ යුතු ය. බංග්ලාදේශයේ ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත ව සිටින කළමනාකරුවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ශ්‍රී ලාංකිකයන් වීම, සිංගප්පූරුවේ බොහෝ හෝටල්වල ප්‍රධාන අරක්කැමියා (Chef) ශ්‍රී ලාංකික වීම, ඕස්ට්‍රේලියාවේ වෛද්‍ය, මහාචාර්ය වැනි ඉහළ වෘත්තීන් හොබවමින් ශ්‍රී ලාංකිකයින් සැලකිය යුතු ප්‍රමාණයක් සිටීම මෙන් ම ජපානයේ තේ අලෙවිකරුවන් සහ වෙනත් විශේෂිත

> **මේ අවස්ථාවේ ශ්‍රී ලංකාවට පැමිණෙන පිරිස ක්‍රම දෙකක් ඔස්සේ බලගැන්විය හැකි ය. පළමු වැන්න ඔවුන්ගේ මුදල් අපතේ නොයන අන්දමින් ආයෝජනය කළ හැකි පසුබිමක් සැකසීම යි. දෙවැන්න කොවිඩ්-19 අවදානමෙන් පසු නැවත මෙරටින් පිට වන විට ඒ ඒ රටවල උසස් රැකියා ලබාගැනීම වෙනුවෙන් අවශ්‍ය පුහුණුව දී යැවීම යි.**

ව්‍යාපාරිකයන් අතර ද ශ්‍රී ලාංකිකයන් සිටීම රටට ආඩම්බරයකි. මෙවැනි තත්ත්වයක් යටතේ අප විශේෂ අධ්‍යයනයක් ඔස්සේ තීරණය කළ යුත්තේ ඇත්තෙන් ම අප ආදායම් ඉපයීමට එතෙර යැවිය යුත්තේ කවුරුන් ද? සහ කෙසේද? යන කාරණාව යි.

## ශ්‍රමිකයන්ට ගෞරවයක්

මේ තීරණය නිවැරදි ව ගනිමින් අලුතින් උත්පාදනය වන යුරෝපීය රැකියාවලට යැවීම වෙනුවෙන් මේ කාලය තුළ ලාංකිකයන් පුහුණු කළ හැකි නම් එය ගෞරවාන්විත ව විදෙස් විනිමය උපයා ගැනීමෙහිලා නව හැරවුම් ලක්ෂ්‍යයක් ද වනු ඇත. එසේ ම එය මෙරට පවතින සේවා වියුක්තියට ද සැලකිය යුතු මට්ටමේ විසඳුමක් සපයාලිය හැකි උපායක් ද වනු ඇත.

පසුගිය දිනවල බඳවාගත් උපාධිධාරීන් පවා නිසි පුහුණුවක් දී ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රයන්වල රට රැකියා සඳහා පුහුණු කොට යැවිය හැකි මාර්ගයක් සොයා ගත්තේ නම් එය ද රටට බරක් නොවී උපාධිධාරීන් රැකියාගත කිරීමේ ප්‍රශස්ත උපායක් වන්නට ඉඩ තිබිණි. දියුණු කළ මානව සම්පත යොමු කළ හැකි ක්ෂේත්‍ර පිළිබඳ සැලකිලිමත් වීමේ දී අපට චීනයට, මැද පෙරදිගට ඉංග්‍රීසි ගුරුවරුන් යැවිය හැකි ය. ඒ රටවල ඉංග්‍රීසි ගුරුවරුන් වෙනුවෙන් විශාල ඉල්ලුමක් ඇති අතර මේ වන විට ඒ සඳහා වැඩිපුර මානව සම්පත යොමු කෙරෙන්නේ ඉන්දියාව, බංග්ලාදේශය වැනි රටවලිනි. අපට එවැනි අවස්ථාවන් හඹා යා නොහැක්කේ මන්ද? එය මැදපෙරදිගට ගෘහ සේවිකාවන් යැවීමට වඩා හැම අතින් ම යහපත් සහ ගෞරවාන්විත නොවන්නේ ද? මැදපෙරදිග ගෘහ සේවයට ගොස් අපා දුක් විඳි කාන්තාවන්ගේ කඳුළු කතා ඇසීම කොතැනින් හෝ නතර විය යුතු ය. රටක් ලෙස අප අපේ ශ්‍රමිකයන්ට ලබාදිය යුත්තේ ඊට වැඩි ගෞරවයකි. ආරක්ෂාවකි. මෙරට හෝටල් පාසල් සියල්ල එක්කොට හෝටල් ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයන් විදෙස් රටවලට ලබාදීමේ විශේෂ වැඩසටහන් සකස් කිරීම ද අවධානය යොමු විය යුතු අංශයකි.


## ලාංකිකයන්ට ඇති තැන

අප විසින් පුහුණුවක් ලබා දී ශ්‍රමිකයන් කොරියාවට යැවීම වෙනුවට මේ වන විට කොරියාවෙන් පැමිණි, අපේ ශ්‍රමිකයන් පුහුණුකොට කොරියාවේ රැකියා සඳහා ගෙන යෑමේ ප්‍රවණතාවක් ද ඇත. එම ක්‍රමය ම අපට සෙසු රටවල් වෙනුවෙන් ද අනුගමනය කරමින් ඒ ඒ රටවල් හා සම්බන්ධ වෙමින් ඔවුන්ට අවශ්‍ය මානව සම්පත ඔවුන් හා සහයෝගයෙන් ගොඩනගා එතෙර යැවිය හැකි නම් රටක් ලෙස අපට තව දුර යා හැකි බව පැහැදිලිව පෙනෙන්නට තිබේ. උදාහරණයක් ලෙස සිංගප්පූරුව වැනි රටවලින් සෙසු රටවල ශ්‍රමිකයන්ට සාපේක්ෂව ලාංකික ශ්‍රමිකයන් බඳවා ගැනීමට දක්වන්නේ විශේෂ කැමැත්තකි. එයට හේතුව ලාංකිකයන් තුළ ඇති දරාගැනීමේ ශක්තිය සහ විනය යි. එවැනි විභවතාවන් භාවිත කරමින්, මේ දිනවල ශ්‍රී ලංකාවට පැමිණෙන ශ්‍රමිකයන් නිරෝධායනයකොට, මනා පුහුණුවකින්, විනයකින්, භාෂා දැනුමකින් සන්නද්ධකොට කොවිඩ් -19 අවදානමෙන් පසු නැවත විදෙස් රැකියාවලට යැවීමට අවශ්‍ය වැඩපිළිවෙළ සකස් කළ යුතු ය.

තව දුරටත් වැඩ කළ හැකි මට්ටමේ සිටින විශ්‍රාමිකයන් ද පුහුණුවක් දී රට රැකියාවලට යැවිය හැකි ය. ශ්‍රී ලංකාවේ පරිපාලන ක්ෂේත්‍රයේ බහුල අත්දැකීම් ඇති පරිණත පුද්ගලයන් උපදේශකයින් ලෙස බඳවා ගැනීමට ඇතැම් රටවලින් දක්වන්නේ විශේෂ කැමැත්තකි.

මැදපෙරදිග සහ වෙනත් රටවල සිට මෙරටට විදෙස් විනිමය එවූ ශ්‍රමිකයන් කොවිඩ් -19 ගෝලීය වසංගතයේ අතුරු ප්‍රතිඵලයක් ලෙස නැවත මව්බිමට පැමිණීම වැළැක්විය නොහැකි තත්ත්වයකි. එසේ වුවත් ඔවුන්ගේ ආගමනය හේතුවෙන් අපට අහිමි ව යන විදෙස් විනිමයේ පාඩුව පියවා ගැනීමට රටක් වශයෙන් ගත යුතු තීරණ පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. එහි දී ඔවුන් රැගෙන එන මුදල් ආයෝජනය කරමින් දේශීය නිෂ්පාදන වැඩි වැඩියෙන් අපනයනය කිරීමට අවශ්‍ය පසුබිමක් සකස් කරගත හැකි නම් රටට අහිමි වන විදෙස් විනිමය ප්‍රමාණය නැවත උපයාගත හැකි වනු ඇත. මෙහි දී තේ, පොල්, රබර් අපනයනය සහ සංචාරක කර්මාන්තය වැනි විදෙස් විනිමය උපයන සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ගෙන් ඔබ්බට යමින් නව අංශ වෙත යොමු වීමේ අවශ්‍යතාව මැනවින් හඳුනාගත යුතු ය. උදාහරණයක් ලෙස ගංජා හේන්වලට ගිනි තබනු වෙනුවට ඖෂධයක් ලෙස ද රට රටවල භාවිත කරන ගංජා නීත්‍යනුකූල ව විදෙස් රටවලට අපනයනය කළ හැකි ය. ජපන් ජනතාවගේ ප්‍රියතම ලුණු ලෙස ලංකාවේ නිෂ්පාදනය කරන ලුණු හඳුනාගත හැක. එවැනි නිෂ්පාදන අපනයනයට ද වැඩි අවධානයක් දිය යුතු ය. විශේෂයෙන් ම අපනයනයේ දී නව අංශ වෙත ප්‍රවිෂ්ට වීමේ දී අවශ්‍ය වන ප්‍රාග්ධනයේ මූලයක් ලෙස විදෙස්ගත ව සිට පැමිණෙන ශ්‍රමිකයන් මෙරටට රැගෙන එන මුදල් භාවිත කළ හැකි සේ ම එම ශ්‍රමිකයන්ට නිසි පුහුණුවක් ද ලබා දී එම ක්ෂේත්‍රයන්වලට ම යොදාගැනීම වටී. විදෙස් විනිමය ඉපයීමෙහිලා හැල්මේ දුවනු වෙනුවට නැවතී සිතන්නට කාලය ලැබී ඇත. ඒ ලැබී ඇති කාලයෙන් උපරිම ඵල නෙළීම බලධාරීන්ට භාර වී ඇත.

**කාංචනා සිරිවර්ධන**



# අන්තර්ජාල හොරුන්ගෙන් ගැලැවෙන පොට



අන්තර්ජාලය හරහා සිදුකරන කප්පම් ගැනීම, මූල්‍ය වංචා ඇතුළු අපරාධ ප්‍රමාණය දිනෙන් දිනම ඉහළ යමින් තිබෙන බව අපරාධ අංශය භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත ජයකොඩි මහතා පසුගිය ඉරිදා පුවත්පතකට ප්‍රකාශ කර තිබිණි.

අන්තර්ජාලය උපයෝගී කරගනිමින් සිදුකළ මූල්‍ය වංචාවක් පිළිබඳ ආසන්නතම පුවතක් වාර්තා වූයේ කුරුණෑගලිනි.

ලෝක ප්‍රසිද්ධ මෝටර් රථ නිෂ්පාදන සමාගමක සැමරුම් සඳහා ලොතරැයි ඇදීමෙන් ත්‍යාග ලෙස නවීන ඉතා වටිනා මෝටර් රථයක් ලබා දෙන බවට අන්තර්ජාලයේ ව්‍යාජ දැන්වීම් පළ කරවා ඒවා උපයෝගී කරගෙන ජනතාව රවටා කෝටි ගණනක මූල්‍ය වංචාවක තොරතුරු හෙළිකර ගැනීමට කුරුණෑගල කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් සමත් වූයේ පසුගිය ජූලි මාසයේ දීය. සුප්‍රසිද්ධ මෝටර් රථ සමාගමක 2020 වසරේ නිෂ්පාදිත රුපියල් දෙකෝටියකට වඩා වටිනා සුපිරි මෝටර් රථයක් අහඹු ලෙස කරන දිනුම් ඇදීමකින් ශ්‍රී ලාංකිකයකුට ලබා දෙන බවට පවසමින් මුහුණු පොතේ පළ වූ දැන්වීමකට ප්‍රතිචාර දක්වමින් ඉහත වංචාකරුවන්ට අදාළ මෝටර් රථය මෙරට ගෙන්වා ගැනීමට මුදල් ලබා දී එම වංචාකරුවන්ට ගොදුරු වූ කාන්තාවක විසින් කරන ලද පැමිණිල්ලකට අනුව ඉහත අන්තර්ජාලය හරහා සිදුකරන ලද මූල්‍ය වංචාව සොයා ගැනීමට කුරුණෑගල කොට්ඨාශ අපරාද විමර්ශන ඒකකය සමත්ව තිබිණි.

ශ්‍රී ලංකාවේ ද රජයේ ආයතන කිහිපයකම නිල වෙබ් අඩවිවලට අනවසරයෙන් ඇතුළ් වී ඒවායේ ඇති දත්ත විනාශ කර මහත් කලබගෑනියක් කළ අවස්ථා පසුගිය කාලයේ අසන්නට ලැබිණි. එසේම ඉතාම මෑතක දී වාර්තා වුණු ආසන්නතම සිද්ධිය වන්නේ දළදා මාලිගාවේ නිල වෙබ් අඩවියට අගෝස්තු 31 වන දා පෙරවරුවේ සහ පස්වරුවේ දී එල්ල වූ හැකර් ප්‍රහාරයන්ය.

එසේම සමාජ ජාලා ගිණුම් වෙත කඩා වැදී තොරතුරු සහ ඡායාරූප සොරාගෙන ඒවා අන්තර්ජාලයේ පළ කරන බවට පවසමින් කප්පම් ඉල්ලා හසුවන්නන් පිළිබඳ පුවත් ඕනෑතරම් එදිනෙදා පුවත්පත්වලින් හෙළි වෙමින් තිබේ.

එපමණක් නොව වර්තමානයේ ජංගම දුරකථනවල පිහිටුවා ඇති වට්ස්ඇප්, වීචැට්, වයිබර් වැනි සංවාද මෘදුකාංග හරහා හුවමාරු වන අතිශය පෞද්ගලික ඡායාරූප බාහිර පුද්ගලයන් අතට පත්වීම නිසා අපහසුතාවට, අතවරවලට, මෙන්ම කප්පම් ගෙවීමට සිදු වූ අවස්ථා බොහොමයක් පුවත්පත්වලින් මෙන්ම පෞද්ගලිකවද අනාවරණය වූ අවස්ථා එමටය.

පරිගණකය හරහා වෙනත් පුද්ගලයකුට සිදුවන හානියක් හෝ අවැඩක් නිර්වචනය කරන්නේ පරිගණක අපරාධයක් ලෙසය. මෙය තනි වචනයක් ලෙස අප පොදුවේ භාවිත කළත් අභ්‍යන්තරයෙන් ඇත්තේ ඊට වඩා පුළුල් අර්ථයකි.

අන්තර්ජාලය හරහා සිදුවන සෑම අනර්ථකාරී ක්‍රියාවක්ම නැතිනම් අනවසරයෙන් කඩා වැදී දත්ත සොරාගැනීම්, තර්ජන ගර්ජන, තොරතුරු විනාශ කිරීම්, යන ක්‍රියාකාරකම් සියල්ල පරිගණක අපරාධයක් ද යන්න තීරණය වන්නේ ඊට මුහුණදුන් පුද්ගලයා හෝ ආයතනය ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග අනුවය. කිසියම් පුද්ගලයකු හෝ ආයතනයක් තමන්ට සිදු වූ සිදුවීම පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කොට ඊට වගකිව යුත්තන් නීතිය හමුවට පැමිණ වීමට කටයුතු කරන්නේ නම් එය "පරිගණක අපරාධයකි" (Crime). එසේ නොමැතිව තමන්ට එල්ල වූ ප්‍රහාරයෙන් වූ හානිය විඳ දරා ගනිමින් මින් ඉදිරියට එවැනි සිදුවීමක් සිදුනොවීමට හැකි වන අයුරින් තම පරිගණකය හෝ පද්ධතිය ආරක්ෂා කර ගැනීම "සිදුවීමක්" (Incident) ලෙස ගැනේ. කෙසේ වෙතත් සරල ලෙස මෙය විග්‍රහ කළහොත් මෙරට තිබෙන නීතිය අනුව පරිගණකයට අනවසරයෙන් ඇතුළුවීම ම වරදකි. එහෙත් එය අපරාධයක් ද සිදුවීමක් ද යන්න තීරණය වන්නේ ඊට මුහුණදුන් පුද්ගලයා ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග අනුවය.

පුද්ගලයකු හෝ කණ්ඩායමක් වෙනත් පරිගණකයකට අනවසරයෙන් ඇතුළුවීමට ඇති හේතු රාශියකි. වෙබ් අඩවියකට ඇතුළු වී එහි තොරතුරු අවුල් කිරීම හෝ වෙනස් කිරීම මගින් එම ආයතනයට හෝ පුද්ගලයා අපහසුතාවයට පත් කිරීම. වෙබ් අඩවි හරහා මහජන සේවා ලබාදෙන රජයේ හෝ පුද්ගලික ආයතනවල කටයුතු අඩාල කිරීම හෝ සේවා බිඳ වැට්වීම් (Denial of Service Attack). පෞද්ගලික හෝ ආයතනවල පරිගණකවලට ඇතුළු වී වටිනා පෞද්ගලික හෝ ව්‍යාපාරික තොරතුරු, ගබඩා කර ඇති පෞද්ගලික ඊමේල් ලිපින සහ ගබඩා කර ඇති මුර පද සොරාගෙන වෙනත් අනර්ථකාරී ක්‍රියාවන්ට යොදා ගැනීම මෙන්ම විශාල මහජන සේවාවන් සපයන ආයතනවල වෙබ් අඩවිවලට හෝ පරිගණකවලට ඇතුළු වී එහි තොරතුරු විනාශ කිරීම හෝ අවුල් කිරීම හෝ වෙනස් කිරීම මගින් එම ආයතනය මෙන්ම රජය ද අපහසුතාවට පත් කිරීම සිදුවිය හැකිය. එසේම ෆේස්බුක් වැනි සමාජ ජාලාවලට ඇතුළු වී ඒවායේ ඇති තොරතුරු, ඡායාරූප ලබාගෙන ඒවා විකෘති කර අන්තර්ජාලයට මුදාහැරීම මෙන්ම තර්ජනය කර මුදල් ලබා ගැනීම ද සිදුවිය හැකිය. ඊට අමතරව දත්ත සොරා ගෙන වෙනත් තරගකාරී ආයතනවලට ලබා දී මුදල් ලබා ගැනීම මෙන්ම නිකරුණේ විනෝදයට ද වෙනත් පරිගණකවල වෙත කඩා වැදී තොරතුරු අවුල් කිරීම සිදු කළ හැකිය. පරිගණකය හරහා කිසියම් අනර්ථකාරී ක්‍රියාවක් හෝ අපරාධයක් කිරීමට අවශ්‍ය පුද්ගලයකු අප පරිගණකයට කඩා වැදී එය තමන්ට අවශ්‍ය අයුරින් හසුරවමින් අප පරිගණකය හරහා වෙනත් පරිගණකයට ඇතුළු වී සිය අවශ්‍යතා ඉටු කර ගන්නා අවස්ථාද තිබේ. එවිට අදාළ සිදුවීම සිදුවූ පුද්ගලයා හෝ ආයතනය මේ පිළිබඳ නීතිමය කටයුතු කරගෙන යාමේ දී ඔහුගේ පරිගණකයට කඩා වැදී ඇති පුද්ගලයා ලෙස හඳුනා ගන්නේ අප පරිගණකයයි. ඒ ඔහුගේ පරිගණකයට ඇතුළු වී ඇත්තේ අප පරිගණකයෙන් නිසා ය. අප නොදැනුවත්මවම සිදුවුවත් නීතිය ඉදිරියට යාමට සිදුවන්නේ අපටය.

අනවසරයෙන් පරිගණකයට ඇතුළු විය හැකි ක්‍රම ද රාශියකි. විශේෂයෙන්ම අනවසරයෙන් පරිගණකයකට ඇතුළුවීමේ ඉඩ ප්‍රස්ථාව ඇත්තේ අන්තර්ජාලය හරහා ය. එසේම මිතුරු වෙසින් පැමිණෙන වෛරස් ගොනු සහිත ඊමේල් ද අප ග්‍රහණය කර ගැනීමට සමත් ය.

පරිගණකයට අනවසර මෘදුකාංග ඇතුළුවීමේ තවත් මාර්ගයකි අන්තර්ජාල ක්‍රීඩාවල යෙදීම. විශේෂයෙන්ම ෆේස්බුක් වැනි සමාජ ජාලවල ඇති ක්‍රීඩා අතරතුර වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට හැකි යැයි පවසමින් පැමිණෙන විවිධාකාරයේ ලින්ක් හරහා ද අනවශ්‍ය කරදරවලට මුහුණදීමට සිදුවන මෘදුකාංග පරිගණයේ තැන්පත් වීමේ හැකියාව ඇත.

වෙනත් පරිගණකයකින් ගොනු පිටපත් කරගෙන පැමිණීමේදී ද (file copying through USB drives) දත්ත සොරා ගැනීමේ මෘදුකාංග, පරිගණක වෛරස ආදිය අපට නොදැනුවත්වම පැමිණිය හැකි තවත් මාර්ගයකි. එසේම අවිශ්වාසවන්ත වෙබ් අඩවිවල සැරිසැරීම මගින් ද මෙවැනි ආකාරයේ මෘදුකාංග අප නොදැනුවත්වම පරිගණකයට ඇතුළු විය හැකිය.

අප පරිගණකයෙන් ණය පත් නැතිනම් ක්‍රෙඩිට් කාඩ් (Credit Card) හරහා මුදල් ගණුදෙනු කරන්නේ නම් කිසිවිටකත් ක්‍රෙඩිට්කාඩ්පතට අදාළ මුරපද හෝ නාම වෙබ් අඩවියේ තැන්පත් වීමට (Save/Store) ඉඩ ලබා නොදිය යුතුය. එසේම අප භාවිතා කරන ඊමේල් ලිපින හෝ ගණුදෙනු පත්වල මුරපද ඊමේල් ලිපිවල ලියා නොතැබීමට වගබලා ගත යුතුවා සේම භාවිත කරන සෑම ඊමේල් ලිපිනයකම මුරපද එකිනෙකට වෙනස් ඒවා භාවිත කිරීමට ද වගබලා ගත යුතු වේ. විශේෂයෙන්ම ඊමේල් ලිපිනයකට මුරපද ලබාදීමේදී අකුරු, ඉලක්කම් සහ සලකුණු ඇතුළු කර කිසිවකුට අනුමාන කළ නොහැකි අයුරින් දිගු මුරපදයක් භාවිත කළ යුතුම වේ. එසේ නොවී එකම මුරපදය සෑම ඊමේල් ගිණුමකටම භාවිත කළහොත් එම මුරපදය සොයාගත් සැණින් අනෙක් සෑම ඊමේල් ගිණුමක්ම විවෘත කරගැනීමේ හැකියාව දත්ත සොරුන්ට හිමිවේ. සමාජ ජාලා වෙබ් අඩවිවල ගිණුම් හි මුරපද මේ අයුරින් සකසා ගැනීමට කටයුතු කිරීම තම තමන්ගේ ආරක්ෂාවට හොඳය.

ඒ ඒ වෙබ් අඩවිවල ආරක්ෂාව සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ද තමන්ගේ ආරක්ෂාව තර කර ගැනීමට ඇති තවත් හොඳ මාර්ගයකි. නිදසුනක් ලෙස දක්වතොත් ජීමේල් ගිණුමට ඇතුළුවීමේ දී මේ පිවිසෙන්නේ නියම තැනැත්තා ද යන්න තෝරා-බේරා ගැනීමට අදාළ ගිණුම් හිමියාගේ ජංගම දුරකථනයට කිසියම් අංකයක් (කේතයක්, code) කෙටි පණිවිඩයක් ලෙස ලැබේ. අදාළ ගිණුමට පිවිසෙන්නේ නියම තැනැත්තානම් අදාළ අංකය ජීමේල් ගිණුමට පිවිසීමේදී මුරපදයට අමතරව මෙම කේතය/ අංකය ඇතුළත් කළ යුතු වේ. එම අංකය නොමැතිව ජීමේල් ගිණුමට පිවිසිය නොහැකි වේ. මෙමගින් යම් පුද්ගලයෙක් තමන්ගේ මුරපදය දැනගත්තත් හෝ සොරාගත්තත් තමන්ගේ ඊමේල් ගිණුම ආරක්ෂා කරගත හැක .ෆේස්බුක් සමාජ ජාලයේ ද මෙවැනිම ආරක්ෂක ක්‍රමයක් භාවිත කරන අතර මෙරට සමහර වෙළෙඳ ආයතනද පාරිභෝගිකයන් තම ගිණුම්වලට ඇතුළුවීමේදී තහවුරු කර ගැනීම සඳහා මෙවැනි ආරක්ෂණ ක්‍රමයක් භාවිත කෙරේ. එම නිසා තමන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගත යුතු වන්නේ සුළු අතපසුවීමකින් බොහෝ දේ අහිමි විය හැකි බැවිනි.

යම් අවස්ථාවක තමන්ගේ ගිණුමක මුරපදය අමතක වූ හෝ වෙනයම් කෙනෙක් එය වෙනස් කර හෝ සොරාගත් අවස්ථාවක තමන්ගේ ගිණුම නැවත ලබා ගැනීමට, තිබෙන සැකසුම් (password recovery options, account recovery options) නිසි පරිදි සකසා ගැනීමත් කළ යුතුය. ඒ සඳහා ආරක්ෂක ප්‍රශ්නයක් සහ පිළිතුරක් (security question and answer), තමන්ගේ දෙවන ඊ මේල් ගිණුමක් (alternate email account), ජංගම දුරකථන අංකය ආදී සැකසුම් යොදාගත හැක.

පොදුවේ භාවිත කරන පරිගණකවලින් මුරපද භාවිත කර පිවිසෙන වෙබ් අඩවිවලට නො පිවිසීමට වග බලා ගත යුතුය. විශේෂයෙන්ම ඉන්ටර්නෙට් කැෆේ භාවිත කරන්නෙක් නම් මේ බව තරයේ සිහියේ තබා ගත යුතුවේ. ඒ මන්දයත් රහස්‍ය හෝ විශ්වාසවන්ත කටයුතු සඳහා අනාරක්ෂිතම ස්ථානයක් ඉන්ටර්නෙට් කැෆේ වන බැවිනි. බොහෝ දෙනා භාවිත කරන බැවින් අප ඇතුළත් කරන රහස්‍ය තොරතුරු ගබඩා කර ගැනීම සඳහා මෘදුකාංග පිහිටුවා තිබිය හැකිය.

තාක්ෂණික ක්‍රමෝපායන් මගින් පරිගණකය දත්ත සොරුන්ගෙන් මෙන්ම වෛරස්වලින් ද බේරා ගැනීමට නම් නිතර යාවත්කාලීන වන වෛරස් ආරක්ෂණ පද්ධතියක් තිබිය යුතුම ය. ලෝකයේ ජනප්‍රියතම වෛරස් ආරක්ෂණ පද්ධතීන්වල නොමිලේ ලබාදෙන සංස්කරණ (Free Versions) ද නොමිලේ භාගත කිරීමට ලබාදෙන මුත් ඒවා පරිගණකය මුළුමණින්ම ආරක්ෂා වන්නේ නැත. නමුත් එදිනෙද අන්තර්ජාලයේ සිදුකරන කටයුතු කල්පනාකාරීව සිදුකරන්නේ නම් මෙම anti virus software වුවද ප්‍රමාණවත් වේ. තමන් අන්තර්ජාලයේ දී පරිස්සමින් කටයුතු නොකරන්නේ නම් උපරිම ආරක්ෂාව සඳහා මුදල් ගෙවා ඊට වැඩි කාර්යක්ෂමතාවකින් යුතු වෛරස් ආරක්ෂණ පද්ධතියක් මිලදී ගත හැක. එහෙත් ලෝකයේ හොඳම වෛරස් ආරක්ෂණ පද්ධතියෙන් පවා පරිගණකයක් සියයට සියයක් ආරක්ෂා නොවන බවත් සිහියේ තබාගත යුතුය. වෛරස් ආරක්ෂණ පද්ධතීන් ඉහළ මුදලක් වන බැවින් බොහෝ දෙනා වෛරස් ආරක්ෂණ පද්ධතීන් ද භාගත කරගන්නේ ටොරන්ට් හරහා ක්‍රැක් සොෆ්ට්වෙයාර් ලෙසිනි. මේ නිසා වෛරස් ආරක්ෂණ පද්ධතිය සමඟ ද අපට අනවශ්‍ය මෘදුකාංග පරිගණකයේ පිහිටුවීම සිදුවිය හැකිය. තම පරිගණකයේ වටිනා තොරතුරු ඇත්නම් සෑම විටම නියම මෘදුකාංග පරිගණකයේ පිහිටුවීමට වගබලා ගත යුතුය.

තාක්ෂණය මතම නො යැපී තම පරිගණක ආරක්ෂා කර ගැනීම මෙන්ම තමන්ද ආරක්ෂා වීමේ වගකීමක් පරිගණක පරිශීලකයන්ට (Check this word. Its wrong) ද ඇත. වෛරස් ආරක්ෂණ පද්ධතිය ස්වයංක්‍රීයව යාවත් කාලීන නොවේ නම් එය යාවත්කාලීන කර ගැනීම මෙන්ම පරිගණකයේ මෙහෙයුම් පද්ධතියේ ඇති අඩුපාඩු මගහරවමින් පැමිණෙන මෙහෙයුම් පද්ධතිය යාවත්කාලීන කිරීම් සිදුකර ගැනීම ද කරගත යුතුය. එවිට මෙහෙයුම් පද්ධතිය අනාරක්ෂිත සිදුරුවලින් රිංගා පරිගණකයට ඇතුළුවීමට වෙනත් මෘදුකාංගවලට තිබෙන ඉඩ ප්‍රස්ථාව අවම වේ.

මීට කලකට ඉහත දී නම් පරිගණක මෙහෙයුම් පද්ධතියක මිල ඉතා ඉහළ අගයක් ගත්තද වර්තමානයේ අලුතින් පරිගණකයක් මිලදී ගැනීමේ දි ඔරිජිනල් මෙහෙයුම් පද්ධතියක් ලැබෙන නිසා එය නිසි පරිදි යාවත්කාලීන කිරීමට වගබලා ගත යුතුවා සේම අලුතින් පැමිණෙන මෙහෙයුම් පද්ධතීන් පිහිටුවා ගැනීමට උත්සාහ දැරීමේ දී වෙනස් කරන ලද මෙහෙයුම් පද්ධතීන් නැතිනම් පයිරටඩ් ඔපරේටින් සිස්ටම් කෙරෙහි විශ්වාසය නොතැබීමට ද වගබලා ගත යුතු වේ.

තමන්ට අවැසි මෘදුකාංග පරිගණකයේ පිහිටුවීමේ දී නියම මෘදුකාංග පිහිටුවා ගැනීමට ද කටයුතු කළ යුතු වේ. නියම මෘදුකාංග වෙනුවට අනවසර මෘදුකාංග සමඟ පැමිණෙන ක්‍රැක් ෆයිල් හරහා වෛරස් මෙන්ම පරිගණකවල දත්ත සොරාගැනීමට උඩගෙඩි දෙන මෘදුකාංග ද පරිගණකයේ පිහිටුවේ. ටොරන්ට් හි ඇති මෘදුකාංග සෑම එකක්ම වෛරස්වලින් ගහණ යැයි අනුමාන කළ නොහැකිය. ඒ අතර වෛරස් රහිත මෘදුකාංග ද තිබිය හැකිය. ඒ කෙසේ වෙතත් ටොරන්ට් ඩවුන්ලෝඩ් කිරීමේ සැමවිටෙකම අවදානමක් ගෙන කළ යුතු වේ.

තවද ජංගම දුරකථනවලින් ලබා ගන්නා අතිශය පෞද්ගලික ඡායාරූප ආරක්ෂා කර ගැනීමට වගබලා ගත යුතුය. ඒ සඳහාම නිර්මාණය වුණු ආරක්ෂක මෘදුකාංග නොමිලයේම භාගත කිරීමට අදාළ මෙහෙයුම් පද්ධතිවලට සහාය දක්වන ඇප්ස් ස්ටෝර් හි පහසුකම් සලසා තිබේ. එසේම තමන්ගේ අතිශය පෞද්ගලික ඡායාරූප හුවමාරු කරගන්නා ස්වාමියා,පෙම්වතා හෝ පුද්ගලයා තමන් සමග විශ්වාසය තහවුරු කරගත්තකු ද යන්න ගැනවත් විමසිලිමත් වන්නේ නම් බොහෝ අකටයුතුකම්වලින් බේරීමට හැකියාව තරුණියන්ට ඇත. එමෙන්ම තම ජංගම දුරකථනයේ අතිශය පෞද්ගලික ඡායාරූප ඇත්නම් එය වෙනකකු අතට පත්වීම වළක්වා ගත යුතුවා සේම ජංගම දුරකථනය වෙනකෙකුට විවෘත කළ නොහැකි ආකාරයෙන් මුරපද යොදා තිබීම ද වැදගත් වනවා ඇත.

කිසියම් අපරාධයකට පරිගණකයක් භාවිත කළ පළියට එය පරිගණක අපරාධයක් වන්නේ ද නැත. නිදසුනක් ලෙස දැක්වුවහොත් කිසියම් පුද්ගලයකුට ඊමේල් පණිවිඩයක් හරහා මරණ තර්ජනයක් කළහොත් එය පරිගණක අපරාධ පනත යටතේ නොව සාමාන්‍ය සිවිල් අපරාධ නීතිය යටතට ගැනේ. මෙහිදී පරිගණකය භාවිත කර ඇත්තේ තර්ජනය කිරීමේ මාධ්‍යයක් ලෙසය.

කිසිවකු පරිගණක අපරාධයකට ලක්වුවෙක් නම් එය නීතිය ඉදිරියට ගෙන යන්නේ ද නැතිනම් සිදුවූ හානිය තාක්ෂණික සහයක් ලබාගෙන නිවැරදි කරගන්නේ ද යන්න ගැන තීරණයකට එළැඹිය යුතුය. තමන්ට සිදුවූ හානිය සම්බන්ධයෙන් නීතිය ඉදිරියට යන්නේ නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇති පරිගණක අපරාධ සම්බන්ධ අංශයට පැමිණිලි කළ යුතු වේ. එසේත් නැතිනම් 'පොලිස්පතිට කියන්න' (TELLIGP - http://www.telligp.police.lk/) වෙබ් අඩවියට පිවිස තම පැමිල්ල ඉදිරිපත් කළ හැකිය.

තමන්ට නීතිය ඉදිරියට නොගොස් මෙවැනි සිදුවීම් ඉදිරියට නොවීමට වගබලා ගැනීමට අවශ්‍ය නම් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ පිහිට පැතිය හැකිය (http://www. cert.gov.lk/). එම සංසදය පරිගණක හෝ අන්තර්ජාල හෝ සමාජ ජාලා හරහා මුහුණ දෙන ගැටලු විසඳීමට සහාය ලබාදෙන අතර ඒවායේ රහසිගතභාවය රැක ගැනීමට ද බැඳී සිටියි.

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ (Sri Lanka CERT|CC) හිටපු තොරතුරු ආරක්ෂණ ඉංජිනේරු රොෂාන් චන්ද්‍රගුප්ත මහතා සමග කරන ලද සාකච්ඡාවක් සහ අන්තර්ජාලයේ තොරතුරු ඇසුරිනි.

**පී.කේ. බණ්ඩාර**

> 'තමන්ගේ අතිශය පෞද්ගලික ඡායාරූප හුවමාරු කරගන්නා ස්වාමියා,පෙම්වතා හෝ පුද්ගලයා තමන් සමග විශ්වාසය තහවුරු කරගත්තකු ද යන්න ගැනවත් විමසිලිමත් වන්නේ නම් බොහෝ අකටයුතුකම්වලින් බේරීමට හැකියාව තරුණියන්ට ඇත. එමෙන්ම තම ජංගම දුරකථනයේ අතිශය පෞද්ගලික ඡායාරූප ඇත්නම් එය වෙනකකු අතට පත්වීම වළක්වා ගත යුතුවා සේම ජංගම දුරකථනය වෙනකෙකුට විවෘත කළ නොහැකි ආකාරයෙන් මුරපද යොදා තිබීම ද වැදගත් වනවා ඇත.'




## සබරගමුව නඟන මඟ



රංජනී ජයකොඩි
ප්‍රධාන ලේකම්
සබරගමුව
පළාත් සභාව

මැණික්වලට මැලෝ සුපතල සබරගමුව පළාත ආර්ථික හා සමාජීය සංවර්ධනය අතින් ඉහළ තැනෙකට ඔසවා තැබෙන සැලසුම් මේ වන විට සකස් කරමින් තිබේ. වර්ග කිලෝ මීටර් 65610 ක් වන ශ්‍රී ලංකාවේ පළාත් 09 කි. මෙම පළාත් නවය අතුරින් ක්‍රිස්තු වර්ෂ ආරම්භයට පෙර වසර 25,000 කටත් වඩා පැරණි පොසිල්ස් යුගය හා ඉන් පසුව ඇතිවූ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට නූතන යුගය දක්වා සම්බන්ධකම් ඇති සොබාදහම විසින් සම්පත් ගොන්නක දායාදයක් සහිතව නිර්මිත සබරගමුව පළාත මෙරට පළාත් අතර ප්‍රමුඛස්ථානයක් ගන්නා බිමක් බවට පත්කිරීම මෙම සැලසුම්වල අරමුණයි. ශ්‍රී ලංකාවේ මූලික සමාජ ආර්ථික දත්ත පළාත් අනුව ගණන් බැලෙන ගෘහ ඒකක ආදායම් වියදම් 2016 සමීක්ෂණය අනුව බස්නාහිර පළාත ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය 38.5% කි. (ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 2019 විශේෂ සංඛ්‍යා දත්ත පරිශිටය 12 වන සංඛ්‍යා සටහන)

සබරගමුව පළාතේ අප පසු වනුයේ ජාතික ආර්ථික සංවර්ධනයට දායකත්වය සපයන පස්වන පළාත ලෙසය. එය 7.6% කි. අප පළාතට ඉහළින් ජාතික ආර්ථිකයේ දියුණුවට දායකත්වය ලබා දෙන සෙසු පළාත් ගත් විට මධ්‍යම පළාත 11.8% ක ද, වයඹ පළාත 11% ක ද, දකුණු පළාත 10% දායකත්වයක් ලබා දෙයි.

මෙම සංඛ්‍යා දත්තවලට අනුව ජාතික ආර්ථිකයේ දියුණුවට ඌව පළාත 5.7% ක ද, නැගෙනහිර පළාත 5.6% ක ද, උතුරු මැද පළාත 5.7% ක ද දායකත්වයක් ලබා දෙයි. අඩුම දායකත්වයක් ලබාදෙනුයේ උතුරු පළාතය. එය 4.5% කි.

ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුවට සෑම පළාතක්ම එක සේ දායක කර ගැනීම රජයේ අපේක්ෂාවයි. භූ විෂමතා අනුව විවිධ පළාත්වල පවතින විභවතාවයන් විවිධය. එම විවිධත්වය මනාව ආර්ථික දියුණුවට ගලපා ගැනීම ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ වගකීමය. ඒ අනුව සලකා බලන කළ මැණික්වලට ලෝ පතල සබරගමුව පළාත ඒ ඔස්සේම දියුණු කරනවාට අමතරව වෙනත් විකල්ප උපාය මාර්ගික සැලසුම් ඔස්සේ දියුණුවට පත්කිරීම අද දවසේ අප මුහුණ දෙන අභියෝගය වේ. මේ පිළිබඳව අවධානය යොමු කළ සබරගමුව පළාත් සභාව පළාතේ කෘෂිකාර්මික, කාර්මික සහ සේවා අංශවල දියුණුවක් ඇති කිරීමට රජයේ සහ පෞද්ගලික අංශයේ දායකත්වය මත පුද්ගල කේන්ද්‍රීය සංවර්ධන මාවතක් සැලසුම් කරන ලදි. එම සැලසුමට අනුව සබරගමුව පළාතේ ප්‍රමුඛව පවතින කෘෂිකාර්මික භවබෝග නිෂ්පාදනයේ ඵලදායිතාවය වැඩිකොට ඒවා අමුද්‍රව්‍ය ලෙස නොව නිමැයුම් ලෙස ජාතික හා ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත යොමු කිරීමට අදහස් කොට සිටී. සබරගමුවේ කිතුල් කර්මාන්තය, කෙසෙල් වගාව, කුරුඳු සහ ගම්මිරිස් වැනි වගාවන්වල අස්වැන්න අලෙවියෙන් වැඩි ආදායමක් උපයා ගත හැකිය. නමුත් මේ කෘෂි අංශ වැඩිදුරටත් අප නොසිතන අලුතින් සිතා දියුණු කළ යුතු උපායමාර්ගික සැලසුම් අප සතුව පවතී. විශේෂයෙන් කිතුල් කර්මාන්තයේ කිතුල් වගාවේ වර්ධනයක් සිදුකොට ඒවායේ නිෂ්පාදන ලෙස කිතුල් වයින්, කිතුල් රා, කිතුල් පිටි, කිතුල් හකුරු, කිතුල් පැණි සහ කිතුල් ගස ආශ්‍රිතව විවිධ අත්කම් භාණ්ඩ නිෂ්පාදනයට විසිතුරු නිමැයුම් වෙළෙඳ පොළට ලබාදීමට අපට හැකිනම් ග්‍රාමීය දුප්පත්කම ඉන් දුරුකර ගැනීමට මනා පිටුබලයක් ලැබෙනු ඇත.

එමෙන්ම කෙසෙල් වගාව ගනිමු. කෙසෙල් වගාවේ අස්වැන්න ලෙස කෙසෙල් කැනක් ගත්තායින් පසුව ගස විනාශයට පත් වේ. මෙලෙස නිරපරාදේ විනාශයට පත්වන කෙසෙල් ගසෙන් අතුරු නිෂ්පාදන ලෙස පරිසර හිතකාමී කෑම පෙට්ටි, පිගන්, අත්බෑග් ආදී නව නිපැයුම් සිදුකොට අලුතින් වෙළෙඳ පොළක් දිනා ගැනීමට අපට හැකිය. ඊට අමතරව ගම්මිරිස්, කුරුඳු වැනි භෝගවල අස්වැන්නට අමතරව ගසේ කොළ, පොතු, මල් ආදී අලුත් නවාකාරයකින් සිතා අලුත් නිෂ්පාදන ලෙස වෙළෙඳ පොළට යොමු කිරීමට අප සමත් වුවහොත් ඉන් ලැබෙන ආදායම් ප්‍රමාණය ඉහළය. මේවා පිළිබඳව අලුතින් සලකා බැලූ සබරගමුවේ අප පළාතේ දුප්පත්කම, විරැකියාව දුරු කිරීම සඳහා මැණික්වලට අමතරව අපනයන ආදායම් ඉහළ නංවන කෘෂිකාර්මික රටාවක් කරා පරිවර්තනය වීමට සැලසුම් කර සිටී. එමෙන්ම නව කර්මාන්තකරණයක් කරා ගමන් ගන්නා අතර, සේවා අංශය ද පාරිභෝගික සිත් ආකර්ෂණය කර ගන්නා අයුරින් නවීකරණය කර ගැනීමට පියවර තබමින් සිටී.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් ස්ත්‍රී පුරුෂ ප්‍රතිශත ලෙස ගතහොත් 53.2% ක් ස්ත්‍රී ජනගහනයයි. පුරුෂ සංඛ්‍යාව 46.8% කි. සමස්තයක් ලෙස අප රටේම පුරුෂ ජනගහනය අභිභවා ස්ත්‍රී ජනගහනය වැඩි වී තිබේ. සබරගමුව පළාතේ ජනගහනයෙන් 53.7% ක් ස්ත්‍රීන්ය. පුරුෂ ජනගහනය 46.3% කි. රටේ ජනගහනයෙන් ශ්‍රම බළකාය ප්‍රතිශතයක් ලෙස ගතහොත් 46.4% ක් වේ. සබරගමුවේ ශ්‍රම බළකාය 51.4% කි. ශ්‍රී ලංකාවේ වැඩිම ශ්‍රම බළකායක් සහිත පළාත සබරගමුව බව සතුටින් සඳහන් කළ හැකිය. මෙම ශ්‍රම බළකායෙන් 68% ක් පුරුෂයින්ය. 32% ක් කාන්තාවන් වේ. සේවා වියුක්තිය ගතහොත් ශ්‍රී ලංකාවේ 8.9% ක සේවා වියුක්තියක් පවතී. එය සබරගමුව පළාතේ 7.1% කි.

මෙම සංඛ්‍යා දත්ත බලන විට සමස්ත රටේම වාගේම සබරගමුව පළාතේ ද වැඩි දියුණු කළ යුතු අංශයක් ලෙස කාන්තා ව්‍යවසායකත්ව අංශය හැඳින්විය හැකිය. කාන්තාව මුල්කොට ගත් ව්‍යවසායකත්ව වැඩපිළිවෙළක් හරහා වඩාත් සමෘද්ධිමත් සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් බිහිකර ගත හැකිය. කාන්තාවන්ගේ ඉතිරිකිරීමේ පුරුද්ද සකසුරුවම පුරුෂ පාර්ශ්වයට වඩා වැඩි බවට මතයක් පවතී. එය මනාව යොදා ගනිමින් ග්‍රාමීය ආර්ථිකයේ දියුණුව සඳහා නව තාක්ෂණය, කාන්තාවන්ගේ අදහස් හා යෝජනා මුල්කොට ගත් ව්‍යවසායක උපදේශන සේවා හඳුන්වා දීම තුලින් රටේ ආර්ථික දියුණුවට කාන්තා දායකත්වය වැඩි කර ගත හැකිය. මෙහිදී මෙරට බැංකු පද්ධතියට ද සුවිසල් කාර්යභාරයක් පැවරේ. එය නව ව්‍යවසායකත්වයක් ගොඩනැගීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සපුරාලීමට පමණක් සීමා නොකොට වෙළෙඳ පොළ, ඇසුරුම්කරණය, ඵලදායිතාවය, නිෂ්පාදන පිරිවැය අඩු ක්‍රමවේද හඳුන්වා දී කාන්තා ව්‍යවසායත්වය බලගැන්වීම ඉලක්ක කොට දියත් කළ යුතුව ඇත. ඒ සඳහා පෙරට එන ලෙස බැංකු පද්ධතියට ආරාධනා කරන අතර දැනටමත් අප පළාතේ කුඩා ව්‍යාපාර, කාර්මික සංවර්ධන මණ්ඩල, වෙළෙඳ මණ්ඩල සහ පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කරති. එය සැමට ආදර්ශයක් බව ද සටහන් කිරීමට කැමැත්තෙමු.

**ජයසිරි මුණසිංහ**

| ගොවිසෙත | සුපිරි වාසනා | ලග්න වාසනාව | කෝටිපති කප්රුක | සංවර්ධන වාසනාව | ජයෝදා | ශනිදා වාසනාව | සුපර් බෝල් | ජාතික සම්පත | අද කෝටිපති | වාසනා සම්පත | දරු දිරි සම්පත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 - 10 - 04 | 2020 - 09 - 21 | 2020 - 09 - 08 | 2020 - 09 - 27 | 2020 - 07 - 31 | 2020 - 09- 09 | 2020 - 09 - 09 | 2020 - 09- 27 | 2020 - 09-30 | 2020 - 09 - 09 | 2020 - 09 - 28 | 2020 - 07 - 30 |
| දිනුම් වාරය - 2560 | දිනුම් වාරය - 1537 | දිනුම් වාරය - 2916 | දිනුම් වාරය - 630 | දිනුම් වාරය - 354 | දිනුම් වාරය - 1688 | දිනුම් වාරය - 3366 | දිනුම් වාරය - 1228 | දිනුම් වාරය - 1059 | දිනුම් වාරය - 1036 | දිනුම් වාරය - 1617 | දිනුම් වාරය - 013 |
| 23 29 30 78 | 01 33 37 57 | 21 37 45 59 | 11 21 45 64 | 22 23 40 | 07 31 35 43 | 31 34 60 64 | 11 27 35 42 | 0 0 2 7 9 6 | 07 12 39 48 | 37 46 48 58 | 04 12 33 63 |
| අක්ෂරය M | සුපිරි අංකය -01 | ලග්නය-මිතුන විශේෂිත අංක රු 500 තෑගි සඳහා-9609 | ඉංග්‍රීසි අක්ෂරය- E | දෛව අංකය - 02 අක්ෂරය- L | අක්ෂරය-A | අක්ෂරය - D | අක්ෂරය - Q විශේෂ අංකය -5767 | අක්ෂරය -H | අක්ෂරය - K රු 500 තෑගි සඳහා-2169 | අක්ෂරය - G | අක්ෂරය - U |

# පීසීආර් පරීක්ෂණයට යොමු කළ 101කට කොරෝනා

## පුද්ගලයන් 2000කට ඥානවිමල සිසුන් 100කට පීසීආර් පරීක්ෂණ

## සිසුහු 1500ක් නිරෝධායනයට

**සන්ධ්‍යා කරුණාරත්න**

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කර්මාන්ත ශාලාව ආශ්‍රිත කොරෝනා පොකුරෙන් ආසාදිතයන් මේ වන විට 103ක් වාර්තා වී තිබේ.

දිවුලපිටිය ප්‍රදේශයේ පදිංචි බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කළ කාන්තාවට මෙම වයිරසය ආසාදිත වූ බවට වාර්තා වීමත් සමග ඊයේ (5) සිදු කළ පීසීආර් පරීක්ෂණ මගින් එම ආයතනයේ සේවය කළ පුද්ගලයන් 69කට වයිරසය ආසාදිත වී ඇතැයි තහවුරු වූ බව වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවැසුවේය.

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවැති මාධ්‍ය හමුවට සහභාගී වෙමින් ඒ මහතා මේ බව ඊයේ (5) ප්‍රකාශ කළේය.

ආසාදිත කාන්තාවට වෛරසය ශරීරගත වූයේ කෙසේද යන්න තවමත් සොයා ගැනීමට නොහැකි වූ බවත් කාන්තාවට වෛරසය ආසාදිත වූ මූලාශ්‍රය සොයා ගැනීමට හැකි වේද, නොහැකි වේද යන්න ගැන තවමත් තීරණයක් නොමැති බවත් ඒ මහතා පැවසීය.

ඊයේ දිනයේ අලුතින් වාර්තා වූ කොරෝනා ආසාදිතයන් 69 දෙනා සම්බන්ධයෙන් තොරතුරු විමර්ශනය කරමින් තිබෙන බවත් ඔවුන් ආගිය තැන්, ආශ්‍රය කළ පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු මේ වන විට ලබා ගනිමින් සිටින බවත් හෙතෙම පැවැසීය.

මෙම පොකුර හා සම්බන්ධ පුද්ගලයන් 2000 කට පමණ ඊයේ (5) පීසීආර් පරීක්ෂණ සිදු කළ බව ද ඒ මහතා ප්‍රකාශ කළේය.

දිවුලපිටිය ඥාණවිමල විද්‍යාලයේ දරුවන් 100 කට සහ පාසලේ ගුරුවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයේ පුද්ගලයන්ට පී.සී.ආර්. පරීක්ෂණ සිදු කළ බවත්, ඒවායේ ප්‍රතිඵල අනුව පාසලේ සෙසු පුද්ගලයන්ගේ තවදුරටත් පීසීආර් පරීක්ෂණ සිදු කරන්නේ ද යන්න තීරණය කරන බවත් දිවුලපිටිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. එල්. අත්තනායක් මහතා 'දිනමිණ'ට ඊයේ (05) පැවැසුවේය.

# ශිෂ්‍යත්වය-උසස් පෙළ ගැන කඩිනමින් තීරණයක් ගන්නවා

## ඇමැති ජී.එල්.පීරිස්

**සිතාරා සේනානි**

පස්වැනි ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස. උසස් පෙළ විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඉතා ඉක්මනින් අවසන් තීරණයක් ගෙන ඒ පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීමට පියවර ගන්නා බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාපති, අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා පවසයි.

මේ සම්බන්ධයෙන් කුමන හෝ තීරණයක් ගනු ලබන්නේ 'දූදරුවන්ගේ සෞඛ්‍යය' නමැති තීරණාත්මක සාධකයකට යටත්ව බවද ඒ මහතා අවධාරණය කළේය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාපති, අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා මේ බව පැවසුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පක්ෂ මූලස්ථානයේ ඊයේ (5) පැවති මාධ්‍ය හමුවේදී ය.

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය මේ මස 11 වැනි දා පැවැත්වීමටත්, උසස් පෙළ විභාගය මේ මස 12 වැනි දා ආරම්භ වීමටත් නියමිතව තිබෙන බව පැවසූ මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා, අදාළ දිනවල විභාග පවත්වන්නේ නම්, නිවෙස්වලට පෝරමයක් යවා මේ සිකුරාදා දිනට පෙර දරුවන්ගේ සෞඛ්‍ය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් මව්පියන්ගෙන් ලබා ගත යුතු බවද, පසුව එම ළමයින් හඳුනා ගැනීමට ක්‍රමානුකූල වැඩපිළිවෙළක් සකස් කිරීම අවශ්‍ය බවද පැවසීය.

එසේම, සාමාන්‍ය ආරක්ෂක පියවර වන මුව ආවරණ, සමාජීය දුරස්ථභාවය, අත් සේදීම වැනි දෑ ඉතා දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට සිදුවන බවද කීය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී සාගර කාරියවසම් මහතා ද මේ අවස්ථාවට සහභාගී විය.

# නිව් ඩයමන්ඩ් මිලියන 442 ගෙවයි

**කුමුදු හෙට්ටිආරච්චි**

ගිනි ගැනීමට ලක් වූ එම් ටී නිව් ඩයමන්ඩ් නෞකාවේ හිමිකරුවන් ගින්න නිවීමේ කටයුතුවලදී වැය වූ රුපියල් මිලියන 442ක මුදල ශ්‍රී ලංකා රජයට ලබාදුන් බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිනී රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය පැවසුවාය. එම මුදල ගින්න නිවීම සඳහා වැය වූ මුදල පමණක් වන බව පැවසූ රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය ගින්න හේතුවෙන් සමුද්‍රීය පරිසරයට වූ හානිය පූර්ණය ඊට ඇතුළත් නොවන බවද පැවසුවාය.

# මිනුවන්ගොඩ ඇඟලුම් කම්හලේ සේවය කළ කුරුණෑගල, යාපනයේ සහ මොණරාගල හතරකටත් කොරෝනා

**සන්ධ්‍යා කරුණාරත්න, ඌව වෙල්ලස්ස විශේෂ**

මිනුවන්ගොඩ ඇඟලුම් කර්මාන්ත ශාලාවේ සේවය කළ කුරුණෑගල පදිංචි සේවිකාවන් දෙදෙනෙකුට, මොණරාගල පදිංචි සේවිකාවකට යාපනයේ වෙලෙන පදිංචි අයෙකුට කොවිඩ් - 19 වෛරසය ආසාදිත බවට කුරුණෑගල සහ මොණරාගල රෝහල්වල සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණ වාර්තාවන්ගෙන් තහවුරු වී තිබේ.

කුරුණෑගල කටුපොත සහ පන්නල ප්‍රදේශයේ පදිංචි දෙදෙනකු මෙසේ ආසාදනයට ලක්ව ඇති අතර වැඩිදුර ප්‍රතිකාර සඳහා ඔවුන් අංගොඩ ජාතික උණ රෝහලට ඇතුළත් කිරීමට ඊයේ (05) පියවර ගත් බව ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ මහතා 'දිනමිණ'ට පැවැසුවේය. කොවිඩ් ආසාදිත දිවුලපිටියේ කාන්තාව සේවය කළ ඇඟලුම් කම්හලට ඉන්දියානුවන් දෙදෙනකු පැමිණ ඇති බවට පළ වන කතාවන්හි සත්‍යතාව මෙතෙක් තහවුරු නොමැති බවත් අදාළ කාන්තාවට වෛරසය ශරීරගත වූ ආකාරය සම්බන්ධයෙන් තවමත් පරීක්ෂණ පවත්වන බවත් ඔහු කීය.

# මිනුවන්ගොඩ රෝහල කොවිඩ් රෝහලක් වෙයි

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 වෛරසයට අදාළ ප්‍රතිකාර ලබාදෙන රෝහලක් ලෙස මිනුවන්ගොඩ රෝහල ප්‍රකාශයට පත් කර තිබේ.

අවශ්‍ය වුවහොත් සෑම ප්‍රධාන රෝහලකම කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර ලබාදීම සඳහා අදාළ හුදෙකලා වාට්ටුවක් ස්ථාපිත කිරීමේ පහසුකම් පවතින බවත් කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර ලබාදීම සම්බන්ධයෙන් අඩුපාඩුවක් පවතින්නේ ද යන්න සම්බන්ධයෙන් කිසිවකුත් සැකයක් ඇති කර නොගත යුතු බවත් වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවැසුවේය.

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමින් ඒ මහතා මේ බව ඊයේ (05) ප්‍රකාශ කළේය.

# හෘද සාක්ෂියට අනුව ඡන්දය දිය හැකිනම් ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් 20 පැරදවීමට සූදානම්

## කබීර් හෂීම්

**ශිවන්ති ප්‍රනාන්දු**

හෘද සාක්ෂිය අනුව ඡන්දය ලබා දීමට ඉඩ ලැබෙන්නේ නම් ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් බහුතරයක් විසි වැනි සංශෝධනය පරාජය කිරීමට සූදානම් බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම් මහතා අවධාරණය කරයි.

කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ ඊයේ (05) පැවති මාධ්‍ය හමුවකදී මාධ්‍යවේදියකු නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් මන්ත්‍රීවරයා මේ බව අවධාරණය කළ අතර පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මහතා ආණ්ඩුවට එක්වීම සම්බන්ධයෙන්ද හෙතෙම අදහස් දැක්වීය.

# ඩිජිටල් ගනුදෙනු ඉහළ නංවන්න 'LANKA QR' කේතය හඳුන්වා දෙයි

**මහින්ද අලුත්ගෙදර**

භෞතික වශයෙන් මුදල් භාවිතය අවම කොට ඩිජිටල් ගනුදෙනු ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදය 'LANKA QR' කේතය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙයි. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන මෙම කේතය නිල වශයෙන් එළිදැක්වීම වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ඊයේ (05) සිදු කෙරිණි. ඒ අනුව මෙම ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදය මේ වනවිට රට පුරා ක්‍රියාත්මක වෙයි.

# විස්ස පසෙක තබා කොරෝනා මඬින්න මුල් තැන දෙන්න

## ජවිපෙ ආණ්ඩුවට කියයි

**නදී මාණික්කගේ**

මේ මොහොතෙහි ආණ්ඩුව ප්‍රමුඛතාව දිය යුත්තේ වසංගත මර්දනයට මිස ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා නොවන බව ජනතා විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස මහතා ඊයේ (5) දිනමිණට පැවසුවේය. මහජනතාව රැස්කිරීම මේ මොහොතේ නොකළ යුතු බැවින්, පාර්ලිමේන්තුව රැස් කිරීමද නොකළ යුතු බවත්, පළමු කොරෝනා රැල්ලේ පැවති බලතල යොදාගෙන තත්ත්වය පාලනය කිරීමට ජනාධිපතිවරයාට පවතින බලතල ප්‍රමාණවත් බවත් එයට සංශෝධන හරහා තවත් බලතල අනවශ්‍ය බවත් ජයතිස්ස මහතා කීවේය.

පළමු කොරෝනා රැල්ල අවසන් වූවා යැයි නිශ්චිතව කිව නොහැකි අතර මෙය කොරෝනා දෙවැනි රැල්ලදැයි කීමට තවම කල් වැඩි බව පැවසූ ඒ මහතා අවුරුදු 95ක් පමණ පැරණි ප්‍රජා සෞඛ්‍ය සේවයේ ශක්තිමත් බව හේතුවෙන් පළමු රැල්ල යම්තාක් දුරකට සාර්ථකව පාලනය කළ බව පැවසීය.

# කොවිඩ් වයිරසය සමාජගත වී නෑ

## විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 වයිරසය තවමත් සමාජගත වී නොමැති බව වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවසුවේය. පසුගිය සතියක හෝ දෙකක කාලයේ මිණුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයට ආගිය හෝ වෙනත් සම්බන්ධතාවක් පැවැති පුද්ගලයෙක් වේ නම් ඒ බව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට දැනුම් දී සෞඛ්‍ය උපදෙස් ලබා ගැනීමෙන් වයිරසය ව්‍යාප්තිය පාලනය කළ හැකි බව ද ඒ මහතා ප්‍රකාශ කළේය. සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවැති මාධ්‍ය හමුවට සහභාගී වෙමින් ඒ මහතා මේ බව ඊයේ (5) ප්‍රකාශ කළේය.

# 'ගම්පහ සියලු කම්හල්වලට පීසීආර් පරීක්ෂණ'

## සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කරයි

**සන්ධ්‍යා කරුණාරත්න**

ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු කර්මාන්ත ශාලාවල සේවයේ නියුතු කාර්ය මණ්ඩල පී.සී.ආර්. පරීක්ෂාවට ලක් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කරයි.

කොවිඩ්-19 වෛරසය පාලනය කිරීමට අදාළ තීරණ හයක් ගනිමින් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක විශේෂිත වැඩපිළිවෙළට අනුව මේ තීරණය ගැනීමට සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය පියවර ගෙන තිබේ.

ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රදේශයෙන් කොවිඩ් ආසාදිතයකු වාර්තා වීම හේතුවෙන් එම ප්‍රදේශයේ වෛරසය ව්‍යාප්තිය පාලනයට, මැඩපැවැත්වීමට සහ ප්‍රතිකාර සේවාවන් ශක්තිමත් කිරීමට ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව විශේෂ සාකච්ඡාවක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී ඊයේ (05) පැවැත්විණි. එම අවස්ථාවේදී මේ තීරණය ගෙන තිබේ.

සෞඛ්‍ය ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ, වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය එස්. ශ්‍රීධරන්, අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) වෛද්‍ය ලක්ෂ්මි සෝමතුංග, අතිරේක ලේකම් (සංවර්ධන) ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත මහත්ම මහත්මීහු මේ සාකච්ඡාවට සහභාගී වූහ.

# ඇමති මහින්දානන්දගේ නඩුව ජනවාරි 3 වැනිදාට කල් යයි

**කුමුදු හෙට්ටිආරච්චි**

මුදල් විශුද්ධීකරණය වැළැක්වීමේ පනත යටතේ අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතාට එරෙහිව නීතිපතිවරයා පවරා ඇති නඩුවේ වැඩිදුර සාක්ෂි විභාගය ලබන ජනවාරි මස 03 වැනිදාට කල් තැබුණි. කොළඹ මහාධිකරණ විනිසුරු ප්‍රදීප් හෙට්ටිආරච්චි මහතා ඉදිරියේ මෙම නඩුව විභාගයට ගැනේ.

01 වැනි පිටුවෙන්...

## 20ට පක්ෂ විපක්ෂ...

එම පනත් කෙටුම්පතට එරෙහිව ගොනු කළ පෙත්සම් 37ක් සහ අතරමැදි පාර්ශ්ව පෙත්සම් 20ක් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කෙරිණි.

අගවිනිසුරු ජයන්ත ජයසූරිය, බුවනෙක අලුවිහාරේ, සිසිර ආබෲ, ප්‍රියන්ත ජයවර්ධන, විජිත් මලල්ගොඩ යන පංච පුද්ගල විනිසුරු මඬුල්ල හමුවෙහි මෙම කරුණු ඉදිරිපත් කෙරිණි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, සිවිල් වැසියන් සහ සිවිල් සංවිධාන විසින් මෙම පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් පෙත්සම් තිස්නවයක් (39) ශ්‍රේෂ්ඨාධිකරණය හමුවෙහි ගොනු කර තිබුණි.

පෙත්සම් දෙකක් සම්බන්ධ නොතිසි පාර්ලිමේන්තුවේ කථානායකවරයා වෙත දන්වා යවා නොතිබීම නිසා එම පෙත්සම් සම්බන්ධ කරුණු ඉදිරිපත් කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කළ ශ්‍රේෂ්ඨාධිකරණ පංච පුද්ගල විනිසුරු මඬුල්ල සෙසු පෙත්සම්කරුවන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමට එක් අයෙකුට විනාඩි 30 බැගින් අවස්ථාව සලසා දුන්නේය.

ඒ අනුව ජනාධිපති නීතිඥවරු සහ නීතිඥවරු කිහිපදෙනෙක් කරුණු ඉදිරිපත් කළ අතර, සිය පෙත්සම වෙනුවෙන් සිවිල් වැසියකු තමාම අධිකරණයෙහි පෙනී සිටිමින් කරුණු ඉදිරිපත් කළේය.

මෙම පනත් කෙටුම්පතෙහි වගන්ති කිහිපයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වන අතර, එමගින් මූලික වශයෙන්ම ජනතා පරමාධිපත්‍යය උල්ලංඝනය වන බව ද සඳහන් කළ ඔවුහු මෙය නීතියක් බවට පත් වීමට නම් අනිවාර්යයෙන්ම තුනෙන් දෙකේ පාර්ලිමේන්තු සම්මතයකට අමතරව ජනමත විචාරණයක් මගින් ජනතාවගෙන් ද සම්මත කර ගත යුතු බවට දීර්ඝ ලෙස කරුණු ඉදිරිපත් කළහ.

මැදිහත් පාර්ශ්ව පෙත්සම්කරුවන් ලෙස බෞද්ධ භික්ෂුන් වහන්සේලා තිදෙනෙක්, රජයේ ඇමැතිවරු තිදෙනෙක්, සිවිල් සංවිධාන, සිවිල් වැසියන් විසින් පෙත්සම් 20ක් ගොනු කර සිටියහ. මෙම පනත් කෙටුම්පතේ ඇතුළත් වගන්ති මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වීමක් සිදු නොවන අතර, එය නීතියක් බවට පත් වීමට නම් පාර්ලිමේන්තුවේදී සම්මත වීම පමණක් ප්‍රමාණවත් බවට එම පෙත්සම් වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥවරු දීර්ඝ ලෙස කරුණු ඉදිරිපත් කළහ.

මෙහිදී නීතිපති දප්පුල ද ලිවේරා මහතා සඳහන් කළේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය, ආකෘතිය සහ එය ක්‍රියාත්මක වන ක්‍රියාවලිය පමණක් මෙහිදී සංශෝධනය කරන බවය. එමගින් ජනතා ස්වාධිපත්‍යය සහ පරමාධිපත්‍යය උල්ලංඝනය නොවන බව ඒ මහතා පෙන්වා දුන්නේය. මෙම පනත් කෙටුම්පතේ එකම වගන්තියක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන බවට නීතිපතිවරයා කරුණු ඉදිරිපත් කළේය. එය පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත වීම පමණක් ප්‍රමාණවත් බව නීතිපතිවරයා සඳහන් කළේය.

කරුණු සලකා බැලූ අධිකරණය පෙත්සම්කරුවන් කිහිපදෙනෙකුගේ ලිඛිත දේශන මේ වන විට ලැබී ඇති බවත් සෙසු පෙත්සම්කරුවන්ගේ ලිඛිත දේශන විද්‍යුත් ක්‍රම මගින් හෝ අද (6) දහවල් වන විට ගොනු කරන ලෙස විනිසුරු මඬුල්ල මෙහිදී දැනුම් දුන්නේය.

මෙහිදී පෙත්සම්කාර පාර්ශ්වයේ නීතිඥවරු නීතිපතිවරයාගේ ලිඛිත දේශන තමන්ට ද ලබා දෙන ලෙස ඉල්ලීම් කළ අතර, නීතිපතිවරයා ඊට අකමැත්ත පළ කළේය. මෙම පෙත්සම් විභාගයේදී තමන් අධිකරණයට සහාය පළ කරමින් කරුණු ඉදිරිපත් කළ බවත්, වෙනත් කිසිදු පාර්ශ්වයකට ලිඛිත දේශන දිය නොහැකි බවත් සඳහන් කළ නීතිපතිවරයා අවශ්‍ය නම් එහි සාරාංශයක් දිය හැකි බව සඳහන් කළේය.

මෙහිදී එම ලිඛිත දේශනවල පිටපතක් ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛනාගාරයෙන් ගත හැකි බව විනිසුරු මඬුල්ල සඳහන් කළේය.

ජනාධිපති නීතිඥවරුන් වන කේ. කනග්ඊශ්වරන්, එම්. ඒ. සුමන්තිරන්, ජෙෆ්රි අලගරත්නම් ඇතුළු නීතිඥ මඬුල්ලක් පෙත්සම්කරුවන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කළහ.

ජනාධිපති නීතිඥවරුන් වන සංජීව ජයවර්ධන, කුෂාන් ද අල්විස්, ෂවින්ද්‍ර ප්‍රනාන්දු ඇතුළු නීතිඥ මඬුල්ලක් මැදිහත් පාර්ශ්ව පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටියහ.

## ඉදිරි වසර පහේදී...

පසුගිය අවුරුදු 5ක කාලයක් පුරා ලබා ගත් සූර්ය බලශක්ති ප්‍රමාණය මෙන් හතරගුණයක බලශක්ති ප්‍රමාණයක් ලබන වසර පහේදී ලබා ගැනීමට කටයුතු කරන බව ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති ඉංජිනේරු විජිත හේරත් මහතා දිනමිණට ඊයේ (5) පැවැසීය.

ඒ අනුව ඊළඟ අවුරුදු 5ක කාලයේදී සූර්ය බලශක්තිය මෙගාවොට් 1000ක ප්‍රමාණයක් ලබා ගැනීමට කුඩා පරිමාණ සූර්ය බලාගාර ව්‍යාපෘතියක් විදුලිබල අමාත්‍යාංශය, සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය, සුනිත්‍ය බලශක්ති අධිකාරිය එකතු වී ආරම්භ කර ඇත.

## කොවිඩ් තෙවැනි...

ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ උපදෙස් මත පසුගිය ජනවාරි මාසයේදී ආරම්භ කළ කොවිඩ් මර්දනය කිරීමේ යාන්ත්‍රණය කිසි විටෙක නවතා දැමුවේ නැති බවත්, එය දිගින් දිගටම ගෙන ක්‍රියාත්මක කෙරුණු බවත් ආරක්ෂක ලේකම්වරයා කියා සිටියේය.

ආරක්ෂක ලේකම්වරයා මේ බව ප්‍රකාශ කළේ ඊයේ (5) ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැති විශේෂ මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

## චම්පිකගේ...

සිය නීතිඥවරයා මගින් අධිකරණයට භාර වූ විත්තිකරු පවසා සිටියේ තමාට නඩු දිනය අමතකවීම හේතුවෙන් පසුගිය මස 29 වැනි දින අධිකරණයේ පෙනී නොසිටි බවයි.

## රට පුරා ඇඳිරි...

ඒසේම සමාජ මාධ්‍ය ඔස්සේ හුවමාරු වන සාවද්‍ය ප්‍රචාරවලට නොරැවටෙන ලෙස ජනාධිපති මාධ්‍ය අංශය ජනතාවගෙන් ඉල්ලා සිටී.

අද දිනයේ (06) රට පුරා ඇඳිරි නීතිය පනවා ඇති බවට සමාජ මාධ්‍ය ඔස්සේ හුවමාරු වෙමින් පවතින ප්‍රචාරයන්ට ද නොරැවටෙන ලෙසත් රජය ජනතාවටකියා සිටී.

ජනතාව දැනුවත් කිරීමට ජනාධිපති මාධ්‍ය අංශය හෝ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යොමුකරන විශේෂ නිවේදන විද්‍යුත් හා සහ මුද්‍රිත මාධ්‍ය මගින් පමණක් පළ කරන බව දන්වා සිටී.

හඳුනාගත් කොවිඩ් අසාදිතයන්ගේ සමීපතමයන් හඳුනාගෙන රෝගය පැතිරයාම වැළැක්වීමටත් රෝගීන් හඳුනා ගැනීමේ PCR පරීක්ෂණ සංඛ්‍යාව වැඩි කිරීමටත් කඩිනම් පියවර ගන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අදාළ පාර්ශවයන්ට මෙහිදී උපදෙස් දුන්නේය.

අසාදිතයන් ළඟින් ඇසුරු කළ පිරිස දැන් හඳුනාගෙන තිබේ. ඔවුන් නිවෙස්වල සිට ස්වයං නිරෝධායනයට යොමුකර ඇත. එම පිරිස ආසන්නතම ප්‍රදේශවල හෝටල්වල නිරෝධායනයට පියවර ගන්නැයි ජනාධිපතිතුමා නියම කළේය.

කොවිඩ් මර්දනයට රජය දී තිබූ උපදෙස් පිළිපැදීම කාලයත් සමග ජනතාවගෙන් ගිලිහී යාම රෝගය ආසාදනයට මූලිකම හේතුව බව වෛද්‍යවරු මෙහිදී පෙන්වා දුන්හ.

කොවිඩ් වසංගතය ලෝකයේ සෙසු රටවල් වේගයෙන් ආක්‍රමණය කරමින් සිටී. ඒ පිළිබඳව වාර්තා කළද ජනතාව දැනුවත් කිරීමට රට තුළ ගෙන ගිය ප්‍රචාරණ වැඩපිළිවෙළ මාධ්‍ය වෙතින් මගහැරී ගිය බව ජනාධිපතිතුමා පෙන්වා දෙයි. සාමාන්‍ය පරිදි කොවිඩ් වසංගතය පවතින බව ජනතාවට ද අමතක වූ බව ජනාධිපතිතුමා කියා සිටී.

දිවයිනේ සියලු දිස්ත්‍රික්කවල මෙන්ම ආයතන වලද අහඹු ලෙස PCR පරීක්ෂණ සිදු කිරීමට උපදෙස් දී තිබේ. විශේෂයෙන්ම කණ්ඩායම් වශයෙන් විශාල පිරිසක් සේවය කරන ආයතනවල PCR පරීක්ෂණ අහඹු ලෙස විටින් විට සිදුකරන ලෙස නියම කර තිබිණ. එහෙත් කර්මාන්ත ශාලා වෙතින් එය නිසි ලෙස සිදු වී නොමැති බව පෙනී යන්නේ යයි ජනාධිපතිතුමා කියා සිටී.

පවතින තත්ත්වය අවබෝධ කරගෙන යළි එය මර්දනයට සහය වීමට මාධ්‍යයට සහ ජනතාවට විශාල වගකීමක් ඇති බව ජනාධිපතිතුමා කීය. මාස දෙකකට පසු කොවිඩ් ආසාදිතයින් සමාජයෙන් හමුවීම පිළිබඳව පුළුල් විමර්ශණයකට ලක් කළ යුතු බව ද රාජපක්ෂ මහතා පැවසීය.

පොලීසිය සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කළ විශාල කාර්ය භාරය සිහිපත් කළ ජනාධිපතිතුමා නැවත එම වැඩපිළිවෙළ ප්‍රදේශ මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම අවධාරණය කළේය.

රෝගීන් හඳුනාගත් ප්‍රදේශ වලින් ජනතාව බැහැර යාම වැළැක්වීමට දැනටමත් පියවර ගෙන තිබේ. ප්‍රදේශයේ සෙසු කර්මාන්ත ශාලා සහ ආයතන අහඹු ලෙස පරීක්ෂාවට ලක් කෙරේ. පෞද්ගලික අංශයේ දායකත්වය ඇතිව ආයතන සේවකයන් අහඹු ලෙස පරීක්ෂාවට යොමු කිරීමේ අවශ්‍යතාව ද ජනාධිපතිතුමා පෙන්වා දුන්නේය.

කොවිඩ් මර්දනයට අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග ලෙස හඳුනාගත් බොහෝ දේ ජනතාව නිසි ලෙස පිළි නොපදින බව පොලිසිය සඳහන් කළේය. පවතින නීති රීති කොවිඩ් මර්දනය ඉලක්ක කර ගනිමින් ගැසට් කිරීමේ අවශ්‍යතාව ද සාකච්ඡාවට ලක් කෙරිණ.

ජනතාව දැනුවත් කිරීම මාධ්‍ය මගින් අඛණ්ඩව සිදු කරන ලෙස ද ජනාධිපතිතුමා විසින් උපදෙස් දෙනු ලැබිණ.

ප්‍රතිශක්තීකරණය වර්ධනයට සහ රෝගය වැළඳුණු පිරිස ඉක්මනින් සුවපත් කිරීමට දේශීය ඖෂධ වලට ඇති හැකියාව සාකච්ඡාවට ලක් විය.

ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි, රාජ්‍ය ඇමැති සිසිර ජයකොඩි, ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග මහත්ම මහත්මීහු සහ කොවිඩ් මර්දන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයෝ සාකච්ඡාවට එක්ව සිටියහ.

## ප්‍රහාරය ගැන...

තමන්ට දුරකථනයෙන් හෝ දැන්වූයේ නම් එය වළක්වාගැනීමට ඉඩ තිබූ බව කියා සිටී හිටපු ජනාධිපති වරයා තමන් විදේශ ගමන වළක්වා ගෙන ප්‍රහාරය වැළැක්වීමට ගත යුතු සියලු පියවර ගන්නා බවද කීවේය.

මේක ජාතියේ මහා අවාසනාවක්. මම විදේශ ගත වුණේ ප්‍රතිකාර සඳහා. මම සංචාරය අවලංගු කරනවා මේ තොරතුරු දැනගත්තා නම්. අප්‍රේල් 14 පොලිස්පති ආරක්ෂක ලේකම් දෙන්නම මගේ ගෙදර ආවා. පැය දෙකක් විතර ඉඳලා දවල් කෑමත් කාලා ගියේ. පොලිස්පති මම විදේශ ගත වන විට 16 දා ගුවන්තොටුපළට ආවා. ගුවන් යානයටත් නැගලා සැලියුට් කරලා සුබ ගමන් සර් කියලා කිව්වා. මම කිව්වා දින 04 බලාගන්න කියලා. අප්‍රේල් 04 තොරතුරු ආවා නම් මට කියන්න තිබුණා. මම 16 වෙනකම් ලංකාවේ හිටියේ. අප්‍රේල් 12 මඩකළපුවේ 7000ක විතර එක් වූ උත්සවයකට ගියා. එතනදි කිව්වෙත් නෑ. අප්‍රේල් 08 ඩීආයිජීලා හමුවුණා. මට කිව්වේ නෑ. මගේ දේශපාලන දිවියටත් ජනාධිපති ධුර කාලයටත් සිදු වූ මහා අවාසනාවන්ත ඛේදවාචකය මට කිව්වා නම් නවත්තගන්න තිබුණා.

## රනිල් අද...

මේ සම්බන්ධයෙන් වන නොතිසිය හිටපු අග්‍රාමාත්‍යවරයාට කොමිසමේ ලේකම්වරයා විසින් යොමු කර ඇත.

මේ අතර හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඊයේ (05) පාස්කු කොමිසමට සාක්ෂි දීම සඳහා පළමු වතාවට පැමිණියේ ය.

පෙරවරු 10.00 සාක්ෂි දීම ආරම්භ වූ අතර පස්වරු 5.00 දක්වා ඒ මහතාගෙන් සාක්ෂි විමසීම සිදු කළේය

හිටපු ජනාධිපතිවරයා නැවත ලබන 12 වැනිදා කොමිසම හමුවට පැමිණෙන ලෙස කොමිසමේ සභාපති විනිසුරුවරයා ඒ මහතාට දැනුම් දුන්නේය.

01 වැනි පිටුවෙන්...

## කෝටි 600කට...

අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 20, 26, 30 සහ 40ක් වන අනුරාධපුර, රඹෑව, පේරාදෙණිය යන ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

සැකකරුවන් මොනරාගල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඊයේ (5) ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

මොණරාගල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදු කරයි.

## ට්‍රම්ප් සුවඅතට...

විශේෂ මෝටර් රථයක නැගී රෝහලෙන් පිටතට පැමිණි ජනාධිපතිවරයා, රෝහල අවට රැස්ව සිටි සිය පාක්ෂිකයන්ට ආචාර කරමින් ගමන් කර තිබෙන අතර, මෝටර් රථය තුළ අසුන්ගෙන සිටි ජනාධිපති ට්‍රම්ප් මහතා මුඛ ආවරණයක් පැළඳ සිටීම විශේෂත්වයකි. තව දුරටත් රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටින ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මහතා ට්විටර් පණිවිඩයක් නිකුත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ තමන් කොවිඩ් වසංගතය සම්බන්ධයෙන් බොහෝ දෑ උගත් බවත් වෛරසය පිළිබඳ ඉගෙන ගැනීමට හැකි හොඳම පාසල මෙය බවත්යි. තමන් ඒ සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගත් බවද සඳහන් කර තිබේ.

# මහ බැංකුව හඳුන්වා දුන් ඩිජිටල් ගෙවීම් ක්‍රමය රටේ අනාගතයට ශක්තියක්

● ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන

**මහින්ද අලුත්ගෙදර**

භෞතික වශයෙන් මුදල් භාවිතය අවම කොට ඩිජිටල් ගනුදෙනු ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වා දී තිබෙන ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදය (LANKA QR කේතය) රටේ අනාගත ආර්ථික වර්ධනය වෙනුවෙන් දැවැන්ත ශක්තියක් බව වෙළෙඳ ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ප්‍රකාශ කරයි.

ඇමැතිවරයා මේ බව සඳහන් කෙළේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දෙනු ලබන ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදය වන LANKA QR කේතය එළිදැක්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඊයේ (05) පෙරවරුවේ පැවැති උත්සවය අමතමිනි.

මෙම කේතය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය සතු වර්ණ යොදාගෙන තිබෙන අතර ඊට අමතරව ස්ටිකරයක් හඳුන්වා දී තිබේ. අනාගතයේදී මෙම කේතය සතු ආයතනවල එම ස්ටිකරය දැක ගැනීමට හැකි වන අතර මේ වන විට බැංකු ආයතන වෙනුවෙන් ඉදිරිපත් කර තිබේ. පාර්භෝගිකයා මේ හරහා ගනුදෙනු කළ විගස ජංගම දුරකතනය වෙත ඒ බව කෙටි පණිවිඩයකින් දැනුම් දෙන අතර ව්‍යාපාරිකයාට ද කෙටි පණිවිඩයක් ලැබීම විශේෂත්වයකි. මේ කේතය භාවිත කරමින් ගනුදෙනු කිරීමේදී රජයේ ආයතන සඳහා කිසිදු ගාස්තුවක් අයකළ නොහැකි අතර සාමාන්‍ය ගනුදෙනුවකට අයකරන ගාස්තුව මේ වසරේදී සියයට 0.5 දක්වා පහත හෙළා තිබේ. ඉන්ධන පිරවුම්හල්වලදී කිසිදු අමතර ගාස්තුවක් අය කළ නොහැකි අතර මෙම කේතය සම්බන්ධයෙන් මේ වන විට රට පුරා ආයතන 16ක් අනුමැතිය හිමිකරගෙන ඇත. ශ්‍රී ලංකාවේ මුල්වරට බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන සියල්ල එක්ම ව්‍යාපෘතියක් වෙනුවෙන් මේ සඳහා දායක වී සිටී.

ශ්‍රී ලංකා ආර්ථිකය සෞභාග්‍යමත් හා තිරසර සංවර්ධනයක් වෙත මංපෙත් විවර කරවන ගමනේ තවත් එක් සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් නව තාක්ෂණය යොදා ගනිමින් ඩිජිටල්කරණය වූ ආර්ථිකයක් වෙත පියමැනීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී මූල්‍ය ආයතන, ජාලගත ජංගම දුරකතන සැපයුම්කරුවන්, ලංකා ක්ලියර් සමාගමත් එක්ව LANKA QR ගෙවීම් ක්‍රමවේදය හඳුන්වා දී තිබේ. මෙමගින් ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගත භාවය ඉහළ නැංවෙනවා පමණක් නොව ගනුදෙනුවල දී අඩුවෙන් මුදල් භාවිතා කළ හැකි වෙයි.

එහිදී වැඩිදුරටත් අදහස් පළ කළ ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා මෙසේද පැවසීය.

ජාතික නිමවුම් සංඛ්‍යා ලේඛනවලට ඇතුළත් නොවන කළු ආර්ථික ගනුදෙනු විශාල ප්‍රමාණයක් අපේ රට තුළ සිදු වෙනවා. විධිමත් මුදල් වෙළෙඳ පොළ තුළ රාජ්‍ය අංශයත් පෞද්ගලික අංශයත් සියලු දෙනා ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වා දෙන ක්‍රමවේදය වැලඳ ගන්නේ නම් එය අපේ ඉදිරි සංවර්ධනය සහ ජයග්‍රහණය සඳහා අතිශයින්ම වැදගත් වෙනවා. ශ්‍රී ලංකාවේ සියලුම රාජ්‍ය ආයතන මෙම විද්‍යුත් ගෙවීම් පද්ධතිය භාවිතා කිරීම සඳහා කැපවීමකින් යුතුව ඉදිරිපත් වන්නේ නම් ඒ තුළ විශාල ලෙස රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වැඩි කළ හැකියි.

වඩාත් ආරක්ෂිත හා වේගවත් ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදයන් දිරිගැන්වීම වෙනුවෙන් මේ කේතය හඳුන්වා දී තිබෙනවා. එය රටපුරා ක්‍රියාත්මක වෙයි. එක් ආයතනයක් සතුව QR එක් කේතයක් පමණක් ප්‍රමාණයත් වන අතර කිහිපයක් අවශ්‍ය නොවේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වාදෙන මේ කේතය එළිදැක්වීම අපේ රටේ අනාගතය වෙනුවෙන් ඉතා වැදගත් වෙනවා. පසුගිය කාලයේ අපිට නව තාක්ෂණය හඳුන්වා දෙන අවස්ථාව වන විට ලෝක ඉතිහාසයේ දරුණුතම ස්වාභාවික ව්‍යසනයට මුහුණ දෙන්න සිදු ව තිබෙනවා. ඒ අනුව මිලියන 35කට ආසන්න පිරිසක් කොවිඩ් ආසාදිතයන් වන විට මිලියනයක් පමණ මිය ගොස් තිබෙනවා. ඒ අනුව එම වසංගතයේ භයානක තත්ත්වය පැහැදිලියි. ලෝකයේ මහා බලවතා වන අමෙරිකාවේ මරණ සංඛ්‍යාව ලක්ෂ දෙක ඉක්මවා තිබෙනවා. ඉන්දියාවේ මරණ සංඛ්‍යාව ලක්ෂය ඉක්මවන විට අපේ රටේ මරණ සංඛ්‍යාව 13 වැනි අවම සංඛ්‍යාවක පවත්වා ගෙන යන්න පුළුවන් වී තිබෙනවා. කොවිඩ් වසංගතය මැඩ පැවැත්වීම සඳහා විචක්ෂණශීලී පාලන ක්‍රමවේදයක් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින අනුගමනය කර තිබෙනවා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරු ප්‍රමුඛ ආණ්ඩුව සහ ආරක්ෂක අංශ, සෞඛ්‍ය අංශවල කැපවීම හේතුවෙන් මේ දක්වා අපේ රටේ බලවත් රටවලට සාපේක්ෂව රටට අභිමානයක් විය හැකි ආකාරයෙන් මිනිස් ජීවිත බේරා ගැනීම වෙනුවෙන් විශාල ප්‍රගතියක් අත් කර ගෙන තිබෙනවා.

මෙහිදී බොහෝ වෙලාවට සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදවල දී මුදල් භාවිත නොවී ගනුදෙනු කරගන්න හැකිවූවා නම් මේ ක්‍රමය මීට වඩා ජනතාව අතර ප්‍රචලිත වී තිබුණා නම් එය විශාල පහසුවක් වන්නට ඉඩ තිබුණා. ලෝකයේ වෙනස් වීම හැර අන් සියල්ල වෙනස් වෙනවා. ඒ අනුව මූල්‍ය ක්‍රමයේ ඉතිහාසය තුළ දෙවැනි ලෝක යුද්ධයේදී ද මෙවැනි විනාශයක් වුණා. ලොව සමස්ත මුදල් ක්‍රමය කඩා වැටුණු අවස්ථාවේ වොෂිටන් නුවර පැවැති සම්මේලනයේ දී අන්තර්ජාතික මුදල් අරමුදල වැනි ආයතන බිහිවෙමින් ලෝක මූල්‍ය ක්‍රමය සම්බන්ධයෙන් නව ප්‍රවණතාවක් ඇති වුණා. පසුව විවිධ මූල්‍ය උපකරණ ලෝකයේ බිහි වුණා. ඒ අනුව තාක්ෂණයේ ඇතිව තිබෙන සංවර්ධනය අනුව අවම පිරිවැයක් යටතේ ගෙවීම් හා පියවීම් පද්ධති ලෝකය පුරා දියුණු තත්ත්වයට පැමිණ තිබෙනවා. අපේ කේත භාවිත කරමින් මීට වසර ගණනාවකට පෙර චීනය භාවිත කර තිබෙනවා. තමන්ගේ ජංගම දුරකතනය මඟින් මෙම ගෙවීම් සිදු කර තිබෙනවා. අපේ රට තුළ මූල්‍ය සාක්ෂරතාවය පහළ මට්ටමක පවතින රටක්. මේ රට තුළ විශාල වශයෙන් අවිධිමත් මුදල් වෙළෙඳපළෙක් හා විධිමත් නොවන ආකාරයේ ගෙවීම් සිදු වෙනවා.

මේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ නැති විශාල කළු ආර්ථිකයක් රටේ තිබෙනවා. ඒ තුළ නිල ගනුදෙනු සහ නිල නොවන ගනුදෙනු ජාතික නිමවුම් සංඛ්‍යා ලේඛනවලට ඇතුළත් නොවන කළු ආර්ථික ගණුදෙනු විශාල ප්‍රමාණයක් අපේ රට තුළ සිදු වෙනවා. විධිමත් මුදල් වෙළෙඳපොළ තුළ රාජ්‍ය අංශයත් පෞද්ගලික අංශයත් සියලු දෙනා ශ්‍රී ලංකා







මහ බැංකුව හඳුන්වා දෙන ක්‍රමවේදය වැලඳ ගන්නේ නම් එය අපේ ඉදිරි සංවර්ධනය සහ ජයග්‍රහණය සඳහා අතිශයින්ම වැදගත් වෙනවා. ඒ නිසා මේ වෙනුවෙන් දායක වුණු සියලු දෙනාටම මගේ ගෞරවය පිරිනමනවා. මෙමම විද්‍යුත් ගෙවීම් පියවීමේ පද්ධතිය සමස්ත ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන අද දිනයේ ඒ වෙනුවෙන් දායක වුණු සැමට ප්‍රණාමය පිරිනමනවා. මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ ආයතනවලින් මිල ගණන් කැඳවා තිබෙන බවට අධිපතිවරයා සඳහන් කළා. අපේ රටේ රාජ්‍ය මාධ්‍ය ආයතන සෑම මසකම වැටුප් ගෙවා එම ආයතන පවත්වාගෙන යම සඳහා මහජන බදු මුදලින් මුදල් ගෙවා පවත්වාගෙන යනවා. ඒ නිසා වැඩසටහන් රැසක් කිසිදු ගාස්තුවක් අය කිරීමකින් තොරව ඉටු කර දීමේ වගකීම ඒ මාධ්‍ය ආයතනවලට තිබෙනවා.

ඒ නිසා මේ සම්බන්ධයෙන් කිසිදු ගාස්තුවක් අය කිරීමකින් තොරව ජනතාව දැනුවත් කිරීම සඳහා කර දෙන ලෙස ඉල්ලීමක් කරනවා. මෙමම නව ඩිජිටල් තාක්ෂණික ක්‍රමවේදය පොදු ජනතාව අතර හඳුන්වාදීම සඳහා ඔවුන්ට සහනයක් ලබාදීමට කිසිදු පිරිවැයක් නොදරා ඒ ක්‍රමය වෙනුවෙන් ඇතුළු වීමට ඉඩ ප්‍රස්තා සලසා දියයුතු වෙනවා. රුපියල් 100ට වඩා අඩුවෙන් සිදු වන ගනුදෙනු සඳහා කිසිදු ගාස්තුවක් අය නොකරන්න කියා අගමැති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කර තිබෙනවා. ඒ වගේම ලංකාවේ සියලුම



රාජ්‍ය ආයතන මෙම විද්‍යුත් ගෙවීම් පද්ධතිය භාවිතා කිරීම සඳහා කැපවීමකින් යුතුව ඉදිරිපත් වන්නේ නම් ඒ තුළ විශාල ලෙස රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වැඩි කළ හැකි වෙනවා. ඒ අනුව රාජ්‍ය ආයතන හා අනෙකුත් ආයතන ද මේ වෙනුවෙන් අනුගත වෙයි. කෙටි කලක් තුළ ජනතාවගේ විශ්වසනීය බව තවදුරටත් තහවුරු වන ආකාරයෙන් හා පිරිවැය අවම වන ආකාරයෙන් කාර්යක්ෂමතාව වර්ධනය වන පරිදි ඩිජිටල් ගෙවීම් පද්ධතිය සාර්ථක වේවා.

**මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා-**

මෙය ඉතා වැදගත් ව්‍යාපෘතියක්. මෙය වැදගත් ව්‍යාපෘතියක ආරම්භයක් වෙනවා. එය දිගින් දිගටම ක්‍රියාවේ යෙදෙනවා. නවීන තාක්ෂණය දිනෙන් දින දියුණු වෙනවා. නවීන තාක්ෂණය ඔස්සේ මුහුණ දෙන්නට සිදුව තිබෙන අලුත් තත්ත්වයන් තිබෙනවා. අපට අලුත් අභියෝග තිබෙනවා. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව නවීන තාක්ෂණය සමඟ ඉදිරියට පැමිණ තිබෙනවා. මෙහි නවීකරණය 2002, 2003 වසරවල දී පටන් ගත්තා. එයින් පසුව සෑම වසරකදීම සිදුව තිබෙනවා. ඒ සමගම 2006 වසරේ සිට මොබයිල් ටෙක්නොලොජී මුළු ජාලයටම එකතු කර ගත්තා ගෙවීම් සහ පියවීම් සඳහා. ඒ හරහා සිදුවන සිදුවීම් අද දිගින් දිගටම තවදුරටත් වර්ධනය කර ගන්න හැකිව තිබෙනවා. තාක්ෂණය යොදාගෙන මේ ගෙවීම් කරනවිට සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන්. කල්පනාකාරීව කටයුතු කළයුතු වෙනවා. සයිබර් ආරක්ෂාවක් නොමැතිව මේක කරන්න බැහැ. මෙය ඉතාම පහසුවෙන් සිදු වන නමුත් ඒ කාර්යය පිටුපස දැවැන්ත ක්‍රියාවලියක් සිදු වෙනවා. ඒක මහ බැංකුවෙන් සිදු වෙනවා.

ගෙවීම් සහ පියවීම් එතරම්ම වැදගත් වන්නේ ඒ නිසයි. ගෙවීම් සහ පියවීම්වලට පසුගිය 2005 වසරේ දී පාර්ලිමේන්තුවට විශේෂ පනතක් ගෙනැ විත් තිබෙනවා. එහි වැදගත්කම එයින් තහවුරු වෙනවා. ඒ නිසා අද මෙවැනි දේ කරනවිට සියලු අංග සම්බන්ධයෙන් සොයා බලා කරනවා. ක්‍රෙඩිට් කාඩ්පත් භාවිතය ඉහළ ගොස් තිබෙනවා. ඒ අනුව අද QR කේතයක් හඳුන්වා දී තිබෙනවා. එය රටේ වාණිජමය ක්ෂේත්‍රයට ඉතා වැදගත් වෙනවා. රටක් ලෙස ඉදිරියට යෑම සඳහා මේ කාර්යය ඉතාම වැදගත් වෙනවා. ඉදිරියේ දී සිදුවිය යුතු දේ තිබෙනවා. මේ ක්‍රමවේද හරහා අපි තවදුරටත් අපේ ගෙවීම් සහ පියවීම් වර්ධනය කරන්න අවශ්‍ය වෙනවා. ඒක ඉතාම වැදගත්. විදේශවලින් දැවැන්ත මුදලක් හවාලා ක්‍රමවේදය හරහා අපේ රටට පැමිණෙනවා. එය සිදු වෙනවා. විකල්ප ක්‍රමවේද සොයා ගෙන ඒ අනුව කටයුතු කරගෙන යනවා. මෙවැනි ක්‍රමවේද හරහා පහසුකර ආරක්ෂා සහිතව අඩු පිරිවැයකට කරන්න පුළුවන් නම් විදේශ ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට ද මේ රටට මුදල් එවන්න පුළුවන්කම තිබෙනවා. එය කරන්න පුළුවන් නම් අපේ රටට ගලාඑන මුදල අවම පිරිවැයකින් කරන්න පුළුවන් වෙයි.

ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් සම්බන්ධ නියමුවා ශ්‍රී ලංකා මහ බැංකුවයි. ඒ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවට තිබෙනවා. ඒක හරියාකාරව කරන්න සියලු තාක්ෂණ වර්ධනය සමඟ කටයුතු කළයුතු වෙනවා. අනාගත අභියෝග තිබෙනවා. තාක්ෂණයෙන් ඉක්මනින් ඉදිරියට යනවා. ඉදිරියේ දී තාක්ෂණය සමග ඉදිරියට යන්න සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් සොයා බැලිය යුතු වෙනවා. තාක්ෂණය සම්බන්ධයෙන් හොඳ අවබෝධයක් ද පැවතිය යුතු වෙනවා.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතා-**

ඩිජිටල් ගනුදෙනු වර්ෂය මේ වනවිට අප ගත කරමින් සිටිනවා. මේ වසර ඩිජිටල් ගනුදෙනු වසර ලෙස නම් කර තිබෙනවා. මහජනතාව අතර භෞතික වශයෙන් මුදල් භාවිතය අවම කොට ඩිජිටල් ගනුදෙනු වැඩි කිරීමයි අපේ අරමුණ. ඒ සඳහා රටපුරා QR කේතය අද හඳුන්වා දෙනවා. මේ කාර්යය වෙනුවෙන් දායක වූ සැමට මගේ ගෞරවය පිරිනමනවා. සමාජය තුළ ඩිජිටල් ගෙවීම් ක්‍රම ප්‍රචලිත කිරීමෙන් රටේ මුදල් භාවිතය පවත්වාගෙන යෑමට දරන පිරිවැය අවම කරගන්න පුළුවන් වෙනවා. නව්‍ය තාක්ෂණික ක්‍රමවේද භාවිතය තුළින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ අවශ්‍යතා සඳහා රටක් වශයෙන් ශක්තිමත්ව මුහුණ දීමට අපිට හැකියාව ලැබෙනවා. එසේම එමඟින් රාජ්‍ය හා පෞද්ගලික අංශවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, මූල්‍ය සුරක්ෂිතතාව තහවුරු කිරීම යනාදී ප්‍රයෝජන රැසක් අත් වෙනවා. මේ සියල්ල මූල්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයටත් ඒ හරහා ආර්ථික සංවර්ධනයටත් විශාල රුකුලක් වෙනවා. කොවිඩ් -19 වසංගත තත්ත්වය උග්‍රව පැවැති කාලය තුළ එම තත්ත්වයට ශක්තිමත්ව මුහුණදීමට ඩිජිටල් ගෙවීම් ක්‍රම මහත් පහසුවක් වුණා.

කෙසේ වුවද එම කාලයේ දී රට තුළ සංසරණය වූ මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 770ක් පමණ වුණා. ඒ තත්ත්වය තුළ භෞතික මුදල් පරිහරණය අවම කරන ක්‍රමවේද හඳුන්වාදීම තවදුරටත් කළ යුතු වෙනවා. එමඟින් රටේ මුදල් නිකුතුව අඩු කර වියදම් අඩු කර ගැනීම හා වසංගත තත්ත්වයක දී භෞතික වශයෙන් මුදල් භාවිතයෙන් සිදුවන රෝග ව්‍යාප්තියේ අවදානම අඩු කර ගන්න පුළුවන්. අන්තර්ජාතික ප්‍රමිතීන්ට හා පරිචයන්ට අනුව මූල්‍ය වෙළෙඳපොළ සම්බන්ධ නවීන යටිතල පහසුකම් ගොඩනැඟිය යුතු වෙනවා. ඊට අදාළ නෛතික තත්ත්වය ස්ථාපනය විය යුතු වෙනවා. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වගකීමෙන් කටයුතු කරනවා. මෙමම නව්‍ය තාක්ෂණික සංකල්ප මහජනතාව වෙත ගෙන යෑමට බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු වෙත වගකිව යුතු කාර්යභාරයක් පැවරී තිබෙනවා. 2020 වසර තුළ මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය වෙනුවෙන් වැදගත් කාර්යයන් රැසකට පිවිස තිබෙනවා.

ඩිජිටල් ගෙවීම් ක්‍රමය ඔස්සේ 'ඉටුකම' අරමුදල වෙත මුදල් පරිත්‍යාග කිරීම ද වෙළෙඳ ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා අතින් මෙහිදී සිදු විය.

රාජ්‍ය ඇමැතිවරුන් වන ශෙහාන් සේමසිංහ, ලසන්ත අලගියවන්න, භාණ්ඩාගාර ලේකම් එස්.ආර්. ආටිගල, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කුමාරතුංග මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

ඡායාරූප - වාසිත පටබැඳිගේ

# අගමැතිගේ සහාය හිමි වූයේ මුල් මාස හය තුළදී පමණයි

## ● හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

**සුභාෂිණී සේනානායක**

යහපාලන ආණ්ඩුවේ වසර පහටම අගමැතිවරයා, කැබිනට් මණ්ඩලයේ සහ පාර්ලිමේන්තුවේ සහාය තමාට හිමි වූයේ මුල් මාස හය තුළදී පමණක් බව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඊයේ 05 පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

කිසිදු ජනාධිපතිවරයෙක් නොකරන ආකාරයට රට වෙනුවෙන් කටයුතු කිරීමට ඒ අය සමඟ සුහදව සාකච්ඡා කරමින් කටයුතු කළ බව කියා සිටි ඒ මහතා පූර්ණ වශයෙන් සහායක් නොලැබුණු බවද ඒ මහතා කියා සිටියේය.

පළමුව මහබැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් පත් කිරීමේදී ගැටලු මතු වුණා. දෙවනුව මහබැංකු මූල්‍ය වංචාව සම්බන්ධයෙන් ජනාධිපති කොමිසමක් පත් කිරීම යන සිද්ධීන්වලට පසුව ප්‍රශ්න ගණනාවකට මුහුණ දීමට සිදු වුණා යැයිද ඒ මහතා කියා සිටියේය.

ද්වීපාර්ශවික ආණ්ඩුවේ මුස්ලිම් කණ්ඩායම්වල සහායද හිමිවූයේ අනෙක් පාර්ශවයට බවද හිටපු ජනාධිපති වරයා කොමිසමට කියා සිටියේය.

මම ජනාධිපතිවරයා ලෙස පත්වූ පසුව ඇති වූ ස්වාභාවික ආපදා, පෙළපාලි උද්ඝෝෂණ නිසා මම පත්වූ මානසික පීඩනය අති විශාලයි.

කොලොන්නාව කුණු කන්ද, සාමසර කන්ද නායයාම, සාලාව අවිකම්හලේ පිපිරීම, දිගන සිද්ධිය, රණවිරු උද්ඝෝෂණ වගේම වසර දෙකක් පුරා පැවැති සයිටම් උද්ඝෝෂණ මාව විශාල පීඩාවට පත් කළා යැයි හිටපු ජනාධිපතිවරයා කියා සිටියේය.

# නිකාහය තහනම් කරන ලෙස පැමිණි යෝජනාවට හිටපු අගමැති රනිල් විරුද්ධ වූවා

## ● හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

**සුභාෂිණී සේනානායක**

නිකාහය තහනම් කරන ලෙස ආරක්ෂක මණ්ඩලයට පැමිණි යෝජනාවට හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විරුද්ධ වූ බව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඊයේ (05) පාස්කු කොමිසමේදී අනාවරණය කළේය.

ඒ අවස්ථාවේ ISIS ත්‍රස්තවාදීන් ලෝකයේ ආරක්ෂාව අතින් සන්නද්ධ රටවලට පවා ප්‍රහාර එල්ල කර තිබූ බවත්, එම යෝජනාව පැමිණි විගස ක්‍රියාත්මක වීමට මා ඇතුළු ආරක්ෂක මණ්ඩලයේ සිට සියලු දෙනා කැමැත්ත පළ කළ ද, රනිල් වික්‍රමසිංහ මහතා කල් ඉල්ලා සිටි බවත් කැබිනට් මණ්ඩලයේදී පවා මේ ප්‍රශ්නය මතු වී නැවතුණු බවත් ඒ මහතා කියා සිටියේය.

අන්තවාදීන් පාලනය කිරීමට මේ තත්ත්වය විශාල ලෙස පැවැති බව කියා සිටි මෛත්‍රීපාල සිරිසේන මහතා අගමැතිවරයාගේ දැඩි විරෝධය හමුවේ නිකාහය තහනම් කිරීම තාවකාලිකව නතර කළ බවත් එම කාලය දීර්ඝවීම සිදුවූ බව කියා සිටි ඒ මහතා, ආරක්ෂක මණ්ඩලයේ කතා කළ අතිශය රහස්‍ය කරුණු පුවත්පත්වල පවා එම රැස්වීමෙන් පසුව පළ වූ බවත් කීවේය.

නිකාහය පැලඳ යන කාන්තාවන් පරීක්ෂා කරන්න බැහැ කියලා මේ යෝජනාව ආවේ. එහිදී රටේ ආරක්ෂාව පතා අපිට එය ක්‍රියාත්මක කරන්න අවශ්‍යතාවය තිබුණා. ප්‍රංශය වගේ දියුණු රටවල පවා නිකාහය ඒ අවස්ථාවේ තහනම් කර තිබුණා. සමහරුන් ආරක්ෂක මණ්ඩල රැස්වීමට ගෙන් වූයේ නෑ කියලා මට චෝදනා කරනවා. අපි ඒ රැස්වීමේ කතාකරන සමහර දේවල් පුවත්පත්වල පළ වෙනවා. ඒ නිසා ජාතික ආරක්ෂාව සහතික කිරීම වෙනුවෙන් පැවැත්වෙන ආරක්ෂක මණ්ඩලයේ රහස්‍යභාවය සුරැකීමට ඇතැමුන් එම රැස්වීමට ගෙන්වීම සීමා කිරීමට මට සිදුවූ බව ද හිටපු ජනාධිපතිවරයා පෙන්වා දුන්නේය.

යහපාලන ආණ්ඩුව තිබුණේ සුළුතරයකින්. විපක්ෂයට හෝ ආණ්ඩුවට බලයක් තිබුණේ නැහැ. මුස්ලිම් නායකයන් නියෝජනය ආණ්ඩුව සමඟ තිබුණේ. ඒ අය විරුද්ධ වුණොත් ආණ්ඩුව කරගන්න බැරිවේවි කියා රනිල් වික්‍රමසිංහ මහතා සිතන්නට ඇති යැයි ද එම නිසා නිකාහය තහනම් කිරීම නතර කරන්න සිදුවූ බව ද හිටපු ජනාධිපතිවරයා කියා සිටියේය.

# තර්ජන ගර්ජන හමුවේ මත්ද්‍රව්‍ය මර්දන සටන කිසි විටකත් අත්හරින්නේ නෑ

## ● ආරක්ෂක ලේකම් (විශ්‍රාමික) මේජර් ජනරාල් කමල් ගුණරත්න

**රත්නසිරි පතිරණ සහ රක්ෂණ ශ්‍රියන්ත**

සංවිධානාත්මක අපරාධ කල්ලි සහ මත්ද්‍රව්‍ය ජාවාරම මර්දනය කිරීමට පෙරමුණ ගෙන කටයුතු කිරීමේදී ජනාධිපතිවරයාට තමන්ට සහ තම පවුලේ සියල්ලන්ටම මරණීය තර්ජන එල්ලවී ඇති බවත්, එවැනි තර්ජන ගර්ජන හමුවේ ආරම්භ කර ඇති මේ සටන කිසි විටකත් අත් නොහරින බව ආරක්ෂක ලේකම් (විශ්‍රාමික) මේජර් ජනරාල් කමල් ගුණරත්න මහතා කියා සිටියේය.

පසුගිය මස පමණක් රතු නිවේදන 18ක් නිකුත් කරමින් විදේශ වල සිටින සංවිධානාත්මක අපරාධ කරුවන් හා මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් මෙරටට ගෙන්වා ගැනීමට රාජ්‍ය තාන්ත්‍රිකව කටයුතු කර ඇති බවද ආරක්ෂක ලේකම්වරයා පෙන්වා දුන්නේය.

ආරක්ෂක ලේකම්වරයා මේ බව ප්‍රකාශ කළේ ඊයේ (05) ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැති විශේෂ මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

ප්‍රබල සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් සහ අන්තර්ජාතික මත්ද්‍රව්‍ය ජාවාරමේ ප්‍රබලයන් වන පකිස්ථානු ජාතිකයන් හතර දෙනෙකු ඇතුලු මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මේ වන විට බූස්ස බන්ධනාගාරයේ රඳවා ඇති බවත් එම බන්ධනාගාරයට නවීන ආරක්ෂිත උපකරණ ලබා දී ඔවුන්ට පිටස්තර ලෝකය සමග සම්බන්ධතා පැවැත්වීම අවහිර කර ඇති අතර අධි ආරක්ෂාවක්ද ලබාදී ඇත්තේ මේම ජාවාරමේ කොඳු නාරටිය බිඳ දැමීමට බවද ආරක්ෂක ලේකම්වරයා කියා සිටියේය.

එසේම ප්‍රාදේශීය මට්ටමේ මත්ද්‍රව්‍ය බෙදා හරින්නන්ද බොහෝ පිරිසක් මේ වන විට අත්අඩංගුවට ගෙන ඇති බවත් මත් ද්‍රව්‍ය ලොලීන්ද බොහෝ ප්‍රමාණයක් අත්අඩංගුවේ පසුවන බව පෙන්වා දුන් ආරක්ෂක ලේකම්වරයා මේ වන විට ඉතිරිව ඇත්තේ සුළු පිරිසක් බවද කියා සිටියේය.

මේ වන විට මත්ද්‍රව්‍ය ලෝලීන් ලක්ෂ හතරක් පමණ මෙරට තුළ සිටින බවත් ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා අන්තරායකර ඖෂධ පාලන ජාතික මණ්ඩලය සමග එක්ව විශාල වැඩ කොටසක් ආරම්භ කර ඇති බවද කියා සිටියේය.

ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා විසින් මත්ද්‍රව්‍ය ලෝලීන් පුනරුත්ථාපනය කිරීම සඳහා ඇඹිලිපිටිය යොවුන් නිකේතනය ලබාදීමට කටයුතු කර ඇති බවත් එහි හාරදහසක පමණ පිරිසක් පුනරුත්ථාපනය කිරිමට පහසුකම් ඇති බවද ආරක්ෂක ලේකම්වරයා කියා සිටියේය.

මීට අමතරව නිට්ටඹුව, විරවිල, පල්ලන්සේන වැනි ස්ථානවලද මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවුවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන ආරම්භකිරීමට කටයුතු කර ඇති බවද පෙන්වා දුන්නේය.

# 17ක් ස්වයං නිරෝධායනයට

**අසේල කුරුළුවංශ**

කොවිඩ්-19 වයිරසය ආසාදිත බවට තහවුරුවූ පෞද්ගලික ආයතනයේ කාන්තාව සමඟ එම ආයතනයේ සේවය කළ මධ්‍යම පළාතේ පුද්ගල පිරිසක් හඳුනා ගැනීමෙන් පසු මේ වන විට මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක වල 17 දෙනෙකු ස්වයං නිරෝධායනයට යොමුකර තිබෙන බව මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය නිහාල් වීරසූරිය මහතා පවසයි.

මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවල අට දෙනා බැගින්ද නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් අයෙකුද මෙලෙස නිරෝධායනයට යොමුකර තිබෙන බවත් ඔවුන් අතරින් උණ සහිත රෝග ලක්ෂණ පෙන්නුම් කළ දෙදෙනෙකුගේ පී.සී.ආර් පරීක්ෂණ සිදු කළ බවත් ඒ මහතා කීය.

මධ්‍යම පළාත් ආණ්ඩුකාර කාර්යාලයේදී ඊයේ (05) පැවැති කොවිඩ්-19 රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා වන මධ්‍යම පළාත් කාර්ය සාධන බළකායේ විශේෂ රැස්වීමේදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා මේ බව පැවසුවේය.

මෙම කාර්ය සාධක බලකා රැස්වීම ඇමතූ මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් ගමගේ මහතා සඳහන් කළේ මෙම රෝග පාලනය සඳහා මධ්‍යම පළාත් තුළ සෞඛ්‍යාරක්ෂක ක්‍රමවේද ඉතා තදින් ක්‍රියාත්මක කරන බවයි. මෙම සෞඛ්‍ය ක්‍රමවේදවලට පටහැනිව කටයුතු කරන අයට එරෙහිව නීතිය තදින් ක්‍රියාත්මක කරන්නැයි පොලිසියට හා ආරක්ෂක අංශ වෙත උපදෙස් ලබාදී තිබෙන බවද ඒ මහතා කීය.

# ගම්පහ අයකුට කොවිඩ් ලක්ෂණ නම් ළඟම රෝහලකට යන්න

## විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර

**සන්ධ්‍යා කරුණාරත්න**

ගම්පහ දිස්ත්‍රික්කය තුළ කිසියම් පුද්ගලයෙකුට උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, උගුරේ වේදනාව, ස්වසන අපහසුතා යනාදි කොවිඩ් - 19 වෛරසයට අදාළ රෝග ලක්ෂණ පවතින්නේ නම් ළඟම ඇති ප්‍රධාන රෝහලකට ගොස් ප්‍රතිකාර ලබා ගන්නා ලෙස වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා මහජනතාවට දැනුම්දීමක් සිදු කරයි.

එවැනි රෝග ලක්ෂණ සහිත කෙනෙක් රෝහලට යන්නේ නම් පොදු ප්‍රවාහන සේවාව භාවිතා නොකර පෞද්ගලික වාහනයක හෝ එසේ නොහැකි නම් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට දැනුම් දී හෝ රෝහල්ගත වීම ආරක්ෂාකාරී බවත් ඒ මහතා අවධාරණය කළේය.

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමින් ඒ මහතා මේ බව ඊයේ (05) ප්‍රකාශ කළේය.

කොවිඩ් - 19 සම්බන්ධයෙන් දැන ගැනීමට පැය විසි හතරම ක්‍රියාත්මක ක්ෂණික දුරකතන අංකයක් '1999 - සුවසැරිය' සේවාව සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රජා සත්කාරයක් ලෙස ක්‍රියාවට නංවා ඇති අතර සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම අවශ්‍ය තොරතුරු දැන ගත හැකි ය.

කොරෝනා වළක්වා ගැනීම සම්බන්ධයෙන් පවතින සෞඛ්‍ය උපදෙස් මහජනතාව පිළිපැදීම ගැන සෑහීමකට පත් විය නොහැකි බවත් මෙම අවදානම් අවස්ථාවේදීවත් එම උපදෙස් නිසි ලෙස පිළිපැදීමට ජනතාව කටයුතු කළ යුතු බවත් වෛද්‍ය සමරවීර මහතා පැවැසුවේය.

රට වසන්නේද යන්න සම්බන්ධයෙන් තීරණය කරනුයේ ජනතාවගේ ක්‍රියාකලාපය අනුව බව ද ඔහු කීය.

# සතොසින් සියලු භාණ්ඩ හිඟයකින් තොරව

මානෙල් පුෂ්ප කුමාරි



මේ වන විට රටේ ඇති වී තිබෙන කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ සියලු භාණ්ඩ හිඟයකින් තොරව සතොස මඟින් බෙදා හැරීමට සූදානම් කර ඇති බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන පැවසීය.

අමාත්‍යවරයා මේ බව ප්‍රකාශ කළේ, ඊයේ (5) කොළඹ, වොක්ෂෝල් වීදියේ පිහිටි වෙළෙඳ අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ පැවැති මාධ්‍ය හමුවකදීය.

මුළු රට පුරාම ඇඳිරි නිතීය පැන වූ අවස්ථාවේදීත් හිඟයකින් තොරව පාරිභෝගිකයාට ආහාර බෙදා දුන් බවද අමාත්‍යවරයා අවධාරණය කළේය.

# චෛතියගිරියේ හොර ගිනි අවි කම්හලක්

## අවි-පතොරම් සමඟ සැකකරුවෙක් කොටු වෙයි

**රක්ෂණ ශ්‍රියන්ත**

චෛතියගිරිය ප්‍රදේශයේ පවත්වාගෙන ගිය නීති විරෝධී ගිනි අවි කම්හලක් වටලා අවි විශාල තොගයක්, පතොරොම් සහ නිෂ්පාදන උපකරණ සමඟ සැකකරුවකු හුංගම පොලීසිය පෙරේදා (4) අත්අඩංගුවට ගෙන තිබේ.

බෝර 12 වර්ගයේ ගිනි අවියක්, මෙරට නිෂ්පාදිත ගිනි අවි 11ක්, බෝර 12 වර්ගයේ ජීව පතොරොම් 7ක්, බෝර 12 වර්ගයේ හිස් පතොරොම් කොපු කොපු 15ක්, ඊයම් කූරු13ක්, ඊයම් කැට 33ක්, අහස් කූරු 10ක්, කැප් රෝලයක්, යකඩ කේබල් 14ක් සැකකරු සන්තකයේ තිබී අත්අඩංගුවට ගත් බව පොලීසිය පැවසීය.

අත්අඩංගුවට පත් සැකකරු වයස අවුරුදු 59ක් වූ චෛතියගිරිය බටහත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. සැකකරු ඊයේ (5) අඟුණකොළපැලැස්ස මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. හුංගම පොලීසිය වැඩිදුර විමර්ශන පවත්වයි.

# බන්ධනාගාර රැඳවූවන් හමු වීම යළි දන්වන තුරු අත්හිටුවයි

බුද්ධිකා ඉඹුලාන

සියලු බන්ධනාගාරවල සිටින රැඳවූවන් හමු වීම සඳහා අමුත්තන් පැමිණීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවීමට තීරණය කර ඇතැයි බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන හා පාලන) චන්දන ඒකනායක මහතා පැවසීය.

දිවුලපිටිය ප්‍රදේශයෙන් කොරෝනා ආසාදිත කාන්තාවක් හඳුනා ගැනීමත් ආසාදිත කාන්තාවගේ ආශ්‍රිතයන් 69දෙනකුට කොවිඩ් ආසාදනය වී ඇතැයි තහවුරු වීමත් සමගම සෞඛ්‍ය අංශ අනුගමනය කෙරෙන දැඩි ආරක්ෂක ක්‍රමවේද මත, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතාගේ උපදෙස් අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව මෙම පියවර ගත් බව කොමසාරිස් වරයා කීය.

මහර සහ මීගමුව බන්ධනාගාරවලට රැඳවියන් බැලීම සඳහා අමුත්තන් පැමිණීම පෙරේදා (4) සිට නවතා දැමීම මෙයට පෙර සිදු කර තිබිණි.

එමෙන්ම, බන්ධනාගාරවල රාජකාරි කටයුතු සඳහා පැමිණෙන නිලධාරීන්ටද, නිසි සෞඛ්‍යාරක්ෂක ක්‍රමවේද අනුගමනය කරන ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුව උපදෙස් ලබා දී ඇත.

# සෞඛ්‍ය ආරක්ෂිත මුහුණු ආවරණ රුපියල් 20ක අවම මුදලකට දෙනවා

## වෙළෙඳ ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන

**මානෙල් පුෂ්ප කුමාරි**

කොවිඩ් වසංගත තත්ත්වය තුළ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂිත උපකරණයක් ලෙස මුහුණු ආවරණ අවම මිලකට ලබා දීමට වෙළෙඳ අමාත්‍යාංශය තීරණය කළ බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන පැවසීය.

අමාත්‍යවරයා මේ බව ප්‍රකාශ කළේ, ඊයේ (05) කොළඹ,වොක්ෂෝල් වීදියේ පිහිටි වෙළෙඳ අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේ දී පැවැති මාධ්‍ය හමුවකදී ය.

ශ්‍රී ලංකාවේ ඉපැරණි ව්‍යාපාරයක් වන දාස සමූහ ව්‍යාපාරය මඟින් මෙම ආරක්ෂිත මුඛ ආවරණය රුපියල් 20 ක අවම මුදලකට අද (05) සිට සතොස හරහා බෙදා හරින බව වෙළෙඳ ඇමැතිවරයා කියා සිටියේ ය.

එම මුඛ ආවරණවල ප්‍රමිතිය පිළිබඳ තත්ත්වය එම ආයතනයේ නිලධාරිනියක් මේ අවස්ථාවේ දී පෙන්වා දුන්නාය. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් මේ මුඛ ආවරණයට ප්‍රමිති සහතිකයක් නිකුත් කර තිබේ.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූඇමැතිවරයා මේ බවද කියා සිටියේ ය.

කොවිඩ් දරුණුම වසංගතය තුළ ජීවිත අවදානමක් තිබෙනවා. ලෝකය පුරා මිලියන 35කට අධික මිනිස් ජීවිත ප්‍රමාණයක් මේ ආසාදනයට ගොදුරු වී තිබෙනවා. ඒ වගේම දස ලක්ෂයකට අධික පිරිසකගේ ජීවිත අහිමි වී තිබෙනවා. නමුත් ලංකාවේ මේ වසංගතය හේතුවෙන් ජීවිත 13ක් පමණක් අහිමි වුණා. අප රටට මෙය සැහෙන දුරකට පාලනය කරගත හැකි වුණා. එසේ පාලනය කර ගැනීමට හැකි වුණේ මුහුණු ආවරණ පැළඳීමත් අත් සෝදා ගැනීමත් දුරස්ථභාවය තබා ගැනීමත් නිසයි. ඉතාම හොඳ පෙරණයන් 03ක් සහිතව නිෂ්පාදනය කර ඇති මේ මුහුණු ආවරණය ගුණාත්මක බවින් උසස් එකක්. පසුගිය කාලවල විවිධ රුපියල් 45ක් 60ක් වැනි මුදලකට මුහුණු ආවරණ විකුණුනා. වෙළෙඳ අමාත්‍යාංශය මැදහත් වුණා ගිවිසුමකට අනුව ඉහළ ගුණාත්මක බවින් යුතු මුහුණු ආවරණ ගන්න. අවබෝධතා ගිවිසුමක් යටතේ රටපුරා මේ මුහුණු ආවරණ බෙදා හැරීමට තීරණයක් ගත්තා. රාජ්‍ය ආයතනවලට රුපියල් 17.50 කටත් පාසල්වලට විශ්වවිද්‍යාලවලට ඊටත් අඩු මිලකට මේ මුහුණු ආවරණ ලබාදීමටත් බලාපොරොත්තු වන බවත් වෙළෙඳ ඇමැතිවරයා කීය.

# ඉකුත් මාස නවයට මී උණ රෝගීහු 6118ක් හමු වෙති

## වසර 7කට පසු වාර්තා වූ වැඩිම රෝගීන් පිරිස

**සන්ධ්‍යා කරුණාරත්න**

ගෙවී ගිය මාස නවයක කාලයේ 6118ක් ලෙස වැඩිම මී උණ රෝගීන් සංඛ්‍යාවක් මෙරටින් වාර්තා වී ඇති බව වසංගත රෝග විද්‍යා අංශය පවසයි.

වසර හතකට පසු වැඩිම මී උණ රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මේ වසරේ ගෙවී ගිය මාස නමයක කාලයේ බවද එම අංශය සඳහන් කරයි.

මේ වසරේ වාර්තා වූ සමස්ත මී උණ රෝගීන්ගෙන් 1340 ක් ලෙස වැඩිම රෝගීන් සංඛ්‍යාවක් රත්නපුර දිස්ත්‍රික්කයෙන් ද, කළුතර දිස්ත්‍රික්කයෙන් 714ක් ද, ගාල්ල දිස්ත්‍රික්කයෙන් 635ක් ද, කෑගල්ල දිස්ත්‍රික්කයෙන් 461ක් ද වාර්තා වී තිබේ.

මොණරාගල දිස්ත්‍රික්කයෙන් හැර සෑම දිස්ත්‍රික්කයකින්ම මී උණ රෝගීන් වාර්තා වී ඇත.

ජනවාරි 665ක්, පෙබරවාරි 457ක්, මාර්තු 227ක්, අප්‍රේල් 156ක්, මැයි 1311ක්, ජූනි 1188ක්, ජූලි 696ක්, අගෝස්තු 585ක්, සැප්තැම්බර් 833ක් වාර්තා වී තිබේ.

පසුගිය වසරේදී මී උණ රෝගීන් 6021 ක් ද, 2018 වසරේදී 5257ක් ද, 2017 වසරේදී මී උණ 3601 ක්, 2016 වසරේදී 4005ක්, 2015 වසරේදී 4402 ක්, 2014 වසරේදී 3214ක්, 2013 වසරේදී 4276ක් වාර්තා වී තිබේ.

# රිය අනතුරකට ලක්ව දැනට කෝමා තත්ත්වයේ පසුවන රශ්මිතට අධ්‍යාපන ඇමැතිගෙන් මූල්‍ය ප්‍රතිපාදනයක්



මීට දෙවසරකට පෙර බරපතළ රිය අනතුරකට ලක් ව දැනට කෝමා තත්ත්වයේ පසුවන ගාල්ල නෙලුව දික්හේනේ පදිංචි 13 වියැති චමෝද් රශ්මිත දරුවාගේ ඉදිරි කටයුතු වෙනුවෙන් අධ්‍යාපන ඇමැති, මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා සිය පෞද්ගලික මැදිහත්වීමෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ දී පෙරේදා (4) සිදුකෙරුණි.

මෙම සිසුවා මාර/ කළුබෝවිටියන විද්‍යාලයේ සිට නිවෙස බලා ගමන් ගත් ලොරි රථය මාර්ගයෙන් ඉවතට පෙරළී යාමෙන් සිදුවූ මෙම බරපතළ අනතුර හේතුවෙන් ඔහුගේ පවුලේ සියලුදෙනා ද මේ වනවිට දැඩි ආර්ථික අපහසුතාවට පත්ව සිටිති. එම තත්ත්වය සැලකිල්ලට ගනිමින් මෙම සිසුවාගේ වැඩිමහල් සොහොයුරිය ට සිය අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට ඉදිරියේ දී සහාය ලබාදීමට ද අධ්‍යාපන ඇමැතිවරයා එකඟත්වය පළ කළේය. එම දැරිය වෙත පොත් පත්, පාසල් බෑග් ඇතුළු උපකරණ ලබාදීමට ද මෙහි දී කටයුතු කෙරිණි.

එසේම, මෙම සිද්ධියට අදාළ ප්‍රවෘත්තිය වාර්තා කරමින් හරවත් මාධ්‍ය මෙහෙවරක නිරත වූ රනිල් ප්‍රියංග ගමගේ මාධ්‍යවේදියා වෙත ඇගයීම් ප්‍රණාම පිරිනැමීම ද අධ්‍යාපන ඇමැතිවරයා අතින් සිදුවිය.

වැවිලි කර්මාන්ත ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ, පාර්ලිමේන්තු මන්ත්‍රී මොහාන් පී. සිල්වා මහත්වරු ඇතුළු පිරිසක් ද මේ අවස්ථාවට සහභාගී වූහ.

# දේශීය හඳුන්කූරු නිෂ්පාදකයන් මුහුණපා ඇති ගැටලුවලට විසඳුම් දීමේ සාකච්ඡාවක්



**රක්ෂණ ශ්‍රියන්ත**

දේශීය හදුන්කූරු නිෂ්පාදකයන් මුහුණපා ඇති ගැටලුවලට විසදුම් දීමේ අරමුණෙන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් හදුන්කූරු නිෂ්පාදකයන්ගේ පාර්ශ්වය සහ අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ රජයේ ආයතනයන්හි ප්‍රධානීන් එක් කරගනිමින් විශේෂ සාකච්ඡාවක් කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් පස කර්මාන්ත අමාත්‍යංශයේ දී පැවැත්වීය.


මේ වනවිට ඔවුන් මුහුණ දී ඇති ප්‍රධානතම ගැටළුව වන්නේ හදුන්කූරු නිෂ්පාදනයට අවශ්‍ය මූලිකම අමුද්‍රව්‍ය වන උණ කූරු අවශ්‍යතාව සපුරා ගැනීමට නොහැකි වීම බව මෙම සාකච්ජාවේදී දීර්ඝ වශයෙන් හදුන්කූරු නිෂ්පාදකයින් ඇමැතිවරයාට පෙන්වා දෙන ලදී.

එහිදී ඇමැතිවරයා විසින් පැමිණ සිටි නිලධාරින් අමතා දේශීය වශයෙන් එම උණ කූරු නිෂ්පාදනයට අවශ්‍ය උණ වගාකිරීමට ඇති හැකියාව විමසා බලන ලදී. වර්තමාන රජය හදුන්කූරු ආනයනය නතර කිරීම නිසා දේශීය වෙළෙන්දාට හොද වෙළෙඳපොළක් විවෘතව ඇති බවත් එම අවශ්‍යතාව සපුරාලීමට දේශීය නිෂ්පාදකයාට හැකියාව ඇති නමුත් උණ කූරු නොමැති වීම නිසා එම ව්‍යාපාර අවදානම් සහගත තත්ත්වයට පත්ව ඇති බවත් නිෂ්පාදකයෝ පේනවා දුන්හ. එහිදී ඇමැතිවරයා පැමිණි සිටි නිලධාරීන්ට උපදෙස් දුන්නේ හැකි ඉක්මනින් දේශීය උණ කූරු ලබා ගැනීමට අවශ්‍ය උණ වගාවන් සිදුකරන ලෙස ය.

# සුගන්ධවත් පරසතු මල



# ගාමිණී





එක්වරම ඔහු කැමරා අධ්‍යක්ෂගෙන් විමසුවේ රූපගත කිරීමට යොදා සිටි ලෙන්සය කුමක්ද යන්නය. කැමරා අධ්‍යක්ෂවරයා අදාළ ලෙන්සය කවරේදැයි කියා සිටියේය.

"ඒක නෙවෙයි. අහවල් ලෙන්ස් එක දාන්න"

ගාමිණි ෆොන්සේකා පැවසුවේ දර්ශන තලයේ ස්ථානගත වෙමින්ය. මේ අත්දැකීමෙන් අන්දමන්ද වූ මම පසුව ඒ ගැන කැමරා අධ්‍යක්ෂගෙන් විමසීමි.

"ඒ තමයි ගාමිණි. සෙට් එකේ ඉඳගෙන ලෙන්ස් එක කියලා ෆ්‍රේම් එක හදනවා. ඒක අපි හැදුවට වඩා හරි."

1924 වසරේ උපන් ලාංකික සිනමා නාමාවලියේ එබඳු හපන්කමක් කළ හැකි අධ්‍යක්ෂවරුන් හෝ සිටියහොත් ඒ අතැඟිලිවලින් ගණනය කළ හැකි සංඛ්‍යාවකි.

1936 වසරේ දෙහිවල විලියම් ෆොන්සේකාට හා ඩේසි සේරම් යුවළට දාව උපන් තුන්වැනි දරුවාට නම තැබුණේ සෙම්බුගේ ගාමිණි ෂෙල්ටන් ෆොන්සේකා යනුවෙනි. ඔහුට අක්කලා දෙදෙනෙකි. බාලව උපන් මල්ලී දින ගණනකට වඩා ජීවත් වූයේ නැත. අසල ප්‍රෙස්බිටීරියන් බාලිකා විදුහලෙන් පසු ගල්කිස්ස සාන්ත තෝමස් විදුහලෙන් අධ්‍යාපනය හැදෑරූ ගාමිණි ෆොන්සේකා සාමාන්‍ය පෙළින් පසු පාසල් අධ්‍යාපනය අතහැරියේය. ඒ වීජ ගණිතය සම්බන්ධව පැවැති ආකල්පය නිසාය. පාසැල් වේදිකාවේදී මුල්වරට රංගනයට පිවිසෙන ගාමිණි පෙනුමෙන් එකල සාම්ප්‍රදායික සිනමා වීරයාට වඩා වෙනස් දේහ ලක්ෂණවලින් යුක්ත විය. එහෙත් ඔහුගේ රූපයට සිනමා කැමරාව ආදරය කළේය. දැවැන්ත සිනමා තිරය ඔහුගේ ප්‍රතාපවත් හා කඩවසම් සිරුර මෙන්ම නළුවකු ලෙස ඔහු තුළ පැවැති කෞශල්‍යය හා මුසුව ප්‍රේක්ෂකයන් වසඟයට ගත්තේය.

ඔහු සිනමාවට පිවිසෙනුයේ දේශීය සිනමාවේ හැරවුම් ලක්ෂ්‍යයක් වන රේඛාව චිත්‍රපටයේ සහාය අධ්‍යක්ෂවරයකු ලෙසය. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ රේඛාව නිර්මාණයේදී ඔහු මුලින් යොමුවනුයේ කැමරා අංශයට වුවත් ඉතා ඉක්මනින් ඔහු නිෂ්පාදන අංශයට එක්විය. ඒ එහි නිෂ්පාදන කටයුතු බාරව සිටි ප්‍රේමනාත් මොරායස්ගේ හා ඩෑන් සෙල්වදොරේගේ මඟ පෙන්වීම යටතේය. එයට පෙර සිරිසේන විමලවීරයන්ගේ නවජීවන චිත්‍රාගාරයට යන ගාමිණි, විමලවීරයන් අතින් ප්‍රතික්ෂේප වන්නේය. විමලවීරයන් අතින් ප්‍රතික්ෂප වන තිදෙනෙක්ම පසුකාලින සිංහල සිනමාවේ දැවැන්තයෝ බවට පත්වෙති. ගාමිණි හැරුණු විට ජෝ අබේවික්‍රම හා එච්.ආර්.ජෝතිපාල අනිත් දෙදෙනාය. රේඛාව චිත්‍රපටයේ නිෂ්පාදන කටයුතු අතරතුර එක් දර්ශනයකට යාන්තම් ඔළුව දමා ගැන්ම ගාමිණි චිත්‍රපටයක පෙනී සිටි මුල්ම ජවනිකාව විය. රේඛාව අතරතුර මෙරට රූප ගත කරන්නට යෙදුණු බ්‍රිජ් ඔන් ද රිවර් ක්වායි දැවැන්ත සිනමා නිර්මාණය ගාමිණිට සිනමාව පිළිබඳ විශ්වවිද්‍යාලයක් විය.

දෛවයෝගය චිත්‍රපටයේ මානමූලගේ චරිතය ගාමිණි වෘත්තාන්ත චිත්‍රපටයක රඟපෑ මුල්ම චරිතය විය. ගාමිණිගේ චරිත නිරූපණය දුටු එවකට සුප්‍රකට සිනමා විචාරකයකු වූ ජයවිලාල් විලේගොඩ ලියනුයේ මෙයට පඹයෙක් යොදා ගත්තා නම් වඩා හොඳයි යනුවෙන්ය. ඇත්ත නම් ගාමිණි මානමූලට පණ පෙවූ අන්දම ඒ වනවිට ඇබ්බැහිව සිටි දකුණු ඉන්දීය සිනමා රංගනයට හාත්පසින්ම වෙනස් අන්දමක එකකි. එය වටහා ගන්නට විචාරකයන් සමත්වූයේ නැත. මුල් යුගයේ ගාමිණි රඟපෑ සිනමා රංගන විලාසය තිබුණේ එකල සිනමා විචාරයට වඩා ඉදිරියෙන්ය.

ඒ වන විට මෙරට සිනමා රංගනය තදින් ගුරුකොට ගත්තේ දකුණු ඉන්දීය සිනමා රංගනයයි. දෛවයෝගය උතුරු ඉන්දියාවේ චිත්‍රාගාරයක රූපගත කළ එකම සිංහල චිත්‍රපටය විය. එහි දර්ශන තලය වූයේ එවකට පූනා නගරයේ පිහිටි ප්‍රභාත් චිත්‍රාගාරයයි. වර්තමානයේ එය ඉන්දීය සිනමා හා රූපවාහිනී පාසලයි. චිත්‍රපටය රූප ගත කළ කැමරා අධ්‍යක්ෂ කේකි මිස්ට්‍රි එවකට ඉන්දියානු සිනමාවේ සිටි ඉහළම ගණයේ කැමරා අධ්‍යක්ෂවරයෙකි. අමෙරිකන් ඇක්ටර් නම් සුරතල් නාමයෙන් ගාමිණි ඇමතූ මිස්ට්‍රි අනාවැකියක් පවසා තිබිණ. "දෛවයෝගය වාණිජමය වශයෙන් දැවැන්ත පාඩුවක් ලබනවා. ඒත් මෙහි එන ගීත හැමදාම වැජඹෙනවා. ඒ වගේම වැඩි කල් නොයා උඹ උඹේ රටේ අංක එකේ නළුවා වෙනවා." මේ අනාවැකිය සඵල වන්නට මහ කාලයක් ගත වුණේ නැත.

ගාමිණිගේ රංගනයේ හැරවුම් ලක්ෂ්‍යය වූයේ සංදේශයයි. සැබෑ සිංහල සිනමාවේ හැරවුම් ලක්ෂ්‍යය ලෙස රේඛාව නිර්මාණයෙහිලා ආචාර්ය ලෙස්ටර්ට ගෞරව දක්වන අපේ සිනමා විචාරකයන් අපේ ජනාකර්ෂණීය සිනමාවේ හැරවුම් ලක්ෂ්‍යය සංදේශය බවත් එහි ගෞරවය ආචාර්ය ලෙස්ටර්ට හිමි විය යුතු බවත් පවසන්න මැළිකමක් දක්වන්නේ එයින් මේ මහා සිනමාකරුවාට අපහාසයක් වේ යැයි සිතා විය යුතුය. සුජාතා චිත්‍රපටයේ සිට ඒ වන තෙක් අපේ ජනාකර්ෂණීය සිනමාව ගුරු කොට ගත්තේ දකුණු ඉන්දීය සිනමාවේ අනුකරණවාදි චිත්‍රපට වුව සංදේශය එබන්දක් නොවේ. හැටේ දශකයේ සිට පිබිදෙන සිනමා භාෂාවෙන් ද අනුකරණ රටාවෙන් ද මිදුණ නව ජනාකර්ෂණීය සිනමාවට මඟ පාදන්නේ සංදේශයයි. සංදේශය ගාමිණිගේ රංගනයට කරුණු කිහිපයක් නිසා වැදගත්ය. එකක් ඔහු එහි රඟපානුයේ දෙවැනි චරිතය වුවත් සිනමාකරණය පිළිබඳ ඒ වන විට ඔහු ලබා සිටි පරිචය අත්හදා බලනුයේ සංදේශයෙන්ය. ප්‍රධාන නළුවා වාචික අභිනයෙහි උත්සුක වන රූපරාමුවේම ඔහු නිහඬව ආංගික අභිනය ඔස්සේ ප්‍රේක්ෂකයාගේ අවධාන යොමු කර ගනියි. මේ පිළිබඳ එහි සහාය අධ්‍යක්ෂ තිස්ස ලියනසූරිය අපූරු මතකයක් හෙළි කරයි. එහි එක් අවස්ථාවක චිත්‍රපටයේ ප්‍රධාන චරිත යුවළ පෙම් බස් දොඩමින් සිටිති. ගාමිණි නැතහොත් තම්මිටට පොතේ හැටියට ඇත්තේ දීර්ඝ දෙබස් සහිත පෙම් ජවනිකාව අතරතුර මුරට සිට ගෙන සිටීම පමණකි. මේ ජවනිකාවෙන් වුවත් නළුවකු විය හැකි යැයි තිස්ස විහිළුවට පැවසුවේය. දර්ශනය රූප ගත කරද්දී ගාමිණි සිය අමුඩය පහළට ඇද පිහිය මුවහත් කළේය. ප්‍රේක්ෂකයාගේ අවධානය වහා යොමු වූයේ එම රංගනයටය. චිත්‍රපටයේ අවසාන ජවනිකාවේ බළකොටුව පුපුරුවාගෙන මිය යා යුත්තේ ප්‍රධාන චරිතය වූ බණ්ඩාරය. එහෙත් එහි රඟපෑ ආනන්ද ජයරත්න එයට එකඟ නොවීය. එක් අතකින් හමුදා උපකාර සහිතව වැළලූ බෝම්බ සහිත බළකොටුව පුපුරුවා ගන්නා දර්ශනය රූප ගත කරන්නේ අද මෙන් දෘශ්‍ය ප්‍රයෝග උපකාරයෙන් නොවේ. එබැවින් එය දැඩි අවදානම් සහිත ජවනිකාවක් විය. ප්‍රධාන නළුවා බාර නොගත් අභියෝගය දෙවැන්නා බාර ගත්තේය. චිත්‍රපටය අවසානයේ වඩා මතක හිටියේ තම්මිටගේ ජීවිත පූජාවය. සහාය අධ්‍යක්ෂවරයෙකු ලෙසද සංදේශයට සම්බන්ධ වන ගාමිණිට එම චිත්‍රපටයට එක්වූ සිය ගණනක අතිරේක නළුවන් ආම්බාං කිරීමේ වගකීම ද පැවරී තිබිණ. සියල්ලට පෙරාතුව නැඟිට අවසානයේ නින්දට ගියමුත් චිත්‍රපටයේ බලසම්පන්න චරිතයකද වගකීම දැරූ ගාමිණී දෙස ලෙස්ටර් ජේම්ස් පීරිස් පවා බලා සිටියේ පුදුමයෙන්ය.

ඊළඟට එළැඹි යුගයේ ඔහු ජනාකර්ෂණීය චරිත ගණනාවකට පණ පොවන්නේ එතෙක් මෙරට සිනමා පෙම්වතාට ආවේණික ගිනි කූරු කට් රැවුල, ස්ත්‍රී ලාලිත්‍යය සිහිපත් කරන වචන හැසිරවීම, වැනි සියලු දකුණු ඉන්දීය රෝග ලක්ෂණ සියල්ල කපා හරිමින්ය. රන්මුතුදූව මේ සම්ප්‍රදාය බිඳ හෙළන මුල්ම චිත්‍රපටය විය. ටී ෂර්ට් එකකින් පමණක් නොව නාන කලිසමකින් ද ගාමිණි එහි සැරසෙන්නේ එතෙක් සිනමාවට නැතිව සිටි කඩවසම් පෙම්වතා හඳුන්වා දෙමින්ය. එක් පසෙකින් සරම ඉහළට ඔසවා වම් පයින් එක තැන කැරකැවී පයින් ගසමින් චුට්ටේ බවට පත් ගාමිණි, සිය කඩවසම් සිරුර බෝතලයකට රිංගන්නා සේ හසුරුවනුයේ ගම්පෙරළියේ ජිනදාස වෙමින්ය. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ තුන් ඈඳුතු සිනමා කෘති එකවර නරඹද්දී ගම්පෙරළියේ නිවට ජිනදාසත් යුගාන්තයේ සවිමන් කබලානත් එකම නළුවකුයැයි සිතන්නට කිසිවකුටත් හැකියාවක් නැත. සූරයන්ගෙත් සූරයා රඟපා පැය ගණනක් ඉක්මවන්නට මත්තෙන් ඔහු නිධානයේ විලී අබේනායක වූයේ ද එහෙමය. කිසිදු රංගනයකට ඉඩක් නොමැති මුළුමනින්ම සිරුර අභ්‍යන්තරයෙන් ගොඩ නැංවිය යුතු චරිතයක් වූ වැලිකතරේ පොලිස් අධිකාරි රන්දෙණිය ඔහු ගොඩනඟන්නේ ද එහෙමය. ධීවරයෝ, හුලවාලි, ඔහොම හොඳද, එදත් සූරයා අදත් සූරයා, රෑන ගිරව්, රත්තරන් අම්මා, හතරදෙනාම සූරයෝ ,කොටි වලිගය, දෙවියනි ඔබ කොහිද ,අමල් බිසෝ, සාගරයක් මැද වැනි සියයකට ආසන්න ඔහුගේ චරිත නිරූපණයන් සොයා බලද්දී මේ එකිනෙකට වෙනස් රංගන පරාසයන් දැක ගත හැක්කේය. සරුංගලේ නඩරාජා වන ගාමිණි හුලවාලිහි ධාරා වන්නේ ලොව බොහෝ නළුවන්ට අභියෝගයක් ඉදිරිපත් කරමින්ය.

ඔහු පරසතු මල් නිර්මාණය කරනුයේ විසිහය හැවිරිදි වියේදීය. මේ, ලොව විශිෂ්ටතම සිනමා කෘතිය ලෙස සැලකෙන සිටිසන් කේන් චිත්‍රපටය ඕසන් වේල්ස් විසින් නිර්මාණය කරනු ලබන වයසයි. පරසතු මල් පනස් වසක් ඉක්මව ගියත් මහලු නොවන චිත්‍රපටයකි. එය සිනමාකරුවකුගේ කුලුඳුල් චිත්‍රපටයක දැකගත හැකි නොඉඳුල් ස්වභාවය ඉස්මතු කරන සිංහල සිනමාවේ අතළොස්සක් වූ චිත්‍රපටවලින් එකකි. පී.කේ.ඩී.සෙනෙවිරත්නයන් විසින් රචනා කරන ලද මුල් තිරනාටකය ගාමිණි ෆොන්සේකා විසින් තමන්ට අවශ්‍ය පරිදි වෙනස් කරන ලදී. ඒ වන විට මෙරට සිනමාවේ නළු නිළියන් සියල්ල ප්‍රතිරූප ගත චරිතවලට කොටුවෙමින් සිටින යුගයයි. රුක්මණී දේවිය නළඟන චිත්‍රපටයේ රඟපෑම වරදක් ලෙස මාර්ටින් වික්‍රමසිංහයන් විසින් දකින ලද්දේ එයින් වසර කිහිපයකට මත්තෙන්ය. මේ වන විට සිනමාවේ වීරයා සුචරිතවාදියකු විය. සල්ලාලකම අයිති දුෂ්ටයාටය. එහෙත් ගාමිණි විසින් වෙනස් කරන ලද තිරනාටකයේ වීරයා බයියාම්වාදියකු විය. බොනී මහත්තයා ගැහැනියකගේ තොල්පටකට, මධුර සංගීතයට, ඉම්හිරි මීවිතකට ජීවිතය දෙන ජාතියේ මිනිහෙක් විය. සිනමා කෘතියේ රඟපෑම පමණක් නොව මෙබඳු චිත්‍රපටයක් කිරීම පවා කාලයේ හැටියට අභියෝගයක් විය. එමෙන්ම එහි විෂය පථය ගෙන හැර පෑමේදී ගාමිණි විසින් පෑ සංයමය තරුණ සිනමාකරුවකුගෙන් කිසිවිටෙකත් බලාපොරොත්තුවන්නක් නොවේ. මෙහිදී පරසතු මල් රඟපෑමෙන් ගාමිණි පරදුවට තබන්නේ තමන්ගේම සිනමා වෘත්තියේ අනාගතයයි.

චණ්ඩියා තිරගත වන සමය වන විට ගාමිණි ෆොන්සේකා මෙරට සිනමා රංගනයේ වීරයාගේ ප්‍රතිරූපය සහමුලින්ම වෙනස් කර හමාරය. එයින් පසු සියලු සිනමා වීරයන්ට සිදු වූයේ ගාමිණි ගිය මඟ යන්නටය.

ඉන්දීය සිනමා වීරයා වෙනුවට අපට පිළිගත හැකි අපේ රටේ තරුණයෙකු වීරයා කරන්නට ගාමිණිට සෑහෙන කට්ටක් කන්නට තිබිණ. ඔහු ඒ සඳහා මුළුමනින්ම කැපවිණ. ඔහු සිය වෘත්තියේ ගරුත්වය හැම විටම අපේක්ෂා කළේය. පසුකලෙක සිනමාස් සමාගමට නැතුවම බැරි නළුවා ගාමිණි වුව ද ධීවරයෝ සඳහා ගාමිණි තෝරා ගන්නට අධ්‍යක්ෂ එම්. මස්තාන්ට නිෂ්පාදක ගුණරත්නම් සමග සෑහෙන අරගලයක් කරන්නට සිදුවිය. ගාමිණි නිසා ගැටවරයෝ චිත්‍රපටයේ ආයෝජනයට සිලෝන් තියටර්ස් සමාගම කැමැති කරවා ගැන්මට විශාල සාකච්ඡාවක් පවත්වන්නට තමන්ට සිදුවූයේ යැයි එහි නිෂ්පාදක ශේෂා පලිහක්කාර පසුව හෙළිදරවු කළේය. ඒ සියල්ලම ගාමිණිට සිදුවූයේ ඇතැම් නළුවන් මෙන් උළු හෙවිලි කරන්නට ගොස් වත්තේ හතර මායිම් සොයන ජාතියේ වැඩ කරන්නට ගිය නිසාය. එහෙත් ඔහු එසේ කරන ලද්දේ තමන් වෙනුවෙන් නොව අනුන් වෙනුවෙන්ය. මේ බැව් වරෙක පැසුවේ ක්‍රිස්ටි ලෙනාඩ් ප්‍රනාන්දුය. සූර චෞරයා චිත්‍රපටය රූප ගත කරන ලද්දේ දඹුල්ලේය. ගාමිණිටත් ප්‍රධාන නිළිය වූ සන්ධ්‍යාටත් අධ්‍යක්ෂ මස්තාන්ටත් දඹුල්ලේ තානායමේ නවාතැන් ලැබිණ. ගාමිණි විසින් ක්‍රිස්ටි කැඳවා ගෙන ගිය බැවින් ඔහුටද නවාතැන් ලැබුණේ එහිය. රූපගත කරන්නට පෙර දින එහි ගිය ගාමිණි සෙසු සිනමා ශිල්පින්ගේ නවාතැන් බලන්නට ගියේය. ඒ වන විට සියලු ශිල්පින් නවාතැන් ගෙන සිටියේ කූඩාරම් වැනි තැන්වලය. ඔවුන්ට නිසි ආකාරයෙන් සලකන්නට නිෂ්පාදන කණ්ඩායම අපොහොසත්ව තිබිණ. මේ කට්ට එයට වසර හයකට පෙර ගාමිණි කෑවේ සංදේශය රූප ගත කරද්දීය. මේ සංදේශය තරම් දැවැන්ත චිත්‍රපටයක් ද නොවිණ. සියලු ශිල්පින්ට නවාතැන් දෙන තුරු තමා දර්ශන තලයට නොඑන බැව් පැවසූ ගාමිණි චිත්‍රපටය දමා ගසා ආපසු කොළඹ ගියේය. ගාමිණිට දෙවැනි විකල්පයක් සිනමා අධ්‍යක්ෂට නොවිණ. ප්‍රධාන නළුවා අවශ්‍යය. අවසානයේ ගාමිණි නැවත ආවේ සිය ඉල්ලීම ඉටුවුණ පසුවය. ගාමිණි අත සිගරට්ටුව එකල සුපුරුදු දර්ශනයක් විය. පසුකලෙක සිගරට්ටුව සහිත තම ඡායාරූප සරසවිය පුවත්පතේ පළ කිරීමෙන් වළකින ලෙස ගාමිණි ෆොන්සේකා ඉල්ලීමක් ද කළේය. එහෙත් ගාමිණි සිගරට් බීමට ඇබ්බැහි වූයේ ද අතිරේක ශිල්පියෙකු සිගරට්ටුවක් ඉල්ලා සිටි විට ගෝරනාඩු කළ නිෂ්පාදනයකට එරෙහි වීමට යැමෙන්ය. සිනමාවේ ජනප්‍රියත්වය යනු එක්තරා ආකාරයක සෝඩා බෝතලයකි. එය වහා නැඟ ඉක්මනින් අවසාන වෙයි. මුල් දශකයේ අතිශය ජනප්‍රිය සිනමා තාරකාවන් සිය අවසාන ගමන ඥාතිමිත්‍රාදින් විනා පිරිවැරූ රසිකයන් නොමැතිව යන හැටි මම දැක ඇත්තෙමි. කාලානුරූප නොවුණ බොහෝ දෙනාගේ ඉරණම එය විය. සිය ජනප්‍රිය සමයේ පවා ඔවුන් සිය නාමය මිල කොට තිබුණේ තුට්ටුවටය. ගාමිණිට සිය වෘත්තිය අරගලයේ දී පළමුවෙන්ම කරන්නට වූයේ තම වටිනාකම් එකිනෙකාට අවබෝධ කර දීමය. එයින්ද සිත් අමනාපකම් සිදු නොවුණා නොවේ. තම වටිනාකම පහදන්නට ගිය කල එයට වඩා අඩුවෙන් ගොස් සේවය ලබා දුන් ශිල්පින් සමඟ තරග කරන්නට ඔහුට සිදුවිය.

> ගාමිණිගේ රංගනයේ හැරවුම් ලක්ෂ්‍යය වූයේ සංදේශයයි. සැබෑ සිංහල සිනමාවේ හැරවුම් ලක්ෂ්‍යය ලෙස රේඛාව නිර්මාණයෙහිලා ආචාර්ය ලෙස්ටර්ට ගෞරව දක්වන අපේ සිනමා විචාරකයන් අපේ ජනාකර්ෂණීය සිනමාවේ හැරවුම් ලක්ෂ්‍යය සංදේශය බවත් එහි ගෞරවය ආචාර්ය ලෙස්ටර්ට හිමි විය යුතු බවත් පවසන්න මැළිකමක් දක්වන්නේ එයින් මේ මහා සිනමාකරුවාට අපහාසයක් වේ යැයි සිතා විය යුතුය.



සිනමාව සම්බන්ධ ගාමිණිගේ මත බොහෝ යාවත්කාලින විය. ඒ ඇතැමක් බොහෝ දෙනා වටහා ගත්තේ ද පසුවය.

ගාමිණි නිර්මාණකරුවෙකු ලෙස බොහෝ ප්‍රතිභාවන් රැගත් කෙනෙකි. ඔහු ප්‍රවීණ චිත්‍ර ශිල්පී සාර්ලිස් මාස්ටර්ගේ අවසාන ගෝලයා විය. ජී.එස් ප්‍රනාන්දුගේ මෙන්ම සුසිල් ප්‍රේමරත්නගේ මුල්ම ගෝලයා ද විය. ඔහු විසින් අඳින ලද බුදු රුවක් අරිසෙන් අහුබුදුවන්ගේ කාර්යාලයේ තැන්පත් කර තිබිණ. ඔහු කවියෙක් විය. සාන්ත තෝමස් විදුහලේ නිර්මාණ සංග්‍රහයකට පාසල් අවදියේ ලියන ලද 'මිය යන පියෙකුගෙන්' කවිපෙළ ළමා වියේ සිට ඔහු සතුවූ කාව්‍ය හැකියාව ප්‍රකට කරවන්නකි. සිනමාකරුවකු ලෙස ඔහු අතින් තැනී අන් අය නමින් එළි දුටු සිනමා කෘතීන් රැසක් අපේ සිනමාවේ එයි. මේ බොහෝ සිනමා කෘති අපේ රස නහර පුබුදාවාලූ කෘති බැව් නොකියාම බැරිය. මේ සිනමා කෘතින් පරිශීලනය කරන්නෙකුට ගාමිණිගේ සිනමාවේ ඇති ලක්ෂණ මෙන්ම ඔහුට ආවේණික රූපරාමු දැක ගත හැකිවෙයි. ඒ අතර තම අතින් තනා අනුන්ට උප්පැන්න ලියා දුන් චිත්‍රපට තම චිත්‍රපටයැයි ගාමිණි ෆොන්සේකා කිසිවිටෙකත් පැවසුවේ නැත.

ඔහුට සිනමා සක්විති යන කිරුළ පැළඳුණේ නිකම්ම නොවේ. සිනමාව සම්බන්ධ ඔහු සතු හැකියාවත් කුසලතාවත් නිසාමය.

උතුමාණෙනි වැනි සිනමා කෘතියක් ඔහු අතින් නිර්මාණය වූයේ එකී අභිමානයේ ප්‍රතිඵලයක් හැටියටය. පරසතු මල් චිත්‍රපටයේ එන බොනී මහත්තයා බීමත්ව පඩිපෙළේ මැද සිටින විට පසුපස ඇඳෙන දැවැන්ත සෙවණැල්ල ලෝක සිනමාවේ මට්ටමින් ගත් කල ද අපූරු සිනමා රූප රාමුවක් බැව් කිව යුතුය. එමෙන්ම උතුමාණෙනි චිත්‍රපටයේ එන අතවරයට ලක් වූ තරුණියට උසාවියේදී සාධාරණය නොවන බව දැනෙන තීන්දුව ප්‍රකාශයට පත් කිරීමේදී ගාමිණි විසින් ගොඩ නංවනු ලබන රූප රාමු පෙළ සිනමා ප්‍රකාශනයක් සතු අද්වීතිය රූපිය ගුණය මනාව ඉස්මතු කරවන්නකි. සිනමාකරු මේ තීන්දුව ප්‍රකාශයට පත්කිරීම ආරම්භ කරනුයේ විනිසුරුවරයාගේ මධ්‍ය සමීප රූපයකිනි. හෙමින් හෙමින් තීන්දුව සමග ඉහළට ඇදෙන කැමරාව ප්‍රේක්ෂකයා අඬවන, නැතහොත් යුක්තිය ඉටු නොවුණ තීන්දුව ප්‍රකාශයට පත් කරනුයේ රාජ්‍ය ලාංඡනයේ සමීප රූපයකිනි. මේ තරම් උත්ප්‍රාසජනක හා නිර්භීත රූප පද්ධතියකට වෙනත් සිනමාකරුවකුගේ අත ගැසුණේ නම් ඒ එයින් පසු කලෙකය.

හැත්තෑව දශකයේ පිබිද ආ නව සිනමාකරුවන් හා ගාමිණි අතර මුලින් එතරම් ඇයි හොඳයියක් නොවිණ. ඒ දේශපාලනය හා සිනමාව පිළිබඳ ඔවුන්ගේත් ගාමිණිගේත් මතවාද අතර වූ අරගලය නිසාය. චිත්‍රපට සංස්ථාව බිහිවීම සම්බන්ධව ගාමිණි දැරූ මතය එයින් එකක් විය. එහෙත් බොහෝ දෙනෙක් පසුකලෙක ඔවුන්ගේ නවතම සිනමා කෘති සඳහා ගාමිණි සොයා ගිය බව නොරහසකි. අවාසනාව නම් ඒ කටයුතු ඉෂ්ට නොවීමය. හැත්තෑව දශකයේ මැද භාගයේ බිහි වන සිනමාකරුවන් අතරින් ගාමිණි ෆොන්සේකා රංගනයෙන් දායක වූයේ මහාචාර්ය සුනිල් ආරියරත්න සහ සුමිත්‍රා පීරිස් ගේ සිනමා නිර්මාණයන්ට පමණකි. මේ හැරෙන්නට ජීවිතයේ අවසාන භාගයේ හෝ ඔහු සොයා ආ නව පරපුරේ සිනමාකරුවන්ගේ චිත්‍රපට වලට දායකවූයේ නම් අපේ සිනමාවේ මුල්ම තෙස්පියානුවන්ට තවත් විශිෂ්ට මතක සටහන් ඉතුරු කර යන්නට ඉඩ තිබිණ.

එහෙත් ඔහු මිය යන තුරා යාවත්කාලින මිනිසෙක් විය. තරුණ සිනමාකරුවන්ගේ ජයග්‍රහණ දැක පෞද්ගලිකව ඔවුන්ට සුබ පැතුවේය. අලුත් සාහිත්‍ය කෘතින් ගැන, ගීත සාහිත්‍යය ගැන ඔහුට තිබුණේ යාවත්කාලින දැනුමකි. මේ විඳ ගන්නා රසය බොහෝ විට එය දන්නා ඔහුගේ ඇසුරු කරන්නන්ට නිබඳ ලබා දෙමින් රැය පහන් කිරීම ගාමිණි ෆොන්සේකා සිරිත වූයේය. සිය ජීවිතයේ අවසාන භාගයේදී ගාමිණි තවත් අලුත් චිත්‍රපටයක් ගැන උනන්දු වූයේය. එයට පාදක වූයේ ඔහු මුල්වරට සිනමා රංගනයට පිවිසි දෛවයෝගය චිත්‍රපටයේ එක් නිෂ්පාදකවරයෙකුගේ චරිතයයි. පසු කලෙක මෙරට බිහිසුණු අපරාධ වැලකට හේතු වූ ඔහුට එක් අතකින් දරුවකු වඩා ගත් සැණින් සුවපත්වන අත් ගුණයක් තිබණ. සම්භාව්‍ය සංගීතය පිළිබඳ මනා රසාස්වාදයක් තිබුණ ඔහුගේ අඳුරු පස වූයේ දරුණු මිනීමරුවෙකි. මේ චරිතය සඳහා ඔහු බොහෝ කරුණු අධ්‍යයනය කළ ද එය එළි නොදුටු සිහිනයක් විය.

ගාමිණි ෆොන්සේකා, ඇතැම් කෙනෙකුට පෙනෙන්නේ ආඩම්බරකාරයෙකු හැටියටය. ඔහු සිය වෘත්තිය සම්බන්ධව ආඩම්බරකාරයෙකු බව ඇත්තය. එහෙත් ඔහු දන්නා අය වටහා ගන්නේ ඔහු තරම් මිත්‍රශීලී ප්‍රතිපත්තිගරුක හා සංවේදී මිනිසුන් ඇත්තේ අතළොස්සක් බවය. ගාමිණිගේ ආඩම්බරකම ඕනෑම ලොක්කෙකු ඉදිරියේ පාන්නකි. ඔහු කිසිවිටෙකත් කිසිවකුට හෝ හිස පාත් කරන ජාතියේ පුද්ගලයකු නොවිණ. සිනමා චරිතවල අප දකින පුද්ගලයා ඔහු තුළින් සැබැවින් විද්‍යමාන විය. එය ඔහු ගැන දන්නා බොහෝ අය විඳි අත්දැකීමකි. එක්තරා ඉහළ පෙලේ දේශපාලන නායකයකු වේලාව වරදවා සිය නිවෙසට ආ වරදට දොර නොඇර ආපසු යවන්නට තරම් ගාමිණී අභිමානවත් පුද්ගලයෙක් විය. එමෙන්ම කෙනෙකුගේ සැපතේ දී නොව කරදරයකදී ඔහු උපකාර කළ අයුරු කිසිවකු හෝ දන්නේ නැත. සමහරවිට අදාළ පුද්ගලයාද ඒ උදවුව කරන ලද්දේ ගාමිණි බැව් දන්නේ තවත් පසුකලෙකය.

ගාමිණි ෆොන්සේකා අප අතරින් වෙන්වූයේ 2004 වසරේ සැප්තැම්බර් මස 4 වැනි දින දහවල් කාලයේය. දහවල් කෙටි නින්දකට වැටී සිටි ඔහු එම කෙටි නින්ද අවසානයේ සදාකාලික නින්දට ගොස් තිබිණ. සයනය මත අඩක් වසා සිටි පොරෝණය සහිත ඔහුගේ නිසල සිරුර දුටුවන්ට සිහිපත් වූයේ දශක කිහිපයකට පෙරාතුව පරසතුමල් චිත්‍රපටයේ බොනී මහත්තයා හිරු පායද්දි අවසන් නින්දට වැටුණු අන්දමය. ගාමිණිගේ අවසන් කටයුතු ඉන් පසු සිදු කෙරුණේ නිදහස් චතුරශ්‍රයේය. පසුදින සිය පියාණන්ගේ භස්මාවශේෂ එක් කරන්නට ගිය ගාමිණි පුත් දම්මිත් දුටුවේ කුමක්ද? ජීවිත කාලය පුරා කිසිවකු හමුවේ නොනැමුණු සිය අභිමානවත් පියාණන්ගේ කොඳු නාරටිය ඔහු දැවුණු චිතකයේ ගින්නටද විනාශ කරන්නට නොහැකි ව නොදැවී ඉතිරිව තිබුණු අන්දමය.

| | |
|---|---|
| බටහිර අහස රතු සිතුවම් | මැකුණාවේ |
| දෙණි පෙත හඬන හිරියා මල් | පිපුණාවේ |
| මා ආදරය දුටු වග නොම | හැඟුණාවේ |
| මා නැති කලෙක උන් සුවඳක් | දැනුණාවේ |

අරුණ ගුණරත්න
සිතුවම් - ලකී ලියනගේ

# දේශීය සමාගම් හතරකින් පාසල් දරුවන්ගේ නිල ඇඳුම් රෙදි ලබා ගන්නවා

## ❯ ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස්

**සිතාරා සේනානි**

පාසල් දරුවන්ට නිල ඇඳුම් ලබාදීමට අවශ්‍ය රෙදි මීටර් මිලියන 12ක් දේශීය රෙදිපිළි නිෂ්පාදන සමාගම් හතරක් වෙතින් දෙසැම්බර් මාසයට පෙර ලබාගැනීමට නියමිත බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාපති, අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා පවසයි.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පක්ෂ මූලස්ථානයේ ඊයේ (5) පැවති මාධ්‍ය හමුවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'අදාළ එකගතා ගිවිසුම අනුව මේ රෙදි සියල්ල දෙසැම්බර් පළමු සතියට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දිය යුතු බවට එම සමාගම්වලට ඉතා පැහැදිලිව දැනුම්දී තිබෙනවා. රජයේ තීරණය කූපන් තිළිණ ලබාදීම නොව රෙදිම ළමයින්ට ලබාදීමයි. දේශීය නිෂ්පාදන දිරිගැන්වීම රජයේ ප්‍රමුඛ අරමුණ වන නිසා මේ රෙදි නිෂ්පාදනය කරන සමාගම්වලට කරන දිරිගැන්වීමක් වශයෙන් මේ පියවර ගැනීමට රජය තීරණය කළා. හැබැයි එක කොන්දේසියකට යටත්වයි. මෙය ස්ථිර කරගැනීමට ඉදිරි දවස් දෙක ඇතුළත මා බලාපොරොත්තු වෙනවා, ඒ සමාගම්වල නියෝජිතයන් හමුවී ඒ අයට ඉතා පැහැදිලිව කියන්න කිසිම ප්‍රමාදයකින් තොරව, දෙසැම්බර් මාසය ආරම්භය වීමට පෙර ගිවිසුම අනුව පොරොන්දු වූ පරිදි මේවා අපට ලබා දිය යුතුයි කියලා.



සති අන්තයේ මිනුවන්ගොඩ ප්‍රදේශයේ ඇඟලුම් කර්මාන්ත ශාලාවක කොවිඩ්-19 ආසාදිතයකු හමු වුණා. මේ පිළිබඳ ක්ෂණික තීන්දු ගැනීමට රජය ඉදිරිපත් වුණා. පළමුව ගත යුතු තීරණය වුණේ පාසල් සම්බන්ධවයි. අප පැහැදිලි ස්ථාවරයක සිටියා කිසිම අවදානමක් පාසල්වල ළමයින් සම්බන්ධයෙන් පිළිගන්න බෑ කියලා. ඒ නිසා එකවිටම අප තීරණය කළා 09 වන සිකුරාදා ආරම්භ වීමට නියමිතව තිබූ පාසල් නිවාඩුව මුළු දිවයිනට ම බලපාන පරිදි 05 වැනිදා සිට ක්‍රියාත්මක කිරීමට. මේ තීරණය රටේ සියලු පාසල්, පෙර පාසල්, පිරිවෙන් සහ උපකාරක පන්තිවලටත් බලපානවා. ඒ වගේම කැලණිය විශ්වවිද්‍යාලය, වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය සහ නයිවල උසස් තාක්ෂණ ආයතනයත් මේ තත්ත්වය නිසා තාවකාලිකව වැසීමට පියවර ගත්තා.

කොවිඩ් ආසාදිතයා සොයාගැනීමෙන් පසු අදාළ ඇඟලුම් කර්මාන්ත ශාලාව වයිරසය පැතිරීම වැළැක්වීමට ගත හැකි සියලු දේ විධිමත් පරිදි ගත්තා. ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් විෂබීජහරණයකට ලක් කළා. ඒ වගේම බස් රථ විෂබීජහරණය කළා. මේ සියල්ල කළේ මහජන සෞඛ්‍ය නිලධාරීන්ගේ උපදෙස් දැඩි ලෙස අනුගමනය කරමින්. ඒ වගේම යුද හමුදාව මේ සම්බන්ධයෙන් ඉතා අගනා කාර්යභාරයක් ඉටු කළා. රෝගියාගේ සමීපතමයන්, ආශ්‍රිතයන් සහ දුරස්ථ ආශ්‍රිතයන් සොයා ගෙන පී. සී. ආර්. පරීක්ෂණ පැවැත්වීමේ වගකීම හමුදාව භාර ගත්තා. දැනටම හයසීයක් පමණ නිරෝධායනයට ලක්ව තිබෙනවා. මේ පරීක්ෂණවල ප්‍රතිඵල බදාදාට පෙර ලැබීමට නියමිතය. අනාගතය පිළිබඳ තීරණගැනීම වඩා පහසු වෙනවා ඒ තොරතුරු දැනගත්තාට පසුව. මිනුවන්ගොඩ, දිවුලපිටිය සහ වේයන්ගොඩ පොලිස් බල ප්‍රදේශවලට පොලිස් ඇඳිරිනීතිය පනවා තිබෙනවා. මේ තත්ත්වය ගැන නිරන්තරයෙන් විමසිල්ලෙන් සිට දවසින් දවස ගත යුතු පියවර ගැනීමට ආණ්ඩුව යුහුසුලු වෙනවා.'

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහ ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී සාගර කාරියවසම් මහතා**

'ඇතැම් සමාජ මාධ්‍ය සඳහන් කර තිබෙන ආකාරයට ජනාධිපතිවරයාවත්, අගමැතිවරයාවත්, අපේ පක්ෂයේ නිර්මාතෘ බැසිල් රාජපක්ෂ මහතාවත්, චමල් රාජපක්ෂ මහතාවත් රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයාගේ සොහොයුරා නිදහස් කිරීම සම්බන්ධයෙන් හෝ රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා රජයට සම්බන්ධ කරගැනීම සම්බන්ධයෙන් එකගතාවක් හෝ කිසිදු සාකච්ඡාවක් පවත්වා නෑ. එවැනි කිසිම අදහසක් ඇත්තේ නැති බවත් ඉතා පැහැදිලිව කිව යුතුයි.

2015ට පෙර මහින්ද රාජපක්ෂ මහතාගේ රජය පෙරළන්න, දුර්වල කරන්න කටයුතු කළ දේශපාලන කණ්ඩායම් සමග එක්ව කටයුතු කරන පිරිස් තමයි රාජපක්ෂවරුන්ට එරෙහිව මේ අසත්‍ය මත ප්‍රචාරය කරන්නේ. ඒ ප්‍රචාරවලට හසු නොවන ලෙස අප ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. මැතිවරණයට පෙර අප ඉතා පැහැදිලිව කිව්වේ 19 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ඉවත් කරන බව. ඉන් පසුව අපට පුළුවන් අලුත් ව්‍යවස්ථාවක් හදන්න.'

# බන්ධනාගාර කාන්තා රැඳවූවන්ගේ අවුරුදු 5ට අඩු දරුවන්ට විශේෂ දිවා සුරැකුම් මධ්‍යස්ථාන

## ❯ රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ

**බුද්ධිකා ඉඹුලාන**



විවිධ අපරාධ සම්බන්ධයෙන් වරදකරුවන් වී කුඩා දරුවන් සමග බන්ධනාගාරගතව සිටින කාන්තා රැඳවූවන්ගේ වයස අවුරුදු 5ට අඩු දරුවන්ට විශේෂ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් ලබාදීමේ වැඩපිළිවෙළකට බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ අවධානය යොමු වී ඇත.

ඒ අනුව ඉඩපහසුකම් පවතින බන්ධනාගාර පරිශ්‍රයන් තුළ වෙනම විශේෂ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීමටත්, ඉඩපහසුකම් නොමැති බන්ධනාගාර ආශ්‍රිතව විශේෂ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීමටත් අවශ්‍ය කටයුතු සූදානම් කිරීමට ඇමැතිනිය උපදෙස් ලබාදී ඇත.

ඇමැතිනිය මේ බව පැවැසුවේ පසුගියදා අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේ පැවති සාකච්ඡාවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිනිය මෙසේ ද කීවාය.

'මේ සඳහා කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය ලබාගැනීමට රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත මහතා සමග සාකච්ඡා කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

මෙහි පළමු පියවර ලෙස මේ මස සිට ඉඩපහසුකම් පවතින අගුණකොළපැලැස්ස බන්ධනාගාර පරිශ්‍රයේ විශේෂ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කෙරෙනවා. වයස අවුරුදු 2ක් දක්වා දරුවන්ට මව්කිරි දීම අත්‍යාවශ්‍ය නිසා අවුරුදු 2ත් - 5ත් අතර වයසේ පසු වන දරුවන් මේ දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට යොමු කරනවා.

වරදක් නොකළද සිරගත වීමට සිදුව ඇති අවුරුදු 5ට අඩු දරුවන්ගේ මානසික තත්ත්වය යහපත් කර තැබීමට අවශ්‍ය පරිසරය සකස් කරදීමේ අවශ්‍යයි. දරුවන්ගේ පූර්ව ළමාවිය සංවර්ධනය හරියාකාරව සිදු නොවූ විට රටක්, සමාජයක් පත් වන්නේ ඛේදනීය තත්ත්වයකට. සිරගෙයක් තුළ වැඩෙන දරුවකුගේ මානසික තත්ත්වය සිරගෙයක පිටත සිටින දරුවකුගේ මානසික තත්ත්වයට වඩා වෙනස්. දිවා කාලයේදී හෝ දරුවන්ට බන්ධනාගාර සිර මැදිරි පරිසරයෙන් මිදී ඔවුන්ගේ මනස සංවර්ධනය කිරීමට අවශ්‍ය පරිසරය සකස් කරදීමට විශේෂ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බලධාරීන්ට උපදෙස් දුන්නා.'

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ගීතාමනී කරුණාරත්න, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ආර්. පී. එස්. සමන් කුමාරි, බන්ධානාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) චන්දන ඒකනායක, කොමසාරිස් (බුද්ධි) තුසිත උඩුවර මහත්ම මහත්මීහු ද මේ සාකච්ඡාවට සහභාගී වූහ.

# ජනපති හා අගමැති කාර්යාල විගණනය විගණකාධිපති යටතෙන් ඉවත් කරලා

## ❯ හිටපු කථානායක කරු ජයසූරිය

ජනාධිපති කාර්යාලය සහ අග්‍රාමාත්‍ය කාර්යාලය විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතෙන් විගණකාධිපතිවරයාගේ විෂය පථයෙන් ඉවත් කිරීම අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සාධාරණීකරණය කළද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විගණකාධිපතිගේ විෂය පථයට ඇතුළත්ව තිබූ ආයතන දෙකක් සංශෝධනයකින් ඉවත් කිරීමෙන් එම ආයතන දෙක විගණකාධිපතිගේ විෂය පථයෙන් ඉවත් වන බව පැහැදිලිව පෙනී යන්නේ යැයි හිටපු කතානායක සහ සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරයේ සභාපති කරු ජයසූරිය මහතා සඳහන් කරයි.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාට ලිපියක් යවමින් කරු ජයසූරිය මහතා පවසන්නේ අග්‍රාමාත්‍යවරයා පවසන පරිදි රාජ්‍ය සමාගම්වලින් 50%ක් නොව 100%ක්ම 20 වැනි සංශෝධනයෙන් රාජ්‍ය විගණනයෙන් ඉවත් වන බවයි.

එම ලිපියේ මෙසේද සඳහන් වේ.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් විසි වැනි සංශෝධනයෙන් විගණකාධිපතිවරයාගේ බලතල කප්පාදු වන බවට විපක්ෂය ගෙන යන ප්‍රචාර' යන මාතෘකාවෙන් යුක්තව මාධ්‍ය නිවේදනයක් නිකුත් කර ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීමට කැප වූ සිවිල් සංවිධානයක් වශයෙන් අපගේ අදහස් ද අගමැතිවරයාගේ කාරුණික අවධානයට යොමු කරනු කැමැත්තෙමි. අධිකරණ ඇමැතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ ඔහු විසින් 2020 සැප්තැම්බර් මස 02 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද විසි වන ආණ්ඩුක්‍ර ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධව සමාජයෙන් ද, ආණ්ඩු පක්ෂයේ ඇතැම් පාර්ශ්වවලින් ද මතුව ඇති මූලික විරෝධයක් වන විගණකාධිපතිවරයාගේ බලතල අඩු කිරීම සම්බන්ධ චෝදනාවට ලබාදී ඇති පිළිතුර පිළිබඳව අපගේ අවධානය යොමු කර ඇත. ඊට අදාළව පහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

මූලික වශයෙන්ම මාධ්‍ය නිවේදනයෙන් දක්වන්නේ විගණන සේවා කොමිසන් සභාව අහෝසි කිරීමෙන් විගණනයට හානියක් සිදු නොවන බවය. විගණන සේවා කොමිසන් සභාවෙන් සිදු කරන ලද්දේ විගණනය සිදු කරන නිලධාරීන්ට වෙනම සේවාවක් ස්ථාපනය කිරීමෙන් විගණනය ස්වාධීන සේවාවක් බවට පත් කිරීමය. එකී කොමිසන් සභාව අහෝසි කිරීමෙන් විගණනයේ ස්වාධීනත්වය ඉබේම අහෝසි වී යන අතර විගණකාධිපති ද ඇතුළුව විගණනයට සම්බන්ධ සියලුම දෙනා ජනාධිපති විසින් පත් කරන සහ ජනාධිපතිට අවශ්‍ය විටෙක් ඉවත් කළ හැකි (විසි වන සංශෝධනයට අනුව) රාජ්‍ය සේවා කොමිසන් සභාව යටතට පත්වේ. එය රාජ්‍ය විගණනයට සිදු වන බරපතළ අගතියකි.

රජයට අයත් සමාගම් විගණකාධිපතිගේ විෂය පථයෙන් ඉවත් කිරීම පිළිබඳව කරුණු දක්වන අගමැතිවරයා ප්‍රකාශ කරන්නේ එම සමාගම්වල විගණනය භාර පුද්ගලික සමාගම්වල විගණනය විගණකාධිපතිගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු බවට නියෝග කිරීමට විගණකාධිපතිට බලය ඇති බවයි. රාජ්‍ය සමාගම් විගණකාධිපතිගේ විගණනයට දක්වන ලද අඩු සහයෝගය සහ පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර කාරක සභාවට උත්තරදීමට දක්වන ලද අඩු උනන්දුව සලකන කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ලිඛිතව සඳහන් කිරීමකින් තොරව රාජ්‍ය සමාගම් විගණකාධිපතිගේ විෂය පථයට ඇතුළත් කළ නොහැකිය. එසේම විගණකාධිපතිගේ විෂය පථයට යටත්ව පැවති රාජ්‍ය සමාගම් සංශෝධනයෙන් ඉවත් කරන්නේ නම් එහි අර්ථය වන්නේ ව්‍යවස්ථා සම්පාදකයන්ගේ අරමුණ එය විගණකාධිපතිගේ විෂය පථයෙන් ඉවත් කිරීම බවයි. මේ නිසා අගමැතිවරයා පවසන පරිදි රාජ්‍ය සමාගම්වලින් 50%ක් නොව 100%ක්ව රාජ්‍ය විගණනයෙන් ඉවත්වේ.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදු කිරීමට උත්සාහ කරන්නේ 19 වන සංශෝධනයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද සංශෝධන ඉවත් කර 19 වන සංශෝධනයට පෙර පැවති තත්ත්වයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙන ඒම බවට අගමැතිවරයා සඳහන් කරයි. මේ 20 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණනයට කිසිදු බලපෑමක් සිදු කිරීමට අදහස් නොමැති නම් කළ යුතු හොඳම දෙය වන්නේ එකී වගන්තිවලට සංශෝධන ගෙන ඒමෙන් වැළකීම හෝ විගණනය වඩාත් ශක්තිමත් කරන සංශෝධන ගෙන ඒමයි.

# පොල් මිල ඉහළ ගියත් වගාකරුවාට හොඳ මිලක් ලැබෙන්නේ නෑ

## ❯ සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ කැඳවුම්කරු, හිටපු මන්ත්‍රී නාමල් කරුණාරත්න

**මල්ලවපිටිය සමූහ - අනුර දිසානායක**

'ලෝකයේ පොල් වවන රටවල් අසූ නවයක් තිබෙනවා. ඒ අතරින් ලංකාව හතර වැනි ස්ථානයේ ඉන්නවා. ලෝකයේ හොඳම පොල් තිබෙන්නේ ශ්‍රී ලංකාවේ. මේ වන විට පොල් හිඟයක් රටේ නිර්මාණය වෙලා. ඒ නිසාම පොල් මිල ඉහළයි. ඒත් පොල් වගාකරුවාට හොඳ මිලක් ලැබෙන්නේ නෑ.' යනුවෙන් සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ කැඳවුම්කරු, හිටපු මන්ත්‍රී නාමල් කරුණාරත්න මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ පසුගියදා (29) කුරුණෑගල ජනතා විමුක්ති පෙරමුණ දිස්ත්‍රික් කාර්යාලයේදී පැවති පොල් මිල ඉහළ යෑම සහ පොල් ආදායම අඩු වීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට පැවති මාධ්‍ය හමුවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'පොල් වගාකරුවාට රුපියල් පනහක් හැටක් අතර මිලක් ලැබෙනවා. ඒත් පොල් එළදාව මේ වන විට සියයට හැටකින් විතර පහත වැටිලා. පොල් ගෙඩි දාහක් කැඩෙන වගාවකින් මේ වන විට කැඩෙන්නේ පොල් ගෙඩි හාර සීයක් විතර. පොල් මිල ඉහළ ගියාට ගොවියාගේ සාක්කුවට දැනිලා නෑ. ඒත් පාරිභෝගිකයා පොල් මිල ඉහළ යෑම නිසා බැට කනවා.

දැන් මහජනතාවට එලොව පොල් පේන තත්ත්වයක් උදා වෙලා. අපේ රටේ ඒක-පුද්ගල පොල් පරිභෝජනය එකසිය දාසයයි. ඒ අනුව අපට වාර්ෂිකව පොල් ගෙඩි මිලියන 2,000කට වැඩිය අවශ්‍ය වෙනවා. අප පොල්වලින් ස්වයංපෝෂිත වෙන්න නම් පොල් ගෙඩි මිලියන තුන්දහස් හත් සියය ඉක්මවා නිෂ්පාදනය කළ යුතුයි. නමුත් ලංකාවේ මේ වන විට පොල් නිෂ්පාදනය වෙන්නේ ගෙඩි දෙදහස් පන්සියයක් විතර. මෙවැනි ප්‍රශ්නයක් උද්ගත වෙන්න බලපෑ කාරණාව මොකක්ද කියලා සොයා බලන්න අවශ්‍යයි.

මේ ප්‍රශ්නය පිළිබඳව අප විධිමත් අධ්‍යයනයක් කළා. 1960 සිට 2018 වනතුරු ශ්‍රී ලංකාවට ලැබුණු වර්ෂාපතනය අධ්‍යයනය කළාම නිරීක්ෂණය වුණා, 2016 අවුරුද්දේ අඩුවෙන්ම වර්ෂාපතන ලැබුණු බව. 2016 ඇති වූ නියඟය නිසා පොල් ගස්වල කරටි කඩා වැටුණා. පොල් ගස් මැරුණා. වතුර හිඟය නිසා සත්තු මිය ගියා. බොහෝ වගාබිම් විනාශ වුණා. එහෙම නම් 2016 සිට 2020 අතර කාලය වසර හතරක් ගත වෙලා. පොල් ගෙඩියක කළලයේ සිට ගෙඩියක් බවට පත් වෙන්න අවුරුදු හතරක කාලයක් ගත වෙනවා. ඒ අනුව අද පොල් ගෙඩියක් බවට පත් වෙන කළලය නිර්මාණය වෙලා තිබෙන්නෙ උග්‍ර නියඟය පැවති කාලයේ. ඒ අනුව මේ කළලය දුර්වල වුණා. බාල වුණා. ඒ අනුව ස්වාභාවයෙන්ම පොල් ගස විසින් ගෙඩි සංඛ්‍යාව අඩු කළා. ගෙඩි ප්‍රමාණයෙන් කුඩා කළා. මෙන්න මේ කාරණා නිසා මේ වන විට පොල් එළදාව අඩු වෙලා. අද උද්ගත වෙලා තිබෙන පොල් මිල ඉහළ යෑම සහ පොල් එළදාව අඩුවීමට මේ විද්‍යාත්මක හේතු බලපෑවා.

රටට ඕන තරම් වහිනවා. ඒ වැස්ස ලැබෙන පිළිවෙළ හා දින වකවානු පිළිබඳ වෙනස්කම් තිබෙනවා. නමුත් මේ ලැබෙන වර්ෂාව, ජලය කළමනාකරණය කරගන්න පාලකයන් සමත් වෙලා නෑ.

හිටපු පොල් හා සම්බන්ධ ඇමැතිවරුන් සමග අප සාකච්ඡා කළා. දැන් ඉන්න ඇමැතිවරයා සමගත් සාකච්ඡා කළා. සමුළුවක් කැඳවුවා. යෝජනාවලියක් ඉදිරිපත් කළා. එම යෝජනාවලිය ඇතුලේ තිබෙන ප්‍රධානම කාරණය පොල් ගස ගස් හෙළීමේ පනතට ඇතුල් කරන්න කියන එක. කැබිනට් පත්‍රිකාවක් හැදුවා. නමුත් අනුමත වුණේ නෑ. ගැහැණු තල් ගහ, දෙල් ගහ, කොස් ගහ ගස් හෙළීමේ පනතට අදාල වෙනවා. ගස් හෙළීමේ පනතට පොල් ගහ ඇතුළත් කළා නම් පොල් ගහට රැකවරණයක් ලැබෙනවා. දැන් හිතුමතේ පොල් ගස් කපනවා. අප රජයට කියනවා වහාම මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියලා.

මේ වන විට සරුසාර විශාල පොල් ඉඩම් කොටස් කර විකුණනවා. පසුගිය කාලයේ හිටපු මෛත්‍රීපාල ජනාධිපතිවරයා කුරුණෑගල සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී අප කළ ඉල්ලීමක් අනුව පොල් ඉඩම් කඩන එක තහනම් කළා. නමුත් ඒක ගැසට් එකක් ලෙස හෝ චක්‍රලේඛයක් ලෙස හෝ නිකුත් කළේ නෑ. ඒකත් බොරුවක් බව තේරුම් ගත යුතුයි.

ඊට අමතරව වන අලි හානිය, ඌරන්, රිළවුන්, වඳුරන්, ඉත්තෑවුන්, දඬුලේනා වැනි සතුන්ගෙන් වන හානිය බරපතළයි. අප එකතු වෙලා හැදූ වැඩපිළිවෙළක් තිබෙනවා. අප ආණ්ඩුවට කියන්නේ ඒක වහාම ක්‍රියාත්මක කරන්න. තිබෙන ගස් කපන එක නවත්වන්න. අලුත් පොල් වගාවන් ආරම්භ කරන්න. පොල් ඉඩම් කැබලි කර විකුණන එක නවත්තන්න. ගස් හෙළීමේ පනතට පොල් ගස ඇතුලත් කරන්න.



දැනට මේ ගැටලුවලට තාවකාලික විසඳුමක් දෙන්න කියලා අප ආණ්ඩුවට කියනවා. ඒත් එක්කම අප සාකච්ඡා කර තිබෙන, අනුමත වෙලා තිබෙන යෝජනාවලිය ස්ථිර විසඳුමක් ලෙස ගේන්න කියලා ආණ්ඩුවට බල කරනවා.'

# පසුගිය වසරවල මෙරට පියයුරු පිළිකා රෝගීන් වැඩි වෙලා

## ❯ කොළඹ පුරපතිනී රෝසි සේනානායක



**මැද කොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ**

'පියයුරු පිළිකා පිළිබඳ දැනුවත්භාවය ගෝලීය මට්ටමෙන් සෑම වසරකම ඔක්තෝබර් මාසය කේන්ද්‍ර කරගෙන සිදු කරනවා. එයින් ජනතාවට රෝගයේ ස්වාභාවය, රෝග ලක්ෂණ, වැළැක්වීමේ ක්‍රම සහ කල්තියා හඳුනාගැනීම පිළිබඳ අවබෝධයක් ලැබෙනවා. ලොව පුරා කාන්තාවන් අතර බහුලව දක්නට ලැබෙන පිළිකාවක් වන පියයුරු පිළිකා ශ්‍රී ලංකාවේ ද පසුගිය වර්ෂවල ක්‍රමයෙන් ඉහළ යමින් පවතිනවා.' යැයි කොළඹ පුරපතිනී රෝසි සේනානායක මහත්මිය පැවැසුවාය.

ඒ මහත්මිය මේ බව පැවැසුවේ පසුගියදා (01) කොළඹ නගර ශාලාවේ ඉන්දිරා පිළිකා භාරයේ මෙහෙයවීමෙන් පැවති උත්සවයකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහත්මිය මෙසේ ද කීවාය.

'පියයුරු පිළිකාව වැළැක්වීමට නම් රෝගය කල්තියා හඳුනාගත යුතුයි. පියයුරු පිළිකාව කලින් හඳුනාගැනීමෙන් සහ රෝග විනිශ්චය නිර්ණය කිරීමෙන් ප්‍රතිකාර ලබා ගත හැකියි. පියයුරු පිළිකා සුව කිරීමට මෙය මහඟු අවස්ථාවක්.'

ජාතික පිළිකා මර්දන වැඩසටහනේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය ජානකී විදානපතිරණ මහත්මිය

'මෙරටින් සෑම වසරකම පියයුරු පිළිකා රෝගීන් 3,000ක් 3,500ක් අතර ප්‍රමාණයක් අලුතින් හඳුනා ගැනෙන බව ජාතික පිළිකා මර්දන වැඩසටහනේ වාර්තා වෙනවා. ඒ අනුව දිනකට පියයුරු පිළිකා වැළඳුණු කාන්තාවන් 9ත් 10ත් අතර සංඛ්‍යාවක් හඳුනා ගැනෙනවා. ලෝකයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද කාන්තාවන් වැඩි පිරිසකට වැළඳෙන පිළිකා විශේෂය වන්නේ පියයුරු පිළිකාවයි.

මෙරට පියයුරු පිළිකා වැළඳෙන කාන්තාවන්ගෙන් බහුතරය වයස අවුරුදු පනහ හෝ ඊට ආසන්න වයසේ පසුවන අයයි. පසුගිය වසර කිහිපයේ සිට ශ්‍රී ලංකාවේ පියයුරු පිළිකා රෝගීන්ගේ ප්‍රමාණය වැඩි වෙමින් පවතිනවා. මේ රෝගය මුල් අවස්ථාවේදී හඳුනාගැනීමෙන් ඉතා සාර්ථකව ප්‍රතිකාර කළ හැකියි. එනිසා කාන්තාවන් සුවනාරී සායන හෝ වෙනත් සායනයන් පියයුරු පිළිකා පරීක්ෂාව සිදු කරගැනීම ඉතා වැදගත්.'

ඉන්දිරා පිළිකා භාරයේ ප්‍රධානී වෛද්‍ය ලංකා දිසානායක මහත්මිය

'ඉන්දිරා පිළිකා භාරය බොහෝ හවුල්කරුවන් සමග එකතු වී දැනුවත් කිරීම් සහ ප්‍රවර්ධනය කිරීම් ඔක්තෝබර් මාසයේ ඉටු කරනවා. අපගේ සහාය අවශ්‍ය වන්නේ නම් හෝ රෝගී කාන්තාවකට යම් කිසි උපකාරයක් අවශ්‍ය වන්නේ නම් 011-2088288/ 071-0774488 දුරකතන මඟින් සම්බන්ධ වන්න.'

නාගරික කොමසාරිස් නීතිඥ රෝෂනී දිසානායක, කිසානි රේණුකා ජයසිංහ, එච්. කේ. ගයත්‍රී වික්‍රමසිංහ මහත්මීන් ඇතුළු නාගරික මන්ත්‍රීවරියෝ ද මේ අවස්ථාවට සහභාගී වූහ.

# රයිස් කුකර් දෙනවා කී ආණ්ඩුවට හාල් ටික දෙන්නත් බැරි වෙලා

## ❯ පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම්

**ශිවන්ති ප්‍රනාන්දු**

ජනාධිපතිවරණයේදී රයිස් කුකර් දෙන බව කියමින් ආ ආණ්ඩුවට ජනතාවට හාල් ටික දීමට නොහැකි වී තිබෙන බව පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම් මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ ඊයේ (05) කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'රජය කරන්නේ විස්ස පෙන්න පෙන්නා ජනතා ප්‍රශ්න යට ගහන්නට උත්සාහ කිරීමයි. ජනාධිපතිවරණයට එද්දී ආණ්ඩුව විස්ස පෙන්නලා නෙමෙයි ලූනු ගෙඩිය පෙන්නලා ඡන්දේ ගත්තේ. අද ඒක ගැන කතා කරන්නේ නෑ. විස්ස පෙන්නා එයින් ප්‍රශ්න සියල්ල විසඳෙනවා කියනවා. හැබැයි ජනතා ප්‍රශ්නවලට උත්තර නෑ. ඒවා ඉෂ්ට නොකර යන ගමන භයානකයි. මැතිවරණ වේදිකාවල සමෘද්ධි නැති අයට, දුගී අයට, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් 3000ක් වටිනා ආහාර මල්ලක් දෙන්නයි ජනාධිපතිවරයා එන්නේ කියලා විමල් වීරවංශ මහතා කිව්වා. මාසික ජල බිල්පතට සියයට 15ක සහන දෙනවා කිව්වා. විදුලි ඒකක 30ට අඩු බිල්පත්වලට සියයට 25ක සහන දෙනවා කිව්වා. රයිස් කුකර්, රූපවාහිනී, ගෑස් ලිප් ආදියේ බදු සියයට 50ක් අඩු කරනවා කිව්වා. ගර්භනී මව්වරුන්ට මාසිකව රුපියල් 2000ක් දෙනවා යැයි විමල් වීරවංශ මහතා කිව්වා. හැබැයි රයිස් කුකර් දෙනවා කිව්ව ආණ්ඩුවට හාල් ටික දෙන්න බැරි වෙලා. සාමාන්‍ය ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු කරන්න ආණ්ඩුවට බැරි වෙලා. ජනතාවට ජීවන වියදම එක්ක පොහොර නෑ, විශ්‍රාම වැටුප්, රාජ්‍ය සේවක අතිකාල නතර කළා. රටවිරුවන්ට ආපසු එන්න විදිහක් නෑ. ආයතන වැසිලා. කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ප්‍රශ්න. වග කිව යුතු විපක්ෂයක් ලෙස අප කතා කරන්නේ ජනතාවගේ ප්‍රශ්න ගැන. ආණ්ඩුව තම වෘත්තීය ප්‍රතිපත්ති වරද ගත්තේ කොරෝනා නිසා නොවෙයි. කොරෝනා එන්න කලින් කාර්තු 03දීම ආර්ථිකය ඍණ වුණා.

ජනතාවගේ භාණ්ඩ මිල සතයකින්වත් අඩු වුණේ නෑ, වැඩි වුණා පමණයි. ගිය සතියේ මූඩී ප්‍රමිති ආයතනය සහ ඉන්දියාවේ මෝදි අගමැතිවරයා රටේ ආර්ථිකය ගැන ප්‍රකාශ කර තිබුණා. මූඩීස් ආයතනය ලංකාවේ මූල්‍ය කළමනාකරණය වැරැදියි කියලයි කිව්වේ. හැබැයි ආණ්ඩුව ඒකට ගැහුවා. මේකෙන් විදේශ ණය ගැනීමට රටට බාධා ඇති වෙයි. මේක ඍජුවම බලපාන්නේ රටේ පුංචි මිනිසාට. කුඩා කර්මාන්ත කරන පුංචි මිනිසාට සීනි, පරිප්පු, සැමන් මිල තව තවත් වැඩි වෙනවා. මේ රජයේ වැඩපිළිවෙළ, නොහැකියාව නිසා ඡන්දදායකයා වග කියන්න ඕනෑ. මීට වඩා මොකක්ද ඕන බලය. උපරිම බලය ජනාධිපතිවරයාට තිබෙනවා. ඒ නිසා මේක වෙනස් කරන්න ආණ්ඩුව ක්‍රියා කළ යුතුයි.'

සමගි ජනබලවේගයේ සාමාජික රවී ජයවර්ධන මහතා

'ජනාධිපතිවරයා පත් වෙලා අවුරුදු 02 සම්පූර්ණ වෙද්දී මේ රට තිබෙන්නේ කොතැනද? මූඩීස් රේටින් අනුව දකුණු අප්‍රිකාවේ දුප්පත්ම රාජ්‍ය ඇන්ගෝලාවේ කැටගරි එකට ලංකාව පත් වෙලා. ඒක තමයි ලංකාවේ ශේෂ පත්‍රය. විසි වැනි සංශෝධනයෙන් 78 ව්‍යවස්ථාවට වඩා බලයක් ආණ්ඩුව ඉල්ලුවත් මේ වෙද්දී එය ඉතාම දියාරු ලියවිල්ලක් බවට පත් වෙලා. විසි වැනි සංශෝධනය අද පොඩි එකාගේ ලියුම වගේ. ඒ බලය ගැන තිබු තණ්හාව නිසා. ඒ වගේම ආණ්ඩුව කොරෝනා නිසා ජයග්‍රහණය කරන බව කිව්වා. අද තත්ත්වය වෙනස්. ජනතාවගේ ජීවන බර ගැන ආණ්ඩුව හිතන්නේ නෑ. කහ, හාල්, පොල් දෙන්න බැරි නම් මොකක්ද මේ ආණ්ඩුව කියලා අපි අහන්න කැමතියි. ආණ්ඩුවට සැලැස්මක් නෑ. දිගින් දිගටම යන්නේ ප්‍රපාතයට. අප දැක්කා ආණ්ඩුව ඇතුළෙන් ඇවිත් තිබෙනවා 20 ගැන විරෝධයක්. මේ 20 වැනි සංශෝධනය විනාසකාරී එකක්. අපි හිතනවා අවසන් මොහොතේ හරි මේක වෙනස් කරගන්න පුළුවන් වෙයි කියලා. විසි වැනි සංශෝධනය සම්මත වුණොත් මේක යළි ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් වන එකක් නෑ.සමගි ජනබලවේගය ස්වාධීන බලවේගයක්. අපේ සන්ධානය ශක්තිමත්. මෙහි තව පක්ෂ තිබෙනවා. ඒවායේ නායකයන් කොයි ආකාරයට වැඩ කරයිද අප දන්නේ නෑ. හැබැයි අප කාගේවත් කොන්දේසිවලට යටත් වෙන්නේ නෑ. අපේ ප්‍රතිපත්තිවලයි අප ඉන්නේ. මොකක් හරි දෙයක් කර ගන්න අප අපේ ප්‍රතිපත්ති පාවා දෙන්නේ නෑ.'



# සියලු දහම් පාසල් වසා දමන්න

දිවයින පුරා තිබෙන බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ කතෝලික සියලු දහම් පාසැල් නැවත දැනුම් දෙන තුරු වසා දමන ලද බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ප්‍රකාශ කරයි.

# රාජ්‍ය අමාත්‍ය නාලක ගොඩහේවාගෙන්

## දේශපාලන පළි ගැනීම් කළැයි දූෂණ විරෝධී කමිටුවට සිතාසි

**රෝෂන් තුෂාර**

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ අපද්‍රව්‍ය බැහැර කිරීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මහතාට එරෙහිව බොරු සාක්ෂි මත නඩු පැවරීමට කටයුතු කළේයැයි කියන හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයින්ට ලබන 16 දින පෙනී සිටින්නැයි දේශපාලන පළි ගැනීම් පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසම ඊයේ (05) සිතාසි නිකුත් කළේය.

බොරු සාක්ෂි මත නඩු පැවරීමට කටයුතු කළ සුරක්ෂිත කරුණාරත්න, හිටපු අධ්‍යක්ෂ වජිර විජේගුණවර්ධන, පරිපාලන හා මූල්‍ය අධ්‍යක්ෂිකා අයන්ති ජයරත්න හා තුෂාර ජයරත්න යන අයට ද එදින පෙනී සිටින ලෙසට සිතාසි නිකුත් කළේය.

රාජ්‍ය අමාත්‍ය නාලක ගොඩහේවා මහතා විසින් සාක්ෂි දීමෙන් අනතුරුව දූෂණ විරෝධී කමිටුව හා සුරකුම්පත් හා විනිමය කොමිසන් සභාවේ සාමාජිකයින් වගඋත්තරකරුවන් කරමින් මෙසේ සිතාසි නිකුත් කළේය. දූෂණ විරෝධී කමිටුවේ සභාපති හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ හා විජයදාස රාජපක්ෂ මහත්වරුන් කොමිසම හමුවේ දී ඇති සාක්ෂි මෙම පැමිණිල්ලට අදාළ කරගන්නා ලෙසට කොමිසමේ සභාපති විනිසුරුවරයා දන්වා සිටියේය.

හිටපු අමාත්‍ය මංගල සමරවීර, පාඨලී චම්පික රණවක, රවුෆ් හකීම්, එම්.ඒ. සුමන්තිරන්, අනුර කුමාර දිසානායක, ජේ.සී. වැලිඅමුණ, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, සරත් ෆොන්සේකා, දූෂණ විරෝධී කමිටු අධ්‍යක්ෂ ආනන්ද විජේපාල යන සාමාජිකයින්ට ද නොතිසි නිකුත් කළේය.

මීට අමතරව පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ උප පොලිස් පරීක්ෂක ලලිත් නිශාන්ත ද වගඋත්තරකරුවකු ලෙස නම් කළ අතර, ඒ මහතාට ද සිතාසි නිකුත් කෙරිණි.









ඇබෑර්තු

මේසන්වරු/වඩුබාස්වරු

මේසන් බාස්ලා අවශ්‍යයි. කම්කරුවන් සමග මේසන් වැටුප 3000/ - කම්කරු 2000/ - විමසන්න. 0777807377 *061394*

# 'අපේ කිතුල' විද්වත් කතිකාව සහ නිෂ්පාදන ප්‍රදර්ශනය 7 සහ 8 බත්තරමුල්ල සෙත්සිරිපායේදී

**චන්දිමා කරුණාරත්න**

'අපේ කිතුල' විද්වත් කතිකාවත, හෙට (7) සහ අනිද්දා (8) උදේ 8.00 සිට දහවල් 1.00 දක්වා සෙත්සිරිපාය, මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘති කාර්යාලය, 6 වැනි මහලේ දී පැවැත්වෙන අතර, නිෂ්පාදන ප්‍රදර්ශනය උදේ 8.30 සිට සවස 4.00 දක්වා සෙත්සිරිපාය, එළිමහන් පරිශ්‍රයේදී පැවැත්වේ.

පොල්, කිතුල් හා තල් වගාව ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, සෞඛ්‍ය පර්යේෂණ හා නවෝත්පාදන සංගමය, වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ එක්ව මෙය සංවිධානය කරනු ලැබේ. මේ හරහා පාරම්පරික ඥානය ජනගත කිරීම අරමුණු කරගැනීමට බලාපොරොත්තු වේ.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ විශේෂ මැදිහත්වීම මත වස විෂෙන් තොර ආහාර රටාවකට රට යොමු කිරීම වෙනුවෙන් කිතුල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ කර්මාන්තය ප්‍රවර්ධනයට රජයේ සෘජු මැදිහත්වීම ලබාදීම මෙම වැඩසටහනේ අරමුණය.

වැවිලි අමාත්‍ය, වෛද්‍ය රමේෂ් පතිරණ, පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය, අරුන්දික ප්‍රනාන්දු මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මෙම වැඩසටහනේ ප්‍රධාන දැනුවත් කිරීම හා විද්වත් කතිකාවත වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය, මහාචාර්ය රාජ් සෝමදේව, ආචාර්ය රවීන්ද්‍ර විතානාච්චි, මහාචාර්ය සිරිමල් ප්‍රේම කුමාර, මහාචාර්ය සේනක පිලිපිටිය, වෛද්‍ය මාලිකා උඩගෙදර, ඉංජිනේරු කපිල පෙරේරා යන මහත්ම මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.




NiSACO නිසාකෝ Since 1997 நிசாகோ

NiSACO 011-2744444 බොරැල්ල පාර, අතුරුගිරිය. ෆැක්ස් - 011-2560535

www.nisaco.lk E-mail- nisacofurniture@gmail.com සියලුම ප්‍රදර්ශනාගාර සෑම දිනකම විවෘතයි

කළුබෝවිල | නුගේගොඩ | පන්නිපිටිය | නාරාහේන්පිට | විද්‍යාල හන්දිය

ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න

දිනමිණ වටපිට

# මහජන බැංකුව

## බේරා නොගත් උකස් භාණ්ඩ වෙන්දේසිය

මහජන බැංකුවේ 2019.03.31 දින දක්වා උකස් තබා ශාඛා හා සේවා මධ්‍යස්ථාන වලදී බේරා නොගත් රන් භාණ්ඩ පහත සඳහන් දිනයන්හි මහජන වෙන්දේසියේ අලෙවි කරනු ඇත. වෙන්දේසිය පෙ.ව. 9.00 සිට පහත සඳහන් දිනයන් හා ස්ථානයන් හිදී පවත්වනු ලබන බව මෙයින් දන්වමු.

| ශාඛාව | | පහත දිනට බේරා නොගත් | වෙන්දේසි දිනය සහ ස්ථානය |
|---|---|---|---|
| හැටන්<br>ගිනිගත්හේන<br>මස්කෙළිය<br>බගවන්තලාව<br>තලවකැලේ<br>පුඬළුඔය ශාඛාව | දික්ඔය<br>කොටගල<br>වටවල<br>අප්කොට්<br>ආගරපතන<br>තවලන්තැන්න<br>හපුගස්තලාව | 2020.10.25 | 2020.10.26<br>හැටන් ශාඛාව |
| හඟුරන්කෙත<br>රිකිල්ලගස්කඩ<br>තිල්දණ්ඩාහිත්න | හේවාහැට<br>පදියපැලැල්ල<br>අධිකාරිගම<br>වලපනේ | 2020.10.26 | 2020.10.27<br>හඟුරන්කෙත ශාඛාව |
| රාගල<br>උඩපුස්සැල්ලාව<br>නුවරඑළිය | රාගල<br>උඩපුස්සැල්ලාව<br>කඳපොල<br>නානුඔය | 2020.10.27 | 2020.10.28<br>රාගල ශාඛාව |

ඉහත සඳහන් පරිදි දිනයන් හා කාල වකවානු ප්‍රසිද්ධ කර තිබුණද, බැංකුවේ අභිමතය පරිදි වෙනත් දැනුම් දීමකින් තොරව වෙන්දේසි අවලංගු කිරීම, ඒකාබද්ධ කිරීම හෝ කල් දැමීමේ අයිතිය මහජන බැංකුව සතුය.

**ප්‍රාදේශීය කළමනාකාර,**
**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,**
**නුවරඑළිය.**

මහජන බැංකුව PEOPLE'S BANK

www.peoplesbank.lk

# 20න් ආණ්ඩුව පිරිහීමට පුළුවන්

## විජයදාස රාජපක්ෂ

**නදී මාණික්කගේ**

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත මගින් ආණ්ඩුව පිරිහීමටත් පාක්ෂිකයන් අපේක්ෂා භංගත්වයට පත් වීමටත් ඉඩ ඇතැයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජයදාස රාජපක්ෂ මහතා සඳහන් කරයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත මෙම සංශෝධනය සම්බන්ධයෙන් තම මතය දක්වමින් යොමු කරන ලද ලිපියක මේ බව සඳහන් කර ඇත.

පසුගිය ආණ්ඩු සමයේ ආණ්ඩු පාලනය ගැටලුකාරී තත්ත්වයට පත්වූයේ මෙරට පැවති වෛරී දේශපාලන සංස්කෘතිය තුළ එකිනෙකාට එරෙහිව කටයුතු කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා ජනාධිපති ධුරය හෙබවීමත්, එක්සත් ජාතික පක්ෂයේ නායකයා අග්‍රාමාත්‍ය ධුරය හෙබවීමත් නිසා බවත් එවකට ජනාධිපතිවරයා ඔහුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හිමිව තිබූ බලතල ක්‍රියාත්මක නොකිරීම, ව්‍යවස්ථාදායක සභාව ස්වාධීනව කටයුතු නොකරමින් දේශපාලනීකරණය වීම හා කොමිෂන් සභාවලට කොමසාරිස්වරුන් පත් කිරීමේ සහ ඉවත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ පැවති ගැටලුකාරී තත්ත්වය හේතුවෙන් බවත් ලිපියෙහි සඳහන් වේ.

මෙම ප්‍රශ්න නිරාකරණය සඳහා ගෙන ආ යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි අඩංගු විය යුතුව තිබුණේ ඉතාමත් සරල, මහජන විරෝධය අවම කරගත හැකි සුළු සංශෝධන කිහිපයක් බවත් ඒවා නම් අමාත්‍යවරුන් පත් කිරීමේදී අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් සහිතව අමාත්‍යවරුන් තීරණය කිරීම වෙනුවට ජනාධිපතිවරයාගේ අභිමතය අනුව සියලු අමාත්‍යවරුන් පත් කිරීමට ජනාධිපතිට බලය ඇත්තේය යනුවෙන් සංශෝධනය කිරීම, ව්‍යවස්ථාදායක සභාව වෙනුවට යෝජිත 20 වන සංශෝධනයෙන් යෝජනා කර ඇති පරිදි පාර්ලිමේන්තු සභාවක් ස්ථාපිත කිරීම, කොමිෂන් සභාවල කොමසාරිස්වරුන්ගේ ක්‍රියාකලාපය අනුව ඔවුන් ස්වාධීන ලෙස සහ කාර්යක්ෂම ව කටයුතු නොකරන බවට ජනාධිපතිගේ මතය වේ නම් පාර්ලිමේන්තු සභාවේ ද අදහස් විමසා කොමසාරිස්වරුන් ඉවත් කිරීම සඳහා ජනාධිපතිවරයා වෙත බලය ඇති බවට ප්‍රතිපාදන සැකසීම යන කාරණා බවත්ය.

මතභේදයකට හෝ මහජන විරෝධයකට බඳුන් නොවන සේ මෙවැනි සුළු සහ සරල සංශෝධනයක් කළ හැකිව තිබියදී රට තුළ මහත් ආන්දෝලනයක් ඇති කරමින් ඉදිරිපත් කර ඇති 20 වන සංශෝධනය මගින් ආණ්ඩුව පිරිහීමට පත්විය හැකි බවත් මෙවන් තත්ත්වයක් යටතේ මහජන පරමාධිපත්‍යයට ගරු කරන මන්ත්‍රීවරයකුට හෘද සාක්ෂියට එකගව 20 වැනි සංශෝධනයට පක්ෂව ඡන්දය දීම කළ හැකිද යන්න පිළිබඳ තමා තුළ බරපතළ ප්‍රශ්නයක් මතු වී ඇති බවත් එහි වැඩිදුරටත් සඳහන් වී තිබේ.

ත්‍රිපල් ෆෝචූන් Mega POWER මෙගා පවර් மெகா பவர்

NLB NATIONAL LOTTERIES

## දිනුම් වාරය 632 නිල ප්‍රතිඵල

දිනය: 2020.10.04

ඉංග්‍රීසි අකුර: K | සුපිරි අංකය: 23 | ජයග්‍රාහී අංක: 26 27 58 77

| | ත්‍යාග රටාව | ත්‍යාග මුදල රු. | ජයග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 වන ත්‍යාගය | අංක 4 ක් පමණක් ගැළපේ නම් | 1,000,000.00 | 01 |
| 2 වන ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000.00 | 08 |
| 3 වන ත්‍යාගය | අංක 3 ක් පමණක් ගැළපේ නම් | 1,000.00 | 107 |
| 4 වන ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500.00 | 231 |
| 5 වන ත්‍යාගය | අංක 2 ක් පමණක් ගැළපේ නම් | 100.00 | 5,955 |
| 6 වන ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 40.00 | 4,030 |
| 7 වන ත්‍යාගය | අංක 1 ක් පමණක් ගැළපේ නම් | 20.00 | 98,487 |
| 8 වන ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20.00 | 17,912 |

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 51,880,633.20

මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 11,151,072.80

මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 18,612,194.40

දිනා ඇති මුළු මුදල රු. 5,107,180.00

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය — නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01. දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585 ෆැක්ස්: 0112 433 631, වෙබ් අඩවිය: www.nlb.lk

## 2020-10-04 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 604,286

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 25,251,130.00

රු. 2,000,000.00 ත්‍යාග 01 රු. 1,000,000.00 ත්‍යාග 02 රු. 100,000.00 ත්‍යාග 25

www.nlb.lk

## ධන නිධානය නිල ප්‍රතිඵල

දිනය - 2020/10/04

දිනුම් වාරය - 324

ඉංග්‍රීසි අක්ෂරය: F | ජයග්‍රාහී අංක: 01 05 13 33

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000.00 | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000.00 | 01 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 3,000.00 | 61 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 1,000.00 | 147 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100.00 | 3,343 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 60.00 | 2,257 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20.00 | 56,379 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20.00 | 10,604 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 2,239,380.00
බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 72,792

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය 118,270,917.04

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6කෙ කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය தேசிய லொத்தர் சபை NATIONAL LOTTERIES BOARD — අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01. දුරකථන 011 460 7000 011 232 4324

## ගොවි සෙත නිල ප්‍රතිඵල

දිනුම් වාරය 2560 | දිනුම් අදින ලද දිනය 2020.10.04

ඉංග්‍රීසි අක්ෂරය: M | ජයග්‍රාහී අංක: 23 29 30 78

| | සංයෝගය | තෑගි මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. 1,000,000.00 | 01 |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි | රු. 100,000.00 | 04 |
| 3 ත්‍යාගය | අංක 3 ක් පමණක් නිවැරදි | රු. 2,000.00 | 147 |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි | රු. 1,000.00 | 361 |
| 5 ත්‍යාගය | අංක 2 ක් පමණක් නිවැරදි | රු. 100.00 | 8745 |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි | රු. 40.00 | 5716 |
| 7 ත්‍යාගය | අංක 1 ක් පමණක් නිවැරදි | රු. 20.00 | 143421 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි | රු. 20.00 | 26229 |

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 184,624

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 6,551,140.00

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 61,203,581.60

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6කෙ කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 සහ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.



ජාතික ලොතරැයි මණ්ඩලය தேசிய லொத்தர் சபை NATIONAL LOTTERIES BOARD — නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01. දුරකථන : 0114 607 000, 0112 324 324 ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

## දිනුම් වාරය - 4265 නිල ප්‍රතිඵල

## මහජන සම්පත

දිනය: 2020-10-04

ජයග්‍රාහී අක්ෂරය: H | ජයග්‍රාහී අංක: 3 5 1 1 6 2

ත්‍යාග රටාව - අග සිට මුලට

| | රටාව | ත්‍යාගය | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | 3 5 1 1 6 2 | රු. 2,000,000/- | 01 |
| 2 වැනි ත්‍යාගය | 5 1 1 6 2 | රු. 100,000/- | 10 |
| 3 වැනි ත්‍යාගය | 1 1 6 2 | රු. 10,000/- | 102 |
| 4 වැනි ත්‍යාගය | 1 6 2 | රු. 1,000/- | 989 |
| 5 වැනි ත්‍යාගය | 6 2 | රු. 100/- | 9,886 |
| 6 වැනි ත්‍යාගය | 2 | රු. 20/- | 97,819 |

ත්‍යාග රටාව - මුල සිට අගට

| | රටාව | ත්‍යාගය | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | 3 5 1 1 6 | රු. 10,000/- | 09 |
| 8 වැනි ත්‍යාගය | 3 5 1 1 | රු. 1,000/- | 92 |
| 9 වැනි ත්‍යාගය | 3 5 1 | රු. 100/- | 978 |
| 10 වැනි ත්‍යාගය | 3 5 | රු. 50/- | 9,785 |
| 11 වැනි ත්‍යාගය | H | රු. 20/- | 39,187 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 9,506,770.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිටමාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 20,909,999.00

NLB ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය 32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01 දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416. www.nlb.lk

## නිල ප්‍රතිඵල

## සෙවණ

සෙවණ ඔබට ගෙවල් - අතට මුදල් உங்களுக்கு வீடு – கைகளில் காசு

දිනය 2020/10/04

දිනුම් වාරය 301

ඉංග්‍රීසි අකුර: Y | ජයග්‍රාහී අංක: 03 36 43 52

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000/- බැගින් | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000/- බැගින් | 02 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 1,000/- බැගින් | 63 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 200/- බැගින් | 139 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100/- බැගින් | 3,426 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 50/- බැගින් | 2,008 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20/- බැගින් | 48,210 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20/- බැගින් | 7,433 |

- ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම් පත අනිවාර්ය වේ.

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 14,000,000/-

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 1,846,660/-

ජාතික ලොතරැයි මණ්ඩලය தேசிய லொத்தர் சபை NATIONAL LOTTERIES BOARD — අංක 32, දේශමාන්‍ය N.W.J. මුදලිගේ මාවත, කොළඹ 01. දුරකතනය: 011 460 70 00 | 011 232 43 24 ෆැක්ස්: 011 4669416 වෙබ්: www.nlb.lk

# රසමංජරිය

සතියේ රස මංජුසාව



# ටෙලි නාට්‍ය රැකගන්න ඕනෑ

වේදිකා නාට්‍ය වැඩමුළු, පර්යේෂණාත්මක වේදිකා නාට්‍ය, වේදිකා නාට්‍ය හරහා රංගනයට අත්පොත් තබන ආනන්ද කුමාරඋන්නැහේ, 16 වැනි රයිගම් ටෙලීස් සම්මාන උලෙළ - 2019 වසරේ හොඳම නළුවා සම්මානය දිනා ගනියි. ඒ සුනිල් කොස්තාගේ 'සුදු ඇඳගෙන කළු ඇවිදින්' ටෙලි නාට්‍යයේ විල්සන් නම් චරිතය වෙනුවෙනි. මේ දිනවල විකාශය වන, චරිත් අබේසිංහගේ 'සත්‍යා' ටෙලි නාට්‍යයෙන් රසික ඔබ හමුවට එන ඔහු මේ දිනවල සුමිත් රත්නායකගේ 'මහපොළොව' සහ සුනිල් කොස්තාගේ 'CAN YOU HEAR ME' යන ටෙලි නාට්‍යවල රූගත කිරීම්වලට සහභාගි වේ.

## ආනන්ද කුමාරඋන්නැහේ

**ඔබ මේ ගමන එන්නේ වේදිකා නාට්‍ය කලාවේ දුෂ්කරතා හා එහි සුන්දරත්වය විඳිමින්. එහෙත් බොහෝ රසිකයන් ඔබව හඳුනාගන්නේ රූපවාහිනී තිරයෙන්?**

ඉබේ පූදින ගොයම් එහෙම තමා. යමක් පැළ කරලා, යම්කිසිවක් අරගෙන තමයි, කිසියම් විදිහකට ඒක මතුවෙන්නේ. ඒ තමයි ස්වාභාවික ක්‍රමය.

මා පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට යන කාලේ පාසල් වේදිකාවේ නාට්‍ය කළා. පාසල් කාලයෙන් පස්සේ, නාට්‍ය වැඩමුළුවලට සහභාගි වුණා. ඒ අතර තිස්ස ඩයස් මහත්තයගේ වැඩමුළුවලටත් ගියා. ජයලාල් රෝහණ. ලාල් ප්‍රේමරත්න, රොයිස්ටන් ජූඩ්, චමත් ජයසිංහ අපි කට්ටිය එක්වෙලා වැඩමුළු දිගටම කරගෙන ගියා. ඒ අතර අපි එකතුවෙලා පර්යේෂණ නාට්‍ය කළා. ඒවා කළේ ඉගෙන ගන්න.

වැඩමුළු හරහා වේදිකා නාට්‍යවලට සම්බන්ධ වුණා. නාට්‍ය කලාව ගැන අධ්‍යයනය කළා. යෞවන සම්මාන සඳහා නාට්‍ය කළා.

1986 වසරේ මුල්ම ටෙලි නාට්‍යයට සම්බන්ධ වෙනවා. ඒ සුදත් සේනාරත්න මහත්තයාගේ මවකගේ ගීතයේ ටෙලි නාට්‍ය යේ පියදාස කියන චරිතයට. එහෙම තමයි මගේ ගමන ආරම්භ වෙන්නේ.

මිනිස්සු වේදිකා නාට්‍ය බලන්න යනවා අඩුයි. කලාව කියන්නේ චිත්‍රපට, ටෙලි නාට්‍ය විතරක් නෙවේ. චිත්‍රය, ඡායාරූපය, නර්තනය ඒකත් කලාවක්. සකල කලාවෙන් ම කරන්නේ මනුෂ්‍යයා පෝෂණය කරන එක.

**මෙවර රයිගම් ටෙලීස් උලෙළේ හොඳම නළුවා වන්නේ ඔබ. ඒ 'සුදු ඇඳගෙන කළු ඇවිදින්' ටෙලි නාට්‍යය සඳහා. ඒ විල්සන් කියන චරිතය ප්‍රතිනිර්මාණය කිරීම වෙනුවෙන්. කොහොමද ඔබ විල්සන් වෙන්නේ?**

මීට කලින් මම සුනිල් කොස්තා එක්ක වැඩකළ නිසා. ඒ ඔහුගේ 'පියස' කියන ටෙලි නාට්‍යයේ . ඒක මා සාර්ථක ව කළා කියන විශ්වාසය ඇතිව එතුමා 'සුදු ඇඳගෙන කළු ඇවිදින්' ටෙලි නාට්‍යයේ විල්සන් කියන චරිතය මට බාරදුන්නා. එයට මා සුනිල් කොස්තාට ස්තූතිවන්ත වෙන්න ඕනෑ.

**ඔබ කොහොමද 'සුදු ඇඳගෙන කළු ඇවිදින්' ටෙලි නාට්‍යයේ විල්සන් කියන චරිතය හඳුනාගන්නේ?**

මුලින්ම පිටපත කියෙව්වා.ඊට පස්සේ අධ්‍යක්ෂවරයා සහ පිටපත් රචකයා එක්ක සාකච්ඡා කළා. පස්සේ, ඒ චරිතයට එකතු කළ යුතු අමුද්‍රව්‍ය ටික එකතු කරගත්තා. එවැනි චරිත ගැන අධ්‍යයනය කළා. රංගනය ගැන, චරිතයක් ගැන කොපමණ අධ්‍යයනය කළත්, ලැබෙන චරිතය ගැන ආයෙ අමුතුවෙන් අධ්‍යයනය කළ යුතුමයි.

**මේ සම්මාන ලැබීම ගැන ඔබට දැනෙන විදිහ සහ පොදුවේ සම්මානයක් ලැබීම රංගන ශිල්පියක්ට වැදගත් වෙන්නේ මොන විදිහටද?**

සම්මානයක් ලැබීම කියන්නේ, කෙනෙකුට ලොකු ධෛර්යයක්. ලොකු ආශිර්වාදයක්. ලොකු සතුටක්. උත්තේජනයක්. ඒ වගේම නිර්මාණ ජීවිතයට ලොකු වගකීමක් එක්වෙනවා. ඒ වගකීම නිසා, අපි තවදුරටත් අධ්‍යයනවල නිරත වෙනවා. තවදුරටත් අප හොඳ දේ පමණක් කරන්න යොමු වෙනවා.

**රංග කාර්යය ගැන පලකරන මත විවිධයි. රංගනය කියන විෂය ගැන ඔබගේ කියවීම මොන වගේ එකක්ද?**

සමාජයේ යම් යම් දේ ප්‍රතිනිර්මාණය කිරීමක්. යම් මානව විෂයක්, මානව චාර්යා ගැන, සිතුම් පැතුම්, හැඟීම් පිළිබඳ ව ප්‍රතිනිර්මාණය කර නිරූපණය කිරීමක්. රංගනය ගැන විවිධ අර්ථ තියෙන්න පුළුවන්. ප්‍රශ්නය ඒක නෙවේ, අපි එයින් මොකක්ද කරන්නේ කියන එක.

**ඔබ වේදිකා නාට්‍යයක හෝ ටෙලි නාට්‍යයක චරිතයකට සූදානම් වන්නේ කුමන විදහකටද?**

මා ටෙලි නාට්‍ය හෝ වෙන යම් නිර්මාණ ගොඩක් බාර ගන්න කෙනෙක් නෙවේ. විශේෂයෙන් ම ලංකාවේ ප්‍රධාන පෙළේ, ඉන්න ටෙලි නාට්‍ය හෝ සිනමා නිර්මාණ කරන, ගුණාත්මක දේ කරන අධ්‍යක්ෂවරුන්ට පමණයි මගේ දායකත්වය දෙන්නේ.

යම් චරිතයකට මට කතා කළාම, ඒ පිටපත බලලා ඒ චරිතයට සූදානම් වෙනවා. පිටපත් රචකයා සහ අධ්‍යක්ෂවරයා හා මේ ගැන කතා කිරීමෙන් පසුව, මගේ දැනීම අනුව මගේ අත්දැකීම්වලට අනුව චරිතයට ලැහැස්ති වෙනවා.

ලැබුණු චරිතය ගැන අධ්‍යයනයක යෙදිලා, ඒ චරිතයට සමාන අය හා කතාබහ කරලා යම් රූපයක් මවා ගන්නවා. ලැබෙන චරිතය පරිපූර්ණ කරගැනීමට තමයි, මං උත්සාහ ගන්නේ.

**අද ටෙලි නාට්‍ය කලාව කිසියම් පසුබෑමකට ලක්ව ඇති බවයි එහි නිරතවන්නන්ගේ සහ විද්වතුන්ගේ අදහස?**

ටෙලි නාට්‍ය කලාව කඩාවැටිලා. ඒ අපේම ශිල්පීන්ගේ වරද නිසා. මුදල් ලාබ ලබා ගැනීමට ප්‍රමිතියකින් තොර නිර්මාණ බිහිකිරීම නිසා, මේ තත්ත්වය උදාවෙලා. කැමරාවක් අටවගෙන මොකක් හරි දෙයක් කරලා, යම් යම් බලපෑම් මතින් තමන්ගේ ටෙලි නාට්‍ය පෙන්නගන්නවා. හැමෝම මේක අතපත ගාන්න ගිහිල්ලා විනාශ කරලා තියෙන්නේ.

සමස්ත රූපවාහිනී වැඩසටහන්, ජනතාව විසින් ප්‍රතික්ෂේප කළ යුගයක් තිබුණා. තාමත් එහෙමයි. ඒක ගොඩක් දුරට නැති වුණේ 'කූඹියෝ' ටෙලි නාට්‍ය නිසා. නැවත රූපවාහිනිය දිහා බලන්න පටන් ගත්තා. මේ තත්ත්වය දිගට ම රැකගන්න එක තමයි, කාගෙත් යුතුකම. රැකගත්තොත් සමාජයට ලොකු දෙයක් දෙන්න පුළුවන්.

සමාජයට රසිකත්වය, ආදරය, මනුෂ්‍යත්වය, පරිත්‍යාගය ඇතිකරන්න පුළුවන්. සියලු ම මානව ධර්මතා, සමාජය තුළ වපුරන්න පුළුවන් ලොකුම උපකරණය තමයි රූපවාහිනිය කියන්නේ.

ඒක ජාතික සම්පතක්. රැකගැනීම, රජයේ සහ හොඳ නිර්මාණ ශිල්පීන්ගේ වගකීම සහ යුතුකම.

**සිනමාවට ඔබගේ දායකත්වය කොහොම ද?**

සිනමා නිර්මාණ කීපයකට සම්බන්ධ වුණා. ඒ ඉන්දික ෆර්ඩිනැන්ඩුගේ 'හෝ ගානා පොකුණ', මලිත් හඳපාන්ගොඩගේ 'දැකලා පුරුදු කෙනෙක්', පාලිත පෙරේරාගේ 'තාල' වගේම ප්‍රදීප් ධර්මදාසගේ 'අයිස්ක්‍රීම්', කසුන් චන්ද්‍රනාත්ගේ 'නයිට් රයිඩර්', ප්‍රසන්න විතානගේ 'ගාඩි' චිත්‍රපටවලට.

**මේ දිනවල විකාශනය වන චරිත් අබේසිංහගේ 'සත්‍යා' ටෙලි නාට්‍ය යේ චරිතය ගැන කතා කරමු?**

මෙහි මං රඟපාන්නේ, මිනී කනත්තක් බාරව ඉන්න මනුස්සයෙක්ගේ චරිතයක්. සමහර චරිත ගැන අපට අත්දැකීම් නෑ. මේ චරිතයත් ඒ වගේ චරිතයක්. එහෙම චරිතවලට අප පිවිසෙන්නේ උපකල්පනය කිරීමෙන්. මේ තැනැත්තා එතරම් අධ්‍යාපනයක් තියෙන කෙනෙක් නෙවේ.

**මේ චරිතය විසින් පණ තියෙන කෙනෙක් ව නොදැනුවත්ව ම වළලන්න වෙනවා. ඉතිං ඒ වගේ කොච්චර නම් වැරදි අප අතින් සිද්ධ වෙලා ඇද්ද?**

සංකීර්ණ දේශපාලන, සමාජයේ ආර්ථික වටපිටාවක පරිස්සම් වෙන්න ඕනේ. අප නොදැනීම අපෙන් සිද්ධ වෙන්න පුළුවන්. මා මේ චරිතය වටහාගත්තේ ඒ විදිහට. තව කෙනෙකුට, තව අදහසක් තියෙන්න පුළුවන්.

**වේදිකාව අමතක කරලද?**

වේදිකාව අමතක කරලා නෑ. ඒකට මට වෙලාවක් නෑ. මා කුඩා ව්‍යාපාරයක් කරන ගමන් තමයි කලාවේ නිරතවෙන්නේ.

**අනුසාර මාහිංගොඩ**

## 'සුනාමි' බයෙල්සා උලෙළට



ප්‍රවීණ සිනමාවේදී ආචාර්ය සෝමරත්න දිසානායකගේ අධ්‍යක්ෂණයක් වන 'සුනාමි' සිනමා පටය නයිජීරියාවේ, යොනහෝවාවල බයෙල්සා අන්තර්ජාතික සිනමා උලලේ තරඟකාරී අංශයට සුදුසුකම් ලබා ඇත.

මෙම උලෙළ මේ මස 21 වැනිදා ආරම්භ වේ. ප්‍රථම වරට පැවැත්වෙන මෙකී උලෙළ සඳහා අමෙරිකාව, ඉතාලිය, ඉන්දියාව, ස්පාඤ්ඤය, බ්‍රිතාන්‍යය ඇතුළු රටවල් 26 කට අයත් සිනමාපට 70 ක් නිල වශයෙන් සුදුසුකම් ලබා තිබේ. එයින් සිනමාපට 30 ක් සම්මාන 13 ක් සඳහා නිර්දේශ කර ඇත.

ආචාර්ය සෝමරත්න දිසානායකගේ 'සුනාමි' සිනමාපටය ජූරි කාණ්ඩය යටතේ සම්මාන 6කට නිර්දේශ ය.

## The Billionaire ට සම්මානයක්



ගිහාන් කුරේ අධ්‍යක්ෂණය කළ The Billionaire චිත්‍රපටය අමෙරිකාවේ කැලිෆෝනියාවේ බර්බෑන්ක් සිනමා උලෙළේ හොඳම හා හාස්‍යෝත්පාදක සිනමාපටය ලෙස සම්මානයට පාත්‍ර වී ඇත. මෙය ඔහුගේ ප්‍රථම නිර්මාණය වේ. ගිහාන් දැනට අමෙරිකාවේ හොලිවුඩ් සිනමා ක්ෂේත්‍රයේ නිරතව සිටී.

ඔහු තමාගේ ප්‍රථම සිනමාපටය වන The Billionaire සඳහා ජෝර්ජ් බර්නාඩ් ෂෝගේ විධික්‍රම උපයෝගී කරගෙන ඇත. මෙහි ගිහාන් සමඟ හොලිවුඩ් සිනමාවේ ප්‍රවීණයන් වන හීතර් ටොම්, ජෝර්ඩ්ස් බෙල්ෆි, රැන්ඩ් වේන් ඇතුළු රංගන ශිල්පීන් රැසක් රංගනයෙන් සහාය වෙති.

## කටුක නිර්මාණ භාවනාව 'කෙටුම්පත් තෘෂ්ණාව'

මෙරට චිත්‍ර කලාවේ මඟහැර යානොහැකි භූමිකාවක් ලෙස සුජිත් රත්නායක හඳුන්වාදීම අතිශයෝක්තියක් නොවේ. සුජිත් ඔහුගේ මෙවර සිතුවම් දැක්ම නම් කරන්නේ "කෙටුම්පත් තෘෂ්ණාව"ලෙසය. නැවතත් ඔහු අපව දෘශ්‍ය රූපය තුළ බුද්ධිමය සංවාදයකට කැඳවයි.



චිත්‍ර කලාව මානව වංශ විද්‍යාත්මක කියවීම හරහා මානව පරිණාමය දක්වා දිවයන ප්‍රකාශන මාධ්‍යයකි.

ආදිතම ජනයා ගල්ගුහා ආදීකොට සිය ප්‍රකාශන අඟුරු කැබිලිති මාධ්‍යයෙන් ඇඳි සිතුවම් ප්‍රාථමික අත්හදාබැලීම් ලෙස අපට කිසිදා මඟහැර යානොහැක.

ලෙස්කෝ ලෙන් ගුහා චිත්‍ර වසර පහළොස් දහසකට ආසන්න වන අතර අල්ටමිරා ලෙන් චිත්‍ර එම PALEOLITHIC යුගය සිහි කරයි.

ආදීතම ජන සමාජවල සිය ප්‍රකාශන දියුණු අවධියකට ගෙන ආ මානව ක්‍රියාකාරකම් පසුකාලීන සම්ප්‍රදායන් බවට ගොඩනැඟීම න්‍යායාත්මක පදනමකට අවකාශයද විවර වීමකි.

සුජිත්ගේ සිතුවම් දැක්ම කෙටුම්පත්කරණ ප්‍රවේශය බවට පත්වන්නේ එවන් පසුතලයකදී නූතනම සාකච්ඡාව බවට ගෙන එමිනි.

නව මානයකින් ප්‍රශ්න කරන මෙම අවකාශය සිතුවම මෙන්ම නිමැවුම්කරුගේ ආධ්‍යාත්මය විවරණය කරන ව්‍යායාමයක් ලෙස අපට අර්ථ ගැන්වෙයි.

ප්‍රාග් ඓතිහාසික කලාව තුළද වියුක්ත ලක්ෂණ හඳුනාගත හැකිවීම වියුක්තකරණය සුවිශේෂී තත්වයක ප්‍රතිනිර්මාණය කිරීමද කෙටුම්පත්කරණය තුළින් මෙහි අධ්‍යාසය බවට පත් වේ.

"සිත්තරා යනු හිස් කැන්වසය ඉදිරියේ සිටින සමාජමය වශයෙන් ළඟාකරගත හැකි මහත් වූ බලාපොරොත්තුවකින් තොරව හුදෙකලා වූ පුද්ගලයෙක් පමණකි" යන මතය බලවේගයක් කොට පෙරළීමට ගන්නා උත්සාහයම ප්‍රකාශනවාදයේ ජයග්‍රහණයක් වීමත් IMPRESSIONISTIC චිත්‍ර කතිකාව තුළ ප්‍රංශ සිතුවම් කරුවකු වන EDGAR DEGAS 1834-1917 පැස්ටල් මාධ්‍ය කොටගත් සිතුවම්කරණය නියැළුණු චිත්‍ර ශිල්පියෙකි .ඔහුගේ "ස්නානයෙන් පසු" වැනි චිත්‍ර නූතන චිත්‍ර කලාවේ සාකච්ඡාවට ගතයුතු නිර්මාණ බවට පත් වන්නේ එවන් පසුබිමකයි.



සුජිත්

චිත්‍රය හැඩයක් ලෙස දැකීමකට වඩා හැඟීමක් තුළින් දකින්නට සලස්වන සම්භාව්‍ය චිත්‍රය තුළ ස්වාභාවිකත්වය මතුකරන්නට උත්සාහ ගැනීම පසුකාලීනව චිත්‍ර කලාවේ මායාව බවට පත්වීම වුවත්, නූතනම අවකාශයක සිට සුජිත් රත්නායක ඒ තෘෂ්ණාවෙන් රසිකයා, පාඨකයා මුදවා ගන්නට යම් උත්සාහයක යෙදීම පෙරටුගාමී වන්නේ එවන් පසුබිමකයි.

ස්ථිතික ඉරට යටින් චලන රේඛාවේ පවතින ප්‍රබල බව ඔහුගේ මෙම CHARCOAL සිතුවම් පෙනී සිටීම ගැඹුරු අවකාශයක් බවට පත්වීම මෙහි විශේෂත්වයයි.

අඳුර සහ ආලෝකය, කළු සහ සුදු, රේඛා හා හැඩතල කිසියම් මොහොතක ග්‍රහණය කර ගැනීමට දරන ශක්‍යතාව සුජිත් අතීතයෙන් අනාගතයට රැගෙන ඒමකි. එය විටෙක කටුක නිර්මාණ භාවනාවක සමාධියකට පැමිණීමක්ද වෙයි. එය කෙටුම්පත් තෘෂ්ණාව අපට ප්‍රකට කරයි.

**ෂර්ලි සමරසිංහ**



## සඳ තරු මල්



ජනප්‍රිය ටෙලිනාට්‍ය ගණනාවක් අධ්‍යක්ෂණය කළ ප්‍රවීණ අධ්‍යක්ෂවරයකු වන රවීන්ද්‍ර විජේරත්න අධ්‍යක්ෂණය කරන ළමා ටෙලිනාට්‍ය ගණනාවක් නිපදවා ජනාදරයට පත්ව සිටින ප්‍රමිලා සුරංගනී නිෂ්පාදනය කරනු ලබන නවතම ටෙලිනාට්‍ය වන "සඳ තරු මල්" හි මුහුරත් උලෙළ පසුගිය 28 වැනි දින කොළඹ ගලධාරි හෝටලයේදී පැවැත්විණි. ජනක් ප්‍රේමලාල්, මාලිනී වීරමුනි, ප්‍රමිලා සුරංගනී, ශිරෝමිකා ප්‍රනාන්දු, හෂිණිකා කරලියැද්ද, නිරෝෂන් විජේසිංහ, අංජුලා රාජපක්ෂ, තරංග දිසානායක, හර්ෂණ බෙත්මගේ, සංජය මොරමුදලි, රුවන් පෙරේරා සහ තවත් ළමා නළු නිළියෝ රැසක් මෙහි රංගනයෙන් දායක වෙති. මෙම ටෙලිනාට්‍යයේ සංගීතයෙන් ගයාන් ගුණවර්ධන, කලා අධ්‍යක්ෂණයෙන් රංගන ජයලත්, වේෂ නිරූපණයෙන් අමිල මිරිස්සගේ, සහාය අධ්‍යක්ෂණයෙන් දිනේෂ් හග්ගල්ල සහභාගි වෙති. සඳතරු මල් තිරපිටපත ගයාන් හෙට්ටිආරච්චිගේ රචනයකි.

**ජයසිරි මුණසිංහ**

**ඡායාරූපය - චින්තක කුමාරසිංහ**

## නිවාසි නාට්‍ය දැක්ම

නිවාසි නාට්‍ය යනු ගෙයින් ගෙට ගොස් ප්‍රදර්ශනය කරන නාට්‍ය කලාවකි. මෙරට නාට්‍ය වංශයේ එසේ රඟ දක්වනු ලබන නිවාසි නාට්‍ය දැක්මට වසර 15ක් ගෙවී ඇත. මෙහි අධ්‍යක්ෂක වන්නේ ප්‍රවීණ නාට්‍යවේදී ජූඩ් අමරගුරුය. නිවාසි නාට්‍ය දැක්ම, නදන Theatre house ඉදිරිපත් කිරීමකි.



# ආධාරකරුවන්ට 'බායි' කියමින් ලෙඩ ඇඳේ සිටි ට්‍රම්ප් සවාරියක් යයි





කොරෝනා රෝගය වැලඳී වෝල්ටර් රීඩ් රෝහලේ තුන්වැනි දිනටත් ප්‍රතිකාර ලබමින් සිටි අමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඊයේ (05දා) තමාට සුවය පැතීමට රෝහල අසලට රැස්වී සිටි ආධාරකරුවන් පුදුමයට පත් කරමින්, එකවරම රෝහලෙන් එළියට පැමිණ ඔවුන්ට අත වැනීමට කටයුතු කර ඇතැයි වාර්තා වේ. මේ අවදානම් කටයුත්ත පිළිබඳ සෞඛ්‍ය අංශ අප්‍රසාදය පළ කර ඇත.

පසුගිය සිකුරාදා සහ සෙනසුරාදා ට්‍රම්ප්ගේ සිරුරේ ඔක්සිජන් මට්ටම පහළ වැටීම නිසා වෛද්‍යවරු ඩෙක්සමෙතසෝන් ස්ටෙරොයිඩ් ප්‍රතිකාර දී ඇත. මෙම ඖෂධ දෙනු ලබන්නේ කොවිඩ් -19 තත්ත්වය නරක අතට හැරුණු රෝගීන් සඳහාය.

ට්‍රම්ප්ගේ මෙම හැසිරීම විවේචනය කරන වෛද්‍යවරුන් පවසන්නේ ඔහුගේ පරිවාර සෞඛ්‍ය සේවකයන්ට ද කොවිඩ් - 19 වැලඳීමේ අවදානමක් ඇති බවයි. මේ අතර ප්‍රතිවාදී ජනාධිපති ධූර අපේක්ෂක ජෝ බිඩන් පවසන්නේ ෆ්ලොරිඩාවේ මැතිවරණ ප්‍රචාරණ වැඩසටහනකට යෑමට තමන් සැලැසුම් කර තිබුණු බවයි. පසුගිය අඟහරුවාදා ජනාධිපති ට්‍රම්ප් සමඟ එකම වේදිකාවේ විවාදයක නිරත වූ අවස්ථාවේ ඔහුට කොවිඩ් පවතින්නට ඇතැයි බිඩන් සැක පළ කරයි.

# ඉන්දියාවේ දී කොරෝනා පරීක්ෂාව පන්සීයේ කොළයකින් පුළුවන්

කොවිඩ් - 19 පිළිබඳ පරීක්ෂා කිරීමට අඩු වියදම් කඩදාසි තීරු පරීක්ෂාවක් හඳුන්වා දීමට ඉන්දියානු පර්යේෂකයන් පිරිසක් සමත් වී තිබේ. මෙම පරීක්ෂාව ගැබ් ගැනීම් පිරික්සීමට කරන කඩදාසි තීරු පරීක්ෂාව වැනි පරික්ෂාවකි.

ඉන්දියාවේ ජනප්‍රිය රහස් පරීක්ෂක කතා මාලාවක නමින් හඳුන්වා ඇති මෙම පරීක්ෂණයෙන් ඉන්දීය රුපියල් 500ක පමණ වියදමකින් කොවිඩ් - 19 ආසාදනය වී ඇත්දැයි සොයා ගත හැකි බව අනාවරණය වී ඇත. ෆෙලූඩා නමින් හැඳින්වෙන මේ පරීක්ෂණය වෙළෙඳපොළට ඉදිරිපත් කරන්නේ එරට සුප්‍රකට ව්‍යාපාර සමූහයක් වන ටාටා සමාගමයි.






# කෙන්සෝගේ සමනල මෝස්තර කොරෝනා කෙටි කරයි

ජපානයේ ජනප්‍රිය කෙන්සෝ ඇඟලුම් සන්නාමයේ නිර්මාතෘ කෙන්සෝ ටකාඩා වයස අවුරුදු 81ක්ව තිබිය දී නව කොරෝනා රෝගය වැලඳී ජීවිතක්ෂයට පත් වී තිබේ. ලොව පුරා දස දෙසින් ඔහුගේ නමට සේවය අගය කිරීමේ කීර්ති ප්‍රසංශා ගලා එමින් පවතින බවත් පැරීසියේ ඇමෙරිකානු රෝහලකදී ටකාඩා මියගිය බවත් විදෙස් වාර්තා වැඩිදුරටත් සඳහන් කරයි. තද පැහැති ග්‍රැෆික් මෝස්තර, වනාන්තරයක සිරිය ගෙන දෙන මුද්‍රණ, වර්ණ යොදා ගනිමින් උපරිම ලෙස භාවිත කළ ඔහු පැරිස් මෝස්තර නිරූපණ ලෝකය තරණය කළ මුල්ම ජපන් ජාතිකයාය.

AROUND THE WORLD
ලොව වටා









# ඇලෙක්ස්ට හසු වූ 20කට ඇඩ්‍රස් නෑ

ගිනිකොන දිග ප්‍රංශයේ සහ වයඹ දිග ඉතාලියට බලපා ඇති ප්‍රබල කුණාටුවක් නිසා දෙදෙනකු මියගොස් 20කට වැඩි පිරිසක් අතුරුදන් වී තිබේ. ඇලෙක්ස් ලෙස නම් කර ඇති මේ කුණාටුව නිසා දරුණු සුළං සහ ධාරාණිපාත වැසි ඇති වී තිබේ. ප්‍රංශයේ නයිස් හි උතුරු ප්‍රදේශයේ ගම්මාන රැසක ගංවතුර සහ නායයෑම් නිසා පාරවල්, පාලම් සහ නිවාස විනාශ වීම් වාර්තා වී තිබේ. වයඹ දිග ඉතාලියේ මෙවර ඇති වී තිබෙන ගංවතුර ඓතිහාසිකව දරුණු මට්ටමට පත් වී තිබෙන බවත් සෙසියා ගංගාවේ ඉදිකර ඇති පාලමේ කොටසක් කඩාගෙන ගොස් ඇති බවත් වැඩිදුරටත් වාර්තා වේ. ප්‍රංශ අගමැති ජීන් කැස්ටෙක්ස් ආපදා සහන සේවකයන් සහ අති විශාල අරමුදල් ප්‍රමාණයක් සහන කටයුතු සඳහා මුදා හැර ඇත.

# සිංගප්පූරුවේ චංගිට බහින කලාව





ලොව හොඳම ගුවන්තොටුපළ ලෙස එක දිගට අට වරක් ජනප්‍රසාදය හිමි කරගත් සිංගප්පූරුවේ චංගි ගුවන්තොටුපළේ කොවිඩ් -19 වසංගතය නිසා නරක කාලයක් උදා වී ඇතැයි වාර්තා වේ. ඉතිහාසයේ වාර්තා වූ නරකම ගුවන් ගමන් අඩු වීම් පසුගිය කාලයේ වාර්තා වූ බැවින් මෙම ගුවන් තොටුපළේ පර්යන්ත දෙකක්ම සම්පූර්ණයෙන්ම වසා දමනු ලැබිණි. පසුගිය වසර දෙක තිස්සේ ඉදි කරමින් සිටි පස්වැනි පර්යන්තය ඉදිකිරීම සම්පූර්ණයෙන්ම නවතා දමනු ලැබිණි. චන්ගි ගුවන්තොටුපළ සමූහය ප්‍රකාශ කරන්නේ කොවිඩ් 19ට එරෙහි සටන දැන් ආරම්භ වී ඇති බවයි.

# ගන්ජා නගරයට ෂෙල් වෙඩි





අසර්බයිජානය සහ ආර්මේනියාව අතර ඇති වී තිබෙන නගෝර්නෝ - කර්බක් වටලෑම ඉදිරියට ඇදෙද්දී ආර්මේනියානු හමුදා අසර්බයිජානයේ දෙවැනි විශාලම නගරය වන ගන්ජා නගරයට විශාල වශයෙන් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කර තිබේ. මේ වටලෑම නිල වශයෙන් අසර්බයිජානයෙන් සිදු කළත් එය දැන් කරගෙන යන්නේ වාර්ගික ආමේනියානුවන් විසිනි. අසර්බයිජානු හමුදා තමන්ගේ කලාපයේ අගනුවර වන ස්ටෙපනකර්ට් වෙත ෂෙල් වෙඩි එල්ල කිරීමෙන් අනතුරුව තමන් ගන්ජා නුවර හමුදා ගුවන් තොටුපළට පහර දුන් බව ස්වයං පාලිත බලධාරීහු කියති. අසර්බයිජානය කියන්නේ ගන්ජා නුවර හමුදා ප්‍රදේශයකට පහර දී නොමැති බවයි. සතියකට පෙර ආරම්භ වූ මේ ගැටුම් නිසා 220කට අධික පිරිසක් මියගොස් තිබේ.

# නිදහස දෙන්නම හදනවා! ඒත් එයාලා එපා කියනවා



දකුණු පැසිෆික් රාජ්‍යයක් වන නිව් කැලිඩෝනියාවේ පසුගියදා පැවැති ජනමත විචාරණයකින් පසු එරට ජනතාව ප්‍රංශයෙන් නිදහස ලැබීමට අකැමැති බව ප්‍රකාශ විය. ගෙවුණු වසර දෙක ඇතුළත මෙසේ ප්‍රකාශ වූයේ දෙවැනි වතාවටයි. සියයට 85.6ක් තරම් ඉහළ ඡන්ද ප්‍රමාණයක් ප්‍රකාශ වී තිබූ අතර එයින් සියයට 53.26ක් ප්‍රංශයෙන් නිදහස ලැබීමට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කර තිබිණි. මීට වසර දෙකකට පෙර පැවැති ජනමත විචාරණයකින් මීට වඩා ඉහළ ප්‍රතිශතයක් එනම් සියයට 56.7ක් ප්‍රංශය සමඟ එකට සිටීමට කැමැත්ත ප්‍රකාශ කර තිබිණි.

ආර්. ඇම්. කරුණාතිලක - උඩුබද්දාව සමූහ

## කනංකේ සිරි පැරකුම් විදුහලේ ළමා දින උළෙල




ළමා දිනයට සමගාමීව පසුගිය 30 වැනි දින ඉමදුව කනංකේ සිරි පැරකුම් විදුහලේ අපූරු උත්සවයක් පැවැත්විණි. කනංකේ සිරිපැරකුම් විදුහලේ ආචාර්ය මණ්ඩලය හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ එකමුතුවෙන් පාසලේ සියලු දූ දරුවන්ට දිවා ආහාර වේලක් ලබා දී.පසුව ගුරු භවතුන්ගේ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් මඟින් එකමුතුකම පිළිබඳ ආදර්ශයක් ලබා දී දරුවන් දැනුවත් කිරීම මෙහි දී සිදුවිය. කනංකේ සිරි පැරකුම් විදුහලේ විදුහල්පති නිල්මා පතිරණ මහත්මියගේ ප්‍රධානත්වයෙන් අචාර්ය මණ්ඩලය ඇතුළු සිසු දරුවන් මෙය සංවිධාන කර තිබිණි.



දිසා
දස අත ම එක තැන

හැටන් මධ්‍යම වීශේෂ

## පාසල් ක්‍රීඩාංගණ පිළිසකර කරයි





ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ සංකල්පයක් මත හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජෙනරාල් රියාර් අද්මිරාල් ආනන්ද පීරිස් මහතාගේ උපදෙස් පරිදි පාසල් ක්‍රීඩාංගණ පිළිසකර කිරීමේ වැඩසටහන අනුව අනුරාධපුර කඩවත්ගම ශ්‍රී සෝභිත මහා විද්‍යාල ක්‍රීඩාංගණය සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු සිවිල් ආරක්ෂක සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් (30)සිදු කළ අයුරු.

ජායාරූප-අමිල ප්‍රභාත් වනසිංහ-අනුරාධපුර අතිරේක

රාගම සමූහ

## කඨින පෙරහරේ නැටුම් පුහුණුවට ආ දරුවන්ට
## අමුතු නැටුමක් පෙන්නලා

වාර්ෂික කඨින පෙරහරට නැටුම් පුහුණු වීම් සඳහා කැලණිය වනවාසල ප්‍රදේශයේ විහාරස්ථානයකට පැමිණි පිරිමි දරුවන් තිදෙනෙකු අපයෝජනයට ලක් කිරීමට තැත් කළ වෑන් රථ රියදුරකු පෑලියගොඩ පොලීසියේ ළමා හා කාන්තා කාර්‍යාංශයට ලද පැමිණිල්ලකට අනුව ලෝක ළමා දිනය වූ පසුගිය ඔක්තෝබර් පළමුවනදා අත් අඩංගුවට ගෙන ඇත.

සැකකරු නර්තන කණ්ඩායමේ පුහුණුකරුගේ මිතුරකු බව කියැවේ.

කැලණිය හුණුපිටිය වනවාසල අවට කාර්‍යාල සේවකයන් ප්‍රවාහනය කිරීමේ නිරත වන බව කියන මෙම 33 හැවිරිදි අවිවාහක රියදුරා සවස් කාලයේ සේවා නිමවූ පිරිස ඇරලවා රාත්‍රි 9.00 සේවා මුරය එනතෙක් වනවාසල දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටි මෙම විහාරස්ථානයේ වෑන් රථය නතර කර තබා ගැනීම පුරුද්දක් ලෙස සිදුකර ඇත.

සැකකරු ඔහුට අයත් වෑන් රථය පංසල අසල නවතා ගෙන සිටිමින් වෑන් රිය තුළට ළමුන් කැඳවාගෙන වීඩියෝ දර්ශන නැරඹීමට ඉඩ සලසා දී මෙම පිරිමි දරුවන් වරදට පොලඹවා ගැනීමට මීට ඉහතදීද කීප අවස්ථාවක් උත්සාහ කර ඇත.

සිද්ධිය වූ පසුගිය ඔක්තෝබර් පළමුවනදා නර්තන කණ්ඩායමේ එක් දරුවකු වෑන් රථය තුළට කැඳවාගෙන එහි පසුපස අසුන දිගහැර දරුවාට සැකකරුගේ ජංගම දුරකථනයෙන් ක්‍රීඩාවක් කිරීමට අවස්ථාව ලබාදී දරුවා අපයෝජනයට ලක් කිරීමට උත්සාහ දරා ඇත. සිද්ධියෙන් බේරී පැමිණි දරුවා විහාරාධිපති හිමියන්ට දැනුවත් කර ඇත. ඒ වන විට දායක සභාව හා ගම්වාසීන් සැකකරු අල්ලා ගෙන ඔහුගේ ජාතික හැඳුනුම් පත ඔවුන්ගේ භාරයට ගෙන පොලීසිය එහි පැමිණි පසුව සැකකරු පොලීසියට භාරදී ඇත.

දරුවන් තිදෙනාගෙන් දෙදෙනකු මීට පෙර දෙවතාවක් මෙම වෑන් රථයට ගොඩවී ඇති අතර ඔවුන්ටද මෙලෙස අනාචාර ක්‍රියාවන් සිදුකර ඇති නමුත් ඔවුන් ඒ පිළිබඳව ඇති බිය නිසා වැඩිහිටියන්ට පවසා නැත.

සැකකරු 2වනදා අළුත්කඩේ අංක 5 අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු මේ මස 14 වනදා දක්වා රක්ෂිත බංධනාගාර ගත කර ඇත. අපයෝජනයට ලක් කිරීමට සූදානම්වූ දරුවන් වයස අවුරුදු 12/13 කාංඩවලට අයත් බවත් ඔවුන්ගෙන් දෙදෙනෙකු දෙමාපිය සෙවණේ ඔවුන්ගේ රැකවරණය මත ජීවත්වන දරුවන් බවත් අනෙක් දරුවා සිය මිත්තණිය ගේ භාරයේ ජීවත්වන බවත් පොලිසිය පැවසීය. දරුවන් තිදෙනා අධිකරණ වෛද්‍ය වරයාවෙත ඉදිරිපත් කල වාර්තාවක් ලබා ගත් බවත් පරිවාස වාර්තාවක්ද කැඳවූ බවත් පොලීසිය පැවසීය.

කැලණිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රොෂාන් ඩයස් මහතාගේ සහපෑලියගොඩ පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මහින්ද විල්ලෝරාරච්චි මහතාගේ උපදෙස් මත පෑලියගොඩ පොලීසියේ ළමා හා කාන්තා කාර්‍යාංශයේ ස්ථානාධිපතිනි කාන්තා පොලිස් පරීක්ෂක තමරා දුෂාන්ති ද සිල්වා මහත්මියගේ අධීක්ෂණයෙන් සැකකරු අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇත.

හැටන් මධ්‍යම වීශේෂ

## හැටන් බස්පොළේ වළවල් වහන්නේ නැද්ද?

හැටන් ප්‍රධාන බස් නැවතුමේ ලංගම බස් රථ නැවතුම් පළ භූමිය මේ වන විට ජලාශයක් බවට පත්ව ඇත.

මෙම බස් රථ නැවතුම්පළ භූමියේ මේ වන විට විශාල ප්‍රමාණයේ වළවල් හෑරීඇති අතර එහි වැසි ජලය පිරීමත් සමගඑම බස් නැවතුමට පැමිණෙන බස් මඟීන් පාසල් සිසුන් මෙන්ම බස් රථ රියැදුරන්ද විවිධ දුෂ්කරතාවන්ට පත්ව ඇත.

මෙම තත්ත්වය පිළිබඳව අදහස් දක්වන පාසල් සිසුන් කිප දෙනකුම පවසන ලද්දේ මෙම බස් රථ භූමියේ වළවල්වල මඩ ජලය පිරීමත් සමග තමන් විවිධ දුෂ්කරතාවන්ට පත්වන බවත්ය.

තමන් බස් රථ පැමිණෙන තෙක් මෙහි රැඳී සිටින විට මෙම බස් නැවතුමට පැමිණෙන බස් රථවල රෝද එම වළවල්වලට වැටීමෙන් එහි මඩ ජලය තම ඇඟට විසිවන බවත් මෙම තත්ත්වයන් මත තමන් විවිධ දුෂ්කරතාවන්ට පත්වන බවත්ය.




මෙම බස් නැවතුම්පළ තුළ මෙසේ විශාල ප්‍රමාණයේ වළවල් හෑරීමෙන් බස් රථ පැමිණෙන විට මඩ ජලය ඉසීමෙන් තමන්ද ඇඩි දුෂ්කරතාවන්ට පත්වන බව බස් මඟීහුද පවසති.



මල්වාන සමූහ මහානාම විතානගේ

## මලිතු සෙත්මිත සිසුවාගේ ළමා පොත් 3ක් දොරට වඩී



ලෝක ළමා දිනයට සමගාමීව සපුගස්කන්ද සෝභිත විදුහලේ පහ වසර පන්තියේ ඉගනුම ලබන ඩබ්ලිව්. ඒ. මලිතු සෙත්මිත සිසුවා විසින් රචිත ළමා පොත් තුනක් ඉකුත්දා එම විදුහල් ශාලාවේ දී ජන ගත කරන ලදී.

මලිතු සෙත්මිත සිසුවා විසින් රචිත හොරෙන් හාල් කන කොණ්ඩ කුරුල්ලා, කුරුලු ගමේ කුරුලු සින්දු, ලක්ෂණ කාගේද හා හැංගි හොරා මං දැක්කා, යන ළමා පොත් තුන මෙහිදී ජන ගත කළහ.

මෙ උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වුයේ බියගම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂිකා සලනී බණ්ඩාර මහත්මිය වන අතර ප්‍රවීණ ලේඛිකා සුනිලා විජේසිංහ මහත්මිය මීට විශේෂ ආරාධිතයා ලෙස සහභාගි විය.

එහිදී මලිතු සිසුවා විසින් රචිත එම ළමා පොත් තුන බියගම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂිකා සලනී බණ්ඩාර , ප්‍රවීණ ලේඛිකා සුනිලා විජේසිංහ හා විදුහල්පති තිලකරත්න ලියනගේ යන මහත්වරුන් ඇතුළු ආරාධිතයන් වෙත පිළිගැන්වූ අයුරු

විදුහල්පති තිලකරත්න ලියනගේ මහතා ඇතුළු ගුරු මණ්ඩලය , පාසල් සංවර්ධන සමිතිය හා ශක්ති සංවිධානය මගින් මෙය සංවිධාන කරන ලදී.



එන්. නවරත්න - මීගහකිවුල සමූහ

## ළමා දින සැමරුම් උළෙලක්

විශ්ව ළමා දිනයට සමගාමීව පවත්වන ලද සැමරුම් උළෙලක් 01 උදෑසන මීගහකිවුල ජාතික පාසලේ ප්‍රධාන ශාලාවේ දී පැවැත්විණි.

විදුහල්පති ඩී. එම්. දයාරත්න මහතාගේ උපදෙස් හා මග මඟපෙන්වීම මත විද්‍යාලයීය ගුරු මණ්ඩලය සැමරුම් උළෙල සංවිධාන කළහ. එහිදී විද්‍යාලයේ ගුරු මණ්ඩලය නැටුම් ගැයුම් වැයුම් ඉදිරිපත් කරමින් දරුවන් අමන්දානන්දයට පත් කළහ.

උත්සවය අවසානයේ දී දරුවන් වෙනුවෙන් ගුරුවරුන් විසින් විශේෂ සංග්‍රහයක් ද පවත්වන ලදී.



ආර්. ඇම්. කරුණාතිලක - උඩුබද්දාව සමූහ

## කිරි දානය 7වැනිදා

කුලි /කප්පන්ගමුව ප්‍රාථමික විද්‍යාලයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින සිසු දරුවනට ආශිර්වාද පතා, වාර්ෂිකව සංවිධාන කරනු ලබන කිරි අම්මා දානය මෙවරද 2020.10.07 දින අලුයම කිරි අම්මාවරු හතළිස් දෙදෙනකුට පිරි නැමීමට කටයුතු සැලසුම් කර ඇත.

එම විදුහල්පති නිහාල් රාජපක්ෂ මහතා ගේ උපදෙස් හා මෙහෙයවීම මත පැවැත්වෙන මෙම දානමය පින්කම විද්‍යාලයීය ආචාර්ය මණ්ඩලයේ සහ පාසල් සංවර්ධන සමිතියේ සහයෝගය ඇතිව සංවිධාන කර ඇත.

ඩී.එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## කාන්තාවකගේ ගෙල බැඳි රන්මාලයක් කඩාගෙන

වැල්ලවාය-තණමල්විල මාර්ගයේ ගාලුවංගුව අසලදී (01) රාත්‍රී 7 ට පමණ වෙළෙඳසලකට ගොස් ආපසු නිවෙසට පැමිණෙමින් සිටි කාන්තාවකගේ ගෙලබැඳි රන් මාලයක් යතුරුපැදියකින් පැමිණි තරුණයන් දෙදෙනකු මංකොල්ලකා පළාගොස් ඇතැයි වැල්ලවාය පොලීසිය පවසයි.

මෙම කාන්තාව ඥාතිවරයකු සමඟ නිවෙසට නුදුරින් පිහිටි වෙළෙඳසලට ගොස් ආපසු පැමිණෙමින් සිටියදී ඔවුන් අසල යතුරුපැදිය නතරකොට යතුරුපැදියේ පසුපැදිකරු විසින් කාන්තාවගේ ගෙලබැඳි රන්මාලය කඩාගෙන යතුරුපැදියේ නැඟී පළාගොස් ඇත.

රන්මාලයේ වටිනාකම රුපියල් එක්ලක්ෂ පනස් දහසක් පමණ වේ.

සිද්ධිය පිළිබඳව වැල්ලවාය පොලිස් ස්ථානාධිපති ටී.එම් රත්නායක මහතා පරීක්ෂණ පවත්වයි.

ඩී.එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## ධීවර කාර්මිකයකුගේ මළසිරුරක් වැවක

වැල්ලවාය පෙතියන්ආර වැවට ධීවර කටයුතු සඳහා ගිය තරුණයකුගේ මළසිරුරක් (01) සවස වැල්ලවාය පොලීසිය මඟින් සොයාගෙන ඇත. මෙලෙස මියගොස් ඇත්තේ වැල්ලවාය වරුණගම බටහිරයාය පදිංචි පරණමානගේ නිහාල් කුමාර (45) නැමති අවිවාහක ධීවර කාර්මිකයෙකි.

හෙතෙම ඉකුත් 30 වැනිදා සවස ධීවර කටයුතු සඳහා පෙතියන්ආර වැවට ගොස් පසුදින ආපසු නොපැමිණීම නිසා ඒ බව පොලිසියට දැනුම්දී ඇත. පසුව පොලීසිය පැමිණ පරීක්ෂා කිරීමේදී වැවේ තිබූ මළ සිරුර සොයාගෙන තිබේ.

මෙම මරණය පිළිබඳව මහේස්ත්‍රාත් පරීක්ෂණය සහ පශ්චාත් මරණ පරීක්ෂණය (02) පැවැත්වීමට නියමිතව තිබිණි. වැල්ලවාය පොලිස් ස්ථානාධිපති ටී.එම් රත්නායක මහතා සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වයි.

ඩබ්ලිව්.පී.ධර්මසේන - මාතර සමූහ

## ගිනි අවියක් සහ උණ්ඩ සමඟ පුද්ගලයෙක් පොලිස් දැලේ

දික්වැල්ල පොලිස් වසමේ වලස්ගල මුල්ලහේන ප්‍රදේශයේදී නිවෙසක සඟවා තිබු ගිනි අවියක් සමඟ සැකකරුවකු දික්වැල්ල පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. බෝර 12 තුවක්කුවක්, ජීව උණ්ඩ 05 ක්, හිස්පතොරම් 16ක් සමඟ මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ 45 හැවිරිදි අයෙකි. දික්වැල්ල පොලීසියේ

උ. පො. පා සංජීව මහතාට ලැබුණු තොරතුරක් මත 01 වන දින සවස මෙම ස්ථානය වටලා ගිනි අවි සමඟ සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු මාතර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

මතුගම මධ්‍යම

## කළුතර මහ රෝහලේ වැඩිහිටි ප්‍රමුඛතා බෙහෙත් කවුළු නෑ

කළුතර - නාගොඩ මහ රෝහල මේ වනවිට තිබුණාට වඩා නව පන්නයේ මහ රෝහලක් බවට බොහෝදුරට පත්ව තිබීම සම්බන්ධයෙන් සෑම දෙනාගේම පැසසුමට ලක්වී ඇත.

රෝහලේ නවීන වාට්ටු සංකීර්ණ පැවැත්ම, ශල්‍ය වෛද්‍ය ක්‍රමවේද හා සායන රටාවන් මනාව ක්‍රියාත්මකව පවතින බව දක්නට ලැබේ.

දිනකට බාහිර රෝගීන් විශාල පිරිසක් සායන වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම උදෙසා රෝහලට පැමිණ පිරී ඉතිරී සිටින අතර ඖෂධ ලබා ගැනීමේ බෙහෙත් කවුළු ද පෝලිම් සහිතව පිරී පවත්නා බව දක්නට ඇත. තරුණ මහලු වයස්ගත විශාල රෝගීන් පිරිස් ඉතාම අපහසුතාවයෙන් යුතුව ඒ අතර සිටින අතර කොළඹ අගනුවර රෝහල්වල පවත්නා පරිදි (වැඩිහිටි ප්‍රමුඛතා බෙහෙත් කවුළු) නොමැතිවීම සම්බන්ධයෙන් බොහෝ දෙනෙකුගේ බලවත් කණස්සල්ලට භාජනය වී ඇත.

ප්‍රියදර්ශනී කහවල - ඉංගිරිය මධ්‍යම සමූහ

## අලුත්ගම-දර්ගානගරයේ පෝයදා අරක්කු කාල රුපියල් 1000යි

පොසොන්, ඇසළ සහ නිකිණි පොහොය දිනයන්හිදී අධික මිලට මත්පැන් විකුණා මීටපෙර පොලිස් අත්අඩංගුවට පත්ව ඇති අයකු බ්‍රහස්පතින්දා(01) වප් පොහොය දිනයේදීත් එලෙසින්ම වැඩි මිලට මත්පැන් විකිණීම හේතුවෙන් යළිත් පොලිස් අත්අඩංගුවට පත්ව ඇත.

එලෙස පොලිස් භාරයට පත් සැකකරු සමගින් කාන්තාවක්ද පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර, මෙලෙස අත්අඩංගුවට පත්ව ඇත්තේ අලුත්ගම, දර්ගා නගරය සහ බොන්දුපිටියේ පදිංචිකරුවන් දෙදෙනෙකි.

මොවුන් විසින් අරක්කු කාලක්(මිලිලීටර් 380ක්) රුපියල් 1000ක් වැනි අධික මුදලකට අලෙවි කර ඇති අතර, නිවසෙහි ගේට්ටුව අසළ සඟවා තිබූ මත්පැන් බෝතල් හතරක්ද පොලිසිය විසින් සොයාගෙන ඇත.

සැකකරුවන් කළුතර මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිත අතර, අලුත්ගම පොලිසිය සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ මෙහෙයවයි.

උබයරත්න වනසිංහ - පස්සර සමූහ

## පස්සර නගරයට රු.මිලියන 434 ජල ව්‍යාපෘතියක්

දිගු කලක සිට පස්සර නගරයට බලපා ඇති පානීය ජල ගැටලුවට තිරිසාර විසඳුමක් ලබාදීම සඳහා රජය විසින් නව ජල ව්‍යාපෘතියක් පළාත් පාලන අමාත්‍යාංශය අධීක්ෂණය යටතේ ඌව පළාත් සභාව හරහා ක්‍රියාත්මක කිරීමට පුරනැගුම ව්‍යාපෘතිය කටයුතු සළසා ඇත.

.පුරනැගුම ව්‍යාපෘතියක් ලෙස ඉදිරිපත් කරනු ලබන මෙම නව ජල යෝජනා ක්‍රමය සඳහා ආසියානු සංවර්ධන බැංකු මුල්‍යාධාර යටතේ දැනට රු.මිලියන 434ක් ලබා දී ඇති අතර ඒවා පළාත් සභා මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ ව්‍යාපෘති වැඩ බිම් සඳහා විටින් විට මුදා හැරීමට පියවර ගෙන තිබේ.

පස්සර ප්‍රාදේශීය සභා නගර ජල පාරිභෝගිකයන් 1100 කට හා නගරයට යාබද තවත් ජල පාරිභෝගිකයන් රැසක් සඳහා වසරේ දින 365 දීම පිරිසුදු පානීය ජලය ලබාදීම මෙම මෙම ව්‍යාපෘතියේ මුලික අරමුණ බව ජල ව්‍යාපෘති වාර්තාවේ පෙර වදනෙහිද සඳහන් කොට තිබේ.

■ ප්‍රාර්ථනා ලියනගේ - හිනිදුම සමූහ





## බද්දේගම විජයලත් පෙර පාසලේ ළමා දින සැමරුම

බද්දේගම විජයලත් පෙර පාසලේ දරු දැරියන් ලෝක ළමා දින සැමරූ අයුරුයි මේ.

■ සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

## ගොවීන්ගේ තොරතුරු රැස් කිරීමේ වැඩසටහනක්

ගොවීන් සඳහා හැඳුනුම්පතක් ලබාදීම, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට බඳවා ගැනීම ඇතුළු කරුණු කිහිපයක් සඳහා දිවයිනේ සියලුම ගොවීන් සම්බන්ධ තොරතුරු ඇතුළත් දත්ත ගබඩාවක් යාවත්කාලීන කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතාගේ අදහසකට අනුව මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ගොවීන්, ගොවි සංවිධාන ඇතුළත්ව මේ දත්ත ගබඩාවේ යාවත්කාලීන තොරතුරු දේශගුණික කලාප මට්ටමෙන් වෙන්කර ඒ ඒ කලාපයට උචිත භෝග වර්ග තීරණය කිරීමට ද නියමිත අතර ගොවින් සඳහා නිශ්චිත වගා ඉලක්කයක් ලබාදී වගා කටයුතු සඳහා සහන ලබාදීමේදී සිදු වන ගැටලු අවම කර ගැනීමට මේ මඟින් හැකි වේ.

දිනමිණ දිනසත දස අත ම එක තැන

■ බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## ජීව පතුරම් සමඟ තරුණයෙක් දැලේ

බලපත්‍රයක් නොමැතිව බෝර-12 වර්ගයේ ගිනි අවියට යොදන ජීව පතුරම් රැගෙන ගිය තරුණයකු තිරප්පනය පොලීසියේ නිලධාරින් හා යුද හමුදා පොලිස් සේවා බළකාය එක්ව එකාබද්ධව ක්‍රියාත්මක කරන ගල්කුලම මාර්ග බාධකයේ දී පසුගියදා (30) සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ.

අනුරාධපුර සිට කැකිරාව දෙසට ධාවනයවූ වෑන් රථයක් සම්බන්ධයෙන් සැකසිති එම රථය මාර්ග බාධකයේ නවතා පරීක්ෂාවට ලක්කළ අවස්ථාවේ සැකකරු පොලිස් අත්අඩංගුවට පත්වී තිබිණි. සැකකරුගේ ඇඳුම් බෑගයක් වෑන් රථයේ තිබී ඇති අතර එම බෑගය පරීක්ෂා කරද්දී නොම්මර හතර වර්ගයේ බෝර-12 අර්ධ ස්වයංක්‍රීය ගිනි අවියට යොදන උණ්ඩය හමුවී තිබේ.

■ සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

# මාතලේ මහ නගර සභාවෙන් ප්ලෑන් පාස් කරගන්න ගියාම හොඳ පණ යනවා

මාතලේ මහ නගර සභාවට ගොඩනැගිලි සැලැසුම් අනුමත කර ගැනීමට පැමිණෙන ජනතාවට මාස ගණනක් රස්තියාදු වීමට සිදුවීමෙන් ජනතාව පීඩාවට පත්ව ඇතැයි මාතලේ නගරාධිපති සන්දනම් ප්‍රකාශ් මහතා පැවැසීය.

නගරාධිපතිවරයා එසේ ප්‍රකාශ කරනු ලැබුවේ සැප්තැම්බර් මාසයට අදාළ මහා සභා රැස්වීම (30) වන දින මාතලේ මහ නගර සභා රැස්වීම් ශාලාවේදී රැස්වූ අවස්ථාවේදීය.

එහිදී නගරාධිපතිවරයා මෙසේ ද කීය.

නගර සභාවට වගකීමක් තියනවා ජනතාවගේ අවශ්‍යතා කඩිනමින් ඉටු කිරීමට. එහෙත් මාස අවුරුදු ගණන් ජනතාව ගොඩනැගිලි සැලැසුම් අනුමත කරගන්න නොහැකිව තිබීම හේතුවෙන් අනවසර ඉදිකිරීම්වලට ජනතාව යොමුවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙන බැවින් නාගරික කොමසාරිස්වරයා මේ කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ජනතාවට සිදුවන අපහසුතා වැළැක්වීමට පියවර ගත යුතුයි.

### නගරාධිපති

පිටරට ඉන්න අය නිවාඩු අරගෙන එනවා ඔවුන්ගේ නිවාස වෙළෙඳ ස්ථාන ඉදිකරගන්න. එහෙත් නිවාඩු අවසන් කර යනතුරුත් සැලැසුම් අනුමත කර ගන්න බැරි තත්ත්වයක් තමයි තියෙන්නේ. ඒ ගෙනපු මුදල් වෙනත් දේට වියදම් කර ඔවුන්ගේ පවුල්වල අය වසර ගණනාවක් කුලී නිවාසවල ඉන්න තත්ත්වයකුයි තියෙන්නේ.

**මන්ත්‍රී අනාර් රියාල් මහතා (එජාප)** - 2014දී ගොඩනැගිලි සැලැසුම් අනුමත කිරීමට බාරදී ඇතත් තවමත් එම ගොඩනැගිලි සැලැසුම අනුමත කර දී නෑ. සල්ලි තියන බලය තියන අය කොහෙම හරි මේ වැඩ කර ගන්නවා. මාතලේ නගර සීමාවේ තියන නිවාස ගොඩනැගිලිවලින් 70%ක් පමණ අනවසර ඉදිකිරීම්.

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

## වල්ලිපුර අම්මාන් කොවිලේ මංගල්‍යය උත්සවාකාරයෙන්



යාපනය පේදුරුතුඩුව වල්ලිපුර අම්මාන් කොවිලේ වාර්ෂික මංගල්‍යය පසුගියදා (1) පැවැති වේල් කරත්තය ඇදීමේ උත්සවයත් සමඟ අවසන් විය.

මෙවරද කොවිලේ වාර්ෂික මංගල්ලයට විශාල බැතිමතුන් පිරිසක් සහභාගී වී සිටි අතර කොරෝනා නීති රීති නිසා දානය පිරිනැමීමේ අවස්ථාව අවලංගු කිරීමට කෝවිල් භාරකාර මණ්ඩලය පියවර ගෙන තිබිණි.

■ කුමාරි දිසානායක - ඉබ්බාගමුව සමූහ

## රන් මාලය සොරාගත් සැකකරු ළඟ හෙරොයින්

කුරුණෑගල බන්ධනාගාරයේ නිලධාරිනියකගේ ගෙල බැඳි රන් මාලය සොරාගෙන දඹුල්ල නගරයේ මහජන බැංකුවකට උකස් කළ පුද්ගලයකු කුරුණෑගල පොලීසියේ අපරාධ විමර්ශන අංශය විසින් පසුගියදා අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට පත්වන විට සැකකරු සතුව හෙරොයින් මිලිග්‍රෑම් 3330ක් තිබූ බව පොලීසිය කියයි. පසුගිය අගෝස්තු 12 දින කුරුණෑගල නගරයේ ඔරලෝසු කණුව අසලදී රන් මාලයක් සොරාගත් බවට කුරුණෑගල පොලීසියේ අපරාධ විමර්ශන අංශයට කරන ලද පැමිණිල්ලකට අනුව පසුගිය සැප්තැම්බර් 24 වන දින අදාළ පුද්ගලයා අත්අඩංගුවට ගෙන තිබේ.

■ අනුර දිසානායක - මල්ලවපිටිය සමූහ

## ඉබ්බාගමුව නගරය මැද කන්ද කපන්නේ කාගේ අවසරයෙන් ද?

නගරය මැද පිහිටි කන්ද අනවසරෙන් කැපීම නිසා ඒ අවට පදිංචිකරුවන් මෙන්ම වෙළෙඳසල් හිමියන් ඉතාම අවදානම් තත්ත්වයකට පත්වී ඇති බව නගරවාසීහු පවසති.

ඉබ්බාගමුව නගරය මැද පිහිටි සති පොළ ඉදිරිපිට කුරුණෑගල-දඹුල්ල මහා මාර්ගයට මායිම්ව මේ කඳු ගැටය පිහිටා ඇත. මේ ප්‍රදේශයට මේ දිනවල ඇදහැලෙන ධාරානිපාත වර්ෂාව හේතුවෙන් මෙහි අවදානම් තත්ත්වය උග්‍ර අතට හැරෙමින් පවතී.

මේ වන විටත් ප්‍රධාන පාරේ සිට කන්ද දෙසට බර වාහන යොදා ගනිමින් හාරා ඇති කන්ද කෙළවරෙහි විශාල කළු ගල් රාශියක් පිහිටා ඇත. යම් හෙයකින් කන්ද සේදී ගොස් මේ කළු ගල් පෙරළීමට ලක්වුවහොත් සිදු විය හැකි හානිය කියා නිම කළ නොහැක.

මේ කන්ද කැපීම සඳහා පුද්ගලයන් දෙදෙනකු සම්බන්ධ බවත් ඉන් එක් අයකු නීත්‍යානුකූලව අවසර ලබා ගෙන කරන බව දැන ගන්නට ඇත. එහෙත් අනෙක් පුද්ගලයා කිසිදු අවසරයක් ලබා නොගෙන කන්ද කැපීම කරන බව නගරවාසීහු පවසති.

කෙසේ නමුත් කන්ද කැපීමේදී කිසිදු ආරක්ෂක ක්‍රමවේදයක් අනුගමනය කර නැත. කන්ද පාමුල සිට ඉදිරියට පස් කපා ගෙන යාමේදී දෙපස ඇති ව්‍යාපාරික ස්ථාවලට මෙන්ම මහාමාර්ගයේ ගමන් කරන රථවාහන වලට ද, පුද්ගලයන්ට ද, අවට පදිංචිකරුවන්ට ද දැඩි අවදානමක් දරන්නට සිදු වී ඇත.

මේ සිද්ධිය දකින අය ප්‍රශ්න කරන්නේ මෙවැනි ජනාකීර්ණ ප්‍රදේශයක අනාරක්ෂිත අයුරින් පස් කැපීමට අවසර දුන් බලධාරීන් කවුරුන්ද යන්නයි.

උකුස ඇස

ukusuase@lakehouse.lk



■ සීගිරිය විශේෂ

## අනේ! අලිවංගුවේ දරුවන්ට බඩගිනියි





පාසල් වයසේ පසු වුව ද මවුපියන්ට ඇති ආර්ථික දුෂ්කරතා නිසා පාසල් ගමන සම්පූර්ණයෙන් නවතා දැමූ දරුවන් දස දෙනකු සහ කඩින් කඩ පාසල් ගමන සිදු කරන ළමයින් පනස් දෙනකු පමණ සිටින ගම්මානයක් අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා තිබේ.

ලෝක ළමා දිනය සමරන අවස්ථාවේ මේ දුෂ්කරතා නිසා අධ්‍යාපනයට තිත තබා අනාගතය ගැන සිහිනයක් හෝ නොමැති දරුවන් සොයා අපි එහි ගියෙමු.

මවුපියන් විසින් යමක් ඉල්ලාගෙන, යකඩ එකතු කොට, පින්තූරයක් හඳුන්කූරු පැකැට්ටුවක් අලෙවි කරමින් රැකියාව ලෙස කරන මේ ගම්මානයේ බොහෝ දානපතීන් ගේ උදව්වෙන් නිර්මාණය වූ එකක් බව ගම්මු පවසති. 'අලිවංගුව' නමින් මේ ගම්මානය හඳුන්වයි.

මේ ගම්මානයට නායකත්වය ලබා දෙන එස්.ආර්. ඩබ්ලිව්. ශාන්ත කුමාර මහතා කියා සිටියේ නිසි ජීවන ක්‍රමවේදයක් නොමැතිවීම, ආහාරපාන නොමැතිවීම, පාසල් උපකරණ ලබා ගැනීමට මවුපියන්ට මුදල් නොමැතිවීම, ආහාර හිඟවීම, නිසි පහසුකමක් නොමැති වීම, මවුපියන්ගේ නිසි අධීක්ෂණයක් නොමැති වීම, මවුපියන් අධ්‍යාපනය නොලැබීම ආදී කරුණු කාරණා රැසක් හේතුවෙන් මේ ගම්මානයේ දරුවන් දස දෙනකුට වඩා පිරිසක් පාසල් ගමනට මේ වන විටත් සමු දී ඇති බව ය.

අලිවංගුව ගම්මානයේ පාසල් වයසේ දරුවන් දැරියන් පනහකට වඩා වැඩි පිරිසක් සිටින බවත් එයිනුත් බොහෝ දෙනකු සතියකට දින එකක් හෝ දෙකක් පමණක් පාසල් යන බවත් ශාන්ත වැඩිදුරටත් කියා සිටියේය .මේ දරුවන්ට අධ්‍යාපන සිහිනය ඇතත් එම සියල්ල දරිද්‍රතාව හේතුවෙන් හා සමාජයේ කොන් කිරීම නිසා විනාශ වී ඇති බව ගම්වාසීහු කියති.

පාසල් නොයන දරුවන් දස දෙනා එක ස්ථානයකට කැඳවා ඔවුන්ගෙන් විමසීමේදී කියා සිටියේ තමන් පාසලට යෑමට ආශා කරන බව ය. එහෙත් අලිවංගුව ගම්මානයේ නම කියූ සැණින් සෑම තැනකින්ම තමන් කොන්කිරීම, කුසගින්නේ සිටීම, නිසිලෙස ඇඳුමක් පැලඳුමක් නොමැතිවීම නිසා පාසලේදී ලැජ්ජාවට පත්වීම උසුළු විසුළු වලට ලක්වීම නිසා පාසල් ගමනට තිත තැබූ බවය. එම අඩුපාඩු සම්පූර්ණ කර දීමට හැකිනම් පාසල් යෑමට හැකි බව මේ දරුවෝ අප සමඟ පැවසූහ.

මේ දස දෙනා පාසල් ඇරී නිවෙස් කරා එන දරුවන් දෙස බලා දැඩි වේදනාවෙන් යුතුව බලා සිටින සංවේදී දසුනක් අපට දැකගත හැකි විය. අලිවංගුව ගම්මානයේ බොහෝ දෙනා වයස අවුරුදු 15 සපිරුණු විට විවාහ වන බව අනාවරණය වූ තවත් කරුණකි. වයස 15 වියේ දී විවාහ වූ කාන්තාවක අප සමඟ හඬා වැටෙමින් කියා සිටියේ තමන් මේ වනවිට අත්විඳින දුක් කම්කටොලු ගැන සිහිපත් කරමිනි. මේ දරුවන් වෙනුවෙන් ඔබේ සහයෝගය අවැසිම මොහොත බව පෙන්වා දිය යුතු වේ.

■ රූපිකා කේ. බණ්ඩාර - කුරුවිට සමූහ

## රත්නපුර හෙක්ටයාර් 286ක තේ වගා කිරීමට අවසර පත්

රත්නපුර දිස්ත්‍රික්කයේ මේ වසරේදී හෙක්ටයාර් 286ක තේ වගා කිරීමට අවසර පත්‍ර නිකුත් කර තිබෙන බව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු එච්.කේ. ලලිත්කුමාර මහතා සඳහන් කරයි.

තේ නැවත වගාව සඳහා හෙක්ටයාර් 129කට අවසර පත්‍ර 363ක් ද, අලුත් වගාව සඳහා හෙක්ටයාර් 42කට අවසරපත්‍ර 158ක් ද, පාලු සිටුවීම සඳහා හෙක්ටයාර් 115කට අවසරපත්‍ර 409ක් ද ලෙස අවසර පත්‍ර 930ක් නිකුත්කර ඇත. තේ නැවත වගාවේ බිම් සකස් කිරීම, පස සංරක්ෂණය හා සිටවූ පැළ නඩත්තු කිරීම සඳහා ආධාර මුදල් ලෙස හෙක්ටයාර් තුන්සිය හතළිස් පහක් සඳහා රුපියල් මිලියන 30ක් ද ගෙවා තිබේ. මේ වසරේ ගොවීන්ගේ දැඩි ඉල්ලීම මත තේගොවින් 16720 දෙනකු සඳහා ග්ලයිපොසේට් ලීටර් 39595ක් ලබාදී ඇති බවද ග්ලයිපොසේට් රසායනය පසට හා පරිසරයට හානිකර බැවින් තේ වගාවේ වල් පැළෑටි මර්දනයට වෙනත් ක්‍රම අනුගමනය කිරීම සුදුසු බව ද සහකාර ප්‍රාදේශීය කළමනාකාරවයා පවසයි.

■ නුවන් ජයසේකර - සූරියවැව විශේෂ


## දඹල වගාවක් ඇතුළේ කංසා වගා කළැයි අයෙක් අත්අඩංගුවට

අගුණකොළපැලැස්ස අබේසේකරගම නිවෙසක දඹල වගාවක් අස්සේ කංසා වගාවක් පවත්වාගෙන ගිය පුද්ගලයකු තංගල්ල කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ නිලධාරින් විසින් පසුගියදා (30) සවස අත්අඩංගුවට ගෙන තිබේ.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ අගුණකොළපැලැස්ස, බරවකුඹුක, අබේසේකරගම පදිංචි 36 හැවිරිදි දෙදරු පියෙකි. සැකකරු දඹල වගාවක් කරන මුවාවෙන් මේ කංසා හේන පවත්වාගෙන ගොස් තිබේ. සැකකරු වැඩිදුර විමර්ශන සඳහා අගුණකොළපැලැස්ස පොලීසියට බාර දී ඇති අතර අගුණකොළපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට ද නියමිතය.

■ එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක

## දඩල්ල මුහුදු වෙරළේ ජීව අත්බෝම්බයක්



පාමුර සංචාරයේ යෙදී සිටි නාවික හමුදා සෙබළුන් පිරිසකට ගාල්ල දඩල්ල මුහුදු වෙරළේ තිබූ අත් බෝම්බයක් පසුගියදා (30) සවස හමුවී ඇතැයි නාවික හමුදාවේ මාධ්‍ය ප්‍රකාශක කපිතාන් ඉන්දික ද සිල්වා මහතා පැවැසීය.

දක්ෂිණ නාවික විධානයේ සෙබළුන් පිරිසක් දඩල්ල මුහුදු තීරය දිගේ පාමුර සංචාරයේ යමින් සිටින විට හමුවී ඇති පොලිතින් ආවරණයක බහා තිබූ මේ ජීව අත්බෝම්බයේ JNO17 යනුවෙන් සඳහන්ව ඇත. මේ අත්බෝම්බය ගාල්ල මූලස්ථාන පොලීසිය වෙත භාරදී තිබේ.

■ ඩබ්ලිව්. රෝහණ - බුලත්කොහුපිටිය සමූහ

## දැරණියගල හල්දොල ඇළට වැටී කාන්තාවක් ජීවිතක්ෂයට

දැරණියගල, මිනුවන්දෙණිය, දෙල්ඔලුව ප්‍රදේශයේ කාන්තාවක් පසුගිය 29 වැනි දින හල්දොල ඇළෙන් එගොඩවීමේදී ඊට වැටී මිය ගොස් ඇති බව දරණියගල පොලීසිය පවසයි.

මෙසේ මිය ගොස් ඇත්තේ ප්‍රේමලතා ජයරත්න මැණිකේ නමැති වයස අවුරුදු 60ක පමණ කාන්තාවකි. 29 වැනි දින උදෑසන දෙල්ඔලුව පාසලේ එක වසරේ ඉගනුම ලබන තම මුනුබුරකු ඇරලීම සඳහා හල්දොළ ඇළ හරහා එගොඩ වීමට පැමිණි අවස්ථාවේ එදින වර්ෂාව ඇදවැටීම නිසා ඇළේ ජල පහර වැඩිවී තිබේ. එම නිසා ඇය මුනුබුරාත් සමඟ ඒ ආසන්න ස්ථානයකින් එගොඩවීම සඳහා මුනුබුරාගේ පොත් බෑගයත්, ජල බෝතලය සහ තම පාවාහන් ගෙන එගොඩවීමට ගලක් මතින් යෑමේ දී පය ලිස්සා වැටී ජලයේ ගසා ගෙන ගොස් තිබේ. පසුව මුනුබුරා ඒ අසල කාන්තාවකට මේ බව පවසා ඇති අතර පසුව අසල්වැසියන් මාර්ගයෙන් අතුරුදන් කාන්තාවගේ මළ සිරුර සොයා ගෙන ඇත. අවිස්සාවේල්ල රෝහලේ දී පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වා ඇති අතර මෙය දියේ ගිලීමෙන් සිදුවූ මරණයක් ලෙස මරණ පරීක්ෂකවරයා විසින් නිගමනය කරන ලදි.

■ කපිල සෝමරත්න - පාණදුර සමූහ

## අනියම් මිනීමැරුමක් සිදු කළ විත්තිකරුට අවුරුදු තුනක සිරදඬුවමක්

අනියම් මිනීමැරුමක් සිදු කිරීම සම්බන්ධ අධිචෝදනාවට වරද පිළිගත් විත්තිකරුවකුට පාණදුර පළාත්බද මහාධිකරණ විනිසුරු මහේෂ් වීරමන් මහතා විසින් බරපතළ වැඩ ඇතිව අවුරුදු තුනක සිරදඬුවමක් නියම කර මරණකරුගේ බිරිය වෙත රුපියල් ලක්ෂයක වන්දි මුදලක් ගෙවන ලෙසට පසුගියදා (30) නියෝග කරන ලදි. එම වන්දි මුදල නොගෙවන්නේ නම් මාස තුනක සාමාන්‍ය සිර දඬුවමක්ද විත්තිකරුට නියම කළේය.

හොරණ මීමනපළානේ පදිංචි විත්තිකරු අධිචෝදනා ලබා සිටියේ වර්ෂ 2018 මාර්තු මස 14 වැනිදා රාජා හපුතන්තිරි යන අයගේ බෙල්ලට පිහියකින් ඇන ඔහුව මරා දැමීම සම්බන්ධයෙනි. විත්තිකරු වෙනුවෙන් අධිකරණයට කරුණු දැක්වූ නීතිඥ සුමේධ වී. පෙරේරා මහතා කියා සිටියේ මේ පිහියා ඇනුම සිදුවන විට විත්තිකරු සහ රාජා හපුතන්තිරි යන දෙදෙනාම එකට කා බී ප්‍රිති වෙමින් සිටි බවත් ඔවුන් දෙදෙනා අතර ඇතිවූ බහින් බස්වීමක් දුරදිග යෑම නිසා පිහියා ඇනුම සිදුවීමෙන් රාජා හපුතන්තිරි යන අය මියගිය බවත් ය. විත්තිකරු අනියම් මිනීමැරුමක් සිදුකිරීම සම්බන්ධ අධිචෝදනාවට වරද පිළිගන්නා බවත් නීතිඥවරයා අධිකරණයට තවදුරටත් පැවසීය. විත්තියෙන් සහ පැමිණිල්ලෙන් ඉදිරිපත් කළ කරුණු සලකා බැලූ විනිසුරුවරයා ඉහත සඳහන් දඬුවම් විත්තිකරුට නියම කළේය.

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ



## ඉරාන ජනපතිගේ අවදි වූ මතකය

ඉරානය මසිත්හි විසිතුරු සිතුවමක් සේ ඇඳී පවතී. ටෙහෙරානයේ හිම තැවරුණ කඳුවල පියකර දසුන, සඳ එලියෙන් දීප්තිමත් වූ ඇල්බෝස් (Alboz) කැඳුවැටිය මෙන්ම එදවස මා දුටු කාව්‍යමය ඉරාන සංගීත සන්ධ්වනියක මිහිර නිතර මම මනසින් විඳ ගන්නෙමි. ඉරානයට මාගේ පළමු ගමන සිදුවූයේ 2007.10.28 වෙනි දින දීය. ඉරානයේ සීත සමය උදාවෙමින් පැවතිණි. ටෙහෙරානයේ මුළුදුන් ආසියානු ගුවන් විදුලි හා රූපවාහිනි සංගමයේ 44 වැනි වාර්ෂික මහ සමුළුවට (ABU) සහභාගී වීම ගමනේ අරමුණ විය. එදවස මා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති තනතුර හෙබවූ බැවින්, සමුළුවට සහභාගී වීමේ වරය ලැබුණි.

මා නැවතී සිටි එස්ටහලාල් (Esteghlal) හෝටලය ඇල්බෝස් කඳුවැටිය අභියස මනරම් පරිසරයක පිහිටි එකකි. ආර්යන්ගෙන් පැවත එතැයි ප්‍රවාද ගත පැහැසර ඉරාන වැසියෝ මිත්‍රශීලි ජන කොටසකි.

**සුරකින දෙරණ ආරිය දන — පුරාණය**
**කතරක නැගෙයි උල්පත තෙල් — නිධානය**
**මුව මුව නිබඳ කියවෙයි අල් — කුරානය**
**සුරගන සදිසි ලඳගන දිසි — ඉරානය**

රටවල් ගණනාවකට අයත් නියෝජිතයන් සහභාගී වූ ආසියානු ගුවන්විදුලි හා රූපවාහිනි (ABU) සමුළුවේ ආරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ එදවස ඉරාන ජනාධිපති ධුරය හෙබවූ මාහමුද් අහමඩීන් ජාඩ් Mahamoud Ahmadine Jad වියතාණෝය. ඉරානයේ විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලයේ උපාධිධාරියකු ද වන අහමඩීන් ජාඩ් ජනාධිපතිතුමා ලෝක ජනමාධ්‍ය විෂය පථය ද අසුරු කරගනිමින් සමුළුව අමතමින් කළ ප්‍රධාන දේශනය ඉතාමත් අර්ථාන්විත වූත් දාර්ශනික වූත් දේශනයකි.

දේශනය අවසානයේ ජනාධිපති තුමා සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටීමට නියෝජිතයන්ට අවස්ථාව ලැබුනි. ජනාධිපති අසල සිටි මම එතුමාගේ කතාවේ ඉතා හරවත් කොටසක් එතුමාට සැලකර සිටියෙමි. පරිවර්තකයා මඟින් එයට හොඳින් සවන්දුන් ජනාධිපතිතුමා සභා ගැබින් පිට වී යන අවස්ථාවේ මඳකට මා ළඟ නැවතී සිට යළිත් වරක් ප්‍රසාදය හා ස්තූතිය පළ කිරීමට තරම් අනතිමානී විය.

ලෝකයේ මෙතෙක් මා අසා ඇති සංගීත සංධ්වනී අතුරෙන් මධුරතම සංධ්වනී සංගීතය





### දේශානු තැන්න

රස විඳීමේ භාග්‍යය මට මෙහි දී ලැබිණි. මෙම සංධ්වනී සංගීත ප්‍රසංගය පැවැත්වූයේ ඉරාන ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදීය. මෙය ඉරාන ඉස්ලාමීය ජන රජයේ ගුවන්විදුලි (IRIB) වාදක මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද්දකි.

පැරණි ඉරාන පද්‍ය කාව්‍ය කලාව හා සංගීත අතර සම්බන්ධය සම්මර්ශනය කිරීමේ දී මෙය ඉතා වැදගත් අත්දැකීමක් විය. ඉරාන පද්‍ය කාව්‍ය කලාවේ ගැඹුරු දාර්ශනික ස්වභාවය සෑම කලාවකටම බලපෑ චින්තන ධාරාවක් සේ සැලකිය හැකිය.

ඉරාන චිත්‍රපට ඉතා විශිෂ්ටය. ඉරානයේ පද්‍ය කලාව නූතන චිත්‍රපටයට බලපෑම පිළිබඳ මහාචාර්ය විමල් දිසානායක කළ කදිම දේශනයක් යූ ටියුබ් මඟින් අපට දැකගත හැකිය. දිව්‍යමය වීරවරයෝ (The Diviemartyrs) නමැති හුෂැන්ග් කම්කර් (Hooushang Kamkar) විසින් රචනා කරන ලද මේ සංධ්වනිය දිව්‍යමය ආස්වාදයක් ගෙනදුන් මධුර ධ්වනි කාව්‍යයක් බඳු විය. මෙය තවත් ආකාරයකින් සම්ප්‍රදාය හා නවීනත්වය මනෝඥ ලෙස සම්මිශ්‍ර වූ අවස්ථාවක් හැටියට මම දුටුවෙමි. මහෞවර් (Mahour) නමැති ඉරාන පාරම්පරික සංගීත ක්‍රම අනුව 'සන්තූර් හා ඩාෆ්' (Santor and Daf) යන වාද්‍ය භාණ්ඩ හැඟීම් හා භාව නිරූපණයට ඉතා ශූර ලෙස යොදා ගැනිණි.

සංධ්වනියේ උච්චතම අවස්ථාවේදී රසිකයා සොඳුරු ලොවකට ගෙනගිය ගීතය මොලානා ජලාල්දීන් මහම්මද් මොලාවි (Molan Jalale) කවියාගේ කවි ඇසුරෙන් සකස් කළ වදන් පෙළකි. මේ පර්සියානු (ඉරාන) කවියා ක්‍රි.ව. 1207 - 1273 දක්වා වූ කාලය තුළ ජීවත් වූවෙකි. දිව්‍යමය වීරවරයෝ නිර්මාණය පුරා රාදිෆ් 'RadifZ' නමැති ඉන්දියානු ස්වර සංගතවල ආභාසය මතු වී තිබිණි.

ඉරාන සංස්කෘතියට අනුකූලව ගායිකාවෝ ඒකල ගායනයේ නොයෙදෙති. එනමුදු මෙහි වාද්‍ය වෘන්දයට හා ගායන වෘන්දයට කාන්තාවෝ එක් වී සිටියහ.

දුටු දුටුවන් සිත් ගන්නා සුලු වූ රූපකායෙන් යුත් මහමුද් අබ්ඩොල් හොස්නි ගායන ශිල්පියා වශයෙන් මෙහි දී කටයුතු කළේය.

දාර්ශනික කවිතාව ඉරාන කාව්‍ය සම්ප්‍රදාය තුළ මතු වී පෙනෙන විශේෂ ලක්ෂණයකි.

ඔමාර් ඛයියාම්ගේ රුබයියාත් පර්සියානු පද්‍ය ආකෘතියකි. මෙහි පරිවර්තනය අප අතර ද ජනප්‍රියව පවතී. ඔමාර් ඛයියම් ඇතුළු පර්සියානු කවීන්ගේ ජීවන තොරතුරු අත්අකුරු හා කාව්‍ය නිර්මාණ පරිශීලනයට මට අවස්ථාව ලැබුණේ ඉරානයේ ජාතික පුස්තකාලයේ දී හා ඉරාන ලේඛනාගාරයේදීය. සංධ්වනී ශ්‍රවණාගාරය, ජාතික පුස්තකාලය හා ජාතික ලේඛනාගාරය එකම ගොඩනැගිල්ලක පිහිටා ඇත.

පැරණි ඉරාන කවීන් වන මවුලානා ජලල්ඩීන් (Molana Jalaledin) රූමි (Rumi) ආටර් නේශාබුරි (Atar neisha-Bouri) ෆෙරඩෝසි (Ferdowsi) වැනි කවීන්ගේ කවි ඉතා ඕනෑකමින් පරිවර්තනය කර මා වෙත පැවසූ ඉරාන ලේඛනාගාරයේ හා ජාතික පුස්තකාලයේ උගත් මඟපෙන්වන්නන් සේවක පිරිස් සිහිපත් වෙති.

ආසියානු ගුවන්විදුලි හා රූපවාහිනී සමුළුවට සහභාගි වී පැමිණි පසු 2007 නොවැම්බර් 24 වැනි දින යළිත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ රාජ්‍ය දූත කණ්ඩායමට එක් වෙමින් ඉරාන චාරිකාවකට අවස්ථාව ලැබිණි.

ඉරාන ජනාධිපති මැඳුර අබියස නීලවර්ණව එළිගිය තණ නිල්ල මත හමුදා ආචාරය සහ පිළිගැනීම සංවිධානය කර තිබිණි. කදිමට හිරුරැස් පතිත පැහැදුල් උද‍ෑසනක එළිමහනේ පැවති මෙම උලෙළ සදා අමතක නොවන වර්ණවත් එකක්විය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මන්දිර භූමියට ඇතුළුවීම ආසන්නයේ අහමඩින් ජාඩ් ඉරාන ජනාධිපතිතුමා පසෙකින් එළිමහනට විවරව තිබූ කුඩා පවුරු දොරකින් එසැණින් මතුවී පිය නගනු දුටිමි.

යුද හමුදා ආචාරයෙන් ඉක්බිතිව පැවතුණේ අප දූත කණ්ඩායම හඳුන්වාදීමයි. ජනාධිපතිවරු දෙදෙනා එක් එක් නියෝජිතයා හඳුනා ගනිමින් මා ඉදිරියට පැමිණියෝය. මහින්ද ජනාධිපතිතුමා මා හඳුන්වාදීමට සූදානම් වෙත්ම අහමඩීන් ජාඩ් ජනාධිපතිතුමා සැලකර සිටියේ මා කලින් හමු වී ඇති බවකි. එමෙන්ම මා පළමු මුණ ගැසුණු පෙර සිද්ධිය ද මතක් කර දුනි.

ඉරාන ජනාධිපතිතුමා මාකෙරෙහි දැක්වූ අව්‍යාජ අවධානය මෙන්ම මතකය ද මසිත්හි තැන්පත්ව ඇති පියකර මනෝරූපයකිනි.

එදා පර්සියාව මෙදා මා දුටු ඉරානය සොඳුරු කලාගාරයක් බඳුය. දෙගොඩ තළා ගලන ගඟ හරහා ඉදිකළ සේතුව (පාලම) පවා කලා කෘතියකි. ඈත පෙදෙස පිහිටි මා දුටු කාජු පාලම ඉරාන ගෘහ නිර්මාණ ශිල්පයේ අසිරිමත් බාවය කියාපාන තුංග නිර්මාණයකි.

මුළු මහත් ඉරානයම මට මහරු කවියකි.



**සුනිල් සරත් පෙරේරා**

## උත්තමාචාරයකි

### කැඩැල්ලක නෙත





මෑ දින් මසෙහි ආදර ආරාධනාව නිකිණිය තෙක් දික් ගැසුණේ ඒ කුප්‍රකට හා මාරාන්තික වයිරසය හේතු කොටගෙනය.

සාහිත්‍යයට ළැදි පිරිසකගේ එකමුතුවෙන් මොරටුව කලා එකතුවෙහි ප්‍රථම සභාපති ලෙස අශෝක පීරිස් මහතා කටයුතු කළ අතර වත්මන් සභාපති වන්නේ සංගීතඥ ලකී දේවා කලාකරුවාය. ඔහු කොළඹ පොත් සමාජයේ ද සාමාජිකයකු වන අතර කියැවීමට නැඹුරු කිරීම සඳහා පොතක් පිළිබඳව කතාබහ කිරීමේ සංකල්පයේ නිර්මාතෘවරයා ද වෙයි. ඒ අනුව 2019 මැයි 31 සිකුරාදා ආරම්භ කළ ඒ මාහැඟි කර්තව්‍යය පොත පතට ළැදි සැමගේ පැසසුමට ලක් විය යුතුය. කර්තෘද සහභාගී කර ගනිමින් පොතක් පිළිබඳව අදහස් දැක්වීමේදී මොරටුව ශාන්ත පීතර දේවස්ථානය ද, නීතිඥ අදූෂ ගුණසේකරයන් ද දැක්වූ සහයෝගය මහත් භක්ති ප්‍රණාමයෙන් සිහිපත් කරන බව සම්බන්ධීකරණ කටයුත්තේ නිරතව සිටින නාමල් ඩයස් සහෘදයා පවසයි.

සැමීගේ කතාව, පර්සෝනා, අප්පච්චි ඇවිත්, මා, සෙංකොට්ටං, තෙවන ඇස සහ ඉක්බිති සියල්ලෝම සතුටින් ජීවත් වූහ, යන කෘතීන්, අපෙන් සමුගත් සුගතපාල ද සිල්වා සූරීන් හැරුණු කොට අනෙකුත් කර්තෘවරුන් වන එල්මෝ ජයවර්ධන, කැලුම් වැලිගම, නීල් විජයරත්න, සමන් වික්‍රමාරච්චි, චූලාභය ශාන්ත කුමාර හේරත්, මහින්ද ප්‍රසාද් මස්ඉඹුල, එස්. ඒ. ජය සිරිමත් සුබසිංහ ලේඛකයන්ගේ සහභාගිත්වයෙන් සාකච්ඡාවට ලක්කොට තිබේ.

පොතපතට පෙම් බඳින 'මොරටුව කලා එකමුතුව' සමඟ කිත්සිරිමෙවන් ජයසේන නම් වූ ප්‍රකට කලා කරුවාගේ ටැලන්ට් ඒෂියා සංස්කෘතික මධ්‍යස්ථානයේ දී ගත කළ පැය කීපය සදාදරණීය මතකයක් වෙයි.

ගිරිකුළ නවකතාව පිළිබඳව කලා එකමුතුවේ සාමාජිකයන් දැක්වූ අදහස් එහි රචිකාව ලෙස මට අගනා සහ අරුත්බර අත්දැකීමක්ම විය. කමල් ඩයස්, සංකල්ප ප්‍රනාන්දු, මෙරිනා ඩයස්, ඔල්වියා ෆොන්සේකා, සරත් වික්‍රමගේ ඇතුළු පාඨකයන් ඉතා ඉහළ වින්දනයකින් යුත් ප්‍රබුද්ධ පිරිසක් බව පසක් කරගන්නට වැඩි වේලාවක් ගත වූයේ නැත.

කලා එකතුවේ සාමාජිකයන්ගේ වැඩි මනාපය තෝරාගන්නා කෘතිය කියැවීමට මාසයක කාලයක් ද ලබා දෙන අතර, සෑම මසකම අවසන් සිකුරාදා පවත්වන ඒ ලේඛන ලේඛක පාඨක හමුව අසිරිමත් බව නැවත නැවතත් සඳහන් කරමි.

සැහැල්ලු හා විනෝදකාමී ජනතාවක් වෙසෙන බව කියන මොරටුව පුරවරයේ සාහිත්‍ය උදෙසා මෙවන් සොඳුරු ආයාසයන් දරන්නෝ මොරටුව නිජබිම කරගත් අමරදේවයන්, රුක්මණී දේවි, ගිවන්ත අර්ථසාද්, නිරංජලා සරෝජනී සහ නිල්මිණී තෙන්නකෝන් වැනි විශිෂ්ට කලාකරුවන් ද අපමණ සෙනෙහසින් සිහිපත් කරති.

අන්ධකාරයට ශාප කරමින් කාලය අපතේ හරින වාට වඩා එක් පහනක් හෝ දැල්වීම අගනා බව අමුතුවෙන් කිව යුතු නැත. කෘතියක් උදෙසා විවිධ පාඨකයන්ගේ විවිධ අදහස් හා අර්ථ නිරූපණයන්ට සවන් දීමට ලැබීම ලේඛකයාගේ භාග්‍යයක් නොවන්නේ ද? 'මොරටුව කලා එකමුතුවට' ශක්තිය හා ධෛර්යය ප්‍රාර්ථනා කරමි.

දරුවන් හා තරුණයන් පොත පතින් ඈත් වන බවට මැසිවිලි නොනගා මෙවන් කාර්යයන් උදෙසා එක් කර ගත යුතුව තිබේ. ළමා හා යොවුන් කෘතියක් මෙලෙසින් සාකච්ඡාවට බඳුන් කරමින් ළමයින් ද සහභාගි කර ගත යුතු බවට මා කළ යෝජනාව වත්මන් සභාපති ලකී දේවා සහෝදරයා ඉත සිතින් පිළිගත්තේය.

කලාවට තෝතැන්නක් වූ මොරටුවෙන් සාහිත්‍ය උදෙසා මෙවන් කාර්යභාරයක් ඇරඹීමද පවත්වාගෙන යෑමද යළිත් අගය කරන අතරම, ඉදිරි සිකුරාදාවක දිලීප ජයකොඩි ලේඛකයා එක්කර ගැනීමටද ඔහු පරිවර්තනය කළ 'දෙන්නා දෙපැත්තේ ආරති මැද්දේ' ග්‍රන්ථය විචාරයට ලක් කිරීමට ද යෝජනා වී තිබේ. අගෙයි.

මේ සොඳුරු චාරිකාව උදෙසා වැය වූ පැය 10ක් 12ක් හේතු කොටගෙන ඉදිමුණු මගේ දෙපා දුටු මගේ කොල්ලෝ විමතිය පළ කළහ.

"අයියෝ අම්මා බලන්න ඔයාගේ කකුල් දෙක හොඳටම ඉදිමිලා. බොරු ගමනක් නෙ ඔය ගියේ ඔච්චර දුර."

ඔවුන් දෝෂාරෝපණය කරන්නට වූ කල මම හපන්කමක් කළ දැරියක මෙන් සිනාසුණෙමි.

"මම පුංචි කාලේ කියවන රුසියන් සුරංගනා කතාවක ගෑනු ළමයා යකඩ සපත්තු හතක්, යකඩ හැරමිටි හතක් ගෙවෙනකම් මුහුදු හතක්, කාන්තර හතක්, කඳු හතක් තරණය කරනවා තමන්ගේ ආදරවන්තයා සොයා ගෙන යන්න. මාත් එහෙම තමා ඕන දුරක්, ඕන දුකක් විඳිනව මගේ ආදරේ වෙනුවෙන්."

ඇස් අයා ගත් කොල්ලෝ වහා ප්‍රශ්න කළහ. "අම්මගේ ආදරේ. ඒ කවුද?"

"ඇයි අනේ සාහිත්‍ය තමා. පතපොත වෙනුවෙන් තාම පුස්තකාලේ යන මට මොරටු යන එක මහ කජ්ජක්ද?"


ඔවුන් හඬනගා හිනහෙන කල මට මා පෙළන්නා වූ ශාරීරික වේදනා සියල්ල අතුරුදන් වූ සෙයක් හැඟෙයි. අපේ මේ කොල්ලන්ට වගේම රටේම කොලු කෙල්ලන් අකුරට පෙම් බඳින්නේ නම්, මේ රට කොතරම් සුන්දර වනු ඇත්ද?



**ශාන්ති දිසානායක**










# සාහිත්‍ය ලොව මවිත කළ එල්මාන්ගේ 'වැල්වටාරම්?'

2019 වර්ෂයේ, බුකර් සාහිත්‍ය සම්මානයේ අවසාන වටය සඳහා නිර්දේශිත නවකතා හයට, ලුසී එල්මාන් ගේ 'ඩක්ස්, නිව්බරිපෝට්' (Ducks, Newburyport) ද අයත් විය. වසරක් තුළ පළවන, දහස් ගණනක් වන ඉංග්‍රීසි නවකතා අතුරින් අවසන් වටයට තේරීම ඉතා අසීරු දෙයකි. එය කතුවරයාට හෝ කතුවරියට විශාල කීර්තියක් මෙන්ම ධනයක් ද ගෙන ඒමට හේතු වෙයි.

ලුසී එල්මාන්ගේ සත්වැනි නවකතාව වන 'ඩක්ස්' (නිව්බරිපෝට් හි තාරාවෝ යන අරුතැති) අවසන් වටය සඳහා නිර්දේශ කළ විනිශ්චය මණ්ඩලය, එය හැඳින්වූයේ 'විස්මිත ලේඛනයක්' ලෙස ය'

එල්මාන් සිය නවකතාව ලියන්නේ තනි වාක්‍යයකිනි. දිගු ගමනක දී, රාත්‍රිය, නවාතැනක ගත කරන්නාක් මෙන් අතරමග තැනක නැවතුණද, පොතෙන් තුනෙන් දෙකක් ම එම තනි වාක්‍යය ඔස්සේ ගෙනයෑමට ඇය සමත් වෙයි. මෙහි දී කතුවරිය උපක්‍රමයක් වශයෙන් යොදා ගන්නේ කොමා සහ තිත් කොමාය. ඇය අනුගමනය කරන්නේ විඥානධාරා ආඛ්‍යාන ශෛලියයි.

එල්මාන්ගේ ජීවිතයේ විවිධ යුග බැඳි අත්දැකීම්, ඇයට හමු වූ පුද්ගලයන්, කියවූ පතපොත, වෙනත් පුද්ගලයන්ගේ සිදුවීම්, යනාදී දහසකුත් එකක් දැය මෙම නවකතාවට හසුකර ගනී.

විනිශ්චය මණ්ඩලය මෙසේ ද සඳහන් කර ඇත.

'තනි වාක්‍යයකින් පිටු සියයක් පමණ ලිවීම නම් අප පුදුම විය යුතු දෙයක් නොවේ. එහෙත් පිටු දහසක්? එය විස්මය දෙන ව්‍යායාමයක්'

පරිච්ඡේදවලින් තොර මෙම නවකතාවේ, ඕනෑම තැනක් පෙරළා කියවිය හැකිය. එල්මාන් ගේ වචන හරඹය අපි නෙත, සිත වසඟයට ගනී. මිත්‍රශීලී ගමන් සගයකු මෙන්, අතනොහරිමින්, අප ඉදිරියට කැඳවා ගෙන යයි. ඩක්ස් හි පිටු දහසම නීරස නොවෙයි. එක හුස්මට කියැවිය නොහැකි වුවත්, පසෙක තැබීමටද සිත් නොදෙයි.

## උඩුපෙළ සහ යටිපෙළ

මෙම දීර්ඝ ආඛ්‍යානයේ සිදුවීම් එකිනෙක එකට බැඳ තැබීමේදී ලේඛිකාව 'එබැවින්, මක්නිසාදයත් හෝ කාරණය නම්' වැනි අරුතකින් යුත් the fact that යන යෙදුම භාවිත කරයි.

මෙහි කතා නායිකාව (ඇය නිර්නාමිකව සිටී) ඇමරිකාවේ මැසචුසෙට්ස් ප්‍රාන්තයේ, ඔහියෝ ප්‍රදේශයේ ජීවත්වන මධ්‍යම පාන්තික මැදිවියේ කාන්තාවකි. ඇයගේ සැමියා ඉතිහාසය පිළිබඳ සහය මහාචාර්යවරයෙකි. ඇයට දරුවන් සිව් දෙනෙකි. ගුරු වෘත්තියේ යෙදී සිටින මෙම කාන්තාවට ඉන් සමු ගැනීමට සිදු වන්නේ පිළිකා රෝග ලක්ෂණ මතු වීමෙනි. පසුව ඇය තම ජීවිකාව උදෙසා, 'බේකරි කෑම' වර්ග තනමින්, ආපනශාලාවන්ට අලෙවි කරයි. ඇගේ මවගේ සෙවණැල්ල ද, මෙම කතාව පුරා විසිරෙයි. ඇය - එමී - කුඩා කාලයේ දී, නිවුබරිපෝර්ට් නගරාසන්නයේ කුඩාවැවක තාරාවන් ලුහුබැඳ යද්දී දියේ ගිලෙයි. ඇය බේරා ගන්නේ ඇගේම සොහොයුරියක විසිනි. පසු කලෙක ඇය පිළිකා රෝගයකින් මියයයි. (මෙම නවකතාවට නම ලැබෙන්නේද එම සිද්ධිය ආශ්‍රයෙනි.)

එක් විචාරකයකු ඩක්ස් නවකතාව හැඳින්වූයේ භ්‍රමණය වන සිතුවිලි එක්තැන් කිරීමක් ලෙසිනි. එය එකමිතියක් නැත්තාසේ පෙනෙන, එහෙත් අවසානයේ දී ජීවිතය හා ලෝකය මෙසේ යැයි හකුළුවා දක්වන කොලාජ් නිර්මාණයක් බඳුය.

කතාවේ එක තැනක දී, කතා නායිකාව තම බේකරි නිෂ්පාදන රැගත් වාහනය පදවා ගෙන යද්දී, එහි ටයරයක සුළං යයි. එදින ඇයට දුරකථනය ගෙන ඒමටද අමතකව ඇත. අධික ශීතල මැද, රථයටම කොටුවී සිටින ඇයට පිහිට වනුයේ, බොහෝ වේලාවකට පසුව එන ට්‍රක් රථ රියැදුරෙකි.

තවත් අවස්ථාවක සිය දියණිය සමඟ වෙළෙඳසලකට යන ඇය ගංවතුරකට මැදි වෙයි මෙබඳු අකරතැබ්බයන් පවසන අතරම, ලොව මුහුණ පා සිටින කාලගුණ විපර්යාස, පරිසර දූෂණය පමණක් නොව ඩොනල්ඩ් ට්‍රම්ප් ගේ දේශපාලනය ද මෙම සිතුවිලි ධාරාව තුළට මුසු වෙයි. සිංහ ධේනුවක පිළිබඳ උප ආඛ්‍යානයක් ද මේ නවකතාව තුළ දී හමුවෙයි.

පිටු 1034 ක් පුරා, වචන 430000කින් කියැවෙන මෙම මහා දිගු සිතුවිල්ලේ ස්වරූපය වටහා දෙනු පිණිස, මම ඉන් සුළු කොටසක්, (එහි ඡේද හෝ පරිච්ඡේද නැත.) මෙසේ සිංහලට නැගුවෙමි.

"කාරණය වන්නේ, සොපියා නැන්දා කිසිදු විටෙක කොක්ටේල් සාද ප්‍රතික්ෂේප නොකරන බව, බෙට්සිගෙ ඇරියුමෙන් නම් කිසිසේත් එසේ නොකරන බව, ඇය අවුරුද්දකට හතර වතාවක් විශාල භෝජන සංග්‍රහයක් වන ස්තූතිය පළ කිරීමේ සාද, පාස්කු හා නත්තල් සාද, ඇතැම්විට කම්කරු දින සාද යනාදිය ඇගේ තරු හා ඉරි මෝස්තරයේ කඩදාසි මේස ආවරණ යොදමින් සිදුකරන අතර, කාරණය වන්නේ ඇය සැමවිටම සය ආකාරයක පේස්ට්‍රි ගණයේ කැවිලි වර්ග සෑදීමත්, ලියෝට එවන් උත්සව මතක තිබීමත්, බොහෝ දෙනා රැස්වී, නොඑසේනම් දුසිමකට වැඩි පවුලේ සාමාජිකයන් එක්වී ඉස්මුරුත්තාව හැදෙන තුරු ඇහාර බුදීමක් වන අතර, කාරණය වන්නේ ඇතැම් විට ඒ කැපිලි අතර තිබෙන කැවිලි අතර තිබෙන ඇපල් නැතිනම් චෙරි, බ්ලැක්බෙරි, වට්ටක්කා, ලෙමන් එසේත් නැත්නම් පො පෝ පලතුරු way down yonder in the rap paw path(ගීතයක පෙළ) සහ තව තවත් රස ජාතීත් ඇතුළුව තිබීම මෙන්ම, කාරණාව වන්නේ එස්කිමෝවරුන් එස්කිමෝ පේස්ට්‍රි කැවිලි නො සෑදූ බවත් ඒ වෙනුවෙන් ඔවුන් ඉනුයිට් අයිවරු තාරාවුන්ගෙන් හෝ වැල්රස් නැත්නම් නාර්වේල් මත්සයින් ගෙන් කෑම වර්ග සෑදීමත් වන අතර, කාරණාව වනුයේ මගේ අතින් ලෙමන් කේක් කෑල්ල බිම වැටීමත්, චතුරස්‍රාකාර ගල් ඇතිරූ මාවත අසල සිටි කැතී එය දැකීමත් කෙසේ හෝ එය විකිණිය හැකි බව ඇය පැවැතීමත් සේම, කාරණාව වන්නේ මීට පෙර මවිසින් එවැනි කේක් තිහකට අධික ප්‍රමාණයක් සාදා ඇති බවත්, සිදු වූ දෙය මට ලැජ්ජාවක් බැවින්, නැවත එවැනි දෙයක් සිදු නොවන බවට වගබලා ගන්නා බවත් කියා සිටි අතර, කාරණාව වන්නේ....."

බැලූ බැල්මට මෙය වැල් වටාරමකි. එහෙත් එය වදනින් වදන, පෙළෙන් පෙළ, පිළිවෙලකට අමුණා කළ සාහිත්‍යයික මෝස්තරයකි. මෙම මෝස්තරය ගෙතීම මෙන්ම විඳීම ද, ඉවසීමෙන් කළ යුත්තකි. මට දැනුනු දෙය නම්, එක දිගටම නොකියවා, තැන තැන කියැවීමෙන් වුවත්, 'තාරාවෝ' නවකතාව විඳිය හැකි බවකි. එබඳු සාහිත්‍ය නිර්මාණ දුලබය. ලුසී එල්මාන් වචන රාශියක් උඩ දමමින් අල්ලමින් කරකවමින් සෙල්ලම් පාන අති දක්ෂ විජ්ජා කාරියකි.

ලුසී එල්මාන් සඳහන් කර ඇති අන්දමට, එක් උදෑසනක ඇය කඩදාසියක the fact that යන වචන තුන ලිව්වාය. එය දිග වාක්‍යයක ආරම්භය බවට පත් කළ හැකි යැයි ඇයට සිතුණි. කතාවට මුල පිරෙන්නේ එසේය.

ඇයට මේ කෘතිය සඳහා පෙර සූදානමක් නොවීය. (ඇගේ අනෙකුත් නවකතා වන්ට සේම) ලිවීම කරගෙන යන කාලයේ ඇගේ මානසික තත්ත්වය, අවට පරිසරය - ලෝක තතු - ඒ සඳහා පසුබිම සලසයි. 'මට අවශ්‍ය දේ මම ලියනවා.' ඇගේ න්‍යාය එයයි.

එල්මාන් සාහිත්‍යකරණයට එළඹෙන්නට පෙර ප්‍රිය කළේ මූර්ති ශිල්පිනියක වීමට ය. එහෙත් කාන්තාවකට ඒ වැඩ බිමෙහි ඉඩක් නැති බව හැඟුණෙන් ඇය ඉන් ඉවත්විය. මෙහිදී ඇය ඇඟිල්ල දිගු කරන්නේ පුරුෂාධිපත්‍ය බලපෑම දෙසටය.

'ඩක්ස්' නවකතාවෙහිද දක්වන පරිදි, සැම අතින් ම දූෂිත වූ නවීන ලෝකය ගැන එල්මාන් තුළ ඇත්තේ දැඩි කලකිරීමකි. ඒ නිසාදෝ, හිරෝෂිමා බෝම්බයට පෙර ලෝකයේ (දෙවන ලෝක යුද්ධයට පෙර ලෝකය) ලියැවුණු සාහිත්‍ය කියැවීමට ඇය ප්‍රිය කරයි.

1759 දී ප්‍රථම වෙළුම පළ වූ, ඉන්පසු වෙළුම් අටක් පළවූ, ඇංග්ලෝ අයිරිෂියානු ලේඛක ලෝරන්ස් ස්ටර්න්ගේ the life and opening of trijatram shandy හා 16 වැනි ශත වර්ෂයේ පළවූ, ප්‍රංශුවා රබ්ලේගේ (ප්‍රංශ ජාතික) gargantna and pantagruel නමැති යෝධ පුරුෂයන් දෙදෙනකු පිළිබඳ ප්‍රබන්ධය වැනි කෘතීන් දෙසට ඇය යොමුවන්නේ, නූතන ලෝකයේ පිටමංව සිටීමටය. දොන් ක්වික්සෝට් වැනි උපහාස නවකතාවක් නැවත ලියැවේදැයි ඇය ප්‍රශ්න කරයි.

ප්ලාස්ටික් හා රසායනික අපද්‍රව්‍ය කඳු ගැසුණු, යුද බිය පැතිරුණු, විකෘති දූෂිත ලෝකයක මවක් වීම පවා, දෙවරක් සිතිය යුතු - නොඑසේනම් වැළකී සිටිය යුතු - කාරණයක් බවට පත්ව ඇතැයි ඇය කියයි. එක් පුවත්පතක් විචාරකයෙක් ඩක්ස් නවකතාවට නිර්දය විවේචනයක් කරමින් එය පිටු දහසකින් නොව වාක්‍ය 8කින් ලියා නිම කළ හැකිව තිබුණි යැයි කීය. ඒ පිළිබඳව උපහාසාත්මක පිළිතුරක් දෙන ලුසී එල්මාන් මෙසේ පවසයි.

" මගේ සොහොන් කොතේ මෙසේ ලියා තබන්න.

එකම වැකියක් යනු වැකි අටක් නොවේ."

one sentence not eight



කපිල කුමාර කාලිංග



# ප්‍රංශ බසින් ලක්දිව පිළිබඳ සටහන් තැබූ පරිවර්තකයා

බොහෝ විදෙස් ලේඛකයෝ ඔවුන් දුටු ලංකාව ගැන විවිධාකාර සටහන් තැබීමෙන් අපේ ලංකාවේ ඓතිහාසික හා සමාජීය කරුණු එළිපෙහෙළි කරගැනීමට මහඟු පිටුවහලක් සැපයූහ. විශේෂයෙන් යටත් විජිත යුගයේ ඔවුන්ගේ මෙහෙවර වඩා කැපී පෙනෙයි. ඉංගිරිසි ජාතිකයෝ මේ පිරිස අතර ප්‍රමුඛයෝ වූහ. ඔවුහු ඉතිහාස හා සමාජ තොරතුරු ලිවීමට අතිරේකව මෙරට ජනශ්‍රැති රැස් කිරීමේ කාර්යයට ද දායක වූහ. ඊට අතිරේකව පෘතුගීසි, ලන්දේසි, ජර්මානු, ප්‍රංශ ආදී ලේඛකයන්ගේ ලේඛන ද දක්නට ලැබෙයි.

'ඊඩලන් ෂොන්විල්' (Eudelin Jonville) මුල් කාලීන බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලංකාවට පැමිණි ප්‍රංශ ජාතික නිලධාරියෙකි. ඔහු පිළිබඳ තොරතුරු වාර්තා වන්නේ ඉතා මඳ වශයෙනි. ඔහු 'ෆ්‍රෙඩ්රික් නෝර්ත්' ආණ්ඩුකාරයා යටතේ ලංකාවට පැමිණි බව සඳහන් ය. ඔහු මිනුම් කටයුතු පිළිබඳ ජනරාල් වරයා ලෙස පත් කෙරිණි. ඒ අතර ම ෂොන්විල්ට උද්භිද උද්‍යාන හා කුරුඳු වතු පිළිබඳ පාලකයා වන්නට ද සිදුවිය. ක්‍රි. ව. 1800 දී මහනුවර බලා ගිය මැක්ඩොවල් දූත චාරිකාවට ෂොන්විල් එක්වන්නේ පෘතුගීසි භාෂා පරිවර්තකයා ලෙසිනි. ඊට අමතරව ඔහුට එහි ස්වභාව විද්‍යාඥයා ලෙස ද කටයුතු කිරීමට සිදුවිය. ජේම්ස් කෝඩිනර් පියතුමා 1807 දී ලන්ඩනයේ පළ කළ A Description of Ceylon කෘතියේ ෂොන්විල් විසින් අඳින ලද භූමි දර්ශන සිත්තම් කීපයක් පළ කොට ඇත. ඉන් දෙකක් මෙම ලිපියට අඩංගු ය. එය ෂොන්විල්ගේ සිත්තම් නිපුණතා මැනවින් පිළිබිඹු කරයි. ඔහු විසින් ප්‍රංශ බසින් ලියා නවසිය පනහේ දශකයේ දී ඉංගිරිසියට නගන ලද ජර්නල ඔහුගේ ව්‍යක්තභාවය, ගවේෂණයේ කුතුහලය මෙන් ම ලේඛනයේ අපූර්වත්වය ද නිරූපණය කරයි. 1805 ඔහු ලක්දිව හැර ගිය බව කියැවෙයි. ඉන්පසු ඔහු ගැන තොරතුරු සඳහන් නොවෙයි.

## සංහිඳ පාමුල

රජමාවතේ සෙන්පති මැක්ඩොවල් සමඟ මහනුවර බලා ගමන් කරන ෂොන්විල්එහි පළින් පළ වූ අම්බලම් පිළිබඳව මෙසේ සටහන් තබයි.

"සැම සැතපුම් තුනකට ම එකක් බැගින් ලී කුලුනු සතරක් මත රඳුණු සෙවිලි කළ වහලයකින් යුතු පාර අද්දර ඉඳුම් හිටුම් සපයන තැනක් තිබිණි. ඒවා හඳුන්වන ලද්දේ අම්බලම් නමිනි. අම්බලම් නිරන්තරයෙන් ශ්‍රේෂ්ඨ බෝ ගසකින් හෝ නා ගසකින් සෙවණ විය."

ගමනේ දී ඇපලපිටිය පසු කොට රුවන්වැල්ලට පැමිණෙන ෂොන්විල් කැලණි ගඟේ රුවන්වැල්ලේ තොටුපළින් එතෙර වීමට පෙර පාලංගමුව වත්තේ තිබුණු තානායම් හා අවට පරිසරය පිළිබඳව අපූරු විස්තරයක් ඉදිරිපත් කරයි

"ගංගාවේ සිට සැතපුම් බාගයක් පමණ දුරින් තානාපතිවරයාගේ හා අදිකාරම්ගේ බංගලා පිහිටා තිබිණි. රුවන්වැල්ල තරමක පහසුකම් සහිත වාසස්ථාන නිසා රමණීය තැනක් වීමට ඉඩ තිබිණි. එක් බංගලාවකට ළඟාවන්නේ අපූරු තේක්ක ගස් දෙපේළියක් අතරිනි. පසෙකින් වූ සමතලා බිම් කැබැල්ලක අපි අපේ කූඩාරම් ලා ගතිමු. ආවරණයෙන් යුතු පසු පස කඳුවැටි, දියදහර, ගොයම් කෙත් එකතු කරගත් සිත්තමක ඉදිරිපස භූ දර්ශනය නා නා වර්ණයෙන් යුතු තුරු ගුල්මයන් සමඟ අප පසුකර ආ පෙදෙසට වඩා රමණීය ය. බංගලාවට ඇතුළු වන ප්‍රවේශ පථයේ ශෛලමය සම සතරැස් කොටුවක විශාල බෝ ගසකි. නිරන්තරයෙන් එහි කටු තබා ඇත්තේ කිසිවෙකු හිඳ ගැනීම වැළැක්වීමට ය. ඒ ගෞරවනීය රාජසිංහ රජු අනුස්මරණය කිරීමට ය. ඔහු වතාවක් මෙහි මිනිත්තු කීපයක් හිඳ විවේක ගෙන ඇත."

ෂොන්විල් ස්ථාන හඳුන්වන විට ඒ සඳහා දේශීයයන් යොදන නම් නිවැරදිව හඳුනාගෙන නිවැරදිව නම් කිරීමට පෙලඹුණු ලේඛකයෙකි. ඇතැම් විදෙස් ලේඛකයෝ කැලණි ගඟ හැඳින්වීමට මුලවෙඩ්ඩි ගඟ, ඔල්ගොඩ ගඟ වැනි යෙදුම් යෙදූහ. ගුරුගොඩ ඔය මහඔය නමින් හැඳින්වූහ. එහෙත් ෂොන්විල් මහවැලි ගඟ, සීතාවක ගඟ, ගුරුගොඩ ඔය, මහඔය වැනි ගංගා ආදිය ද බගලේගල, දෙවනගල, අලගල්ල වැනි පර්වත ද නිවැරදිව නම් කරයි. විමසනු මැනවි.

"අට්ටාපිටිය බංගලාව විචිත්‍රවත් පිහිටීමකි. එහි සිට නැගෙනහිර සීමාවන් දක්වා දර්ශනය වන්නේ වනගහනයෙන් යුත් අනුක්‍රමයෙන් ඉහළ නගින උස් කඳු ය. දකුණින් ගිනිකොන දෙසින් අපූර්ව කඳු වැටියක් පිහිටා තිබේ. ඒ මයිල පහළොවක් තරම් දුර සිට කීප ආකාරයකින් දැකගත හැකි බතලේගල කන්දයි. එහි මුදුන පෙට්ටගමක් වැනි ය. අප ගමන් කළ කොටසේ දී එහි එක් එක් පැතිවලින් පෙනෙන මුහුණුවර තුනක් දිටිමු. මෙම තුන් පැත්තෙන් ම කන්ද බොහෝ පල්ලම් සහිත ය. එතෙකුදු වුවත් විවිධ පඳුරු විවරයන් හරහා මුල් ඇද ගැනීමෙන් ඉක්මනින් පොළොවට සමාන්තරව පැතිරෙයි. අප නුදුටු සතරවන මුහුණක පැත්තකට බෑවුම් වේ නම් කන්දේ ස්තරය උතුරු පැත්තේ සිට දකුණු පැත්තට නැඹුරුව ඇති බව අනුමාන කළ හැකිය. බතලේගල මුහුදු මට්ටමේ සිට බඹ 300 පමණ ඉහළින් විය යුතු ය.

අට්ටාපිටියේ බංගලාවට උතුරු දෙසින් 'දෙවනගල' නම් කන්දකි. එය වටකුරු මුදුනකින් හෙබි කේතු ආකාරයේ හැඩැති පව්වකි. නැත්නම් අර්ධ ගෝල හැඩැති ය. දකුණු දිග මුහුණත නිරන්තරයෙන් ම පෙන්වන්නේ නග්න කන්දකි. දෙවනගලට ළඟාවන්නට නම් ප්‍රථමයෙන් ම බංගලාව අසලින් ගලන මහඔය තරණය කළ යුතු ය. දෙවනගල කඳු ශිඛරයේ මහත් සේ ප්‍රණාමය පුද කෙරෙන බෞද්ධ පන්සලකි. ඒ අසල ම තවත් විශාල පන්සලක නටබුන් අඟල් 18 සිට අඩි 2 දක්වා ඝන කළුගලින් නිමවුණු බිත්ති සහිතව දක්නට ලැබේ. ජනරාල් මැක්ඩොවල්, එම් ද මොරෙවු සහ මම පන්සල නරඹන්නට කන්ද තරණය කළෙමු."

ෂොන්විල් ඇතැම් සිද්ධි සහ නිලධාරීන්ගේ හැසිරීම් උපහාසයෙන් නිරූපණයට ද සමතෙකි.

"පිරිවර සහිතව අපි තානාපතිවරයාගේ දීර්ඝ දූත චාරිකාවේ අවසාන නවාතැන වූ ගන්නොරුවේ බංගලාවට පැමිණියෙමු. ගිණිය නොහැකි තරම් ප්‍රශංසාවන් මෙහිදී හුවමාරු වන්නට ඇත. දෙවන අදිකාරම් සජ්ඣායනය පටන් ගත්තේ ය. ඔහුගේ වචනවල අර්ථය වූයේ රජු ඔහු අප වෙත එවා ඇති බවයි."

ඊඩලන් ෂොන්විල් පරිසරය වර්ණනා කරන්නට මෙන් ම එහි ඇති තුරුලතා, පාෂාණ ආදිය පිළිබඳ තොරතුරු ලියන්නටත් සමතෙකි. මනරම් දසුන් වචනයෙන් මතු නොව තෙලිතුඩින් ද සිත්තම් කරන්නෙකි. ඔහු ප්‍රංශ බසින් ලියූ දෑ අපේ අතීත දැනුම පොහොසත් කරයි.



මහානාම දුනුමාල



# බද්දරමල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

## කොළඹ සිට කතා කළ

# ගුවන් විදුලි මහගෙදර ශතකය අබියස




විදුවස සොඳුරුමය

ගුවන් විදුලියේ ප්‍රථම ස්ථිර නිවේදකයා ලෙස ඩී.එම්.කොළඹගේ පත්වීම ලබන්නේ 1938 ජනවාරි පළමුවන දා යයි කියැවේ. මෙරට ගුවන් විදුලි සේවාව ඇරඹෙන්නේ 1925 වසර අග භාගයේ ය. දැන් ගුවන් විදුලි මහගෙදරට වයස අවුරුදු අනූ පහකි. ශතකය අබියස ය. ක්‍රිකට් ක්‍රීඩාවේදී නම් ශතකය අබියස සිටින පිතිකරුවකුගේ හෘද ස්පන්දනය පිළිබඳ අපි දනිමු. එහෙත් ගුවන් විදුලි මහ ගෙදරට එවනි හෘද ස්පන්දනයක් තිගැස්මක් ඇතැයි නොසිතමි. ඔවුන් මෙතෙක් ඉතා දිගු ගමනක් පැමිණි ලෙසම ශතකය දක්වාම යන බව විශ්වාසය. සාමාන්‍යයෙන් ජුබිලියක් සමරන්නේ වසර විසි පහක දී පණහක දී හැත්තෑ පහක දී හා සියයක දී වුවත් වර්තමාන ගුවන් විදුලිය, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සිය අනූ පස් වන ජයන්තිය සැමරීම් වස් 'ජාතියේ සන්නිවේදකයා' නමින් විශේෂ කලාපයක් පළ කොට තිබෙනු දිටිමි. එය මා අත පත් වූ බැවින් කියවීමට ද කාලය සොයා ගතිමි. එහි ප්‍රධාන සංස්කාරකවරයෙක් වේ. ඔහු තිලකරත්න කුරුවිට බණ්ඩාරය. හේ ප්‍රවීණ හා ජ්‍යෙෂ්ඨතම පුවත් පත් කතුවරයෙකි. දිගු කලක් සිළුමිණ පත්‍රයෙහි කර්තෘ අසුන හෙබවූවෙකි. ඔහු විසින් පසු ගිය කාලයේ ගුවන් විදුලිය වෙනුවෙන් 'හඬ' නමින් ඉතා වටිනා අගනා වාර ප්‍රකාශනයක සංස්කාරකත්වය දැරීය. 'ජාතියේ සන්නිවේදකයා' නමින් පළ වී ඇති මෙම විශේෂ කලාපයෙහි ඔහුගේ නමට පෙර උපදේශකවරු දෙදෙනකුගේ නම් ගම් හමු වේ. සංස්ථාවේ සභාපති ජගත් වික්‍රමසිංහ හා අධ්‍යක්ෂ ජනරාල් චන්ද්‍රපාල ලියනගේ ඒ දෙදෙනාය. අධ්‍යක්ෂ ජනරාල් චන්ද්‍රපාල ලියනගේ අධීක්ෂණය - සංස්කරණය හා මෙහෙයවීම සඳහා ද ප්‍රධාන සංස්කාරකගේ නමට පෙර හිමිකම් කියයි. කලාපයෙහි අන්තර්ගතය විමසීමට පෙරම සංස්කාරකවරුන් තම ප්‍රකාශනය පිළිබඳ කෙතරම් උනන්දුවකින් හා සැලකිල්ලකින් කටයුතු කොට තිබෙනවා ද යන්නට එක් නිදසුනක් දක්වමි. "ජාතියේ සන්නිවේදකයා වශයෙන් අපට පැවරී ඇති බරපතළ වගකීමේ තරම" බරපතල යන්න බරපතළ වීම බරපතල අක්ෂර වින්‍යාස දෝෂයක් ලෙස නොසලකමු. එය පරිගණක අක්ෂර සංයෝජකගේ අතපසුවීමක් විය යුතුය. නොවේ නම් තිලකරත්න කුරුවිට බණ්ඩාර වැන්නකුගේ ඇසට එවැනි දොසක් හසු නොවන්නට ඉඩක් නැති බව අපි දනිමු. එවන් ඉතා සුළු අතපසුවීමක් හෝ අඩුපාඩුවක් අමතක කොට මෙම කලාපයෙහි අර්ථ සම්පන්න බව පිළිබඳ විම්සීමට හැකිද කියා කල්පනා කළ මුත් එම කල්පනාව ද බලාපොරොත්තු කඩ වීමක් වූයේ අන්තර්ගතයෙහි කැපී පෙනුණු දුබලතා නිසා බව කීමට සිදුවේ.

වසර අනූ පහක් වයසැති ගුවන් විදුලි මහගෙදර ප්‍රකාශනයට, ආයතන ප්‍රධානීන් දෙදෙනාගේ ලිපි හැරුණු කල විශේෂ ලිපි තිස් නවයකට ආසන්න සංඛ්‍යාවක් වේ. ඒවායින් බහුතරයක් පණිවිඩයි. නායක ස්වාමීන් වහන්සේලාගේ සුභාශිංසන, රජයේ මැති ඇමතිවරුන්ගේ හා ඔවුන් පිළිබඳ ලියැවුණු ලිපි, ජාතියේ සංනිවේදකයා යන තේමාවට සම්බන්ධයක් නොමැති ලිපි බහුලය. ගුවන්විදුලි මහගෙදර ඉතිහාසයේ අසිරිමත් යුගය වර්ණවත් කළ පුරෝගාමීන් පිළිබඳ ඔවුන්ගේ මෙහෙවර, දායකත්වය පිළිබඳ ලියවුණු ලිපියක්, අතීත මතකයක් මෙම කලාපයට ඇතුළත් නොවුණේ කෙසේදැයි සිතාගැනීමට නොහැකිය. සිංහල සංගීතයේ ගමන් මග නමින් විප්‍රවාසයේ වෙසෙන්නකු ලියා ඇති ලිපිය මේ ප්‍රකාශනයට කෙසේ ඇතුළත් විණි දැයි ප්‍රහේලිකාවකි. ගුවන් විදුලියේ ජන සංගීත පර්යේෂණ අංශයෙහි නයුවා වූ සී ද එස් කුලතිලක වැන්නකුගේ සම්ප්‍රදානය පිළිබඳ සටහනක්, ඔහු විසින් එදවස ගායන ලොවට හඳුන්වා දුන් විශිෂ්ට නිර්මාණකරුවන් වූ නීලා වික්‍රමසිංහ, ටී.එම්.ජයරත්න, රෝහණ බැද්දගේ ආදීන්ගේ අත්හදා බැලීම් ස්වරූපයේ ගීත පිළිබඳ හෝ ඊට පෙර අමරදේව, මඩවල රත්නායක, මහගමසේකර සුසංයෝගයෙන් ගුවන් විදුලිය ශ්‍රාවකයන්ට පිරිනැමූ මධුවන්ති, ස්වර වර්ණ ආදී සංගීතමය වැඩ සටහන් පිළිබඳ හෝ ලියැවුණු අර්ථවත් ලිපියක් දක්නට නොලැබිණ. අනූපස් වසරක ගමන් මග පිළිබඳ අවර්ජනයක දී 1970 න් පසු ගුවන් විදුලියේ අප අත් විඳි මහා පෙරළියේ හිමිකරුවා වූ අධ්‍යක්ෂ ජෙනරාල් රිජ්වේ තිලකරත්න නම් වූ විශිෂ්ට පාලකයා, රසවතාගේ දැක්ම හා රස වින්දනය මත ගුවන් විදුලියෙහි වූ පරිවර්තනය අමතක කිරීම ඛේදයකි. FM නාලිකා මෙරටට එන්නට පෙර සිටම ශ්‍රාවක නිවේදක සම්බන්ධය කෙරෙහි අවධානය යොමු කළ සජීවී වැඩ සටහන් වූ ශනිදා සාදය, සොඳුරු සෙවණ, ඒ වැඩසටහන් ඉදිරිපත් කළ ප්‍රේමකීර්ති ද අල්විස්, අසෝක තිලකරත්න, නිව්ටන් ගුණරත්න, ඩී.එස්.දයාරත්න, ආරියසිරි විතානගේ, දයා ද අල්විස්, කුසුම් පීරිස්, සුමනා නෙල්ලම්පිටිය, බර්ටි ගලහිටියාව, පාලිත පෙරේරා, ශ්‍රීමා අදිකාරී , සුජාතා ගුණවර්ධණ හා තවත් බොහෝ නිවේදක නිවේදිකාවන් විසින් ගුවන් විදුලිය හා ශ්‍රාවකයා අතර ගොඩ නැංවූ සමීප සබඳතාව මින් පෙර කිසි දිනෙක දක්නට ලද්දක් නොවීය.


සංගීත අංශයෙහි මතු නොව, අනෙකුත් බොහෝ කලා ක්ෂේත්‍ර හා ඒවායෙහි විශිෂ්ටයන් හා ගුවන් විදුලිය අතර ගොඩ නැංවූ අගනා සම්බන්ධතාවන්හි මහඟු ඵල ලෙස මෙරට සාහිත්‍යය, ගුවන් විදුලි නාට්‍ය, සිනමාව, වේදිකා නාට්‍යය, කලා හා සාහිත්‍ය විචාරය, අධ්‍යාපනය, යෞවන නිර්මාණකරුවන්ට ගුවන් විදුලියේ දොරගුළු හැරුණු වැඩ සටහන්, සතිපතා ප්‍රචාරය වූ විශිෂ්ට ශ්‍රේණියේ සරල ගී වැඩ සටහන්, (නන්දා මාලිනී, වික්ටර් රත්නායක, සනත් නන්දසිරි, සුජාතා අත්තනායක, ගුණදාස කපුගේ ආදීන්) ප්‍රවෘත්ති විකාශය, ක්‍රීඩා වැඩ සටහන්, හා තවත් බොහෝ විශේෂාංග ඇතුළත් නිර්මාණාත්මක හා විචාරාත්මක ගුවන්විදුලි වැඩ සටහන් හා ඒවා පිටුපස සිටි විශිෂ්ටයන්, ඔවුන්ගේ දායකත්වය ගෙවුණු වසර අනූ පහක කාලය තුළ සන්නාම බවට පත් වූ බව සිහිපත් කළ යුතුය. හැත්තෑව දශකයට ආසන්යේ හා ඉන් පසුව ගුවන් විදුලි මහගෙදර කියූ සැණින් ශ්‍රාවක මුවග රැව් දුන් විශිෂ්ටයන්ගේ නාමාවලිය හෝ මෙම ප්‍රකාශනයෙහි කොතැනක හෝ සඳහන් වී නම් මෙහි අගය කියා නිම කළ නොහැකි වනු ඇත. සුගතපාල ද සිල්වා, සුනන්ද මහේන්ද්‍ර, මඩවල එස්. රත්නායක, ඩෝල්ටන් අල්විස්, දයානන්ද ගුණවර්ධන, පී. වැලිකල, විමල් අභයසුන්දර, තිලක සුධර්මන් ද සිල්වා, අමරබන්ධු රූපසිංහ, දයාරත්න රණතුංග, ශාන්ති දිසානායක, පාලිත පෙරේරා, ලූෂන් බුලත්සිංහල, තිලක් ජයරත්න, බන්ධුල විතානගේ ආදීන් පිළිබඳ සිහිපත් නොකොට අනූපස් වසරක ගමන් මග ගැන කුමන කතා ද? සුභාශිංසන හෝ පැරණි ලිපි උද්ධෘතයන්ගෙන් හෝ අමාත්‍යවරුන් පිළිබඳ වර්ණනා හෝ පණිවුඩවලින් තොරව නිර්මාණශීලී අර්ථවත් ලිපි මාලාවක් මෙවැනි කඩඉම් මොහොතක පළකරනු ලබන ප්‍රකාශනයකට අඩංගු විය යුතු යැයි පළපුරුදු සංස්කාරකවරුන් විසින් අමතක කිරීම මේ ප්‍රකාශනයට කිසිදු වටිනාකමක් එක් නොවූ අවස්ථාවක් බව සංවේගයෙන් සටහන් කරමි. එකම සම්පත්දායකයකුගේ ඡායාරූප දෙකක් පළ වීම, පිටු සැකසුමෙහි කැපී පෙනුණු අවිධිමත් බව, නිර්මාණ ගුණයෙන් වියුක්ත කවර නිර්මාණය 'ජාතියේ සන්නිවේදකයා' කලාපය කියවීමට රුචි නොවන හුදු ලිපි එකතුවක් පමණක් බව සටහන් කරමි. මේ කලාපය හා සසඳා බැලීමේ දී මර්වින් ජයසූරිය විසින් ඉංග්‍රීසි බසින් රචනා කරනු ලදුව, ඩී.එස් දයාරත්න විසින් සිංහලයට පරිවර්තනය කොට ඇති රේඩියෝ සිලෝන්ෝ, මයික්‍රපෝනය පිටුපස සැඟවුණු කතා , සමච්චල්, රැවැටිලි, පම්පෝරි (1951-1961) Mervyn Jayasuriya, The Three F's Behind The Radio Ceylon Microphone (Fun, Flim, flam, Fanforanade), කෘතිය රේඩියෝ සිලෝන් අතීතය පිළිබඳ ලියවුණු අතිශය නිර්මාණාත්මක කෘතියක් ලෙස දකිමි. එහි වූ කියවීමට ඇලුම් කරන ගුණය, අපූරු තොරතුරු, මේ ප්‍රකාශනයෙහි එකදු ලිපියක හෝ තිබුණු බවක් නොදිටිමි.



බුද්ධදාස ගලප්පත්ති
bgalaps@gmail.com




# රතු බත් සහ දියවැඩියාව



වෙද නළාව

දියවැඩියා සායනයට ගිහින් ගෙදර ආපු තාත්තා සාලෙට ආවෙ බත් පිඟානත් අරගෙන. එයා මහන්සියටත් එක්ක බත් ගොඩක් බෙදාගෙන තිබුණා.

" ඔච්චර බත් ගොඩක් කන්න එපා කියල නේද ක්ලිනික් එකෙන් කිවුවේ? " ඒක දැකපු දුව ඇහුවා.

"නෑ පුතේ මේ රතු බත් නේ. දියවැඩියාවට රතු බත් හොඳයි කියලා තමයි එයාල කියන්නේ." තාත්තා කිවුවා.

දියවැඩියාව කියන්නේ ලේවල සීනි මට්ටම සාමන්‍යෙන් තියෙන්න ඕන ප්‍රමානයට වඩා වැඩි වෙන එකට. පැය දොළහක් කන්නෙ බොන්නෙ නැතුව ඉඳලා ලේවල සීනි මට්ටම පරීක්ෂා කරලා බැලුවම අපිට මේක ලේසියෙන්ම හොයාගන්න පුළුවන්.

අපේ ලේවලට සීන් එන්නේ අපි කන කෑමවලින්. නිරෝගි කෙනෙක් ගේ ලේවලට වැඩිපුර සීනි ටිකක් ආවොත් එයා ගෙ ඇඟට පුළුවන් ඒ වැඩිපුර සීනි ටික ලේවලින් අයින් කරලා වෙනම තැනක තැන්පත් කරන්න. බැරි වෙලාවත් ලේවල සීනි අඩු උණොත් අර තැන්පත් කරපු සීනිවලින් ටිකක් ලේවලට එකතු කරගෙන ලේවල සීනි මට්ටම හරි ගානට ගන්න.

මේක හරියට වැඩිපුර තියෙන සල්ලි ගෙදර හරි පර්ස් එකේ හරි තියාගන්නෙ නැතිව බැංකුවේ දානවා වගේ දෙයක්. හදිස්සියක් වුනාම ආපහු ගන්න.

හැබැයි දියවැඩියාව තියෙන කෙනෙකුට මේ දේ කරගන්න අමාරුයි. එයාට ලේවලට එන සීනි ඉක්මනින් අයින් කරගන්න අමාරුයි. ඒ නිසා එයාගෙ ලේවල සීනි මට්ටම අනික් අයට වඩා වැඩි වෙනවා.

හරියට බැංකු ගිණුමක් නැති කෙනෙක් ට වැඩිපුර සල්ලි ටිකක් ලැබුණොත් ඒ ටික ගෙදර ඉතුරු වෙනවා වගේ.

ඉතින් එහෙම කෙනෙක් වැඩිපුර පැනිරස හරි පිටි සහිත කෑම වර්ග හරි කෑවොත් වෙන්නෙ එයාගෙ ලේවල සීනි මට්ටම ගොඩක් වැඩි වෙන එක. එතකොට ඒක එයාගෙ ඇඟට නරක විදිහට බලපානවා.

අන්න ඒ නිසයි අපි දියවැඩියාව තියෙන කෙනෙක් ගේ ලේවලට එකපාර සීනි ගොඩක් එකතුවෙන්න දෙන්න හොඳ නෑ කියන්නෙ.

අපි කන සමහර කෑම ඉක්මනින් දිරවලා ඒ කෑමවල තියෙන සීනි එක පාරටම ලේවලට උරා ගන්නවා. එහෙම කෑම වර්ගයක් කෑවම ලේවල සීනි මට්ටම එක පාර වැඩිවෙනවා. සුදු බත් කියන්නේ එහෙම කෑම වර්ගයක්.

තම්බපු රතු හාල් බත්වල තියෙන සීනි ලේවලට උරාගන්නෙ ඊට වඩා ටිකක් හෙමින්. ඒ නිසා ලේවල සීනි මට්ටම වැඩි වෙන්නෙ හෙමින් හෙමින්. එතකොට ඒ වැඩිවෙන සීනි මට්ටම පාලනය කරගන්න ලේසියි.

හරියට තනි මිනිහෙක්ට එකවර කීප දෙනෙක් එක්ක සටන් කරනවට වඩා එක්කෙනා, එක්කෙනා එක්ක සටන් කරන එක පහසුයි වගේ.

මෙන්න මෙහෙම හෙමින් දිරවන කෑම වර්ගවලට කියන්නේ "ග්ලයිසීමික් දර්ශකය අඩු කෑම වර්ග" කියලා. ඒ නිසා දියවැඩියාව තියෙන කෙනෙක් හැම වෙලාවකම බලන්න ඕනෑ මේ ග්ලයිසීමික් දර්ශකය අඩු කෑම මොනවද කියලා හොයාගෙන ඒව කෑමට එකතු කරගන්න.

දියවැඩියාව තියෙන කෙනෙකුට සීනි පැනි චොකලට් පැණි බීම වගේ දේවල් ගන්නම එපා කියන්නෙත් ඒ වගේ කෑමවල තියන සීනි එක පාරටම ලේවලට උරගෙන ලේවල සීනි මට්ටම ගොඩක් වැඩි කරන හින්දා.

දැන් එහෙනම් අපිට තේරෙන්න ඕනේ සුදු බත්වල වගේම රතු බත්වලත් සීනි තියෙනවා. හැබැයි රතු බත්වල තියෙන සීනි ඇඟට උරාගන්නේ හෙමින් නිසා ලෙඩාට වෙන හානිය සුදු බත් කනවට වඩා ගොඩක් අඩුයි කියන එක.

හැබැයි ඒක එහෙම වෙන්නේ රතු බත් උනත් ටිකක් කනව නම් තමයි. වෙන විදිහකට කියනවා නම් සුදු බත් කෝප්පයක් කන ලෙඩකුට වඩා රතු බත් කෝප්පයක් කන එක දියවැඩියා ලෙඩකුට එයාගෙ සීනි මට්ටම පාලනය කරගන්න ලේසියි.

එහෙම නැතුව දියවැඩියාවට රතු බත් කන්න කියන එකේ තේරුම දියවැඩියාව තියෙන කෙනකුට හිතු මතේ ඇති තරම් රතු බත් කන්න පුළුවන් කියන එක නම් නෙවෙයි.



වෛද්‍ය නුවන් තොටවත්ත

# ටොම්සන් මහත්තයා

## සන්නිවේදනයට කවු ද වගකියන්නේ?

ටොම්සන් මහත්තයා උන්නැහේත් සමග ඉසුරුපායට ගියේ පාසල් මාධ්‍ය සමාජ ගැන ගැන තොරතුරු ටිකක් හොයා ගන්නටය. ඒක පාසලේ විෂය සමගාමී වැඩකි.

"අපි මේ ආවේ නෝනා.... අර පාසල් මාධ්‍ය සමාජ ගැන තොරතුරු ටිකක් දැන ගන්න... මේ දවස්වල මොනවද ඒ ගැන සිද්ධ වෙන්නේ.." කියා ටොම්සන් මහත්තයා මාධ්‍ය සමාජ නෝනාගෙන් ඇසුවේය. මාධ්‍ය සමාජ නෝනා සිටියේ තවත් නෝනලා මහත්තුරු පිරිසක් එක්ක කතා කරමිනි.

"අපි මේ කතා කරන්නෙත් ඒ ගැන තමයි... වැඩේ කියන්නේ අර අයි ටී එන් එකෙන් කරපු වැඩ සටහන් කීපය ඇරෙන්න තාමත් වෙන මුකුත් කරලා නෑ... දැන් මේ සෞඛ්‍යයෙන් ලියුමක් එවලා තියෙනවා නේ... වැඩ සටහන් සකස් කරන්න ඕනෑ ඒකට ගැලපෙන විදිහට..." කියා මාධ්‍ය සමාජ නෝනා කීවාය.

"ඒ කියන්නේ පහු ගිය අවුරුදු කීපයම පාසල් මාධ්‍ය සමාජ ගැන මුකුත් කරලා නෑ කියන එකනේ. ඔය සෞඛ්‍යයෙන් ලියුම එවලා තියෙන එක වෙනම කාරණයක් නේ... කොහොමත් වාර්ෂික සැලැස්මක් තියෙන්න ඕනැ නේ... ඒකනේ සෞඛ්‍යයේ ලියුමත් එක්ක ගළපා ගන්න ඕනෑ..."

"ඔය ගැන අපේ අධ්‍යක්ෂතුමා එක්ක කතා කරන්න... ඊට වැඩිය දෙයක් මං දන්නේ නෑ..."

ටොම්සන් මහත්තයා උන්නැහේත් සමග එතැනින් පිටත් වූයේය. ඒ එන ගමන් දුටුවේ මාධ්‍ය සාක්ෂරතාව යන නම ගැසූ ලොකු ලිපි ගොනු කවර දෙකක් වෙනත් ලිපි ගොනු සමග තබා තිබෙන ආකාරයයි. ඒවා මෙයට අවුරුදු දහයකට පමණ පෙර ජාතික සාම මණ්ඩලයත් සමග එක්ව පාසල්වල මාධ්‍ය සමාජ සාමාජිකයන් සඳහා ක්‍රියාත්මක කරන්නට සම්පාදනය කරන ලද අත්පොතකි.

"මේ ලිපි ගොනු කවර දෙක මොකද මේ විදිහට තියෙන්නේ... කෝ මේවායේ ඇතුළේ තිබුණු අත්පොතේ කඩදාසි...?" කියා ටොම්සන් මහත්තයා අසල සිටි ලිපිකාරිනියකගෙන් ඇසුවේය.

"දන්නෙ නෑ..."

ටොම්සන් මහත්තයා බොහොම කනගාටුවෙන් එතැනින් එළියට ආවේය.

"ඇයි ටොම්සන් මහත්තයා..? මොකද මේ වෙලා තියෙන්නේ...?" කියා උන්නැහේ ඇසුවේය.

"මොනවා වෙන්නද උන්නැහේ... මීට අවුරුදු විස්සකට විතර ඉස්සෙල්ලා ඔය පාසල් මාධ්‍ය සමාජ පටන් ගත්තෙත් ඔය අංශෙත් එක්ක එකතු වෙලා... ඒ කාලේ හිටියා නන්දසිරි කියලා අධ්‍යක්ෂතුමෙක්.. එතුමා මේ වැඩ සටහනට කොයි තරම් සහයෝගයක් දුන්නාද? ඒ කාලේ ඒ විෂයය භාරව හිටපු නිලධාරිනිය අද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරියක්... එහෙම කර ගෙන ආපු වැඩසටහනක් තමයි අද වෙන කොට නන්නත්තාර වෙලා තියෙන්නේ... අර මාධ්‍ය සාක්ෂරතාව අත්පොත ලොකු වියදමක් කරලා හදපු එකක්... ඒක මේ අංශයට සම්පතක් වෙන්න ඕනෑ.. ඒ වුණාට අද වෙන කොට ඒකේ අත් පොතේ කඩදාසි විසි කරලා ඒක පයිල් කවරයකට අර ගෙන..."

උන්නැහේත් කිසිවක් නොකියා ටොම්සන් මහත්තයා සමග පඩි පෙළ බසින්නට පටන් ගත්තේය.

"ඉතින් ටොම්සන් මහත්තයා.. මේ ගැන කතා කරන්න වෙන කෙනෙක් නැද්ද?" කියා උන්නැහේ ඇසුවේය.

"ඒක ගැන නම් කියලා වැඩක් නෑ උන්නැහේ..." කියා ටොම්සන් මහත්තයා කීවේය.

"ඒ මොකද එහෙම කියන්නේ ටොම්සන් මහත්තයා...? මේ වගේ තැනක ඒ විදිහට වෙන්න බැනේ... මේක රටටම වැඩ කරන තැනක් නේ..." කියා උන්නැහේ පුදුමයෙන් කීවේය.

"කවුද කියන්නේ උන්නැහේ... මේක රටටම වැඩ කරන තැනක් කියලා... මේක තමන්ට වැඩ කර ගන්න තැනක්... ඕනෑ තරම් උදාහරණ දෙන්නම්... අඩු ගණනේ මේ වෙන කොට ඔය සන්නිවේදනය විෂය භාර නිලධාරියෙක්වත් මෙතන නැනේ...

ටොම්සන් මහත්තයා මෙහෙම කියන විට එතනින් යමින් සිටි මහත්තයෙක් නතර වී මෙසේ කීවේය.

"මට ඇහුණා මේ මහත්තයා කියාපු දේ... ඔය වගේ බොරු කියන්න එපා මහත්තයා... ඔය සන්නිවේදනය විෂයය සිංහල විෂය භාර නිලධාරියාට ආවරණය කරන්න පුළුවන් නේ.. ඒ විදිහට තමයි... මෙතන වැඩ කෙරෙන්නේ... මේ මහත්තයාට ඕනෑ ඕනෑ විදිහට මෙතන වැඩ කරන්න බෑ... මං මේ ගැන ලේකම්තුමාට පැමිණිලි කරනවා.. මේ වගේ බොරු කියනවාට..." කියා ඒ මහත්තයා ටිකක් සැරෙන් කීවේය.

ටොම්සන් මහත්තයා 'හොක් හොක්' ගා සිනාසුණේය.

"ඒකට මොකක් වෙනවද? ඒ කාලේ හිටපු ලේකම්තුමා රාජ්‍ය සේවා කොමිෂමට කියලා යැව්වානේ සිංහල විෂයය භාර නිලධාරියෙක්ගෙන් සන්නිවේදනය විෂයය ආවරණය කරනවා කියලා... දැන් ඉස්කෝලෙට ඔය විෂයය දීලා අවුරුදු දාහතරක් වෙනවා. පාසල් මාධ්‍ය සමාජ පටන් අරන් අවුරුදු විස්සක් වෙනවා... තවමත් එහෙම තමයි සිද්ධ වෙන්නේ... ඒ වුණාට මේ මහත්තයා මට කියන්න අර රාජ්‍ය සේවා කොමිසමෙන් මීට අවුරුදු හතරකට විතර ඉස්සර වෙලා නිර්දේශ කරලා එව්වානේ... සන්නිවේදන විෂයය සඳහා ඒ විෂයය දන්න නිලධාරියෙක් පත් කරන්න කටයුතු කරන්න කියලා... මට කියන්නකෝ මේ අවුරුදු හතරක්ම ඒ ලියුමට මොකද වුණේ කියලා...?" කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

අර මහත්තයා කරකවලා අත ඇරියා වාගේ ඒ මේ අත බැලුවේය.

"ඒ ලියුමද? ඒ ලියුමද?"

"ඔව්... ඒ ලියුම තමයි... පාසල් මාධ්‍ය සමාජ අයිති වෙන්නෙත් සන්නිවේදනය විෂයයේ සමගාමී ක්‍රියාකාරකමක් හැටියටනේ... එතකොට ඒ දෙකම අද වෙන කොට නන්නත්තාරයි... ඉස්කෝලේ ළමයි තිස් දාහක් මේ විෂයය ඉගෙන ගන්නවා. ගුරුවර ගුරුවරියෝ අටසීයකට වැඩිය මේ විෂයය උගන්නනවා... ඒ වුණාට විෂයය ගැනවත්, මාධ්‍ය සමාජ ගැනවත් හොයා බලන කෙනෙක් නෑ..." කියා ටොම්සන් මහත්තයා කීවේය.


අර මහත්තයා වාෂ්ප වෙලා ගියා වගේ එක සැරේම අතුරුදන් වූයේය.



බන්දුල පී. දයාරත්න

# බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ

## කාට ද ඕනෑ මේ පඬුපුල් සීට් එක?



පීරිසි පිඟන් අහසට පැන එලොව ගියා
කුස්සියෙ වළං පාවී සාලයට ගියා
හැඳිමිටි කොහු ඉදල් තරගෙට ඉහළ ගියා
දීගෙට හය මසක් යන්තම් ගෙවී ගියා

"මයෙ දෑවැද්ද නැත්නම් තර වෙයි මඩිය"
ස්ත්‍රී පාරුසේ ඔසවයි කළු කොඩිය
"මේ යස්සනී හින්දා ඉවරයි පඩිය"
දෙන්නගෙ දුක් ගින්න පුච්චයි මගෙ අඩිය

"මගෙ මුළු හදවතින්මයි මං පෙම පිදුවේ
අරකිගෙ පොත්ත සුදු හින්දද හිත කැඩුවේ"
දුක කිය කියා කෙල්ලක් තනියෙන් හැඬුවේ
මගෙ මේ පුටුව හැම මොහොතෙම උණු උණුවේ


"නහයට උඩින් ගොස් ඉවරයි දැන් වතුර
ණය බර ඉහ උඩයි ටොන් දහසක විතර
මැරෙනව, කාටවත් කෙරුමට බෑ නතර"
ඒ වගෙ ගිනිත් මේ පුටුවට එයි නිතර

"ඩල්සිගෙ ෆිගර් එකනම් මාරයි පට්ට
බඩ එනවා මෙයා මගෙ ඇඟ පිටි මුට්ට"
වැලපෙති මොඩ් එකට නෝනල හරි කට්ට
නෑ සහනයක් පුටුවට දැම්මත් මෙට්ට

පොඩි පොඩි උන්ට උන්ගේ තරමට ප්‍රශ්න
ගැටයෝ ගැටිස්සියො පෙම් හබවල ප්‍රශ්න
අම්මල අප්පලට දරුවන් ගැන ප්‍රශ්න
උන් දුක කියද්දී මට සෑහෙන ප්‍රශ්න

වාසය කරම් දෙවු ලොව තලයක සඳලු
දෑසින් වැටෙන කැට හිතුවද මුතු පබළු
නෑ දෙයියනේ මේ ඔක්කොම උණු කඳුළු
මගෙ පශ්චාත් භාගයෙ තඩි දිය බුබුළු

සෑහෙන වැඩියි මනුලොව දුක රේට් එක
බයටම වැඩි වෙනව පපුවේ බීට් එක
කාටද ඕන මේ පඬුපුල් සීට් එක
ඉවසිය නොහැක මට දැන් මෙහි හීට් එක



**දිල්රූ ජයසේකර**

# විලාසිතා ලොව විවිධ සෘතු

විලාසිතා ලෝකයට සෘතු බලපවත්වන බව බොහෝ දෙනෙකු දන්නා කරුණකි. නමුත් මේ සෘතු සහ විලාසිතා අතර තිබෙන ඒකාකාර සම්බන්ධය ගැන විශාල දැනුමක් හෝ උනන්දුවක් බහුතරය වෙතට සම්ප්‍රේෂණය වී නොමැත. ඇමෙරිකාව ඇතුළත විලාසිතා සෘතු කීපයක්ම සොඳුරු කුණාටු මෙන් හමා යනවා. ඔවුන් අදාළ සෘතුවට ගැළපෙන ආකාරයේ වර්ණ සහ රෙදි වර්ග පවා භාවිත කරමින් දේශගුණික කාලයක් මානසිකව වෙනස් කිරීමකට ලක් කරනු ලබනවා. සීත කාලවල උණුසුම් වර්ණ ඇඳීමට පොලඹවමින්, උණුසුම් කාලවල දීප්තිමත් වර්ණ ඇඳීමට පොලඹවමින් විලාසිතා නිමැවුම්කරුවන් යම් ඉන්ද්‍රජාලමය කාරියක් සිදු කරනු ලබයි. බැලූ බැල්මට පොදු සමාජයේ මේ පිළිබඳ විශාල කතාබහක් නොමැති වුවත් මේ වර්ණ සහ රෙදි භාවිතයට අවිඥානකව ඔවුන්ව පෙලඹවීම කතාබහට ලක් කළ යුතු කාරණාවකි.

ඇඳුම් නිර්මාණකරුවන් සහ විලාසිතා ලෝකයේ ප්‍රාමාණිකයන් විසින් වසරක් පාසා එම වසරට අදාළව ඇඟලිය යුතු ඇඳුම් මොනවාදැයි තීරණය කිරීම එක්තරා අන්දමක විස්මයකි. මන්දයත් ඔබ නොදැනුවත්වම එකී වර්ණය ඇඟලමින් ඔවුන්ගේ වර්ණ සහ රෙදි වර්ගය ප්‍රවර්ධනය කිරීමට සහභාගී වන බැවිනි. එසේම කිසිවකු බලාපොරොත්තු නොවන පාර්ශ්ව පවා මේ ඔබේ ඇඳුමේ වර්ණය තෝරාදීමට සම්බන්ධ වන බව නොදනී. බහුතරයක් පැන්ටෝන් වර්ණ පිළිබඳ කනින් කොනින් අසා ඇති බවට සැකක් නැත. වසරේ පැන්ටෝන් වර්ණ මොනවාදැයි සාමාන්‍ය ජනතාව වධ නොවුණත් වසරේ පැන්ටෝන් වර්ණ තේරීමට එම සමාගම බොහෝ වෙහෙස මහන්සි වේ. වසර කිහිපයකට පෙර පැන්ටෝන් සමාගම විසින් 'වසරේ පැන්ටෝන් වර්ණය' නමින් සංකල්පයක් ඉදිරිපත් කරන ලදී. පෙන්ටෝන් සමාගමේ විධායක නිලධාරීන් සහ ප්‍රමුඛ පෙළේ සේවාදායකයන් හමුවූ එම වසරේ පෙන්ටෝන් වර්ණය කුමක්දැයි සාකච්ඡාවට භාජනය කෙරෙයි. එහිදී ඔවුන් විසින් තෝරා ගන්නා ලද වර්ණය විලාසිතා කර්මාන්තයේ දැවැන්තයන්ට දැනුම් දෙනු ලැබේ. තෝරාගත් වර්ණය සහ එහි අනු වර්ණ ලොව වටා නොයෙක් ඇඟලුම් ලෙස රූපාන්තරණය වන්නේ ඉන් පසුවය.

2014 වසරේ ඔවුන් තෝරාගත්තේ 'Radiant orchid' ය. එනම් රෝස පාටට හුරු දම් පැහැයකි. එම වසර පුරා දම් පැහැයත්, එහි අනු වර්ණ රාශියකුත් විලාසිතා ලෝකය පුරා පැතිර ගියේය. විශේෂයෙන්ම විලාසිතා සංදර්ශන ආදියෙහි අකුරටම මේ වර්ණ භාවිත කෙරුණි.

20 වැනි සියවසේ මුලදී ලොකු ලෝකයටම විලාසිතා හඳුන්වා දෙන තිඹිරිගෙය වූයේ පැරීසියයි. අනෙක් පැත්තෙන් සුප්‍රකට වෝග් මැගසිනයයි. ඔවුන් විසින් ලෝකයට විලාසිතා බෝ කරනු ලැබූයේ යැයි කිවහොත් එහි කිසිදු වරදක් නැත. වර්තමානයේ අප කතාබහ කරන සෘතු සඳහා වර්ණ තේරීම තෙක් දීර්ඝ ගමනක් ආවේ පැරීසියේ විලාසිතා මූලයෙන් සහ වෝග් සඟරා ආදියෙනි. මේ ඒ දිගුවේම අලංකාර කූටප්‍රාප්තියකි.

මුල් කාලයේ ප්‍රධාන සෘතු හතර පමණක් විලාසිතා ලෝකයට ප්‍රමාණවත් වුවත් කල් යත්ම ඔවුන්ට ඒ සෘතු හතර පවා මදි වන්නට විය. අතොරක් රැඩිකල් විලාසිතා නිර්මාණකරුවන් විසින් සෘතු දෙකක් මැදට තවත් විලාසිතා සහ වර්ණ හඳුන්වා දීමට පටන් ගති. ඒවා 'පෙර එකතු' ලෙස වර නැඟුණි. සෘතු දෙකක් මාරු වන කාලයේ ඇති වන කාලගුණ වෙනස සහ පරිසරයේ වර්ණවල ඇති වන වෙනස්කම් උකහා ගනිමින් ඒ කාලයට අදාළ වර්ණ සහ රෙදි වර්ග තෝරා ගැනීමට මොවුහු උත්සුක වූහ. විශේෂයෙන්ම ගස්වල කොළවල පැහැය සහ ඒ කාලයේ පිපෙන මල්වල පැහැය මේ වර්ණ තෝරාගැනීමට උපකාරී විය. ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමත් සමඟ ඇති වූ කාලගුණික වෙනස මේ සෘතු දෙකක් අතර හිඩැසට අනියමින් බලපාන්නට ඇත. යම්කිසි නව අදහසක් ඉදිරිපත්ව ඒ අදහස සාර්ථකව ක්‍රියාත්මක වන බව පෙනෙන්නට තිබුණහොත් සියල්ලෝම ඒ පිටුපස දුවන සංස්කෘතිය අකුරටම පිළිපදිමින් ඉහත කී 'පෙර එකතු' සංකල්පයට විලාසිතා ලෝකය වහ-වහා එකතු විය.

සීත කාලය සැමරීමට උණුසුම් වර්ණ සහ උණුසුම දනවන රෙදි වර්ග භාවිත කරමින් ඇඳුම් මැසීමේ අවිඥානකව ලැබෙන උපකාර ද රාශියකි. ශීතල මැඩ පැවැත්වීමට උණුසුම් පැහැයට නොහැකි වුවද මානසිකව යම් බලපෑමක් ඇති වේ. මෙය ශීත වර්ණවලටද පොදුය. ඒ ඒ සෘතුවක භාවිත කෙරෙන විවිධ රෙදි වර්ග සම්බන්ධයෙන් ඇත්තේ වෙනස් කතාවකි.

මේ අතරම සෘතුවලට අනුගත නොවී වර්ණ සහ, ඇඳුම් වර්ග භාවිතයට ගැනීම දැන් මතුව ඇති තවත් විලාසිතාවකි. නිතර සංචාරයේ යෙදෙන්නන් විෂයෙහි මෙය සර්ව සාධාරණව බලපවත්වයි. එකම මාසයේ සෘතු කිහිපයක සංචාරය කරන මොවුන්ට එක සෘතුවක් බලපැවැත්වීමට කාරණාවක් නැති බව පැහැදිලිය. ශීත සෘතුවක සිට කාන්තාරයක සංචාරයක නිරත වන්නකු ගැන සිතා බලන විට එය හොඳින්ම පැහැදිලි කරගත හැකිය. නමුත් ඒ අතිශය විශේෂ, ඉතාම සුළුතර අවශ්‍යතාවකි. එහෙත් මේ කිසිදු සාධාරණ හේතුවක් නැතිවද 'සෘතු රහිත' ඇඳුම් අඳින්නන් බිහිව තිබේ. ඒ විලාසිතා සංස්කෘතියක් ඇතුළතින් මතු වූ උප ශානරමය වෙනසකි.

එසේම ලෝකයේ 'විලාසිතා සෘතු කැලැන්ඩරයක්' භාවිතයට ගන්නා බවත් තවත් කරුණු විමසූ විට සොයාගත හැකිය. මේ අපූරු කැලැන්ඩරයට අනුව ප්‍රධාන සෘතු දෙකකි. ඒ වසන්ත සහ ගිම්හාන සෘතුවත්, සරත් සහ සිසිර සෘතුවක් ය. වසන්ත සහ ගිම්හාන සෘතුව ජනවාරි මාසයෙන් ආරම්භව ජූනි මාසය තෙක් බල පවත්වයි. සරත් සහ සිසිර සෘතුව ජූලි සිට දෙසැම්බර් තෙක් විහිදෙයි. එහෙත් විලාසිතා වෙළෙඳ කැලැන්ඩරය මීට වඩා වෙනස් ය. ඔවුන්ගේ කැලැන්ඩරය මේ මාස එළැඹීමට පෙර පටන් ගනී. වසන්තය එළැඹීමට පෙර වසන්තයට ඇඳුම් නිකුත් කෙරෙන අතර සිසිරයට පෙර ඊට අදාළ ඇඳුම් විලාසිතා නිකුත් කෙරේ. එසේම 'විලාසිතා සති' සඳහා නිකුත් කෙරෙන ඇඳුම් 'විලාසිතා වෙළෙඳ' කැලැන්ඩරයෙන් වෙනස් වේ. ඔවුන්ට සරත් සහ සිසිර සෘතු පෙබරවාරියේ පටන් ගනී. වසන්ත, ගිම්හාන සෘතු දෙක වෙනුවෙන් වූ විලාසිතා සතිය පටන් ගන්නේ සැප්තැම්බරයේය.

මේ ආකාරයෙන් බලන විට සෘතු වෙනස විලාසිතා ලෝකයට තරම් අන් කිසිවකුට බරපතලව බලනොපාන තරම් ය. එසේම විවිධ සෘතු වෙනුවෙන් මෙයාකාර සූදානමක් ලෝකයේ වෙනත් මුල්ලක සිදු වන බව බහුතරයක් නොදැන සිටීමද පුදුමයකි.



**හිමාලි එන්. ලියනගේ**



# රොබෝ මිනිස්සු



ගෙනල්ලි කතන්දර

ළපෝඩි පැටියෙක් ඉපදුණ දවසෙ ඉඳලා, සමහර විට ඊටත් කලින් ඉඳලා අම්මලා තාත්තලා දරුවව ඇතුළත් කරන ඉස්කෝලෙ ගැන හිතනවා. ළඟම පාසල හොඳම පාසල කියලා කිවුවට ඇත්ත ලෝකෙ එහෙම වෙන්නෙ නෑ. හොඳම ඉස්කෝලෙ කියලා නම් ලබාපු ඉස්කෝලෙකට දරුවා ඇතුළත් කරගත්තාම ලෝකෙ ලොකුම ජයග්‍රහණය ලැබුවාය කියලා හිතලා අම්මලා තාත්තලා නළලේ දාඩිය බින්දු අත්ලෙන් පිහදාලා බිමට දානවා.

එක වසරෙ ඉඳලා දොළහ වසරට යනකල් අපි අනන්ත විභාග කරනවා. අවසාන වාර විභාග, මධ්‍යවාර විභාග, ශිෂ්‍යත්වය, සාමාන්‍යපෙළ, උසස්පෙළ අතරෙ තවත් අටෝරාසියක් වෙන වෙන විභාග තියෙනවා. ඉංග්‍රීසි විභාග, අපරදිග සංගීත විභාග, නැටුම් විභාග ඔය අතරෙ තියෙනවා.

ඉගෙනීමෙ තරගෙ තියෙන්නෙ ලංකාවෙ විතරය. පිටරටවල දරුවො නිස්කාන්සුවෙ උස්මහත් වෙනවය කියලා අපි හිතාන හිටියට හුඟක් පළමුවැනි ලෝකෙ රටවලත් ඔය කියන ඉගෙනීමෙ තරගෙ තියෙනවා. ඒ උදවියත් හොඳම ඉස්කෝලෙට දරුවා දාන්න මහන්සි වෙනවා. සෙනසුරාදා ඉරිදට ළමයි පන්ති එක්කරගෙන ගිහිල්ලා නිවාඩු දවස් දෙක අර්ථාන්විතව වැය කළා කියලා හිත හදාගෙන සඳුදා දවසෙ ආයෙම රාජකාරියට වාර්තා කරනවා.

අන්තිම අරමුණ විදිහට තමන් ජීවත්වෙන රටේ හෝ පිටරටක හොඳම විශ්වවිද්‍යාලයකට ඇතුළත්වීමේ හෝ ඇතුලත්කර ගැනීමේ හීනය දකිනවා. සමහර උදවිය ඒ හීනෙ හැබෑ කරගන්නවා. අනිත් උදවියගෙ හීන අතරමග මඟහැරෙනවා. ලංකාව වගේ තුන්වෙනි ලෝකෙ රටවල නම් හීනෙ මඟහැරගන්න උදවිය ගාමන්ට් යනවා, ටෙක් යනවා, වෘත්තීය පුහුණු පාඨමාලාවලට බැඳෙනවා, සල්ලි යහමින් තියෙනවා නම් විකල්ප ඉගෙනීමේ ක්‍රම හොයනවා.

හීනෙ දිනපු උදවිය රටක් රාජ්‍යයක් දින්නා කියලා හිතාගෙන විශ්වවිද්‍යාලෙ යනවා. තමන්ගෙ දරුවාගේ හීන හැබෑවීම නිමිත්තෙන් අම්මලා තාත්තලා ඇස්වල සන්තෝස කඳුළු පිටි අල්ලෙන් පිහදානවා.

ඉතින් ජීවිතේ එතනින් නවතිනවද? නෑ. ජීවිතේ පටන්ගන්නවා.

මෙච්චර දවසක් ගේ ඇතුළෙ හැදුණ, අම්මා තාත්තා එක්ක ටියුෂන් පන්ති ගියපු දරුවන්ට ජීවිතේ මුණ ගැහෙනවා. විවිධාකාර ඇඳුම් ඇඳපු, නානාවිධ මති මතාන්තර තියෙන, තමන්ගෙ වයසෙ මිනිස්සු මුණගැහෙනවා. තනියම තේ හදන්න, බෝඩිමේ උයාගෙන කන්න හුරු වෙන්න සිද්ධවෙනවා. ඒත් විශ්ව විද්‍යාල ඇතුළෙත් විභාග තියෙනවා. 'ජීවිතේ ඉගෙන ගන්න එක' පැත්තක තියලා, ආයෙත් අකුරු පස්සෙ හැල්මේ දුවනවා.

අවුරුදු හතරකට, පහකට එහෙමත් නැත්නම් උපාධියේ වටිනාකම අනුව අවුරුදු හයකට පස්සෙ, බොහොම උගත් මහදැනමුත්තෙක් විශ්වවිද්‍යාලයේ දොරෙන් එළියට එනවා.

රාජකාරි බහුල මිනිස්සුන්ට අද කාලෙ වැඩපොළ කර ගන්න රොබෝ යන්ත්‍ර උදව් වෙනවා. අති සාර්ථක විදිහට ගෙවල් අතුගාලා පිරිසුදු කරන රොබෝ යන්ත්‍ර දැන් කඩසාප්පුවල මිලදීගන්න තියෙනවා. ඒ යන්ත්‍ර ගේ අතුගාන වැඩේ හරියටම කරනවා. ඒත් අතුගාන්න ඕන මුළු ගෙදරමද එහෙම නැත්නම් ගෙදර කොටසක්ද කියලා රොබෝ යන්ත්‍රයට කියන්න අපට සිද්ධ වෙනවා. කුණු තියෙන තැන විතරක් පිහිදාලා එන්න එයාට බෑ. එයා ලඟ තියෙනවා ගෙදර සැලැස්මක්. සැලැස්මට අමතර උපකරණයක් ගේ ඇතුළෙ තිබුණොත්, එයා ඒ උපකරණෙ මග ඇරලා යන්නෙ නැතුව ගිහින් උපකරණෙ ගැටෙනවා.

ඉතින් පණ තියෙන මනුස්ස ප්‍රාණියෙක්ට ගිහින් ඒ ගැටුම් ලිහලා රොබෝ යන්තරේ ආයෙම ක්‍රියාත්මක කරන්න වෙනවා. විශ්ව විද්‍යාලයෙන් එළියට ආපු උගත් මනුස්සයයි, ගෙවල් අතුගාන රොබෝ යන්තරෙයි අතරෙ නොසෑහෙන සමානකම් තියෙනවා.


මිනිස්සුන්ගෙ මූණෙ ලියවෙන හැඟීම් කියවන්න එයාලා දෙන්නටම නොහැකියාවක් තියෙනවා. හරියටම මෙන්න මේ දේ කරන්නය කියලා කිවුවොත් කරන්නට පුළුවන්කම හැරුණාම දෙයක් හිතලා මතලා කරන්නේ නෑ. එහෙම නැත්නම් හිතලා මතලා කරන්න හිත පුහුණු කරලා නෑ. උගත්කමේ පිහිටෙන් හොයාගත්ත රස්සාවයි, ගෙදරයි අතර දෝලනය වෙන ජීවිතේ මනුස්ස සම්බන්ධකම්වලට හැකියාවක්වත්, කාලයක්වත් නෑ.

මනස විසින් තමන්ව පාලනය කරනවා මිසක් තමන් විසින් මනස පාලනය කිරීමේ කිසිම හැකියාවක් මේ උදවියට නෑ.

ලංකාවෙ විතරක් නෙවෙයි හුඟක් රටවල විභාග ක්‍රමය ඇතුළෙ බුද්ධි ඵලය (Intelligence quotient (IQ) මනිනවා මිසක Emotional Intelligence එහෙම නැත්නම් චිත්තවේගී ඥානය මැනීමේ ක්‍රමවේදයක්වත්, ඒ ගැන ඉගැන්වීමේ විෂයයක්වත් නෑ.

අපි බුද්ධිය විතරක් මනින මිනුම් දඬුවලින් උස මනින එක තව කාලයක් මේ විදිහටම කළොත් රොබෝ යන්තරයි මනුස්ස ප්‍රාණියොයි අතරෙ සැලකිය යුතු වෙනසක් ඉතිරි වෙන්න නෑ.

ඉගෙනගෙන තියෙන අකුරු ගාන අනුව මනුස්සයෙක්ගෙ ජීවිතේ හැඩතල මැවෙන විදිහ වෙනස් වෙන්න නෑ. අකුරු එක්කලා මනුස්ස හැඟීම්, හැසිරීම් ඉස්කෝලවල ඉගැන්නුවා නම්, ඉගනීමේ කඩුලු පැනීමේ තරගෙ අහවර වුණාට පස්සෙ, මූණ දෙන්න සිද්ධ වෙන ජීවිතේ විභාගෙ මේ තරම් අමාරු වෙන්නෙ නෑ.



**දසුනි හෙට්ටිආරච්චි**

බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ
සංස්කරණය - දිල්රූ ජයසේකර

**බද්දර මල්ල ගැන ඔබේ අදහස් අපට කියන්න**

**'බද්දර මල්ල' දිනමිණ, අංක 35, ලේක් හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.**

baddaramalla@lakehouse.lk

දිනමිණ The Dinamina

# ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

### කොළඹ වරායේ යෝජිත ගොඩනැගිලි පහක් සඳහා පාංශු පරීක්ෂණය

01. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ "A" කුඩා පරිමාණ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කොළඹ වරායේ යෝජිත ගොඩනැගිලි පහක් සඳහා පාංශු පරීක්ෂණය (කොන්ත්‍රාත් අංකය : SLPA/CD/CMCS/INV) සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. පසුගිය වසර පහ (05) තුළ ගොඩනැගිලි ව්‍යාපෘති සඳහා බෝර හිල මගින් පර්යේෂණ කරන ලද අවම වශයෙන් ව්‍යාපෘති තුනක් (03) සාර්ථකව සම්පූර්ණ කර ඇති ලියාපදිංචි සමාගමක් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවෙකු වේ. එම බෝර හිල පර්යේෂණයක අවම ශුද්ධ වටිනාකම රු. මිලියන 6 ක් විය යුතු අතර, අනෙකුත් ව්‍යාපෘතිවල වටිනාකමද එකක් රු. මිලියන 2 ක අවම ශුද්ධ වටිනාකම ඉක්මවා තිබිය යුතුය.

    (අ) ලංසුකරු සතුව eroc.drc.gov.lk යන වෙබ් අඩවිය වෙතින් ලංසුකරු විසින් මාර්ගගතව අයදුම් කොට ලබාගත් අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද වලංගු ලියාපදිංචි සහතිකයක් තිබිය යුතුය.

03. පූර්ව ලංසු රැස්වීමක් 2020.10.14 වෙනි දින 10.30 පැයේදී කොළඹ 01, ලේඩින් බැස්ටියන් මාවතේ අංක 45, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පුස්තකාලයේදී පැවැත්වේ.

04. ලංසු, දින 120 ක් වලංගු විය යුතු අතර, ලංසු ඇපකරය 2021.03.17 වෙනි දින දක්වා වලංගු විය යුතුය. ලංසු ඇපකරයේ වටිනාකම රු. 75,000.00 ක් විය යුතු අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බැංකුවක් විසින් නිකුත් කරන ලද කොන්දේසි රහිත සුරක්ෂනයක් විය යුතුය.

05. ආපසු ගෙවනු නොලබන රු. 2,500.00 ක (වැට් බදු ඇතුළුව) ටෙන්ඩර් ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව කොළඹ 01, ලේඩන් බැස්ටියන් මාවතේ අංක 45, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොන්ත්‍රාත් හා සැලසුම් නිර්මාණ අංශයේ ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම් නිර්මාණ) වෙතින් 2020.10.06 වෙනි දින සිට 2020.10.20 වෙනි දින මධ්‍යහ්න 12.00 දක්වා (දෙදිනම ඇතුළුව) රාජකාරී දිනයන්හි 9.30 පැය හා 14.00 පැය අතර, ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලැබේ. එම කාර්යාලයේදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

06. සුරක්ෂිතව මුද්‍රා තබන ලද කවරවල බහාලන ලද ලංසු, එම කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"කොළඹ වරායේ යෝජිත ගොඩනැගිලි පහක් සඳහා පාංශු පරීක්ෂණය (කොන්ත්‍රාත් අංකය : SLPA/CD/CMCS/INV)"** යනුවෙන් සඳහන් කර **"සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් සහ සැලසුම් නිර්මාණ) බාරේ, කොන්ත්‍රාත් සහ සැලසුම් නිර්මාණ අංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 45, ලේඩින් බැස්ටියන් පාර, කොළඹ 01"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ ඉහත ලිපිනයේ ප්‍රධාන ඉංජිනේරු **"කොන්ත්‍රාත් සහ සැලසුම් නිර්මාණ"** කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ලංසු බහාලිය හැකිය.

07. පිටපත් දෙකකින් යුතු ලංසු භාරගැනීම 2020.10.21 වෙනි දින 14.00 පැයට අවසන් කෙරෙන අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

08. වැඩිදුර තොරතුරු ඉහත ලිපිනයේ ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම් නිර්මාණ) වෙතින් ලබාගත හැකිය. (දුරකථන අංකය : 011-2380517)

ඉහත දැන්වීම eroc.drc.gov.lk වෙබ් අඩවියේ පළ කොට ඇත.

**සභාපති,**
**කුඩා පරිමාණ ප්‍රසම්පාදන කමිටුව - A,**
**(ශ්‍රී ලංකා වරාය අධිකාරිය),**
**ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් සහ සැලසුම් නිර්මාණ) බාරේ,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය,**
**අංක 45, ලේඩින් බැස්ටියන් පාර, කොළඹ 01.**

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

01. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දැක්වෙන අයිතම සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | ටෙන්ඩරයේ නම | ලංසු ඇපකරයේ වටිනාකම (රු.) | ලිපිලේඛන ගාස්තුව (වැට් බදු ඇතුළුව) | ලංසු භාරගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| CMS/LP/20/PT/09/052 | 2021 වර්ෂය සඳහා සටහන් පොත්, සිහින් (Slim) දින පොත්, දින දර්ශන හා සුභපැතුම් පත් සැලසුම් නිර්මාණය සහ මුද්‍රණය සඳහා වන ප්‍රසම්පාදනය | 112,200.00 | 3,500.00 | 2020-10-16 වෙනි දින 13.30 පැය<br>පූර්ව ලංසු රැස්වීමේ දිනය හා වේලාව<br>2020-10-12 වෙනි දින 10.00 පැය |

02. **රු. මිලියන 5** ඉක්මවන ටෙන්ඩර් සඳහා 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ වන විධිවිධාන අදාළ වන බව ලංසුකරුවන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව කොන්ත්‍රාත්තුවේ මුළු කාලය පුරාම එකී පනත අනුවම බැඳී කටයුතු කරන ලෙස ඉහත සඳහන් ටෙන්ඩරය හා සම්බන්ධව සියලු පාර්ශ්වයන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. තවද, ඕනෑම විදේශීය නිෂ්පාදකවරයෙකුගේ හෝ සැපයුම්කරුවෙකු සඳහා හෝ වෙනුවෙන් ඒජන්තවරයෙකු, උප-ඒජන්තවරයෙකු, නියෝජිතයෙකු හෝ නම් කරන ලද අයකු ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන ඕනෑම ලංසුකරුවෙකු පොදු කොන්ත්‍රාත්තු රෙජිස්ට්‍රාර් හා ලියාපදිංචි වී ස්වකීය ලංසු ලිපිලේඛන සමග නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

03. ලංසුකරුවන් අවම වශයෙන් පසුගිය වසර තුන (3) ක කාලය තුළ සමාන ස්වභාවයේ භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක නිරත වී සිටිය යුතුය.

04. අභිලාෂී ලංසුකරුවන් හට, වැඩිදුර විස්තර තොරතුරු ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන කාර්යාල වේලාවන් තුළ පහත දැක්වෙන ලිපිනයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

05. අභිලාෂී ලංසුකරුවන් හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා 04 වන තීරුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව **2020 ඔක්තෝබර් 06 වෙනි දින** සිට ලංසු භාරගන්නා අවසාන දිනට පෙර දින දක්වා රාජකාරී දිනවලදී **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** මිලදී ගත හැකිය. ගෙවීමේ ක්‍රමය මුදලින් වනු ඇත.

06. ලංසුව, එම ලංසු භාරගන්නා අවසාන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම පහත සඳහන් ලිපිනයේදී පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ. සියලු ලංසු සමග ඉහත සඳහන් වටිනාකමට වන ලංසු සුරක්ෂණයක් (ඇපකරයක්) ද ඉදිරිපත් කළ යුතුය.

**ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ),**
**සැපයුම් අංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය,**
**අංක 45, ලේඩින් බැස්ටියන් පාර, කොළඹ 01.**
**දුරකථන අංක : 2482231, 2483338, 2482499, 2482652, 2482832, 2482409, 2482638,**
**ෆැක්ස් අංක : 2381652, 2470443**

## මහජන බැංකුව

## කුරුණෑගල ප්‍රාදේශිකය

## බේරා නොගත් උකස් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මහජන බැංකුවේ පහත සඳහන් ශාඛාවන් හා සේවා මධ්‍යස්ථාන වෙත 2019-08-31 (අවුරුද්දක් සඳහා උකස් තැබූ) දින ගනුදෙනු අවසානය දක්වා උකස් කරන ලදුව සඳහන් කර ඇති දින තෙක් බේරා නොගත් රන් භාණ්ඩ පහත දක්වා ඇති දිනයන්හි හා ස්ථානයන්හිදී පෙ.ව. 9.00 ට ආරම්භ කර, ප්‍රසිද්ධ වෙන්දේසියේ අලෙවි කරනු ලබන බව මෙයින් දන්වමු.

| ශාඛාව | සේවා මධ්‍යස්ථානය | පහත දින දක්වා බේරා නොගත් භාණ්ඩ | වෙන්දේසි දිනය | වෙන්දේසි ස්ථානය |
|---|---|---|---|---|
| කුරුණෑගල | රෝහල් ඒකකය<br>නගර සභා ඒකකය | 2020-11-20 | 2020-11-21 සහ 2020-11-22 | කුරුණෑගල |
| පොල්ගහවෙල | ගොඩවෙල | | | පොල්ගහවෙල |
| මාකඳුර | පන්නල | | | මාකඳුර |
| රිදීගම | පානගමුව, දෙඩම්ගස්ලන්ද | | | රිදීගම |
| ඇතුගල්පුර | හිරිපිටිය මල්ලවපිටිය | | | ඇතුගල්පුර |
| මැල්සිරිපුර | - | 2020-11-27 | 2020-11-28 සහ 2020-11-29 | මැල්සිරිපුර |
| කුලියාපිටිය | දුම්මලසූරිය<br>උඩුබද්දාව<br>බිහල්පොල<br>කඳුනේගෙදර | | | කුලියාපිටිය |
| මහව | නාගොල්ලාගම | | | මහව |
| නාරම්මල | කටුපොත | | | නාරම්මල |
| ගිරිඋල්ල | බම්මන්න,<br>දඹදෙණිය | | | ගිරිඋල්ල |
| නිකවැරටිය | නිකවැරටිය<br>රස්නායකපුර<br>ගිරිල්ල | | | නිකවැරටිය |
| හෙට්ටිපොල | බණ්ඩාරකොස්වත්ත | | | හෙට්ටිපොල |
| අලව්ව | බෝයවලාන | | | අලව්ව |
| වාරියපොල | මාස්පොත | 2020-12-04 | 2020-12-05 සහ 2020-12-06 | වාරියපොල |
| බිංගිරිය | වීරපොකුණ | | | බිංගිරිය |
| ගල්ගමුව | අඹන්පොල | | | ගල්ගමුව |
| මාවතගම | පරගහදෙනිය | | | මාවතගම |
| ඉබ්බාගමුව | කුඹුක්ගැටේ | 2020-12-11 | 2020-12-12 සහ 2020-12-13 | ඉබ්බාගමුව |
| මලියදේව | මලියදේව වීදිය<br>පිදුරුවැල්ල | | | මලියදේව |
| පොතුහැර | මතව | | | පොතුහැර |
| කොබෙයිගනේ | බොරළුවැව | | | කොබෙයිගනේ |

ඉහත දක්වා ඇති පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසිය නැවත දැනුම්දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම, කල් දැමීම හෝ ඒකාබද්ධ කර පැවැත්වීමේ අයිතිය බැංකුව සතුය.

**ප්‍රාදේශීය කළමනාකාර,**
**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,**
**නො. 03, වත්හිමි පාර, කුරුණෑගල**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

## මහජන බැංකුව

## ගම්පහ ප්‍රාදේශිකය

## උකස් වෙන්දේසිය 2020

ගම්පහ ප්‍රාදේශිකයට අයත් පහත සඳහන් ශාඛා හා සේවා මධ්‍යස්ථානවල 2019.02.28 දින දක්වා උකස් කරන ලදුව පහත උපලේඛනයේ සඳහන් දිනයන් දක්වා බේරා නොගත් උකස් භාණ්ඩ, පහත දක්වා ඇති දිනයන් හි හා ස්ථානයේ පෙ.ව. 9.00 ට ආරම්භ කර වෙන්දේසි කරනු ලබන බව මෙයින් දන්වමු.

| ශාඛාව | සේවා මධ්‍යස්ථානය | දින දක්වා බේරානොගත් | වෙන්දේසි දිනය සහ පවත්වනු ලබන ස්ථානය |
|---|---|---|---|
| මල්වාන<br>පූගොඩ<br>දෙල්ගොඩ | දෙම්පේ<br>වැලිවේරිය | 2020.10.16 | 2020.10.17<br>දෙල්ගොඩ |
| නිට්ටඹුව<br>වේයන්ගොඩ | තිහාරිය<br>පස්යාල<br>වතුපිටිවල<br>නයිවල | | 2020.10.17<br>නිට්ටඹුව |
| ගම්පහ<br>යක්කල<br>කිරිඳිවැල | ජා ඇල පාර<br>උඩුගම්පල<br>මුදුන්ගොඩ<br>ඌරාපොල | | 2020.10.17<br>ගම්පහ |
| මරඳගහමුල<br>මීරිගම | දිවුලපිටිය<br>දෙමන්හන්දිය<br>පල්ලේවෙල<br>කොටදෙනියාව | | 2020.10.17<br>මීරිගම |
| මිනුවන්ගොඩ<br>කටුනායක<br>සීදූව | ආඩිඅම්බලම<br>ඇවරියවත්ත<br>රද්දොළුගම | | 2020.10.17<br>මිනුවන්ගොඩ |
| මීගමුව<br>කොච්චිකඩේ | කෙලින්වීදිය<br>පිටිපන - ධීවර සේ.ම.<br>කටාන | 2020.10.17 | 2020.10.18<br>මීගමුව |
| ජා ඇල<br>වත්තල<br>පමුණුගම<br>කඳාන | දෙහියාගාත<br>ඒකල-මඩමහන්දිය<br>වැලිගම්පිටිය<br>ඇලකන්ද<br>වැලිසර | | 2020.10.18<br>ජා ඇල |
| රාගම<br>ගණේමුල්ල<br>කඩවත | මහබාගේ<br>බටුවත්ත<br>වැලිපිල්ලෑව<br>කිරිල්ලවල<br>කඩවත නගර | | 2020.10.18<br>රාගම |
| මහර<br>කිරිබත්ගොඩ<br>කැලණිය | එඬේරමුල්ල<br>මාවරමණ්ඩිය<br>සිංහාරමුල්ල<br>පෑලියගොඩ | | 2020.10.18<br>කිරිබත්ගොඩ |

ඉහත පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසිය මහජනයාට වැඩිදුර දැනුම් දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම, ඒකාබද්ධ කර පැවැත්වීම හෝ යන මෙයින් යම් කටයුත්තක් සිදු කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

**ප්‍රාදේශීය කළමනාකාර - ගම්පහ**
**මහජන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය (ගම්පහ)**
**අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

# මුලටියන ප්‍රාදේශීය සභාව

